# ආදරය ගින්දරක්

එය ඇවිළුණු දා සිට සැනසීමක් නැත...

නවකතා තිළිණය

01 පොත



## සුජීව ප්‍රසන්න ආරච්චි

www.sinhalaelibrary.com

# ආදරය ගින්දරක්

එය ඇතිවූ දා සිට සැනසීමක් නැත..

## සුජීව ප්‍රසන්න ආරච්චි

## 01

ශ්‍රී දූම කපාගෙන වැටිච්ච පොදේ නුවරඑළියේ සීතල තවත් වැඩි කළා. ඒත් මේ හිම කැට වැටෙන සීතලෙත් රංගට සීතලක් දැනුණේ නෑ. මේ ජීවිතේ දැකපු ලස්සනම රෝස මල නීතියෙන්ම අයිති කරගෙන සීතල කඳුකරයට ගෙනාවට පස්සේ මොන සීතලක්ද... රංගන උපේක්ෂා දිහා බැලුවේ ඒ පෙරේත බැල්මෙන්මයි.
කෙල්ලට සීතල උහුල ගන්නට අමාරුයි. ඊටත් වඩා මේ දුක උහුලගන්න බෑ. කොළඹ ඉඳලා මේ නුවරඑළියට එනකල් උපේක්ෂාට දස දහස් වාරයක් ඇඬෙන්න ආවා. ඒ සෑම වතාවකදීම ඇය තොල් පට හපාගෙන ඒ ඇඬුම වාවා ගත්තා. මේ ජීවිතේ දැකපු අප්‍රසන්නම කෙනා ඉදිරියේ මේ කඳුළු පෙන්නලා වැඩක් නෑ කියලා කෙල්ල දන්නවා. මේ රැයෙන් පස්සේ හුස්ම ගන්න ජීවිතේ ඉවරයි. ලස්සන යොවුන් විය ඉවරයි. වාහනයේ හිස හප්පගෙන හප්පගෙන මැරෙන්න ඇයට හිතෙනවා. ඒත් අන්තිම මොහොතේ හරි දෙවියෝ තමාව බේරගනී කියල උපේක්ෂාට හිතෙනවා.

උපේක්ෂාගේත් රංගනගේත් වෙඩින් එක තිබ්බේ අද දවල් හිල්ටන් හෝටලයේදී. ඒ මංගල උත්සවය තිබ්බ පැය හතර පහ තුළ මොනාද උනේ කියලවත් දැන් උපේක්ෂාට මතක නෑ.
අද සිද්ධ උනේ මංගල්ලයක් නෙමේ... අවමංගල්ලයක්. උපේක්ෂාට එහෙමයි හිතෙන්නේ.



"සමහර විට මං මැරෙයි ගීතක්කේ..."

උපේක්ෂා මධුසමයට පිටත් වෙන්න කලින් කඳුළු පුරවාගෙන කිව්වා.

"කරදර මැද්දේ හරි ටිකක් ජීවත් වෙන්න බලපන් කෙල්ලේ..."

උපේක්ෂා සාරි පට දකුණු උරතලය මතින් දමාගෙන බිමට නෙත් බර කර ගත්තා. රංගන තමා දිහා බලන්නේ ලේ සුවඳ ඉවසන්න බැරි ගොදුරක් දිහා බලන විදිහට කියලා උපේක්ෂා දන්නවා.

ජීවිතේ හැම දෙයක්ම රැක ගත්තේ මේ වගේ මූසල වැහිබර රෑක මේ වගේ කෙනෙක්ට දෙන්නද කියලා කෙල්ල හිතනවා.

"ඇතුළට ගියාම සීතල යයි..."

රංගන කියන්නේ කෙල්ලගේ වෙව්ලන රෝසපාට තොල් පෙති දිහා බලාගෙන. උපේක්ෂා යටි තොල හපා ගත්තා. "උඹේ ආඩම්බරකම ඔක්කොම අද රෑට පස්සේ ඉවරයි..." රංගන වාහනය නුවරඑළිය නගරයට දමමින් හිතුවා.

වාහනය නුවරඑළිය ග්‍රෑන්ඩ් හෝටලය ඉදිරිපිට නැවතුණා. සීතල වැහි පොද අතරින් උපේක්ෂා හෝටලය දිහා බැලුවා. ඇයට ලස්සන ග්‍රෑන්ඩ් හෝටලය පෙනුණේ වධකාගාරයක් වගේ. ජීවිතේ රැකගත්ත හැම දෙයක්ම දන් දෙන්න වෙන්නේ මේ හෝටලය ඇතුළෙදි කියලා ඇය දන්නවා.

ඒ කාලකන්නි මොහොතට මුහුණ දෙන්නේ කොහොමද...

"බහිමු උපේක්ෂා..."

රංගනට තිබ්බේ ලොකු කලබලයක්. උපේක්ෂා ආසනය මත තිබ්බ රතු රෝස මල් කළඹ පිටුපස අසුනට විසික් කළා.

"උදේට රෝස මල් ටික පරවෙලා තියෙයි... අපරාදේ..."

රංග කිව්වේ උපේක්ෂාගේ පපුව කුප්පවන සිනාවකින්. ඔහු එහෙම කිව්වේ මොකෝ කියලා උපේක්ෂා දන්නවා. ඇත්තටම මේ ජීවිතේ



www.sinhalaelibrary.com

අපරාදේ කියලා කෙල්ලට හිතුණා.

වාහනයෙන් බහිද්දීම ග්‍රෑන්ඩ් හෝටලය ඉදිරියෙන් හමා ගිය වැහි සුළං පාරකින් උපේක්ෂාව වෙව්ලලා ගියා. මේ අඩි තුන හතර යා ගන්න බැරි විදිහට දෙපා කොරවෙලා යනවනම් කියලා උපේක්ෂාට හිතුණා.

"ය..න්..."

රංග ඩිකිය ඇරලා ඇඳුම් බෑග් දෙක අරගෙන සේවකයෙක්ට දුන්නා.

"හනිමූන් එකට යන්න ඇඳුම් බෑග් එකවත් ලෑස්ති කරගෙන නෑනේ ඔයා... අන්න මං ලෑස්ති කරලා තිබ්බා... මෙරූන් පාට නයිට් ඩ්‍රෙස් එකක් මං දාලා ඇති... එදාට රෑට අඳින්න..."

ඊයේ රාත්‍රියේ අම්මා කාමරයට ඇවිත් එහෙම කියනවා උපේක්ෂා අහගෙන.

"ඔකට වහ බෝතලේකුත් දැම්ම නම් හරි..."

උපේක්ෂා ඒ වෙලාවේ කිව්වා.

"දැන් ඉතින් ඔය පුප්පන එක නවත්තලා ඒ කොල්ලා එක්ක හොඳට ඉන්නවා..."

"ඒ කොල්ලෙක්යැ... මිනිහෙක්නේ..."

"නැත්නම් ඒ ලෙවල් කරන කොල්ලෙක්ව ගෙනත් දෙන්නද කියන්නේ... උ..පේ..ක්..ෂා... පිස්සු නටන එක නවත්තනවා..."

එච්චරයි. එහෙමම උපේක්ෂා කට වහ ගත්තා. මේ ජීවිතේ ගැන මත්වෙලා නටන අම්මා කෙනෙක් එක්ක කතා කරලා තේරුමක් නෑ කියලා දැන් උපේක්ෂා දන්නවා.

"දවස් තුන හතරක් විතර නුවරඑළියේ ඉඳලා එන්න... හෝම් කමිං තියෙන්නේ සැටඩේ නේ..."

අම්මා කියද්දී උපේක්ෂා මොනවත් කිව්වේ නෑ... නුවරඑළියේ ඉඳලා





කොළඹට තමාගේ මිනිය ගේන්න වෙනවනම් කොච්චර හොඳද කියලා උපේක්ෂාට හිතුණා.

"මාත් හිතනවා විතරයි... කිසි දෙයනක් කරගන්න බෑ... කසාද බැඳලා හනිමූන් එකට නුවරඑළියට එනකං හුල්ලපු එක විතරයි කළේ... දැන් ඇඳුම් ගලවලා දාලා ඇඳ උඩට වෙලා පූජාවට ලෑස්ති වෙයං... ඊට පස්සේ ජීවිත කාලෙම අඬ අඬා ඉඳපං..."

උපේක්ෂා මේ බැණගන්නේ ඇගේම හිතටයි.

කාමරයේදී උපේක්ෂාට හුස්ම ගන්නවත් රංග ඉඩ දුන්නෑ. පැය පහළොවක් විතර එකදිගට පටලවගෙන හිටපු මංගල ඇඳුමවත් බුරුල් කරගන්න ඔහු ඉඩ දුන්නෑ. එහෙමම කිට් කිටියේ ඔහු කෙල්ලව වැළඳ ගත්තා.

"ම.. ම..ට අ..මා..රුයි... ම..හ..න්..සි..යි..."

උපේක්ෂා කිව්වේ අඬලා වගේ. ඇය එහෙමම වැටෙන්න ගිය සාරි පට පපුව උඩින් දාගෙන ඉවතට හැරුණා. මුහුණ පුරා සටහන් වූ රංගගේ ගොරෝසු තොල් පාරවල් ඇය පිටි අත්ලෙන් පිස දැම්මේ ලොකු අප්පිරියාවකින්.

"ඔ..යා කො..හෙ..ද තාත්තේ... ඉ..න්න තැ..නකින් ඇවිත් මා..ව බේරගන්න..."

උපේක්ෂා තොල් පට ලේ රහ වන තුරු හපාගෙන සිතින් කිව්වා.

"දැන් දහයටත් කිට්ටුයි... වොෂ් එකක් දාගෙන චේන්ජ් එකක් දාගන්න... එතකොට මහන්සිය යයි..."

ඒත් පපුවේ තියෙන දුක... ඒ දුක කවදාවත් යන එකක් නෑ. රංග කෝට් එකත් කමිසයත් ගලවා දමා කලිසමත් වෙස්ට් එකත් පිටින් ඇඳට බර උනා. ඔහු ඔහුට පිටුපා උන් උපේක්ෂාගේ සුන්දර වත පෙරේත ඇස්වලින් රස වින්දා... අවුරුදු දෙකක් මේ රූපේ දිහා බලාගෙන දුක්



www.sinhalaelibrary.com

වින්දා නේද කියලා රංගට හිතුණා.

**"අවුරුදු දෙකක් ඉවසපු එකේ මේ පැය දෙක තුන මොකක්ද..."**

රංග සිනාබරව සිතුවා. උපේක්ෂා සායකුත් බ්ලවුස් එකකුත් ගෙන නාන කාමරයට ගියේ පුදුමාකාර අපහසුතාවයකින්. ඒ ඇඳුම ගනිද්දී ඇය අම්මා දමා තිබූ දුහුල් රෑ ඇඳුම දැක්කා.

**"ඒක ඇඳගෙන මේ පෙරේත ඇස් දෙක ඉස්සරහා ඉන්න බෑ..."**

ඒ රෑ ඇඳුම මසා තිබුණේ ඒ තරම්ම දුහුල් රෙද්දකින්. අම්මට ඒ වැඩ හොඳට පුළුවන් කියලා උපේක්ෂාට හිතුණා.

උපේක්ෂා ඇඳුම් ටික තියලා මංගල ඇඳුම හැවක් අයින් කරනවා වගේ වතින් ගලවලා දැම්මා. කෙල්ලෙක් මේ මංගල ඇඳුම අඳින්නේ මොන තරම් භක්තියකින්ද කියලා උපේක්ෂා දන්නවා. ඒ මංගල ඇඳුම අඳින දවස ඇගේ ජීවිතයේ උදාවන රත්තරන්ම දවස. ඒත් උපේක්ෂාට අද උදේ හතරකුත් ගාණකට මේ මංගල සාරිය අන්දවද්දී හිතුණේ තමාව පෝරකයට ගෙනියන්න සූදානම් කරනවා කියලා.

තුවාය වත දවටාගෙන උපේක්ෂා නාන කාමරයේ පුංචි ටයිල් ගැටිට උඩ වාඩි උනා. දවසක් පුරා හිර කරගෙන උන් දුක මදටිය ඇට දෙකක් තරම් වූ කඳුළු කැට දෙකක් ලෙසින් කෙල්ලගේ දෑසින් පිටවුණා.

**"අ..නේ දෙයියනේ... දැන් මං මොනාද කරන්නේ..."**

උපේක්ෂාට හිතාගන්න බෑ. ඇය එහෙමම ටයිල් බිත්තියට බරවුණා. මීට වඩා ටිකක් හොඳ ජීවිතයක් වත් තමාට නොලැබුණේ ඇයි...

**"උපේක්ෂා... උපේක්ෂා..."**

රංග දොරට ගැහුවා. උපේක්ෂා දොර ඇරියේ නෑ... වතට තද වූ තුවා පට පපුවට තද කරගෙනම ඇය දොර ළඟට ආවා...

**"ඇ..යි..."**

**"මො..නා..ද බාත් රූම් එකේ කරන්නේ..."**





**"මං ඇඳුම් මාරු කරනවා..."**

උපේක්ෂා එපමණයි කිව්වේ. ඇය දිග සුසුමක් හෙළුවා. රාක්ෂයෙක් තමා එනතුරු බලා ඉන්නා බව උපේක්ෂා දැන් දන්නවා. ජීවිතයට සැනසීමක් ඕනම නම්... උපේක්ෂා හිස් හැඟීමෙන් ටැප් එක ඇරියා... එක පැත්තකට කැරකුවාම එන්නේ සීතල වතුර. අනිත් පැත්තෙන් උණු වතුර.

උපේක්ෂා සැහෙන වේලාවක් ගෙන ඇඟ සෝදා ගත්තා... ඇය සායත් බ්ලවුසයත් ඇඳගෙන පිටතට ආවේ පැයකට විතර පස්සෙයි.

**"පැය ගාණක් මො..නාද කළේ..."**

රංග ඇසුවේ තරමක් කේන්තියෙන්.

**"ඇ..ඟ සේ..දුවා..."**

**"ඒක මාර ඇඟ සේදිල්ලක්නේ... වෝටර් ඩ්‍රින්ක්ස් අරගෙන එයි ගන්න..."**

උපේක්ෂා රංගත නාන කාමරයට යන දෙස බලා උන්නා... ජීවිතය ගැන තීරණයක් ගන්නම ඕන නම් දැන් ගන්න පුළුවන්. උපේක්ෂා වාහනයේ තිබූ පාවහන් යුගල ගෙන දා ගත්තා. ඊටත් පසු ඇගේ කුඩා පර්ස් එක අතට ගත්තා...

කවුදෝ දොරට තට්ටු කළේ ඒ මොහොතේදී. උපේක්ෂා ගිහින් දොර ඇරියා.

**"ගු..ඩ් ආෆ්ටර්නූන් මිස්..."**

විස්කි... සෝඩා... අයිස්... රතු වයින්... උපේක්ෂා සේවකයා ගෙන ආ ට්‍රේ එක දිහා බලාගෙනම උන්නා.

**"වයින් එක ඕපන් කරන්නද මිස්..."**

**"නෑ.. එ..පා..."**

රෙඩ් වයින් එක මට වෙන්න ඇති. හිතාගෙන ඇති මම රතු වයින් බීලා මත්වෙලා පිස්සුවෙන් දඟලයි කියලා.

උපේක්ෂා මොහොතක් කැඩපත දිහා බලාගෙන උන්නා. ඒ අසළම කදුකර මල් පිරවූ මල් බදුනක් තිබ්බා. උපේක්ෂා ඇගේ රුව දෙස බලා උන්නේ ඒ මල් අතරින්.

"මං මොකටද මේ ජීවිතේ දු..ක බාරගන්නේ... කවුරුවත් දීපු දුකට මං මොකටද අහුවෙන්නේ... දුක් විඳින්න හරි සැප විඳින්න හරි මං මගේ ජීවිතේ මංම තෝර ගන්නවා..."

ඒ මොහොතේම නාන කාමරයේ දොර ඇරුණා. රංග උපේක්ෂා දෙස බැලුවේ පුදුමයෙන් වගේ.

"මොකද පර්ස් එකත් අතින් අරගෙන..."

රංග උන්නේ සුදු විශාල තුවායක් ඇඳගෙන. උපේක්ෂා මොහොතක් ඔහු දෙස බලා උන්නා... ඊටත් පසු හිතාගන්නවත් බැරි මොහොතක ඇය බාගෙට ඇර තිබූ දොර ඇරගෙන හෝටල් කාමරයේ පිටතට දිව්වා.

"උපේක්ෂා..."

රංග වේගයෙන් දුව ආවේ ඇයව අල්ලා ගන්නට. ඒත් ඒ වෙද්දී ඇය හෝටල් කොරිඩෝවේ සෑහෙන දුරක් ගොස් හමාරයි.

"ප..ඩ්ට බැල්ලී..."

රංග කාමරයට පැමිණ වේගයෙන් තුවාය උනා දමා කලිසම ඇඳගෙන කමිසයක් උඩින් දමා ගත්තා...

"මේ නුවරඑළියේ උඹට පැනලා යන්න බෑ..."

රංග වේගයෙන් පහළ මාලයට දුවගෙන ගියා. ඒත් උපේක්ෂා පෙනෙන්නට උන්නෑ.

උපේක්ෂා උන්නේ ඉහල මාලයේම දිග කොරිඩෝවක අතරමං වෙලා...

"අ..නේ දෙයියනේ... මේකෙන් එළියට යන්නේ කොහොමද..."

උපේක්ෂාව අසාමාන්‍ය ලෙස වෙව්ලනවා. කෙල්ල කොරවෙලා දැන්





දැන් වැටෙයි කියලා ඇයට හිතෙනවා... ඇය කොරිඩෝවෙන් වමට තිබූ දිග කෝරිඩෝවකට යළිත් පිවිසුණා. ඒ කොරිඩෝව අවසන් උනේ බිත්තියකින්... උපේක්ෂා අමාරුවෙන් දුව ගොස් ඒ බිත්තිය මැද වූ ජනේලයෙන් බැලුවා. ඇයට පෙනුණේ ග්‍රෑන්ඩ් හෝටලයේ ඉදිරිපස ගෙමිදුල...

ඒ ගෙමිදුල දිගේ දුව යන රංගව ඇය දැක්කේ ඒ මොහොතේදී... කෙල්ල එහෙමම පපුවට අතක් තබා ගත්තා...

"මං කො..හො..මද දැන් පැනලා ය..න්..නේ... මේ හෝටලෙන් යන විදිහක් මං දන්නෑ..."

දැන්මම හෝටලයෙන් පිටතට යන්න බෑ කියලා උපේක්ෂා තේරුම් ගත්තා. ඒත් සමගම ඇය රංග නැවතත් හෝටලය දෙසට එනවා දැක්කා.

"දැ..න් මෙ..න..නි..න් යයි..."

උපේක්ෂා වෙව්ලමින් සිතුවා... මොනවා කරන්නද කියලා ඇයට හිතාගන්නට බැරි වුණා.

"හෝටලෙන් එළියට යන්න වෙලාවක් නෑ... මෙකි හෝටලේම කොහේ හරි හැංගිලා ඇති..."

රංග සැකයෙන් සිතුවා.

"අවුරුදු විස්සක විතර ගර්ල් කෙනෙක් මෙතනින් යන්න හැදුවොත් යන්න දෙන්නෙපා... ඒ මගේ වයිෆ්... එයාට පොඩි මානසික ආබාධයක් තියෙනවා..."

"හොදයි ස..ර්... අපි බලන්නම්..."

හෝටලයේ ආරක්ෂකයන් පිළිතුරු දුන්නා. රංග වේගයෙන් හෝටලය දෙසට දුවගෙන ආවා.

"දෙයියනේ උෟ එනවා..."

උපේක්ෂා කලබලයෙන් ඒ මේ අත දිව්වා. යංතමට ඇර තිබූ

කාමරයක් ඇය දැක්කේ එවිටයි. කවුදෝ උඩට එන අඩි ශබ්දයක් පවා ළඟට ළඟට ඇසෙනවා... උපේක්ෂාට කරගන්න කිසිවක් තිබුණේ නෑ.

ඇය එහෙමම ඒ කාමරයට ඇතුල් වී දොර වසා ගත්තා. දෑසින් කඳුළු දිගටම ගලා එද්දී ඇය පපුවට දෑතම තබාගෙන හති ඇරියා... ඒත් සමඟම මුළු ඇඟම පණ නැතුව වගේ යනවා ඇයට දැනුණා. උපේක්ෂා එහෙමම කාමරයේ දොර ළඟ බිම ඉඳගත්තා.

"මා..ව ආරක්‍ෂා කර..න්න සුදු නා..න්..නේ..."

ඇස් පියාගෙන උපේක්ෂා ප්‍රාර්ථනා කළා. ඒත් සමඟම වගේ කාමරයේ නාන කාමරයේ දොර ඇරුණා.

"සු..ව..ද දැ..නී.. දැ..නී දැ..නෙ..න..වා... ජී..වි..තේ සු..න්දරද මෙතරම්..."

ඒ ගීතය ඇහෙන්නේ නාන කාමරය ඇතුලෙන්... උපේක්ෂා අන්ත අසරණව දෙනෙත් එසෙව්වා... "අ..නේ දෙයියනේ මට පිහිට වෙන්න..." ඇය ලේ රහ ගැන්වුණු උගුරට අමාරුවෙන් කෙළ පොදක් ගිල්ලා...

"රැ..න් රැන් එ..න පාට පාට සමනලුනේ... පේන පේන මල් සිපගන්..."

තාරකව එක පාරටම ගොළු උනා... තම කාමරයේ දොර ළඟ බිම උන් කෙල්ලව දකිද්දී ඔහුට මොනවත්ම සිතා ගන්නට බැරි වුණා. උපේක්ෂා දෑත් එකතු කළේ අමාරුවෙන්... ඇගේ මුවින් ඇඬුම පිටට එන්නෑ. ඒත් කෙල්ලගේ දෙතොල් වෙව්ලනවා... ඇය මොනවද කියන්න හදනවා කියලා තාරකට තේරෙනවා. ඒත් මේ කෙල්ල තමාට වඳින්නේ ඇයි... කොහෙත්ද ඇය මේ කාමරයට ආවේ.

"මං.. මං.. මං.. අ..යි..යේ..."

උපේක්ෂා දෑත් එකතු කරගෙනම උන්නා... තාරක ඒ මුහුණ දිහා මොහොතක් බලා උන්නා. තමා මේ දකින්නේ මේ ජීවිතයේ දැකපු අහිංසකම ගැහැණු මූණ කියලා ඔහු දන්නවා... ඒත් මේ කෙල්ල තමාට





වඳිමින් මේ මොනවද කියන්න යන්නේ...

"ඔ..යා ක..වු..ද..."

තාරක ඇඳගෙන උන්නේ නිල් පාට බතික් සරම විතරයි. ඔහු ඇඳ උඩ තිබ්බ කමිසය අරගෙන වතට දමා ගත්තා.

ඒත් සමඟම කිසිවෙක් දොරට ගැහුවා. උපේක්ෂා කලබලයෙන් ඔහුගේ දෙපා පාමුලටම දණ ගාගෙන ආවා...

"මං.. මං.. නෑ.. කිය..න්..න.. බු..ඳු අ..යියේ... මං.. මං.. නෑ කිය..න්..න... අ..නේ එ..හෙම කිය..න්..න අ..යියේ..."

තාරකට පුදුමයි. මේ සිද්ධ වෙන්නේ මොකක්ද කියලා ඔහුට තේරෙන්නෑ. නැවතත් දොරට තට්ටු කළා. උපේක්ෂා දුවලා ගිහින් ඇඳ යට බඩගෑවා. ඒ දර්ශනය මේ ජීවිතේ දැක්ක දුක්බරම දර්ශනය කියලා තාරකට හිතුණා.

ඔහු දොර ඇරියේ ඇඳ යටින් එළියට පැමිණ තිබූ කෙල්ලගේ සාය කැල්ලක් වැසෙන්නට ඇඳ රෙද්ද පාත් කරලමයි...

"ඇ..යි..."

කාමරයේ දොර ළඟ උන්නේ රංගත් හෝටලයේ සේවකයෙකුත්ය. රංගගේ දෙනෙත් කාමරය ඇතුළත පුරා දිව්වා.

"මො..ක..ක්ද කෙ..රෙන්..න ඕ..න... ඇයි මේ..."

තාරක ඇහුවා.

"සොරි සර්... මේ සර් අපේ ගෙස්ට් කෙනෙක්... සර් මැරි කරලා අද හනිමූන් ආවේ... සර්ගේ වයිෆ් එක්ක..."

"ම්..."

"ම..ගේ වයිෆ්ට පොඩි මෙන්ටල් අප්සට් එකක් තියෙනවා මිස්ටර්... එකපාරටම රූම් එකේ ඉඳලා දුවලා ආවා... මේ පැත්තට ආවද බලන්න කතා කළේ..."



www.sinhalaelibrary.com

මේ කතාබහ ඇඳ යට උන් කෙල්ලට හොඳට ඇහෙනවා. "උඹ මාව එහෙනම් පිස්සියෙක්ගෙ තත්වෙට දැම්මා... අනේ දෙයියනේ දැන් එයා මං ඇඳ යට ඉන්නවා කියයිද..." උපේක්ෂා සිතුවේ පපුව වේගයෙන් ගැහෙද්දී. ඒ හඬ පිටතට එන තරම්.

"ම..ගේ කා..මරේට මො..ක..වද මිස්ටර්ගේ වයිෆ් එ..න්නේ..."

තාරක කියද්දී උපේක්ෂාට පුදුමාකාර සැනසීමක් දැනුණා.

"ඕන නම් බලන්න..."

"නෑ... කමක් නෑ... අපි ආවද කියලා බලන්න ආවේ..."

"සොරි සර් කරදරයක් උනානම්..."

"ඕ..කේ..."

තාරක එහෙමම දොර වසා දැම්මා. ඊටත් පසු ඔහු ඇඟිලි තුඩු වලින් තදින් නළලත තද කර ගත්තා. තාරකට බැලුනේ ඇඳ දිහාව... ඒ යට ඉන්න කෙල්ලව ඇත්තටම පිස්සුද... එහෙම හිතන්න තාරකට අමාරුයි. ඔහු මොහොතකට කලින් දැක්කේ මේ ජීවිතයේ දැකපු ලස්සනම අහිංසකම මුහුණ. මේ මලක් වගේ කෙල්ලව බන්දලා දීලා තියෙන්නේ රාස්සයෙක්ටනේ. පිස්සු හැදෙන්නැතුව තියෙයියැ කෙල්ලට...

*** *** *** ***

තාරක හෙමිහිට ඇඳ ළඟ පාත් වුණා... ඔහු ඇඳ රෙද්ද ඔසවලා ඇඳ යටට නෙත් යැව්වේ දිග සුසුමක් හෙළලා... ඇඳ යට කෙල්ල ගුලිවී උන් අයුරු දකිද්දී තාරකගේ පපුවම හෙල්ලිලා ගියා.

"එ..යා..ලා ගියා.. එ..න්..න..."

ඔහු කිව්වේ ගොඩාක් මෘදු හඬකින්. උපේක්ෂා ඇඳ යට ඉඳගෙනම ඔහු දිහා බැලුවා. නෙත පාවට ඒ ඇස් දිළිසෙන අයුරු තාරකට බලා





ඉන්නට ඇත්තටම අමාරු වුණා.

"එ..න්..න..."

"එ..යාලා ආ..යි..ත් එ..යිද අ..යියේ..."

"එ..න එ..ක..ක් නෑ... එළියට එ..න්නකෝ..."

කෙල්ල බඩගාගෙනම ආවා. එහෙම ආපු කෙල්ල නැගිට්ටේ නෑ... ඔහුගේ දෙපා වලට දැනම තිබ්බා.

"මා..ව බේ..ර..ග..ත්..තට අ..යි..යට පි..න්... ගො..ඩා..ක් පි..න්..."

ඇත්තටම උපේක්ෂා ඔහුට දැනම එක්කර වැන්දා... නිකමට වත් ඔහු තමා ගැන රංගට කිව්ව නම් මේ ජීවිතේ අද රැයින්ම හමාර වෙන්නට තිබ්බා.

"දැ..න් නැගිටින්..නකෝ..."

තාරක යංතමට ඒ උරතලය මත සුරත තබා කිව්වා. මොනවා කරන්නද කියලා ඔහුටම තේරෙන්නේ නෑ. ජීවිතේ අද රෑ වගේ රැයකට ඔහු කවදාවත් මුහුණ දීලා තිබ්බෙ නෑ.

"ඉඳගන්න..."

"ක..ම..ක් නෑ අයියේ... මං මෙ..හෙම ඉ..න්..න..ම්..."

උපේක්ෂා කාපට් බිම කොණකට ගුලි උනා. හා පැටියෙක් වගේ මෙහෙම බයෙන් ඉන්නේ ඇයි කියලා අහන්න තාරකට හිතුණා.

"ම.. මං ස්වීටර් ගෙනත් නෑ... මේක ඇඟට දාගන්න... සීතලයි..."

තාරක ඇඳ මත තිබ්බ පොරවන රෙද්ද ඇයගේ උකුලට දැම්මා. උපේක්ෂා එය රැගෙන දෙඋර මතින් දමා ගත්තා. මේ රෑ ඔහු වගේ කරුණාවන්ත කෙනෙක්ගේම කාමරයට දෛවය තමාව එව්වේ ඇයි කියලා උපේක්ෂා හිතුවා.

තාරක ඇය ළඟම තිබ්බ කුෂන් පුටුවට බර වුණා.

"මො..නාද මේ කරන්නේ... මහත්තයා එක්ක ප්‍රශ්නයක් උනාද...

මේ බැන්ද දවසෙම..."

ඔහු මෘදු හඬින් ඇහුවේ. කෙල්ලගේ දෑස් බිමට බරවුණා. මදට්ය ඇට වගේ කඳුළු කාපට් එක උඩට සට සට ගාලා වැටුණා.

"ම..ට ක..ර..න්..න දෙ..ය..ක් ති..බ්බේ නෑ... මා..ව බ..ලෙ..න් ව..ගේ බැ..න්දුවා... ඊත්..."

"ම.. ඉතින්..."

"ජීවිතේ අ..ද රෑ බි..ලි දෙ..න්..න ම..ට බෑ... මං කා..ම..රෙන් පැ..නලා ආවා..."

"මේ රෑ මෙ..හෙම ගිහින් ඊට වඩා කරදරයක්නේ වෙන්නේ... මේ රෑ මේ නුවරඑළියේ කොහේ යන්නද... ඔයා ගෑණු ළමයෙක්..."

"අපිරිසිදු වෙලා ජීවිතේ දුක් විඳ මැරෙනවට වඩා ම..ට..."

කියන්නට ගිය දේ ඇය ගිල ගත්තා.

"පිස්සු කියන්නේ..."

"අ..යියා එ..හෙම හි..ත..නව...ද..."

"ගෑණු ළමයින්ට කොහොමත් ටිකක් පිස්සු තමා..."

කෙල්ලගේ මුහුණ හරි අසරණයි... ඒ අසරණකම ඇරෙන්න වෙන දෙයක් තාරක ඒ මුහුණින් දැක්කේ නෑ.

"ම..ට අ..යියේ පා..න්..දර වෙනකල් වු..ට්ට..ක් ඉ..න්..න දෙ..න්..න... අයියට පින් සිද්ධවෙයි..."

ගෑණු ළමයෙක් එක්ක මේ සීතල නුවරඑළියේ රැයක් කාමරයක ගත කරනවයි කියන එක කොච්චර බරපතල දෙයක්ද කියලා තාරක දන්නවා. ඔහු කල්පනා කරද්දී උපේක්ෂාට ලොකු බයක් දැනුණා. "එහෙමම මට පිහිට වෙන එකක් නෑ." උපේක්ෂා සිතුවේ ලොකු දුකකින්.

"අ..යියට කරදරයක් වෙයි... කම..ක් නෑ... මං.. වු..ට්..ට..ක් රෑ වෙ..න..ක..ල් ඉ..ඳලා ය..න්..න..ම..."





මේ රෑ මේ කෙල්ල කොහේ යන්නද... එහෙම යනවා නම් තමා කරන්නේ මනුස්සකමක් නෙමේ කියලා තාරකගේ හිත කිව්වා.

"එයත් එ..ක්..ක ඇත්තටම ඉන්න බැරිද..."

"ඔ..ව්... මාව රැ..ක්..කේ ම..ගේ තා..ත්..තා... එයා නැතිලනා..."එ..යා ජීවත් වෙ..ලා හිටියනම් මට මෙ..හෙම වෙ..න්..නෑ..."

මේ අද රෑ වෙච්ච සිදුවීම කෙල්ලගේ පිස්සුවක් කියලා හිතන්න තාරකට හිතෙන්නේ නෑ. "මූණේ හරි පිරිසිදු පාටක් තියෙනුවා..." තාරක යංතමට ඒ මූණ දිහා බලලා හිතුවා.

"දැන් එයා මොනවා කරයිද... සමහර විට පොලීසියට කියයි... පොලීසියෙන් ඇවිත් හොටෙල් රූම් සර්ච් කරයි.. නේ..ද..."

"එ..හෙම ක..රයිද..."

"කියන්න බෑ බල..මු..."

තාරක නැගිට්ටා.

"අද දවල්ද වෙඩින් එක තිබ්බෙ..."

"ම..."

"වෙඩින් එකට කලින්නේ ළමයෝ මේ තීරණේ ගන්න තිබ්බෙ..."

"ම..ට ආ..ත්..ම ශ..ක්..ති..ය..ක් ති..බ්බෙ නෑ..."

"දැන් කොහොමත් නීතියෙන් ඔයා එයාගේ වයිෆ්..."

කෙල්ල බිම බලාගත්තා... කෙනෙක්ගේ බිරිඳ වෙන්නේ නීතියෙන් නෙමේ, ආත්මයෙන්... බැඳෙන්න ඕන ආත්ම දෙකක්. කසාද සහතිකේ අත්සන් තිබ්බට කසාදයක් ඇතිවෙන්නේ නෑ. ඇය එහෙමයි හිතුවේ.

"කා..ලා නෑ නේ..ද..."

කෙල්ල කතා කළේ නෑ. සමහර වීට ඇය වේල් තුන හතරක් කාලා නැහැ කියලා තාරකට හිතුණා. අච්චර ගින්දරක් තියාගෙන කොහොම කන්නද...



www.sinhalaelibrary.com

"අයියා පහළට ගි..හි..න් කෑම කා..ලා එ..න්..න... මං ඉ..න්..න..ම..."

තාරකට හීල්ලුනා. එහෙම කරන්න තරම් අකාරුණික වෙන්න ඔහුගේ මනුස්සකම ඔහුට ඉඩ දෙන්නේ නෑ. තාරක නැගිටලා ගිහින් ඇඳ අද්දර වූ කබඩ් එක මත වූ දුරකථනය අතට ගත්තා. ඔහු හෝටලයේ රූම් සර්විස් අංශයට කතා කළේ ඇය දිහා බලාගෙනමයි.

"රූම් නම්බර් ෆෝ ෆයිව් සික්ස්..."

"ඔව් සර්..."

"මොනවද ඩිනර් ගන්න පුළුවන්..."

"සර් පහළ බුෆේ එක දාලා තියෙන්නේ... දහයාමාර වෙනකල් බුෆේ ඕපන්..."

"බෑ... මට රූම් එකට මොනාහරි ගෙන්න ගන්න ඕන..."

උපේක්ෂාට පුදුම හිතුණා. ඔහු එහෙම කරන්නේ තමා වෙනුවෙන් කියලා ඇය දන්නවා.

"මොනවද ස..ර්ට ඕ..න..."

"ඉඳිආප්ප වගේ දෙයක්... කරි මොනවා හරි එක්ක... මට කෝපි එකකුත් ඕන..."

"රයිට් සර් එවන්නම්... සර් විතරනේ..."

"ඔ..ව්..."

කෑම අරගෙන එද්දී ඇයව නාන කාමරයට හරි යවනවා කියලා තාරක සිතා ගත්තා.

"දෙන්නෙක්ට කෑම ඕඩර් කළොත් සැක කරයි... බෙදාගෙන ක..මු..."

"ම..ට බ..ඩ..ගි..නි නෑ අ..යියේ..."

"එ..හෙම එපා... කෑම ටිකක් කාලා කෝපි ටිකක් බීලා හිතන්න මොනාද කරන්නේ කියලා... ජීවිතේ කියන්නේ සෙල්ලමක් නෙමේනේ..."





කෙල්ල බිම වකුටුවෙලා ඔහු දිහා බලාගෙන උන්නා.

"න..ම මො..ක..ක්ද..."

"මං.. මං අයියේ උපේක්ෂා..."

"මං තාරක... තාරක සෙනවිරත්න... අද වැඩකට නුවරඑළියට ආවා... පරක්කු උන නිසා පස්සේ නැවතුණා..."

"උ..දෙ..න්..ම ය..න..ව..ද..."

"ය..න්..න ඕ..න..."

ආයෙමත් ඒ ඇස් බිමට බරවුණා.

"දැන් හෝටලෙන් පිටවෙන එක ලොකු ප්‍රශ්නයක්... මේ ප්‍රශ්නේ හෝටලේම දන්නවා ඇති..."

උපේක්ෂාටත් මොනවවත් හිතාගන්න බැහැ.

"මං.. මං පා..න්..දර ය..න්..නම් අ..යියේ..."

"තනියම... මේ නුවරඑළියේ... කොළඹ කියලා හිතුවද... පාන්දරම මේ නුවරඑළියම පාළුයි... මුළු ටවුන් එකම නිදි... හරි කොහෙද දැන් යන්නේ..."

කෙල්ලට කියන්න උත්තරයක් එන්නේ නෑ.

"ය..න්..න ගිහින් මූ..ණ කට සෝදගන්න... අපි කෑම ටිකක් කාලා හිතමු..."

ඇය නැගිට්ටේ හිස වනමින්. තාරක නාන කාමරය වෙත යන කෙල්ල දෙස මොහොතක් බලා උන්නා. ඒත් සමගම දොරට කිසිවෙක් ගැහුවා... තාරක නාන කාමරයේ දොර හෙමිහිට විවර කළා...

"ස..ද්ද නො..ක..ර ඉ..න්..න.. හොඳද..."

"හා..."

උපේක්ෂා එහෙමම නාන කාමරයේ බිත්තියට බර වුණා. ජීවිතයේ ප්‍රථම වරට ඇගේ හිතේ පිරිමියෙක් ගැන ප්‍රසාදයක් ඇතිවුණා. ඔහු මේ

රාත්‍රියේදී තමාව රකිනා බව උපේක්ෂාට විශ්වාසයි. "සමහර වීට ඔයා වෙන්න ඇති තාත්තේ මේ මාව රකින්නේ..."

තාරක දොර ඇරියා. සේවකයෙක් ඔහු ඇණවුම් කළ රෑ කෑමත් කෝපිත් ගෙනවිත් තිබ්බා.

"සර්ට පහළට එන්න තිබ්බේ... අද හොඳ බුෆේ එකක් දාලා තියෙන්නේ..."

"අද සීතලයි... ඇඟටත් අමාරුයි..."

"සර්ට බියර් එකක් මොනවත් ගේන්නද..."

"එපා... කෝපි ඇති..."

සේවකයා ගිය පසු තාරක දොර වහලා ලොක් කළා.

"හ..රි දැ..න් මූ..ණ සෝදගන්න..."

තාරක ආයෙත් පුටුවකට බර වුණා. හිත නොහෙල්ලී තිබ්බොත් ලොකු දෙයක් කියලා ඔහුට හිතුණා. ජීවිතයේ අමාරුම රෑයක අසරණ වෙලා ඉන්න කෙල්ලව මේ රෑ කොහොමටත් කාමරයෙන් එළියට දාන්න ඔහුට හිතෙන්නේ නෑ. ඒත් මේ රෑයින් පස්සේ කෙල්ලව තමා සමඟ තියාගන්නත් බෑ. ඇයට යන්නටත් තැනක් නෑ කියලා තාරකට තේරෙනවා. එහෙම තැනක් තිබ්බනම් කෙල්ල මේ තීරණය ගන්නේ කසාදයට පෙරයි.

ඇය ආවේ සීතල වතුර පොදකින් මුහුණ තෙමාගෙන... අද නුවරඑළියට සීතලම දවසක්. තිබ්බාටත් වඩා ඒ මූණ දැන් එළියයි කියලා තාරකට හිතුණා.

"ඉඳි ආප්ප ටිකක් කමු..."

"අ..යි..යා ක..න්..න..."

"ක..න්..න..කෝ..."

තාරක නැගිටලා පිඟාන අරගෙන ඉඳිආප්ප බෙදුවා. මාළු කරි අල කරි පරිප්පු කරි සමඟ පොල් සම්බෝල ඉඳි ආප්ප වලට එවලා තිබ්බා.





සේවකයා රැගෙන ආවේ එක පිඟානයි. ඔහු ඒ එකම පිඟානේ මේ බෙදන්නේ තමාට කියලා උපේක්ෂා දන්නවා.

"ම් ක..න්..න..."

"අයි..ය..ට..."

"මං මේ පොල් සම්බෝල ප්ලේට් එකට ක..න්..න..ම්..."

"අයියා මේක ක..න්..න... මං චූ..ට්ටයි ක..න්..නේ... මට ඒක ඇති..."

කෙල්ල පිඟාන ගත්තේ නෑ. තාරක ඒ වෙලාවේ නම් හිනාවුණා.

"වෙඩින් එකෙන්වත් කෑවේ නැද්ද..."

ඇය බිම බලාගෙන නැහැයි කියන්න වගේ හිස සැලුවා. ගෑණු ළමයෙක්ට දෛවය සලකන්නේ හරිම පහත් විදිහටයි කියලා තාරකට හිතුණා.

"ඔය ඉඳි ආප්ප හතරනේ..."

"ම..ට ඇ..ති අ..යි..යේ..."

"තව දෙකක් දාගන්න..."

ඇය ඇත්තටම තව ඉඳි ආප්ප දෙකක් දාගත්තේ ඔහු කියූ නිසයි.

"මේ කෙල්ලට නම් ඇත්තටම පිස්සු තමා... ඔය පොල් සම්බෝල ටික එක්ක විතරක් කන්න පුළුවන්ද..."

තාරක එහෙම කියාගෙන නැගිට්ටේ ඇය පොල් සම්බෝල චුට්ටක් විතරක් බෙදාගෙන ඉඳගනිද්දී... තාරක මාළු දීසිය අල දීසිය ළඟට අරගෙන ඇයට බෙදද්දී උපේක්ෂා ඔහු දිහාම බලාගෙන උන්නා. "පුදුම කෙනෙක්" ඇය එපමණයි හිතුවේ.

"ක..න්..න... හාමතේ හිතන්නවත් පුළුවන්ද... කාලා කිරි කෝපි එකක් බොමු..."

තාරකට කද්දී ඇය දෙස බැලුණා. කෙල්ල ඉඳි ආප්ප කටක් කන්නේ දහසක් දේ සිතමින්. ඒ ඇස් තෙත් වෙන්නේ බලාගෙන ඉඳිද්දී කියලා



www.sinhalaelibrary.com

ඔහුට හිතුණා.

"උපේක්ෂා..."

ඔහු ප්‍රථම වරට ඇගේ නම කියලා කතා කළා.

"අයියේ..."

"මගේ කාමරේ ඉන්නවනම් මං කියන විදිහට ඉන්න ඕන... දැන් කන්න..."

"ම්..."

ඇය හිස වනලා ඉඳි ආප්ප දෙක තුනක් කෑවා. කෑම උගුරින් පහළට යන්නෑ. හිර වෙනවා.

"ඉ..න්න මං වතුර අරන් ඉන්නම්..."

උපේක්ෂා නැගිටින්න යද්දී ඔහු කිව්වා. තාරක වතුර වීදුරුවක් දාගෙන ඇයට දුන්නා.

"කා..ල..ම නෑ ව..ගේ..."

"ක..න්..න හි..තු..ණේ නෑ අ..යියේ..."

"තව ඉඳි ආප්පයක් දාන්නද..."

"මං කෝ..පි වු..ට්ටක් බො..න්..න..ම්..."

"කෝපි හදන්න දන්නවද..."

"ම්..."

"එහෙනම් කිරි කෝපි දෙකක් හදමු... එක කෝප්පයයි තියෙන්නේ... මට වීදුරුවට හදන්න..."

උපේක්ෂා අත සෝදගෙන ඇවිත් පුංචි ටීපෝව ළඟ දණින් හිට ගත්තා. මෙහෙම ගෑණු ළමයෙක් දැක්කමයි කියලා තාරක හිතුවා.

"සී..නි වු..ට්ටයි දැ..මමෙ..."

ඔහු අත සෝදගෙන එද්දී ඇය පිරිසි කෝප්පයට කිරි කෝපි එක හදලා දෝතින්ම දුන්නා.





"නාම ෂුගර් නෑ..."

"මං තව හැන්දක් දාන්නම්..."

ඇය ඔහු අතේ තිබ්බ කෝප්පයට සීනි හැන්දක් දාලා දිය කරද්දී ඔහු ළං ළංව ඒ මූහුණ දිහා බලා උන්නා. තාරකගේ හිත මොහොතකට හෙලවිලා වගේ ගියා. මේ රූපෙත් එක්ක ජීවිතේ මොකක් හරි අතීත සම්බන්ධයක් තියෙනවද කියලා ඔහු තමාගෙන්ම ඇහුවා.

"මෙයාට කැමති උනේ නැත්තේ බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් උන්න නිසාද..."

"ම..ට..."

"ඕ..ව..."

"එ..හෙම කෙ..නෙ..ක් ඉ..ඳ..ලා නෑ..."

මොකක්දෝ හේතුවක් නිසා කෙල්ල කියන්නේ ඇත්ත කියලා තාරකට හිතුණා. එහෙම ඉඳුල් වූ පාටක් ඒ මූහුණින් ඔහු දැක්කේ නෑ.

උපේක්ෂා වීදුරුවට කෝපි එකක් හදාගෙන පුරුදු බිම වාඩිවුණා. අහිංසක ගෑණු ළමයි මෙහෙම මුළු වලට කැමතියි.

"ම..ට උපේක්ෂාට එක උදව්වක් ක..ර..න්..න පුළුවන්..."

"ජීවිතේ ක..ර..න ලො..කු..ම උපකාරේ අයියා ම..ට ක..ළා අ..යියේ..."

කෙල්ලට ඒ වචන ටික කියන්නට ඕන වුණා.

"මං කොහොම හරි හෝටලෙන් එළියට ගන්නම් ඔයාව... ය..න්..න තැනක් තියෙනවනම් ගිහිල්ලත් දාන්නම්..."

"මා..ව අ..යි..යේ නුවරඑළිය ස්ටෑන්ඩ් එ..කෙ..න් දා..න්..න... ඒ ඇති..."

"කො..හෙද ය..න්නේ..."

"බ..ස් එ..කට නැ..ග..ලා හි..ත..නවා එ..හෙම ය..න්න තැනක්.. එ..කපාර ම..ත..ක් වෙ..න්..නෑ..."

තාරක ඒ මුහුණ දිහා බලාගෙනම උන්නා.

"ඔයා වටිනා ගෑණු ළමයෙක්... ඒ..හෙම ගිහින් කොහොමද..."

"ගෑ..ණු ළ..ම..යෙ..ක්ගේ ජීවිතේට ඒ..හෙම වටිනාකමක් නෑ අයියේ... ගෑ..ණු ළමයි හ..රියට ගාණක් දාපු නැති චෙක් එකක් ව..ගේ... ඒ ජීවිතේට වටිනාකමක් දෙන්නේ එයාගේ ජී..වි..තේට ළං වෙ..න අය... චෙක් එකේ ගාණ ලියන්නේ එයාලා..."

මෙහෙම කතා කරන කෙල්ලට පිස්සු කියලා ඔහු කිව්වේ කොහොමද...

"ඔයාගේ ජීවිතේට වටිනාකමක් දෙන කෙනෙක් කවදහරි ලැබෙයි... එතකල් පරිස්සම් වෙලා ඉන්න ඕනනේ..."

"මං කා..ම..රෙන් දු..ව..ගෙ..න ආ..වෙ..ත් ඒ..ක..යි... ඒ අපිරිසිදු මොහොතට මූ..ණ දෙ..න්..න ම..ට බෑ..."

"ම..ට තේ..රෙ..න..වා... දැන් ඕක බො..න්..න..."

තාරක කරුණාබරව කීවේය.

කිරි කෝපි ටික නම් කෙල්ල ආශාවෙන් බොනවා තාරක දැක්කා. රෑට තව කෝපි ටිකක් ගෙනල්ලා තියනවා කියලා තාරක හිතාගත්තා. අද රෑ කෙල්ල නිදාගන්නෑ කියලා ඔහු දන්නවා. සමහර විට මේ රෑ ඇගේ ජීවිතයේ අමාරුම රාත්‍රිය වෙන්නත් පුළුවන්.

"අ..යි..යේ..."

උපේක්ෂා කෝපි කෝප්පය තියල ඔහු ළඟ නතර වුණා.

"මං.. ද..න්..න..වා... මෙ..හෙ..ම ඉ..න්..න එක අයියට ප්‍රශ්නයක්... මං.. මං ඒ..හෙම කරදර කරන්න හිතුවේ නෑ..."

තාරක හිනාවුණා. ඒ හිනාව තව කොහෙදි හරි දැකලා තියෙනවයි කියලා උපේක්ෂාට හිතුණා.

"ඕ..හොම ඉඳගන්න... දැන් මෙතන ප්‍රශ්නේ මට ඔයාව ප්‍රශ්නයක්





වෙන එක නෙමේනේ..."

"ඒත්..."

"ඔ..යාගේ ජීවිතේ ගැන හිතන්න..."

"කො..හෙම හිතන්නද ඒක..." උපේක්ෂා හුල්ලලා වගේ හිතුවා.

*** *** *** ***

ඒත් සමගම වගේ ඔහුගේ ජංගම දුරකථනය නාද වුණා... තාරක ගිහින් එය අතට ගත්තා. "ඒ අස්සේ දිල්කිත් කතා කරනවා..." තාරක නාද වෙන ජංගම දුරකථනය අතේ තියාගෙන උපේක්ෂා දෙස බැලුවා.

දැන් කරන්න දෙයක් නෑ. මේ කෝල් එකට ආන්සර් කළේ නැත්නම් ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා.

තාරක නොහිතාම ඇමතුම සම්බන්ධ කර ගත්තා.

"කිය..න්..න දිල්..."

උපේක්ෂාගේ නෙත් බිමට බර වුණා. මේ කතා කරන්නේ එක්කෝ ඔහුගේ පෙම්වතිය. නැත්නම් බිරිඳ. මං එයාට ලොකු ප්‍රශ්නයක් දාන්නේ. උපේක්ෂා නෙත් කාපට් බිමට බර කරගෙන හිතුවා.

"ඔයා ඔය කොහෙද ඉන්නේ..."

දිල්කි ඇහුවේ ටිකක් තදින්.

"මං දිල් මේ නුවරඑළියේ..."

"තා..ම මො..නාද නුවරඑළියේ කරන්නේ... වැ..ඩේ ඉවර වුණා කිව්වේ හතරටනේ..."

"දැන් ඉතින් උත්තර දීපංකෝ..." තාරක සිතුවේ කේන්තියෙන්. "ප්‍රශ්න මවන්නෙම ගෑණු" ඔහු බිම කරබාගෙන ඉන්නා උපේක්ෂා දිහා බලාගෙන හිතුවා.

"ඔව් හතරට තමයි... අද මේ පාරවල් වල එන්න බෑ දිල්කි... දිගටම



www.sinhalaelibrary.com

මිස්ට් එක... ඇරත් හරි මහන්සියි..."

"ඉ..තින්..."

"ඉතින් මීදුම මැද්දේ වාහනේ ඩ්‍රයිව් කරලා සියදිවි නසාගන්නද... නැවතුණා..."

"කො..හෙද..."

"නුවරඑළියේ මගේ බාප්පගේ ගෙයක් තැනේ දිල්... නැවතුණේ හෝටලේක..."

"මං දන්නවා... මොන හෝටලේද..."

"මේ.. ග්‍රෑන්ඩ් එකේ..."

"දැ..න් ඔයා ඉන්නේ ග්‍රෑන්ඩ් එකේ..."

"ඔ..ව්..."

"හරි.. බබා... මං ළඟ ග්‍රෑන්ඩ් එකේ නම්බර් එක තියෙනවා... මං ග්‍රෑන්ඩ් එකේ නම්බර් එකෙන් ගන්නම්..."

"ඇයි සැකද මාව..."

"මං ග..න්..න..මකෝ..."

"හරි ග..න්න..."

"රූම් නම්බර්..."

"ෆෝ ෆයිව් සික්ස්..."

ඇමතුම කට් වුණා. තාරක දිග සුසුමක් හෙලලා උපේක්‍ෂා දිහා බැලුවා.

"ඒ මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්... ළඟදි ඉඳලා සී අයි බී එකේ වැඩ කරන්නේ..."

එවර නම කෙල්ල තොල් පට තද කරලා හිනාවෙලා බිම බලා ගත්තා.

"මං ග්‍රෑන්ඩ් එකේ ඉන්නවා කියලා කිව්වාම ගෑණිට විශ්වාස නෑ...





ඔය හොටෙල් එකේ ජෙනරල් ලයින් එකෙන් මට ගන්නේ... කා..ට කිය..න්..න..ද මේ දු..ක..."

තාරක හෝටලයේ දුරකථනය නාද වෙද්දී එය එසෙව්වා...

"දැන් හරිද..."

"හ..රි හ..රි..."

උපේක්‍ෂා සුසුම් ගාලා නහය උඩට ඇද්දා... ඇය පස්සේ එහෙමම තොල් පට තද කර ගත්තා.

"තා..ර..ක..."

"ඇයි..."

"ක..වුද කාමරේ ඉන්නේ..."

"කවුරු ඉන්නද..."

"මට නහය හූරන සද්දයක් ආවනේ..."

"බූතයෙක් වෙන්න ඇති..."

"බූතයෙක්ද බූතියෙක්ද..."

"දි..ල්.. මට මහන්සියි..."

උපේක්‍ෂාට දුක හිතුණා. ඔහු වගේ කෙනෙක්ව එහෙමම සැක කරන එක හොඳ නෑ.

"හෙට පාන්දරම එන්න ඕන..."

"බලමු..."

"මොනාද බලමු කියන්නේ..."

"කවුද දන්නේ හෙට කඳු නාය යයිද කියලා... මේ වහින වැස්සට..."

"නුවරඑළියෙන් එන්න එක පාරක් නෙමෙනේ තියෙන්නේ... උදෙන්ම එන්න... අම්මටත් ඔයත් එක්ක කතා කරන්න ඕනලු..."

"හො..දයි..."

"හරි බබා.. ගුඩ් නයිට්..."



www.sinhalaelibrary.com

"ගු..ඩ් නයිට්..."

උපේක්ෂා බිම බලාගෙනම උන්නා. තාරක ඇවිත් ඉඳගත්තේ නළලත මිරිකාගෙනමයි.

"අහපං කෑවද කියලා... බිව්වද කියලා... සීතලද කියලා... මහන්සිද කියලා... මරු කට්ටිය... මං ඔයාට දෙයක් කියන්නද.."

තාරක කෙල්ල දිහා බලලා ඇහුවා.

"ම්..."

"කෙනෙක්ව පපුවේ අලව ගන්න ඕනකමට වතුර ටිකක් ගාල හරි එයාව අලවගන්න හදන්නෙපා... එහෙම කළාම මොනාද දන්නවද වෙන්නේ... මේ මට වෙලා තියෙන්නේ..."

"ද..න්..නෑ... මං.. ආ..ද..රේ ක..ර..ලා නෑ..නේ..."

"එහෙම කළාම වෙන්නේ ටික දවසකින් අර වතුර ටික වේලුනාම කොළේ පපුවෙන් ගැලවිලා යනවා..."

"ම්..."

"දෙන්නෙක් ලව් කරනකොට හොඳට ඇලවෙන්න ඕන... මො..නවයින්ද දන්නවද..."

"නෑ..."

"ආදරේ කරද්දී ජූස් එකක් වගේ ගම් එකක් හැදෙනවා... ඒකෙන් තමා ඇලවෙන්න ඕනා... මං කියන්නේ කුණුහරුපයක් නෙමේ... එනකොට ගැලවෙන්නෑ... අලවගන්න ඕන නෑ... ඇලවෙනවා නිකම්ම... ඒක තමා ඇත්ත... ඔය ඇලවිලා ඉන්න ගොඩක් අය වතුර ගාලා අලවගත්ත අය... වේලුනාම ගැලවෙනවා..."

උපේක්ෂා බණක් අහන් ඉන්නවා වගේ අහගෙන උන්නා. මෙහෙම ජීවිතේ කියලා දෙන්න කෙනෙක් ඇගේ ජීවිතයේ උන්නේ නෑ.

"හ..රි... දැ..න් ඔයාගේ ප්‍රශ්නෙට එමු... කො..හෙද උදේට යන්නේ..."





උපේක්ෂා ඔහු දෙස බැලුවේ හරි අසරණ බැල්මකින්. ඒ ප්‍රශ්නය තමාගෙන් අහන්නේ නැත්නම් හොඳයි කියලා ඇයට හිතුණා.

"ඔ..යා..ට ය..න්..න තැනක් නැද්ද..."

කෙල්ල දෙපසට හිස වැනුවා.

"එ..හෙ..නම් නුවරඑළිය ස්ටෑන්ඩ් එකෙන් දාන්න කි..ව්..වේ..."

ඒ ප්‍රශ්නයට කෙල්ලට උත්තර නෑ.

"ගෙදර ය..න්..න..ත් අමාරුද..."

"ගි..යො..ත් මෙයාටම මා..ව දෙ..න..වා... එයා අ..ම්මා කෙනෙක් නෙ..මේ... මෙයාගේ මාමා එ..ක්..ක... ගෙ..දරමයි ඉ..න්..නේ... ඒක මහ අප්පිරිය හි..තෙ..න ගෙ..ය..ක්..."

තාරකට කෙල්ල කියනා දේ හොඳට තේරෙනවා. ඔහුට පුදුම එහෙම ගෙදරක මේ තරම් පිරිසිදු කෙල්ලෙක් උන්න එක.

"මා..ව ර..ක්..කේ ම..ගේ තා..ත්..තා... එ..යා... නැ..ති වු..ණා... ඊට ප..ස්සේ ත..මා මේ ඔ..ක්..කො..ම..."

තාරක සෑහෙන වේලාවක් කල්පනා කළා. ඔහුගේ හිතටත් මොනවවත් එන්නේ නෑ.

"අ..පි තව කෝපි ටි..කක් ගෙන්න ගමු..."

"ක..ම..ක් නෑ අ..යියේ... අයියා නි..දා ග..න්..න... මහන්සිත් ඇතිනේ..."

"වෙඩින් එකක මනමාලි වෙලා ඉන්න එක ඊට වඩා මහන්සිනේ.. නේ..ද..."

උපේක්ෂා බිම බලාගෙන උන්නා.

"රූම් නම්බර් ෆෝ ෆයිව් සික්ස්... මට කෝපි ටිකක් එවන්න..."

"ඕ..කේ ස..ර්..."

තාරක ඉඳගත්තේ උපේක්ෂා දෙස බලාගෙනමයි. කෙල්ලගේ අසරණ මුහුණ දැක්කාම ඔහුගේ පපුවටත් මොනවද දැනෙනවා. මනුස්සකම



www.sinhalaelibrary.com

නාමයෙන් වත් කෙල්ලට පුංචි පිහිටක් වෙන්න තියෙනවා නම් හොඳයි.

"මො..නවද මැරි කරන්න කලින් කළේ..."

"ඒ ලෙ..ව..ල් කළාට පස්සේ මෙ ඇඳුම් ඩිසයිනිං කෝස් එ..ක..ක් කළා..."

"පැට්න් මේකිං..."

"ඔ..ව්..."

"ඇයි ඒවගේ දෙයක්ම කළේ..."

"තා..ත්..ත..ට පොඩි ගාමන්ට් ෆැක්ටරියක් තිබ්බා... තා..ත්තා කිව්වේ ඒක කවදහරි මට කරන්න වෙනවා කියලා..."

"ඉ..තින්..."

"දැන් ඒක වැඩක් නෑ..."

"ඒකට දැන් මොකද වුණේ..."

"මේගොල්ලෝ තමා ඒවා දැන් කරන්නේ..."

කෙල්ලට වෙලා තියෙන්නේ මොකක්ද කියලා දැන් තාරකට හොඳට වැටහෙනවා.

"උපේක්ෂා..."

"අ..යියේ..."

"මං ට..වු..ම..ට ගිහින් ස්විටර් එකක් ගෙනත් දෙ..න්..න..ද..."

"ක..ම..ක් නෑ අයියේ... මේ ඇති..."

"දිගටම වහියි..."

"ම්..."

තාරක නැගිටලා හෝටල් කාමරයේ දිග ජනේලය ළඟට ගියා. ඔහු ජනෙල් තිරය මෑත් කරලා නුවරඑළියට වහින වැස්ස දිහා මොහොතක් බලා උන්නා.

"එයාගේ වාහනේ මොකක්ද..."





"ර..තු පාට පොඩි ජීප් එකක්..."

"මං බලන්නම් ඒක තියෙනවද කියලා පාක් එ..කේ..."

"මේ වැ..ස්..සේ..."

"අපි බලමුකෝ..."

කෝපි අරගෙන සේවකයා එද්දී පුරුදු විදිහට උපේක්ෂා නාන කාමරයට ගියා. ඔහු ගියාට පස්සේ තාරක ඇයට කතා කළා.

"කෝ..පි ටි..කක් බො..න්..න... මං පහළට ගිහින් බලලා එන්නම්... නැත්නම් ඔයාගේ ජීවිතේ අවදානම්... කවුරු ආවත් දොර අරින්නෙපා... මං තුන් පාරක් දොරට ගහනවා... එතකොට අරින්න..."

"ම්..."

"කෝපි එ..ක..ක් බීලා ඉ..න්..න..."

ඔහු ගියේ කෙල්ලගේ හිස අතගාගෙනමයි. තාරක ගියාට පස්සේ උපේක්ෂා දොර වසාගෙන එහෙමම ඇඳට වැටුණා. ඇයට ඇඬුණා. "අනේ දෙයියනේ මො..නවද මගේ ජීවිතේට වෙන්නේ" උපේක්ෂා කඳුළු අතරින් සිතුවාය.

*** *** *** ***

තාරක ග්‍රෑන්ඩ් හෝටලයේ වාහන අංගනයට ගියේ කුඩයක් ඉහලාගෙනමයි. ඔහු වාහන අංගනයේ දෙතුන් පාරක්ම එහාට මෙහාට ගියා. ඒත් කෙල්ල කියපු රතු පාට පොඩි ජීප් රියක් නම් තිබ්බෙම නෑ.

තාරක ඊට පස්සේ වේගයෙන් හෝටලයේ පිළිගැනීමේ කවුන්ටරයට ආවා.

"ම..ට පො..ඩි හදිස්සියක් වෙලා කොළඹ යන්න වෙලා... මගේ බිල් එක බලනවද..."

"ස..ර් දැන්මම ය..නවද..."

"ඔ..ව්..."

"රයිට් සර්... බඩු පැක් කරගෙන එන්න අපි බිල රෙඩි කරලා තියන්නම්..."

"ඕ..කේ..."

තාරක එහෙමම උඩට දුවගෙන ගියා. ග්‍රෑන්ඩ් හෝටලයේම දිගටම ඉඳීම කෙල්ලගේ ජීවිතයට අවදානමක් බව ඔහු දන්නවා. උදේට පොලීසියෙන් ඇවිත් කාමර පරීක්ෂා කරන්න පුළුවන්. ඊටත් උදේ යද්දී හැමෝටම පේනවා. දැන්මම ගියොත් කාටවත් පේන්නේ නෑ.

තාරක තුන් පාරක් කාමරයේ දොරට තට්ටු කළා. කෙල්ල දොරට සැඟවී ගෙන දොර විවෘත කළා.

"උපේක්ෂා..."

"අ..යියේ..."

"මෙ..හේ එ..න්..නකෝ... අපි දැ..න් මෙ..හෙ..න් ය..න්න ඕ..න... එයාගේ වාහනේ හොටෙල් පාක් එකේ නෑ... සමහර විට පොලීසියට ගිහින් ඇති... අපි ඉක්මනට මෙතනින් යන්න ඕන... වෙන තැනක නතර වෙමු..."

"ම.. අ..යි..යා කි..ය..න දෙ..ය..ක්..."

ඇයට ඔහුව විශ්වාසයි.

"මේ ම..ගේ වාහනේ යතුර... තේරුණාද..."

"ම..."

"හොටෙල් එකෙන් එළියට ගිය ගමන් වම පැත්තේ පාක් එක තියෙනවා... මගේ කාර් එක සුදු පාටයි... එස් ඩබ්ලිව් තිස්තුනයි තිස්දෙක නම්බරේ... ගිහින් පිටිපස්සෙ සීට් එකේ ඉඳගන්න... මං බිල් ගෙවලා එ..න්නම්..."



ආදරය ගින්දරක්

"මා..ව අ..යි..යේ ක..වු..රු හරි දකියිද..."

"දැන් වැඩිය කවුරුවත් පහළ නෑ ය..න්..න... වහිනවනේ... මං කුඩයක් අරන් ආවා... තෙමෙන්නැතුව ය..න්..න..."

උපේක්ෂා පුදුමයෙන් වගේ බලා උන්නා. මෙහෙම කියන කෙනෙක් ජීවිතයේ හමුවූ එකත් හරි පුදුමයක්.

"බිම බලාගෙන ය..න්..න... ආ.. මේ ෂර්ට් එක ඔතට උඩින් නිකං දාගෙනම යන්න..."

ඔහු ඔහුගේ කමිසයක් කෙල්ල අත තිබ්බා. ඇය එය වතට දමා ගත්තේ ඔහු දෙස බලාගෙනමයි. නිල් පාට කොටු කමිසේ ඇන්දාම ඇයට ආවේ වෙනස්ම පෙනුමක්. මොනවද කියන්න ගිහින් ඔහු ඒක නතර කර ගත්තා.

"ම.. ය..න්..න.. දුවන්න යන්නෙපා.. සාමාන්‍ය විදිහට ය..න්න... පාක් එකේ සුදු පාට කාර් එකකට තිබ්බේ මගේ කාර් එක විතරයි... හිමිහිට යන්න..."

"ම..."

ඔහු හිමිහිට දොර ඇරලා දුන්නා. උපේක්ෂා ඔහු දෙස බැලුවේ වෙව්ලන දෝතින් කුඩය ඉහලාගෙනමයි.

"ය..න්..න ඔයාට මොනවත් වෙන්නෑ... බුදු සරණයි..."

උපේක්ෂා ලී කොරිඩෝව දිගේ ඇවිදගෙන ගිහින් අන්තිමට හැරිලා බැලුවා. ඒ ජීවිතයේ දුටු අසරණම අහිංසකම දර්ශනය කියලා තාරකට හිතුණා.

උපේක්ෂාට ඔහු ගැන පුදුමයි. ඔහු ගැන අහිතක් බියක් හිතෙන්නෙම නෑ. ඔහු මේ සියල්ල කරන්නේ තමාව ආරක්ෂා කරන්න කියලා උපේක්ෂාට දැනෙනවා. මේ දෛවෝපගත රෑ ඔහු වගේ කෙනෙක් හමුවීමම පුදුමයක්. "ඔයාට පේනවද තාත්තේ මාව..." උපේක්ෂා ලී තරප්පු



www.sinhalaelibrary.com

පෙළ බැසගෙන ගියේ තාත්තාට එහෙම කියමින්.

ඇය පහළට ගියේ පපුව ගැහෙද්දී... මේ යන මගක රංග හිටියොත් තමාව ඉතුරු කරන්නේ නෑ කියලා ඇය දන්නවා. ඔහු කීවාක් මෙන්ම හෝටලයේ පහළ වැඩි සෙනගක් උන්නේ නෑ. මේ සීතලේ කවුරුවත් කාමරෙන් පිටතට එන්නෑ.

උපේක්ෂා හෝටලයේ දොරකඩට ආවේ බිම බලාගෙනමය. දැන් දැන් හෝටලයේ ලොබිය හරහා රංග එයි කියලා කෙල්ලට බයක් දැනෙනවා. ඒ බියකරු මොහොත කවදාවත් ජීවිතේ උදාවෙන්න එපා කියලා ඇය පැතුවා.

හෝටලයේ දොරකඩ උන්නේ ග්‍රෑන්ඩ් හෝටලයේ ආරක්‍ෂක නිලධාරියෙක් පමණයි. ඔහුත් වේගයෙන් වැටෙන වැස්ස දිහා වකුටු වෙලා බලාගෙන උන්නා.

"මි..ස් එළියට ය..න්..න..ද... වැස්සනේ..."

කෙල්ලෙක් මේ රෑ හෝටලෙන් පිටතට යද්දී පුදුමයි.

"නෑ.. මේ වා..හ..නේට ටිකක් ය..න්..න... බෑ..ග් එ..ක ග..න්..න..."

"ඉ..න්..න.. මිස් මං කුඩේ අල්ලන්නම්..."

"ක..ම..ක් නෑ..."

උපේක්ෂා එහෙමම කුඩය ඉහලාගෙන මහ වැස්සට ගියා... එළිය අයිස් මිදෙන තරම් සීතලයි. ඒත් කෙල්ලව වෙව්ලන්නේ ඒ වැසි සීතලට තෙමේ... හිතේ බයට...

ඔහුගේ වාහනය තිබ්බේ ලොකු ගහක් යට නතර කරලයි... උපේක්ෂා වෙව්ලන සුරතින් එහි යතුරු කටට යතුර දැම්මා. ඔව්... ඒ ඔහුගේ වාහනය. දොර ඇරුණා... උපේක්ෂා ඔහු කීවාක් මෙන්ම වාහනයේ පිටුපස අසුනට ගුලි උනා. වාහනය ඇතුළත චුට්ටක් උණුසුම්... උපේක්ෂා පිටුපස අසුනේ ගුලි ගැහිලා හෝටලය දිහා බැලුවා. අද මේ හෝටලයට





ආවේ යක්‍ෂයෙක් සමඟ... මේ මහ රෑ මේ හෝටලයෙන් යන්නේ දෙවියෙක් සමඟ. ඇයට එහෙමයි හිතුණේ.

පිරිමියෙක් විශ්වාස කරන්න හරි අමාරුයි. මේ රෑයේ ඕන නම් ඔහුට මේ ජීවිතේ රැකගත්ත හැම දෙයක්ම උදුර ගන්නට පුළුවන්... ඒත් එහෙම බියක් උපේක්ෂාට දැනෙන්නේ නෑ.

වැස්ස දැන් තවත් වැඩි කළා... නුවරඑළියට වහින්නේ පුදුමාකාර වැස්සක්... මේ වැහි සීතලේ තමාගේ මුළු ජීවිතේම නැතිවෙලා යන්න තිබ්බා. ඒ පිරිසිදුකම රැකගෙන මෙහෙම දුකක් විඳින්න උනාට උපේක්ෂාට දුකක් දැනෙන්නේ නෑ. "මේක ඊට වඩා උතුම් කෙනෙකුට පූජ කරන්න ඕන ජීවිතයක්. හැම කෙල්ලෙක්ම වගේ ඇයත් එහෙම හිතුවා. ඒත් ජීවිතයට එහෙම කෙනෙක් ලැබෙයිද. දන්නෑ.

තාරක ඉක්මනින් ඇඳුම් පැක් කරගෙන පහළට ආවා. කෙල්ල ගැන ඔහුට බයයි. හෝටලෙන් කොහොම පිටඋනාද දන්නෑ. ඔහුට හිතෙනවා.

පහළ පිළිගැනීමේ කවුන්ටරයට තාරක ඉක්මනින් බිල්පත ගෙව්වා.

"වැ..ස්..ස ස..ර්.. ඉන්න මං කුඩේ අල්ලන්නම්..."

ආරක්‍ෂක නිලධාරියා තාරකට කුඩේ ඇල්លුවා. කෙල්ල පිටුපස ආසනයේ ඉන්නා නිසා වාහනය ළඟටම ඔහුව රැගෙන යන්නට තාරකට බයයි. අද සිදුවූ මේ සිදුවීම හෝටලයේ බෝහෝ අය දන්නවා. "හනිමූන් ආපු කෙල්ලෙක් පැනල ගිහින්..." පහළදී සේවකයෙක් තවත් සේවකයෙකුට කියනවා ඉස්සෙල්ලා තාරක අහගෙන...

"හ..රි මේ හරිය තෙමෙන්නෑ... ඔයා ය..න්..න..."

ගස් තියෙන හරියේදී තාරක කිව්වා.

"මං බෑග් එක වාහනේට දාන්නද සර්..."

"නෑ කමක් නෑ..."

වාහනයේ යතුර තිබ්බේ ඇය ගාව... තාරක වාහනයේ දොර ඇරියේ



www.sinhalaelibrary.com

වැහි බිංදු වතට කඩාගෙන වැටෙද්දී...

"ය..තුර දෙ..න්..න..."

ඔහු හිම්හිට කිව්වා. සුදු අත කළුවරේ පිටතට ආවා... තාරක එය අතට ගත්තේ මෘදු සිනහවකින්. ඔහු වාහනයේ ඩිකියට බෑග් එක දාලා එහෙමම රියදුරු අසුනට බරවුණා.

"උපේක්ෂා..."

"අ..යියේ..."

"මො..න..ව..ත් උ..න්..නෑ නේ..ද..."

"නෑ අයියේ.."

"ඔ..හොමම පාත්වෙලා ඉ..න්..න..."

උපේක්ෂා පිටුපස අසුනේ පාමුල බිම ඉඳගත්තා. තමන්ගේ ජීවිතයේ පිවිතුරුකම වෙනුවෙන් මෙහෙම දුක් විඳින කෙල්ලෙක් තාරක දැකලා නෑ. එහෙම කෙල්ලෙක්ගේ පිවිතුරු බව කොච්චර ආරක්ෂා කරන්න ඕනද කියලා තාරක දන්නවා.

ඔහු වාහනය වේගයෙන් ග්‍රෑන්ඩ් හෝටලයෙන් පිටතට දැම්මා... තාරකගේ මුවින් සැනසුම් සුසුමක් පිටවුණා... "හොඳ වෙලාවට ගේට් එකෙන් වාහනේ බැලුවේ නෑ..." තාරකට හිතුණා.

*** *** *** ***

මීලඟ "සඳරාජිනී" කලාපය සමඟ
තවත් රසබර කොටසක්...






www.sinhalaelibrary.com

"හැමදාම මට මොකක්ද අඩුවක් දැනුණා...
ඒක විස්තර කරන්න මට තේරෙන්නේ
නැ... නිකං මොකක්ද දෙයක් නැගෑ වගේ
මට නිතරම දැනෙන්න ගත්තා... ගිය
ආත්මෙක මට තිබුණ දෙයක් මේ ආත්මේ
මට නැ වගේ මට දැනෙන්න ගත්තා... මම
ගොඩක් හිතුවා... ඇයි මට මෙහෙම
හිතෙන්නෙත් කියලා... ඒත් තේරුමක්
තිබුනේ නැ... එක දවසක මම ඔයාව
දැක්කා... ඔයාගේ ඇස් දෙක මගේ ඇස්
ඉස්සරහට ආවා... එදා මට පුදුම හිතුණා...
පස්සෙන් පහු මම තේරුම් ගත්තා මේ
ආත්මේ අඩුවක් වගේ තේරුණේ ඔයා
තේරුණේ ඔයා නැති එක කියලා...
මගේ ජීවිතේ මේ දැනෙන අඩුව ඔයා
කියලා මම හරියටම තේරුම් ගත්තා...
මොකයි... අපි පහුගිය ආත්මෙක එකට
උන්නා... සමහරවිට මේ ආත්මෙට
ළඟම තිබුණ අතීත ආත්මේ වෙන්න
ඇති... ඉතින් මොකද කරන්නේ... ඔයා
හිතනවද මට මේ ආත්මේ ඔයා නැතුව
ජීවත්වෙන්න පුළුවන් කියලා... එහෙම
වුනොත් මට හැමදාම ලොකු අඩුවක්
දැනෙයි... නිකං හිස් ගතියක්...
මොකක්ද නැ වගේ... එහෙම වෙනනේ
කොහොමද... එතකොට ජීවිතේ
සම්පූර්ණ නැනේ ඔහා... ඉතින් මම
තීරණය කළා ඔයාගේ ජීවිතේ
කොටසක් වෙන්න... ඇත්තම කතාව
මෙකයි... මට ඕන ඔයාව මගේ
කරගන්න... මොකද ඔයා නැතුව පුදු
මම සම්පූර්ණ නැ... ඒක විතක්
ආත්මාර්ථකාමී දෙයක්... මොනවා
කරන්නද... ජීවත්වෙන්න ඔයාවම
ඕනනම්... නේද... ඉතින් කියනවා මම
ඔයාට හරි ආදරෙයි... ගොඩක්..
කියන්න බැරි තරම්........"



# ආදරය ගින්දරක්

සුජීව ප්‍රසන්න ආරච්චි


ආදරය ගින්දරක්
නවකතා තිළිණය
02 පොත
එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...
සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්

එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...

## සුජීව ප්‍රසන්න ආරච්චි

තාරක එහෙමම වාහනය තේරුමක් නැතුව ටවුම පැත්තට පැදෙව්වා. කෙල්ල තවමත් ඉන්නේ පිටිපස්සේ බිම ගුලිවෙලා...

"උ..පේක්ෂා..."

"අ..යියේ..."

"දැ..න් ඉ..ඳග..න්..න.. අපි එළියේ.."

උපේක්ෂා වාහනයේ පිටුපස අසුනේ ඉඳගන්නගමන් ඔහු දෙස ස්තූති පූර්වකව බැලුවා.

"ස්වීටර් එකක් ව..ත් අරන් දෙන්න කඩයක් ඇරලා නෑ... සීතලයි නේ..ද..."

"ම..ට සී..තල නෑ අයියේ... මේ හො..ඳයි..."

ළඟ ළඟ නොපෙනෙන තරමට වැස්ස.. මුළු නුවරඑළි නගරයම වැහි සීතලට පාළු වෙලා.

"උපේක්ෂා..."

"අයියේ..."

"පේනවා නේද ටවුමේ හැටි..."

"ම්..."

"මේ මහ රෑ හෝටලෙන් පැනලා ටවුමට ආවා නම් ඔයාට මොනවද



වෙන්නේ... කෝ බස්..."

"අ..යි..ය..ට පි..න්..."

ඇත්තටම ඇයට එපමණයි කියන්න පුළුවන්. තාරක එහෙමම නුවරඑළිය ටවුමෙන් කඳපොල පාරට වාහනය දැම්මා. දැන් නවතින්න තවත් තැනක් සොයාගන්නට ඕන.

"දැ..න් බ..ය..ක් නෑ නේ..ද..."

"න්..නෑ අ..යියේ..."

"අපි හෝටලේ හිටියනම් උදේට ප්‍රශ්නයක් වෙනවා... හෙට මේ ප්‍රශ්නේ ලැව් ගින්නක් වගේ පැතිරෙනවා... පොලීසියෙනුත් එයි..."

"එ..යා..ලා පොලිටික්ස් ක..ර..න ක..ට්ටියත් හොඳට ද..න්..නවා... හෙට මේ පැ..ත්තේ ඇමති කෙනෙක්ගේ ගෙදරටත් ය..න්න හිටියේ..."

"ඒකනේ... දැන් බයවෙන්නෙපා..."

"අ..යියේ..."

"ම්..."

"මෙ..හෙම හෝ..ට..ලෙන් ගියාම අ..යියට ප්‍රශ්නයක් නේද..."

"ම..ට ඇ..යි..."

"දැ..න් මේ අ..ර..."

"මො..කක්ද උපේක්ෂා..."

"නෑ... අ..යියගේ ග..ර්..ල් හෝ..ටලේට ග..ත්..තො..ත්.. උදේට..."

තාරකට එය සිහිවුණේ කෙල්ල කියූ පසුයි. මහ රෑ හෝටලෙන් ගියේ ඇයි කියලා ඇය ප්‍රශ්න කරන බව ඔහු දන්නවා. "දූව විතරක් ප්‍රශ්න අහනව නම් කමක් නෑ... දූවගේ අම්මත් පොලීසියෙන් වගේ ප්‍රශ්න අහනවනේ..." තාරක හිතුවා.

"ඕ..න දෙ..ය..ක් උපේක්ෂා... අපි බලමු..."

"ම..ට ස..මා..වෙ..න්..න අ..යියේ..."

"ඔයාව මගේ කාමරේට එවන්න ඇත්තේ දෙයියොම තමයි... මේ වෙලාවේ දෙයියෝ මට වැඩක් පවරලා තියෙනවනේ... මං හිතන්නේ ඒ ගැන විතරයි..."

"එ..හෙම දෙ..යි..යෙ..ක් නෑ අ..යියේ... අයියා දෙවියෙක් ව..ගේ මේ කෙ..ල්ලට පිහිට උ..නා වි..තරයි..."

කෙල්ල වෙව්ලමින් වගේ කිව්වා... තාරක කතා කළේ නෑ.

කඳපොල පාරේ ටික දුරක් යද්දී හමුවන පුංචි හෝටලයක් තිබ්බා. වැස්ස නිසා හෝටලය වත් හරිහැටි පේන්නේ නෑ.

"බ..ලමු අ..ලා..."

තාරක ඒ පුංචි හෝටලයේ දොරකඩටම වාහනය ගත්තා. ඇහැරී උන්නේ ආරක්ෂක නිලධාරියෙක් විතරයි. තාරක හෙමිහිට වාහනයේ පැති වීදුරුව පහත් කළා...

"අපට රූම් එකක් ගන්න පුළුවන්ද..."

"මැ..නේ..ජර් ම..හ..ත්තයා නම් නි..දි... ඉ..න්න ස..ර් මං බලන්නම්..."

"පුළුවන් නම් ලොකු දෙයක්..."

තාරක මහ හයියෙන් වැටෙන වැස්ස දෙස බලාගෙන උන්නා. මේ මහ වැස්සේ කෙල්ල අතරමං උනානම් වෙන දේ තාරකට හිතාගන්නවත් බෑ.

"උපේක්ෂගේ ඇඳුම් ඒ කාමරේද..."

"ඔව් අ..යියේ... මං ප..ර්ස් එ..ක විතරයි ග..ත්තේ..."

"මො..නාද ඒකේ ති..යෙ..න්..නේ..."

"ම.. ම..ගේ අයිඩින්ටි කාඩ් එකයි පාස්පෝට් එකයි රුපියල් දාහකුයි..."

"ප..රිස්සම් කරලා තියාග..න්..න..."

උපේක්ෂාට ඔහු ගැන අප්‍රමාණ දුකක් දැනුණා. ඔහුට මේ තරම්





කරදරයක් වෙන්න ඇය හිතුවේ නෑ.

ටික වේලාවකින් හෝටලයේ මැනේජර් යැයි සිතිය හැකි කෙනෙක් ආවා.

"ඩබල් රූම් එකක්ද ස..ර්..."

"ඔ..ව්... රූම් එකක් දුන්නොත් ලොකු දෙයක්... නෝනටත් ටිකක් අසනීපයි වගේ..."

තාරක බැගෑපත් වුණා. වචනයකට වත් ඔහු වගේ කෙනෙක්ගේ නෝනා වීම වාසනාවක්. ඒත් ඒ වාසනාව වෙන කෙනෙක් අයිති කරගෙන...

"මං ලෑස්ති කරලා දෙන්නම් ස..ර් එ..න්..න..."

තාරකගේ සිතට නිවනක් දැනුණා.

"වාහනේ ඔහොමම තියන්න ස..ර්... උදේට ගමු..."

තාරක ඩිකිය ඇරලා ඔහුගේ බෑග් එක ගත්තා. ඊටත් පස්සේ පිටුපස දොර හෙමිහිට ඇරියා.

"බ..හි..න්..න..."

ඇය බැස්සේ ඔහු දෙස බලාගෙනමයි.

"ස..ර්ලා කොළඹ ඉඳලා එන ගමන්ද..."

"ඔව් එ..ද්දී ටිකක් පරක්කු උනා... දිගටම වැස්සනේ..."

"ඒකනේ සර්... සර්ලා ඩිනර් අරගෙනද..."

"ඔ..ව් අපි මඟින් ගත්තා... කෝපි ටිකක් ගන්න පුළුවන් නම්..."

"මං හදලා ගේන්නම්... සිරිසේන මේ කාමරේ මහත්තයලට පෙන්නන්න... ටූ ෆයිව් වන්..."

ඇය ගියේ ඔහු ළඟින්ම... ඒ කොරිඩෝව කෙළවර උනේ තරමක් විශාල රවුම් කන්නාඩියකින්. ඒ කන්නාඩිය ළඟ පුංචි ස්ටූල් එකක් උඩ කඳුකර මල් පොකුරකුත් තියලා තිබ්බා. උපේක්ෂාත් තාරකත් එද්දී ඒ

කැඩපතේ දෙන්නගේ රුව ලස්සනට ඇඳිලා තිබ්බා. ඒ රුව මුලින්ම දැක්කේ තාරක... ඔහුගේ හිත පුරා පුදුමාකාර තදින් රූ රූපය ඇඳුනා. මොහොතකට නැවතී ඒ රූපය දෙස බලා ඉන්නට තරම් ඔහුට හිතුණා. ඒත් සමගම වාගෙයි උපේක්ෂා දෙනෙත් එසෙව්වේ... ඇයට ඔහුගේ දෙනෙත් හමුවුණේ කැඩපතින්.

කැඩපතේ ඇඳී තිබූ යුගල් පින්තූරය මීට පෙර දැක තිබූ බවක් උපේක්ෂාට දැනෙනවා. දෙන්නාගේ දෙනෙත් යළිත් ළං ළංව කැඩපතේදීම හමුවුණා. උපේක්ෂා හෙමිහිට බිම බලාගත්තා.

"මේ කාමරේ ස..ර්..."

"හා හොඳයි..."

තාරක කාමරය පුරා නෙත් යැව්වා. පුංචි කාමරය ලස්සනයි... එහි තිබ්බෙත් එක යුගල ඇඳක් විතරයි... කෙල්ලට එහි නිදාගන්න දීලා තමා බිම රෙද්දක් එලාගෙන නිදාගන්නවා කියලා තාරක සිතා ගත්තා.

"දැ..න් බයක් නැනේ... කෝපි ටිකක් බීලා ටිකක් ඇලවෙන්..න... අපි උදේට බලමු මොනාද කරන්නේ කියලා... ම්..."

ඔහු කිව්වේ හරි කරුණාවෙන්.

"අ..යියා ඇඳේ නිදාගන්න... මං බි..ම..."

"දැන් මං ඔයාව මේ සීතලේ බිමට දායි කියලා හිතුවද... මට බිම පුරුදුයි..."

"ක..ම..ක් නෑ අයියේ... මං කො..හොම..ද..."

"හරි එහෙනම් මාත් ඇඳේ පැත්තකින් ඇලවෙන්නම්කෝ..."

වෙන කියන්න දෙයක් නැති නිසා ඔහු කිව්වා.

"ෂ..ර්ට් එක ගාණට තේ..ද..."

"ම්.. මං ග..ල..ව..න්..නම්..."

"ඇඳගෙන ඉන්න... සීතලයි..."





ඇත්තටම එය ඇඳගෙන ඉන්න ඇයටත් ආසයි.

"දවල් දවසෙම ඇඳන් හිටියේ ඕක... ආඩිය ගඳත් ඇති..."

"න්..නෑ..."

ඉන් ඇයට එන්නේ පිරිසිදු පිරිමියෙකුගේ සුවඳ... ඒ සුවඳ දිගටම ඇයට දැනුණා.

ටිකකින් කාමරයට උණු කෝපි දෙකක් ආවා. තාරක එක කෝපි එකක් ඇය අතට දුන්නා.

"ම්.. බීලා නිදාගන්න..."

අවට මහ වැසි තවමත් ඇද වැටෙනවා. ඔහු නාන කාමරයට ගිය පසු උපේක්ෂා කවුළුවෙන් පිටත බැලුවා. මොනවත්ම පේන්නෑ. පේන්නේ එක දිගට වහින මහ වැස්ස විතරයි.

දෙන්නටම පොරොවන්න තිබ්බෙ එක ලොකු බ්ලැන්කට් එකක් විතරයි.

"දැන් නිදාගන්න... කරදරයක් නෑ..නේ..."

ඇය හිමිහිට ඇඳට ආවා. ඔහු විශාල බ්ලැන්කට් එක ඔසවලා එහි පැත්තකින්ම ඇයව වැහෙන්නට පෙරෙව්වා...

ඇඳේ අනිත් පැත්තෙන් ඔහු ඇලවෙද්දී උපේක්ෂා ඔහු දිහාම බලා උන්නා. ජීවිතේ පළවෙනි වතාවට තාත්තා ඇරෙන්නට වෙන පිරිමියෙක් සමග ඇඳක එකට නිදාගන්නේ අද... ඒකත් මහ පුදුමාකාර විදිහට.

"මං ලයිට් එක අඩු කරනවා හොඳේ..."

"හා.. අයියේ..."

කෙල්ල උගුරෙන් වගේ කිව්වා. දැන් මහ වැස්සේ හඬ පෙරටත් වඩා ඇහෙනවා. දෙන්නාටම නින්ද ය..ත්නෑ.

"උපේක්ෂා..."

ඔහු අඳුරේම කතා කළා.



www.sinhalaelibrary.com

"අයියේ..."

"ජීවි..තෙ..න් ම..හ පුදුම දෙයක් නේ..ද..."

"ම්..."

"මේ ගෑ..ණු ළ..ම..යෙක් මෙ..ච්..චරම මාව විශ්වාස කළාමයි..."

"ඇයි අ..යියව අවිශ්වාස ක..ර..න්..නේ..."

"පිරිමි එ..ච්..චර හො..ඳ නෑ උපේක්ෂා... ස..මහර දේවල් වලට පි..රිමි හ..රි පෙරේතයි..."

"හැ..ම කෙනෙක්ම එ..හෙම නෑ... අද මං තේ..රුම් ග..න්..නා..."

"අද ඔයාට මහන්සියි... පැනඩෝල් කාඩ් එකක් මගේ බෑග් එකේ තියෙනවා... දෙකක් දෙන්නද..."

"එ..පා අයියේ... ඔළුවේ බර ගතියක් දැන් නෑ..."

"දැ..න් නිදාගන්න... ම..ගේ ක්..කුලක් එ..හෙම රෑට පස්සේ වැදුනොත් බයවෙන්නෙපා... නිදාගත්තට පස්සේ මං වඳුරා වගේ... ඔළුව යාපනේ ඇඟ තලවකැලේ කකුල් දෙක ගාල්ලේ..."

ඇය මෘදු හඬින් සිනාසුණා.

"මො..නවා උනත් හෙ..ට මං ඔයාව පාරේ දාලා ය..න්..නෑ... බය නොවී නිදාගන්න... අපි මොනවා හරි කරමු... ගුඩ් නයිට්..."

"ගු..ඩ් නයිට් අ..යියේ..."

තාරක එහෙමම අනිත් පැත්තට හැරුණා. ඔහු ගැන උපේක්ෂාට පුදුමයි. නින්ද ඇය සිතූ ඉක්මනින් ඇය වෙත ආවේ නෑ. අද ජීවිතයේ උදාවූ දෛවෝපගතම රාත්‍රිය... මේ රාත්‍රියෙන් පස්සේ ජීවිතයට මො..නවා වෙයිද... ඇත්තටම කියන්න දන්නෑ.

ඒත් එක දෙයක් උපේක්ෂාට දැන් දැනෙනවා. ඒ මොකක්ද සැනසීමක්... නිව්වච ගතියක්. ඒ පහන් බව හදවතට ගෙන ආවේ මේ ඇඳේ වම්පස නිදන ඔහුයි... තා..ර..ක... ඒ නම උපේක්ෂා සිතින් නව පාරක් කියෙව්වා.





ඔහු ඇත්තටම අහරමං වූ තමාට තරු මං සළකුණු දැල්වූ දෙවියෙක්.

අද ඔහු තමාව ආරක්ෂා කළේ මොන තරම් හොඳ පිරිසිදු සිතින්ද කියලා උපේක්ෂා දන්නවා. ඒ පිරිසිදු හැඟීම හදවතට ගෙන ආවේ ලොකු හැඟීමක්.

උපේක්ෂාට සිහිඋනේ තාත්තාව... තාත්තාත් තමාව රැක්කේ ඒ වගේ... ඔහු වගේ පිරිමියෙක් තවත් මේ ජීවිතයේ දකින්නවත් ලැබෙයි කියලා උපේක්ෂා කවදාවත් හිතුවේ නෑ. ඒත් ජීවිතයේ උදා වූ දෛවෝපගතම රෑක තමාව ආරක්ෂා කරන්නට එවැනිම උතුම් පිරිමියෙක් ලැබුණා.

දිල්... ඒ ඔහු පෙම්වතියට කතා කරපු හැටි. එයා දිල්හානිද... දිල්කිද... උපේක්ෂා හිතනවා... ඒත් ඔහු ඇය ගැන කතා කළේ එතරම් පැහැදීමකින් නෙමෙයි. ඇත්ත. අච්චර ප්‍රශ්න කරගෙන ගිය ඇය නිකමටවත් ඔහු කෑවද බිව්වද සීතලද කියලා ඇහුවේ නෑ.

ඔහුම ටික වෙලාවකට කලින් කිව්ව විදිහට ජීවිතෙත් මහ පුදුම දෙයක්.

දැන් රංගන මොන වගේ දෙයක් කරයිද කියලා උපේක්ෂා හිතුවා. මෙ රෑ ඔහු හෝටලෙන් කොහෙද ගියේ කියලා ඇය හිතුවා. ඒත් දැන් ඔහු ගැනවත් ගෙදර ගැනවත් හිතලා වැඩක් නෑ.

ඒ අතීතයම එකට ගුලි කරලා මේ නුවරඑළිය කන්දකින් පහළට වීසි කරලා දාන්න පුළුවන් නම්... ජීවිතය අලුතින්ම හෙට ඉඳලා පටන් ගන්න පුළුවන්නම්... 'ඒත් කොහොමද... හිතාගන්න බැහැ.

අතේ සන්තකයට තියෙන්නේ හැඳුනුම්පතයි ගමන් බලපත්‍රයයි රුපියල් දාහකුයි විතරයි. යන්න තැනක් නෑ. පිහිටක් ඉල්ලගෙන යන්න කෙනෙක් නෑ. තාත්තට නෑයෝ හිටියේ නෑ. ඉන්න දෙතුන් දෙනාත් අම්මා අල්ලගෙන උන්නේ... ඒ ආශ්‍රය කරපු කිසි කෙනෙක් උපේක්ෂාට විශ්වාස නැහැ.



www.sinhalaelibrary.com

උපේක්ෂාට ඔහු නිදාගන්නට පෙර කියූ කතාව සිහි වෙනවා. "මොනවා උනත් ඔයාව මං හෙට පාරේ දාලා යන්නෑ" ඒ වචන පුදුමාකාරයි. මේ මොහොතේත් තමා ජීවත් වන්නේ ඒ වචන ටිකට පින් සිද්ධ වෙන්න නේද කියලා ඇය දන්නවා.

ඔහු මොනවා කරන කෙනෙක්ද... ඇයි එයා නුවරඑළියට ආවේ... කොහෙද ඔහු ඉන්නේ... ඒ මොනවත්ම තමා දන්නේ නෑ... ඒ මොනවා උනත් මේ ලෝකයේ දැන් තමාට ඉන්නා හිතවත්ම කෙනා ඔහු...

ඒත් මේ ජීවිතේ ඔහුගෙන්ම පිහිටක් සරණක් ඉල්ලාගෙන යන එක සාධාරණද... ඒක යුක්ති සහගත නෑ. ජීවිතේ එක මොහොතක පිහිටක් වෙච්ච කෙනෙක්ට වදයක් වෙන තරම්ම උදව් ඉල්ලන එක හොඳ දෙයක් නෙමේ. ඇරත් ඔහු වැදගත් කොල්ලෙක්. පෙම්වතියක් හොඳ තත්වයක් තියෙන කෙනෙක්. මෙහෙම ගෑණු ළමයෙක් එක්ක යන්න එන්න පවා ඔහුට හොඳ නෑ.

තමාට පිහිට වූ නිසාම ඔහුගේ ජීවිතයට කැළලක් වෙනවා නම් ඒක කොච්චර දුක හිතෙන දෙයක්ද... මේ වෙන්නට යන්නේ එය නේද කියලා උපේක්ෂා හිතුවා.

**"ටික දවසක් ඉන්න වත් තැනක් ලැබුණ නම් ටිකක් ඉඳලා හිතන්නවත් තිබ්බා..."**

ඒත් තනිවෙච්ච කෙල්ලෙක්ට නවාතැන් දෙන්නේ කවුද... මොකටද...

උත්තර හොයා ගන්න බැරි ප්‍රශ්නයක තමා පැටලිලා ඉන්න බව උපේක්ෂා දන්නවා. ඒ වෙලාවේ තෝරගන්න තිබ්බෙ මාර්ග දෙකයි. එකක් රංගනට අවනත වෙලා ඒ ජීවිතේ අප්පිරියාවෙන් හරි ගෙවන එක. අනික මෙහෙම පැනලා එන එක. තමා තෝරා ගත්තේ අමාරු මාර්ගයක්. ඒ නිසාම අද අසරණ වෙලා.

හෙට ඉඳලා ජීවිතයට බලාපොරොත්තු සහගතව ධෛර්ය සම්පන්නව





මුහුණ දෙන්න උපේක්ෂා ආසයි. ඒත් කොහොමද... වැලකට තනියෙන් යන්න බෑ... ගහක අත්තක පැටලෙන්නම ඕනා. ගෑණු ළමයෙක්ගේ දෛවයත් මල් වැලක් වගේ. ඒ අතින් පිරිමි හරි වාසනාවන්තයි කියලා ඇයට හිතුණා.

අද නුවරඑළියට වහින්නේ නිමා නොවන මහ වැස්සක්. මේ වහින වැස්සට කඳු පාරවල් පවා නාය යයි කියලා ඇයට හිතුණා. මේ රාත්‍රිය තව ටිකකින් ගෙවෙයි. තව පැය කිහිපයකින් හෙට කියලා දවසක් උදාවෙයි. ඒ හෙටට මුහුණ දෙන්නේ කොහොමද...

උපේක්ෂා යංතමට හැරිලා ඔහු දෙස බැලුවා. ඔහුට නින්ද ගිහින්... පොරවනය තමාගේ පැත්තට ඇඹරිලා ඇවිත්... උපේක්ෂා පොරවනය උඩට කරගෙන ඔහුගේ වත වැසෙන්නට දැම්මා.

**** **** ****

සිංහල EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

www.sinhalaelibrary.com

මුලින්ම ඇහැරුණේ උපේක්ෂා... ඇහැරුණ ගමන් ඇය බැලුවේ පපුව උඩ බරට දැනෙන්නේ මොකක්ද කියලා... ඒ වෙද්දීත් කාමරය පුරා තිබ්බේ තුනීම අඳුරක්. නුවරඑළියට ඉර පායන්නේ ප්‍රමාද වෙලා. අද කොහොමත් ප්‍රමාදයි.

පපුව උඩටම වැටිලා තිබ්බ ඔහුගේ අත දකිද්දී උපේක්ෂාගේ ඇතුළ ළය ඇකිලීගෙන ගියා. ඊටත් පසු ඇයට බැලුනේ ඔහු දිහාව... ඒ මුහුණ නිදිබර සීතලේ ලස්සනට පියවිලා තිබුණා. රෑ නින්දෙන් කොයි වෙලාවක හරි අත පපුව උඩට වැටෙන්න ඇති කියලා උපේක්ෂාට හිතුණා.

පපුව උඩට මෙහෙම කවදාවත් පිරිමියෙකුගේ අතක් වැටිලා නැහැ... ඒක හරි පුදුම දෙයක්. උපේක්ෂා යංතම් කොට්ටේ උඩට හිස තිබ්බා. ඒත් සමගම ඔහුගේ අත පපුවෙන් පෙරලී බඳ අද්දරට වැටුණා. උපේක්ෂා දිග හුස්මක් පිට කළා...

දවසක් උදාවෙලා... ඇය යංතමට දෙනෙත් පියාගෙනම පෙරදා රාත්‍රිය සිහි කළා... පුදුමයි... එහෙම රාත්‍රියක් මේ ජීවිතේ උදා වුණා කියලා හිතද්දීත් ඇයට පුදුමයි.

රැයක් ගෙවුණු පසුත් තමා පිරිසිදු යුවතියක්. සීතල නුවරඑළියේ මහ වැසි වැටෙන පාළු රාත්‍රියේ එක පුංචි කාමරයක එක පුංචි ඇඳක එකම





පොරවනයක් යට ඉඳලත් තමා පිරිසිදු යුවතියක්.

ඒ මනුස්සකමට කොහොම පින් දෙන්නද කියලා ඇයට තේරෙන්නේ නෑ.

උපේක්ෂා ඇඳටම වී ටික වේලාවක් උන්නේ ඔහුගේ නින්ද කැඩෙයි කියලා... දැන් නුවරඑළියට වැටුණ අර මහ වැස්ස නෑ. පරිසරය පුරා තියෙන්නේ තුනී මන්දාලෝකයක්. ඉර පායන්නේ නැතුව එහෙමම මන්දාරම් බවින් තියෙනවා නම් ලස්සනයි.

උපේක්ෂා හෙමිහිට ඇඳෙන් බැස්සේ ඔහු දෙස බලාගෙනමයි. ඇය යද්දීම වාගේ ඇඳ පුරා තිබූ රස්නයක් නැති වෙනවා වගේ තාරකට දැනුණා... ඔහු ඇස් ඇරලා බැලුවා. කෙල්ල නාන කාමරයේ කියලා තාරක දන්නවා.

තාරකට තමා ගැන පුංචි ආඩම්බරයක් ආවා. මේ මලක් වගේ කෙල්ල එක්ක එක ඇඳක එක රැක් මේ සීතලේ දැහැන් බිඳ නොගෙන උන් එක ඇත්තටම ලොකු දෙයක්. හිත ටික ටික ගැස්සුණ බව ඇත්ත. ඒ හදවතට වෙනස් සුවඳක් දැනුණ නිසා. ඒත් හිත ගැහුණේ නෑ. ඇය ගැන හිතට දැනෙන්නේ වෙනස් පිවිතුරු බවක්. ඒ පිරිසිදු පිරුවට ගතිය කිළුටු කරන්න හිතෙන දෙයක් නෙමෙ. රකින්න හිතෙන දෙයක්.

තාරක තේ ටිකක් ඇණවුම් කරලා ඇවිත් ආයෙත් ඇඳේම හාන්සි වුණා. අද හිතන්න දේවල් මහ ගොඩක් තියෙනවා.

ඒත් මොනවත් හිතන්න පෙර දුරකථනය නාද වුණා. කතා කරන්නේ දිල්කි කියලා තාරක දන්නවා... දැන් කොහොම උත්තර දෙන්නද... මොනවා කියන්නද... තාරකට තේරෙන්නේ නැහැ.

දුරකථනයට පිළිතුරු දෙනවාද නැද්ද කියලත් දැන් හිතන්න ඕන. උත්තර නොදී හිටියොත් දිල්කි පැත්තම වනසන බව තාරක දන්නවා. ඊට පස්සේ ගෙදරටත් ඇය කතා කරනවා. අම්මත් ගන්නවා... ප්‍රශ්න



www.sinhalaelibrary.com

කෝටියකට මුහුණ දෙන්නට වෙනවා.

ඔන දෙයක් වෙච්ච දෙන් කියලා තාරක දුරකථනය අතට ගත්තා. දිල්කි මෙහෙමයි. පිළිතුරු දෙනකම්ම අල්ලගෙන ඉන්නවා.

"ගු..ඩ් මෝ..නිං දිල්..."

"කො..හෙද ඉ..න්..නේ..."

"මෝනිං" වත් නොකියයි දිල්කි ඇසුවේ.

"මං මේ එ..න්..න ලෑස්ති වෙනවා... දැන් නැගිට්ටේ..."

"මං අහන්නේ තාරක කොහෙද ඉන්නේ..."

"හෝටලේ..."

"ග්‍රෑන්ඩ් එ..කේ..."

දිල්කි උදෙන්ම හෝටලයේ අංකයට ගන්නට ඇති. තාරකට ලොකු පීඩනයක් දැනුණේ.

"නෑ..."

"ඉතින් ඊ ග්‍රෑන්ඩ් එකේ හිටපු මිනිහා දැන් වෙන හෝටලේක ඉන්නේ කොහොමද..."

තාරක නළල රැළි කර ගත්තා. ඔහුට මේ තරමම බොරු කියා පුරුද්දක් නෑ.

"ඊ යාළුවෙක් කතා කළා... බලන් ගියාම ඌත් නුවරඑළියේ... පස්සේ මං ඊ ඌ ඉන්න හෝටලේට ආවා..."

"අ..ර ම..හ ඊ..."

"ඔ..ව්..."

"දැන් ඉන්නේ එයත් එක්කද..."

"ඌ ගියා... මාත් මේ එන්න කියලා..."

"දැන් ඉන්න හෝටලේ මොකක්ද..."

දිල්කි මෙහෙම දිගින් දිගට අහද්දී තාරකට හරි දුකක් දැනුණා.





"දිල්..."

ඔහු කතා කළේ ටිකක් තදින්. ඇය නාන කාමරයේ දොර ඇරගෙන ආවේ ඒ මොහොතේදී. තාරකගේ දෙනෙත් එහෙමම කෙල්ල දෙසට යොමු වුණා... කෙල්ල මේ පාන්දර නාලා. සීතලේ වෙව්ලන්නේ ඒකයි. ඇය නාගෙනත් ඇඳගෙන තිබුණේ ඊයේ ඇඳුමමයි.

කතා කරන්නේ ඔහුගේ පෙම්වතිය කියලා උපේක්ෂා දන්නවා. ඔහු දැන් ලොකු ප්‍රශ්නයක පැටලෙන බව ඇය දන්නවා.

"මො..ක..ද ක..තා කරන්නැත්තේ... ඔයාට මොන දිෂ්ඨිය වැහිලද තාරක... ආ... මහ ඊ හෝටල් මාරු කරනවා... කතා නොකර ඉන්නවා..."

"දිල් මට මෙහෙම කතා කරන්නෙපා..."

ඔහු කිව්වේ හරි දුකකින් වගේ. උපේක්ෂාගේ දෑසින් කඳුළු වැටුණා. ඒ දුක ඔහු විඳින්නේ තමා නිසා. ඇයට දුක ඒකයි.

"හ..රි... ඔයා එන්නකෝ කොළඹ..."

දැන් කොළඹ යනවට වඩා නුවරඑළියේ හෙළකට වාහනය අල්ලන එක සැපක්. තාරක දුරකථනය තියලා දිග සුසුමක් හෙළුවා.

"අ..යි..යේ..."

ඇය උන්නේ ඔහු ගාවමයි. අමුතුම සබන් සුවඳක් කෙල්ල ළඟින් එනවා.

"ම..ට ස..මාවෙ..න්..න අ..යියේ..."

තාරක හිනාවුණා. ඒ තෙත ඇස් පිහාටු දිහා ඔහු බැලුවේ දුකින්. ඔළුවම තෝන්තු වෙලා කියලා තාරකට හිතුණා.

"මේ පා..න්..දර නෑව..ද..."

"එ..යා බ..ණි..න..ව නේ..ද අ..යියේ..."

"ඒවා ඔයා හිතන්නෙපා උපේක්ෂා... ඒවා මං විසඳ ගන්නම්... දොරට ගහනවා... තේ ගෙනත් ඇති ගන්න... මට වූ බරයි..."



www.sinhalaelibrary.com

ඔහු නාන කාමරයට දිව්වේ එහෙම කියමින්... උපේක්ෂාට කඳුළු අතරින් සිනාවක් ගියා. ඇය දොර ඇරියේ ඒ සිනහවෙන්මයි.

"ගුඩ් මෝ..නිං මිස්... තේ ගෙනාවා..."

"ගේ..න්..න..."

"මං ටී එක හදන්නද මිස්..."

හෝටලයේ සේවකයා ඇහුවා.

"නෑ මං හ..ද..න්..න..ම..."

උපේක්ෂා ඇඳ ළඟ තිබ්බ බෙඩ් කබඩ් එක උඩ තේ ට්‍රේ එක තියාගෙන තේ හැදුවා. උඩරට තේ සුවඳ හොඳට ඇයට දැනුණා. පෙරදා දවසම බඩගින්නේ උන් නිසාදෝ ඇයට තද තිබහක් බඩගින්නක් තිබ්බා. ඒත් කන්න ගත්තාම කන්න බෑ.

උපේක්ෂා හොඳ කහට පාටට තේ දෙකක් හැදුවා. තාරක ඇවිත් ඇඳේ මෙහා කෙළවරේ වාඩි උනා.

"කොහොමද උපේක්ෂා නෑවේ... වතුර මාර සීතලයිනේ..."

"වෙ..ව්..ල වෙ..ව්..ල නෑ..වා... ම..ට උදේට නා..ලා පු..රුදු වෙ..ලා..."

තවමත් ඇගේ කොණ්ඩය තෙතයි. මේ නුවරඑළියේ ලේසියෙන් කොණ්ඩය වේලෙන්නේ නෑ.

"තේ..ක අ..යියේ..."

"මරු කහට... හිතේ තියෙන හොඳම කහට..."

ඔහු කිව්වේ ජනප්‍රිය තේ කොළ වෙළඳ දැන්වීමක පාඨයක්.

"එ..හෙ..ම ක..හ..ට..ක් හි..තේ නෑ..."

ඇය උගුරින් වගේ කිව්වා. රාත්‍රියක් පුරා තමාව රැක්ක ඔහු ගැන මේ හිතේ කොහෙද කහටක්.

"උපේක්ෂා..."

"අ..යියේ..."





"කාමරේට වෙලා ටිකක් ඉ..න්..න... මං නත්පරෙන් ටවුමට ගිහින් එන්නම්..."

කෙල්ල බයෙන් වගේ හිය වැනුවා.

"මං එහෙමම යයි කියලා බයද..."

"හී..නෙ..කි..න් ව..ත් එ..හෙම හි..තුවේ නෑ..."

"මං විනාඩියෙන් එනවා..."

ඔහු මේ උදේ ටවුමට යන්නේ ඇයි කියලා උපේක්ෂාට හිතාගන්න බෑ. ඇයි කියලා ඔහුගෙන් අහන්නත් බෑ.

"මං ඉක්මනට එන්නම්..."

තාරක යතුරයි පර්ස් එකයි ජංගම දුරකථනයයි අරගෙන කාමරයෙන් පිටවුණා. උපේක්ෂා ඔහු රෑ ඇඳගෙන හිටිය සරමත් කමිසයත් අරගෙන ලස්සනට නැව්වා. ඊටත් පස්සේ ඇඳ අස් කළා...

"එ..යා කො..හො..මද මාව දැන් කො..ළඹ එක්කගෙන ය..න්..නේ... මාව කොහෙන් දාන්න කියලද මං කියන්නේ..."

උපේක්ෂාට හිතාගන්නම බෑ. ඇය ජනෙල් තිරය අතරින් හෝටලයේ ලස්සනට සකසා තිබූ මිදුල දෙස බලා උන්නා. රෑ පුරා මහ වැස්සෙන් තෙමුණු නුවරඑළියේ කඳුකර මල් දැන් පායන කහ පාට හිරු රැස් වැස්සේ තෙමී තෙමී ලස්සනට පිපිලා තියෙනවා.

තමා අතරමං වෙලා කියලා අනාථ වෙලා කියලා දැන් උපේක්ෂාට දැනෙනවා. "පිහිටක් වෙ..න්න දෙයියනේ..." ඇය දෑස් පියා දමමින් සිතුවා.

*** *** *** ***



www.sinhalaelibrary.com

**තාරක** වාහනයට ගොඩ වුණේම ඔහුගේ හොඳම මිතුරාට අමතමින්... හිතේ තියෙන දෙයක් විවෘතව කතා කරන්න පුළුවන් අසිත එක්ක විතරයි.

"මචං ම..ම..."

"තාරක... උඹ කොළඹද..."

"නෑ මචං... මං නුවරඑළියේ... මේ ඊයේ ආපු ගමන්..."

"නෑ.. රෑ නුවරඑළියේ හිටියා..."

"ඕ..ව් මචං..."

"ෂා... දන්නවනම් මාත් එනවා බං..."

"උඹ ගෙදරද..."

"මේ ෂොප් එකට යන ගමන් මචං..."

අසිතට මහරගම කුඩා කඩ කෑල්ලක් තිබ්බා. ඒකේ ඇති දේකුත් නෑ. නැති දේකුත් නෑ. ඒත් කොල්ලා ඒක කරගෙන ගියේ හරි අමාරුවෙන්. ඒ පුංචි කඩ කෑල්ලේ හැරෙන්නවත් ඉඩක් නෑ. අමාරු උනාම කොල්ලාට උදව් කළේ තාරක.

"ඇයි මචං..."

"මට පොඩි අවුලක් මචං..."





"අවුලක්... ඇයි මචං..."

"මෙ..හෙම කියන්න බෑ මචං... මං කොළඹ ආවාම උඹව හම්බවෙන්නම්..."

"ප..රිස්සමින් වරෙන්... ආව ගමන් කතා කරපං..."

"ම..."

මේ කතාව කොහොම කියන්නද... ඒක හරියට චිත්‍රපටයක කොටසක් වගේ. සමහර විට පිළිගන්නත් බෑ. ඒ තරම් අතාත්විකයි. ඒත් ඒ දේ ඊයේ රෑ උනා.

තාරක නුවරඑළියට එද්දී නුවරඑළියේ කඩ සාප්පු විවෘත කළා විතරයි. ඔහු ටවුමට ආවේ කෙල්ලට ඇඳුමක් ගන්න. ඊයේ ඉඳන් ඇඳගෙන ඉන්න ඇඳුමින්ම කෙල්ලව කොළඹ අරගෙන යන්න තාරකට හිතෙන්නේ නෑ. පැය කිහිපයකට පෙර හමුවූ ඇය ගැන මේ තරම් හිතෙන්නේ මොකද කියලා ඔහුම දන්නේ නෑ.

තාරක විවෘත කරලා තිබ්බ සාප්පුවකට ගොඩ වෙලා ඇයට ඇඳුම් තේරුවා. ගෑණු ළමයින්ට ඇඳුම් තෝරන එක කොච්චර අමාරුද කියලා ඔහු දන්නේ අද. විශේෂයෙන් ලස්සන කෙල්ලෙකුට...

ගඩොල් පාට සායක් ඔහු තෝරා ගත්තා. ඒ සායේ වාටියට උඩින් තද රතු පාටට හුරු මොනවද සරුංගෝල වගයක් අල්ලලා තිබ්බා. ඒකේ තැනින් තැන පොඩි කන්නාඩි කෑලිත් තිබ්බා. කෙල්ලන්ට මහන්නේ පුදුම මෝස්තර කියලා ඔහුට හිතුණා.

"දැන් ඉතින් මේකට ගැලපෙන බ්ලවුස් එකක් තෝරපංකෝ..."

ඇයට තිබ්බේ හැඩ ඇඟක් බව තාරකට මතකයි. ඔහු සුදු බ්ලවුස් එකකුයි තව ලා බටර් පාට බ්ලවුස් එකකුයි තේරුවා. පස්සේ දෙකම තියලා බැලුවා... ඇත්තටම ඔහු කළේ හිතින් ඇයට එය අන්දවා බලපු එක... දෙකම ලස්සනයි කියලා තාරකට හිතුණා. ඔහු වැඩියෙන්ම ආස



www.sinhalaelibrary.com

කළේ සුදු පාට බ්ලවුස් එකට. ඒ මෝස්තරය චාම්. අත් දෙක දෙපැත්තෙන් පුංචි පටි දෙකක් එල්ලෙනවා.

"ම..ට මේ තුන දෙන්න..."

තාරක ඇඳුම් ටික අරගෙන පිටතට ආවා. උදේට නුවරඑළිය ටවුම පුරා තියෙන්නේ පුදුම කලබලයක්. තාරක ඉක්මනට ඇවිත් වාහනයට ගොඩ වුණා. කෙල්ල කාමරේ තනියම ඉන්නේ බයෙන් කියලා ඔහු දන්නවා.

වාහනය හෝටලය ළඟ නතර කරලා තාරක කාමරයට ගියේ දුවගෙන වගේ. දොර අරිද්දීම දුටු මුහුණ තාරකගේ පපුව පුච්චා දැම්මා. ඒ ඇස්වල කඳුළු.

"ඇයි නංගී..."

"න්..නෑ අ..යියේ..."

"බ..ය වුණාද..."

ඇය බිම බලාගෙන හිස වැනුවා.

"මං එහෙම කරන්නෑ.. ආ..."

ඔහු ගෙන ආ බෑගය ඇය අතට දුන්නා.

"මො..නවද අ..යියේ..."

"ඇ..ඳුම්... ඇඳගෙන ය..න්..න... ඔවා පොඩි වෙලා... ගමනක් ය..න්න බෑ..."

උපේක්ෂා නෙත් එසෙව්වා. ඇස් පැලීගෙන යනවා වගේ ඇයට දැනුණා.

කෙනෙක්ට පිහිට වෙන එක එක දෙයක්. රැක බලා ගන්න එක තව දෙයක්. මිනිස්සු තමන්ගේ අයට වෙන්නේ පිහිටක් නෙමේ. ඒක රැකබලා ගැනීමක්. ඒත් පිට කෙනෙක් වූ තමාව මෙහෙම රැකබලා ගන්න එක ඇයට ඉවසගන්න බෑ. කුණු ගඳ ගහන මිනිස්සු ඉන්න ලෝකයක පිච්ච





මල් වගේ මිනිස්සු ඉතුරු වුණේ කොහොමද...

මොනවා කියන්නද කියලා උපේක්ෂාට හිතාගන්නට බෑ. ඇය පාර්සලය විවර කළේ නෙත පාට ඇස් පිහදාගෙන. ඒකේ තිබ්බ ගවොල් පාට සාය ඇය ජීවිතේ දැක්ක ලස්සනම සාය. එහෙමයි කෙල්ලට හිතුණේ. ඒකට සුදු පාට බ්ලවුස් එක හොඳටම ගැළපෙනවා කියලා ඇයට හිතුණා.

"අ..යියට පි..න්..."

"ඔච්චර පින් දීලා උපේක්ෂා ඒ පාර මාව රහත් වෙනවා..."

රහතන් වහන්සේලාගේ ගතිගුණ සමහර වෙලාවට මිනිස්සුන්ට පිහිටනවා.

"හොඳද..."

"මං දැ..ක්ක ල..ස්සනම සාය... මේ..ක..ට මේ සු..දු එක අඳින්නද..."

තාරක හිනාවුණා. ඔහු දිල් එක්ක සමීප ඇසුරක් පටන් අරගෙන අවුරුදු දෙකක් විතර වෙනවා. ඒක ඔහුගේ ඕනකමට පටන් ගත්ත ඇසුරක් නෙමේ. ඒත් එහෙම දෙයක් ඇති වුණා. ඒත් ඒ අවුරුදු දෙක පුරාවට දිල්කි කවදාවත් තමාගෙන් මෙහෙම අහලා නෑ නේද කියලා ඔහු හිතුවා.

පිරිමි සමහර දේවල් කියන්නෑ. ඒත් අපේක්ෂා කරනවා... තමන් මේ ලෝකේ ආදරය කරන ගෑණි එයාගේ ජීවිතේ තමාගේ සෙවනැල්ල යට හදාගන්නවා නම් පිරිමි ආසයි. පිරිමි තමන්ගේ දූවලා වගේ ගෑණුන්ට ආදරය කරන්නේ එනකොටයි. තමන්ගේ හෙවනැල්ල යටින් ගිහින් ගෑණු එයාලගේ හෙවනැල්ල යටට තමන්ව ගන්න යද්දී පිරිමි සසල වෙනවා.

"ඒ..ක ත..මා මා..ත් හිතුවේ... ඒකට කැමති නැති වෙයි කියලා හිතලා තමා අනික ගෙනාවේ..."

පුදුමයි. මහ රැක හමු වූ මේ අනාථ කෙල්ලගේ ආසාවල් ගැන ඔහු

මොකට හිතුවාද...

"ඒ..ක..ත් ල..ස්සනයි..."

"එ..හෙ..නම් ඇඳගන්න... මං බීල ගෙවලා එ..න්..න..ම්..."

"මං අ..යියට අඳින්න ඇඳුමක් තියන්..න..ද..."

තාරක බලා උන්නා.

"ම්..."

උපේක්ෂා බ්ලවුස් එක වතට තබා බැලුවේ හරි දුක හිතෙන විදිහට... ජීවිතේ මෙ..හෙම නම්... මේ ජීවිතේ නම්... ඒත් එහෙම හිතන්නේ කොහොමද...

පෙරදා රැයේ ඔහුගේ කාමරයට දුවගෙන එද්දී රෑ අටට දහයට විතර ඇති. ඒ මොහොතේ ඉඳලා මේ වන තුරු තවම පැය දොළහක් වත් ගතවුණේ නෑ. ඒත් අවුරුදු දොළහක් එකට ආශ්‍රය කරපු පුරුදු බවක් ඔහු තුලින් දැනෙන්නේ ඇයි කියලා ඇයට හිතාගන්නට බැහැ.

ඒත්... තව පැය කිහිපයකින් මේ පුංචි ඇසුර අතීතයට එකතු වෙනවා. ඔහුට තමාව කොහේ හෝ දමා යන්නට සිදු වෙනවා. ඉන් පස්සේ... ජීවිතය ගැන හිතන්නටත් ඇයට බයයි.

උපේක්ෂා ඔහුගේ පුංචි ගමන් මල්ල විවර කළා. ඉන් එන්නේ මෘදු පිරිමි විලවුන් සුවඳක්. ඊයේ රෑ පුරා නිදාගනිද්දී ඇඳේ තිබ්බෙත් ඒ සුවඳමයි.

"මේ තියෙන්නේ ඒ පර්ෆියුම් එක... කූල් වෝටර්..."

ඇය ඒ නිල් පාට සුවඳ විලවුන් කුප්පිය අතට අරගෙන ඉන් බිඳක් වමතේ පිටි අත්ලට විදගෙන ඒ සුවඳ බැලුවා. ඒ සුවඳ විලවුන් වර්ගයට කූල් වෝටර් කියන්නේ ඇයි කියලා ඇය හිතුවා.

උපේක්ෂා බෑගයේ තිබූ සුදට හුරු නිල් පාට ඩෙනිම් කලිසමත් අත් කොට ලා රතු පාට කමිසයත් තෝරුවා... ලා රතු පාට පසුබිමේ සුදු පාට





ඉරි ගිය ඒ කමිසය ලස්සනයි.

ඇය ඔහු තෝරා ගෙනවිත් දුන් ඇඳුම ඇඳ ගත්තේ ඉන් පසුවයි. ඔහුට තියෙන්නේ මොන තරම් චාම් ඇහැක්ද කියලා උපේක්ෂා හිතුවා. ගඩොල් පාට සායත් සුදු පාට බ්ලවුස් එකත් ඇන්ද පසු ආවේ වෙනස්ම පෙනුමක්. හරිම චාම් පෙනුමක්. ඒ පෙනුම තමා තුලින් දකින්න ඇය ආසයි.

උපේක්ෂා බෝරිච්චි අත් දෙක මැද එල්ලා වැටෙන සුදු පටි දෙක ගැට ගහගන්න උත්සාහ කළා. ඒත් බෑ. ඒ පටි දෙක එකතු කරලා සපත්තු ගැටය දැම්මාමයි ලස්සන...

නොහිතපු විදිහට උපේක්ෂාගේ දෙනෙත් තෙත් වුණා. ඔහු මේ ඇඳුම අද අරන් නොදුන්නා නම්... ඇඳගෙන යන්නට වෙන්නේ මේ ඊයේ සිට ඇඳගෙන නිදාගත්ත පොඩි වූ ඇඳුම පිටින් නේද කියලා ඇය හිතුවා. එහෙම දේවල් පේන්නේ තාත්තලාට. උපේක්ෂා දෙනෙත් තෙත මාත්තු කරගෙන ඇඳ උන් ඇඳුම නවලා ඔහු ඇඳුම් ගෙනා බෑගයට දමා ගත්තා.

හිගන්නියකට මීට වඩා වත්කමක් තියෙනවා කියලා උපේක්ෂාට හිතුණා. ඇය කොණ්ඩය පීරගෙන බෑන්ඩ් එක දාගත්තා. මූණ දැන් එළියයි. ඊටත් පස්සේ ඇය පුංචි දුවෙක් වගේ ඇඳ උඩ වාඩිවෙලා ඔහු එන තුරු බලා උන්නා.

ඔහු කාමරයට ගොඩ වූ වහාම බැලුවේ ඇඳුම දිහාව... උපේක්ෂා ඇඳෙන් නැගිටලා ලැජ්ජාවෙන් බිම බලාගත්තා. කෙල්ල ලස්සනටම පේන්නේ දැන් කියලා තාරකට හිතුණා. පපුව හාරාගෙන එන ලෝබකම ඉදිරියේ ඔහු අසරණ වුණා.

"මේ..ක ගැට ග..හ..න්..න ඕ..න..."

තාරක කෙල්ල ළඟටම ඇවිත් කිව්වා.

"බැ..ලු..වා.. අ..මාරුයි..."



www.sinhalaelibrary.com

"කෝ..."

ඔහු ඇගේ බාහුවට දෑත ගෙනිච්චා... ඒ දෑස් බිමට බරවුණා. ඒ අවසරයෙන් ඔහු ළං ළංව ඒ මුහුණ දැකගත්තා.

"කෝ.. අනිත් පැ..ත්..ත..."

තාරක කෙල්ලව අනිත් පැත්ත හැරෙව්වේ දෑතම ඇගේ උරතල වලට තියලා. දෑතේම පටි ගැට ගහලා තාරක බැලුවා.

"උපේක්ෂා..."

ඔහු හැරී මෘදුව කතා කළේ. මුහුණම නොසෙල්වී තිබියදී ඒ දෑස් පමණක් එසවුණා. තාරකගේ පපුව ඇවිලිලා වගේ ගියා. මේ ඇස් ජීවිතේ කවදාහරි දැකලා තියෙනවා. ඒත් කවදද...

"අ..යියේ..."

"මො..නව හ..රිම ක..රමු... කොළඹට යනකං කිලෝ මීටර් දෙසීය ගාණක් තියෙනවනේ... මොනා හරි හිතමු..."

"ම..."

"කො..හොම උ..න..ත් ඔයාව මහ පාරක ආලා යන්නෑ... තේරුණාද.. ම..."

උපේක්ෂා අමාරුවෙන් හිස වැනුවා.

"මො..න දේටත් වඩා ජීවිතේ වටිනවා... පොරොන්දු වෙන්න අමාරුවෙන් හරි හිත හදාගෙන ජීවත් වෙන්න බලනවා කියලා..."

තාරක සුරත දිගු කළා... ඇය තුනී සිනහවක් දෙතොලතර තියාගෙන ඒ සුරත මතට සුරත තිබ්බා...

"පො..රො..න්..දු වෙ..න..වා අ..යියේ..."

උපේක්ෂා උගුරෙන් වගේ කිව්වා.

"රයිට්... මං චේන්ජ් එකක් දාගෙන එ..න්..නම්... අපි යන ගමන් කමු..."





තාරක ඇඳ මත තමාට අඳින්නට ඇය දමා තිබූ ඇඳුම් දෙස බලා උන්නා. කලිසමත් කමිසයත් විතරක් නෙමෙ... යට ඇඳුමක් පවා ඇය ඒ මත දමා තිබුණා. තාරකගේ දෙනෙත් එසවුණා.

08

කඳපොල පාර දිගේ තාරක පදවාගෙන ආ වාහනය කොළඹ වෙත යන පාරට දැම්මෙ ග්‍රෑන්ඩ් හෝටලය අසළ වූ වටරවුමෙන්. එතනින් ගනිද්දි තාරකට ඉබේටම වගේ එදෙස බැලුණා.

"උපේක්ෂා..."

"අ..යියේ..."

"හෝ..ට..ලේ දිහා බලන්න..."

ග්‍රෑන්ඩ් හෝටලයේ දොරකඩ පාරට හොඳින් පෙනෙයි. එදෙස බලද්දී උපේක්ෂාගේ දෙපතුල් සීතල වීගෙන ගියා. පොලිස් ජීප් රථ දෙකක් තිබුණේ හෝටලය ඉදිරිපසමයි. ඒ පිටුපස තිබුණේ රංගගේ ජීප් රියයි...

"ඒ තියෙන්නෙ එයාගේ ජීප් එකද..."

"ඔ..ව්..."

තාරක වේගයෙන් වාහනය පදවාගෙන ආවා. මඟදිත් ටිකක් පරිස්සම් වෙන්නට ඕනා.

"අපි ඊ ආ..වේ ඇයි කියලා දැන් තේරෙනවා නේද..."

"අ..යි..යා... මාව බේරගත්තා... ඒ..කට කොහොම..."

කියන්නට ගිය දේ උපේක්ෂා ගිල ගත්තා.

"හිටියනම් මගේ කාමරේ ඉඳලා ලස්සනට ඔයාව අරගෙන යයි... කෝකටත් උපේක්ෂා අපි වෙන පාරකින් නුවරට ආලා යන්..."

"අ..යියට කර..දරයක් නේ..ද..."



www.sinhalaelibrary.com

තාරක සිනාබරව ඇය දෙස බැලුවා.

"උපේක්ෂා පිට කෙනෙක් කියලා මට හිතෙන්නෑ... මගේ කවුරු හරි කියලා මට හිතෙන්නේ... තමන්ගේ අය ඉතින් කරදර කරනවා නම් තමා..."

ඒ කතාව පුදුමාකාරයි. ඇය ඔහු දෙස බලාගෙනම උන්නා...

"බ..ඩ..ගි..නිද..."

ඔහු කරුණාබරව ඇහුවා.

"න්..නෑ අයියේ..."

"පු..දුම බ..ඩක්නේ ඔයාට තියෙන්නේ... කොයිවෙලේ ඇහුවත් බඩගිනි නෑ... මට නම් උපේක්ෂා නිතරම බඩගිනි එනවා... වඩයක් හරි තේකක් එක්ක කන්නෝන..."

උපේක්ෂා අහගෙන උන්නේ ආශාවෙන්.

"උපේක්ෂා මං ගැන මොනවත්ම දන්නෑනේ..."

"ද..න්..න..වා අ..යියේ..."

ඔහු කෙල්ල දෙස බැලුවේ පුදුමයෙන්.

"ද..න්..නවා..."

"ඔ..ව්..."

"මො..නාද ද..න්..නේ..."

"ගො..ඩ..ක් හො..ඳ හ..රි උ..තු..ම් කෙ..නෙ..ක් කි..ය..ලා..."

උපේක්ෂා ඒ ඇස් දිහාම බලාගෙන කිව්වා. තාරක කතා කළේ නෑ. කෙනෙක් ගැන ඇත්තටම දැනගන්නවා කියන්නේ නම ගම විස්තර දැනගන්න එකට නෙමේ. කෙනෙක්ගේ ආත්මය ගැන දැනගන්න එකට... සමහර විට තමාව මේ ලෝකේ දැන් වැඩියෙන්ම දන්නේ ඇය වන්නට ඇති.

"මා..ව ක..වුරු..ත් එ..හෙම ද..න්..නෑ උපේක්ෂා..."





ලෝකය එහෙමයි. මුළු ලෝකයක්ම කෙනෙක්ගේ නොදකින පැත්තක් එක්කෙනෙක්ට පේනවා වෙන්න පුළුවන්.... ලෝකයටම වටින්නේ නැති කෙනෙක්ව එක්කෙනෙකුට විතරක් වටින්නේ ඒකයි.

"මං තාරක සෙනවිරත්න උපේක්ෂා... අපේ ගෙවල් තියෙන්නේ කොළඹ නාරාහේන්පිට..."

"නා..රා..හේ..න්..පිට..."

"ඔව්..."

"අ..පේ ගෙ..වල් තියෙ..න්නේ නා..ව..ල..."

තාරක සිනාසුණා.

"මං උපේක්ෂාව දැකලත් ඇති එ..හෙ..න..ම්..."

"ම..ට..ත් අයියව පුරුදුයි..."

"ගිය ආත්ම වලත් දැකපු අය ඉන්නවනේ..."

"සමහර විට එහෙම වෙන්න ඇති..." උපේක්ෂාට හිතුණා.

"මට එක අක්කා කෙනෙක් ඉන්නවා... එයා මැරි කරලා දැන් ඉන්නේ දෙහිවල... තාත්තා බිස්නස් කරන්නේ... අම්මත් එක්ක තමා මං ගොඩක් කිට්ටු... මං යාළුවෙලා ඉන්නේ දිල්කි එක්ක... ඔය කතා කරන්නේ... එයා අපේ පවුලට හිතවත්ම පවුලක දුවෙක්... ගෙවල් වලින් කතා කරලා අපිව ප්‍රපෝස් කළා... මාත් ඔහේ කැමති උනා... දන්න කෙල්ලනේ... මේ දවස්වල වෙඩින් එකට ලෑස්ති වෙනවා... දිල්කිගේ තාත්තා අසනීප වෙලා හිටියා... නැත්නම් මෙලහකට අපි බැඳලා... එයා හරි වෙනස් කෙනෙක්... වරදක්ම නෙමේ... කොළඹ ඉන්ටර්නැෂනල් ස්කූල් එකකට ගියේ... වෙනස් විදිහට හිතන්නේ... මාත් ඉතින් ඒ විදිහට ටික ටික පුරුදු වෙනවා... ඔවා තමා මගේ විස්තර..."

උපේක්ෂා ඔහු දෙසම බලා උන්නා. ඔහු කොළඹ හොඳ වැදගත් පවුලක කෙනෙක් කියලා කොහොමත් උපේක්ෂා දන්නවා.



www.sinhalaelibrary.com

"උපේක්ෂාට කොළඹ යන්න බයද..."

උපේක්ෂාට හිතා ගන්න බෑ. කොළඹ යන එක නෙමේ ප්‍රශ්නේ... කොළඹ ගිහින් කොහෙද ඉන්නේ කියන එකයි...

"එක පුංචි විසඳුමක් නම් තියෙනවා උපේක්ෂා... ටික කාලයකට... බලමු..."

එහෙම කියලා තාරක ඔහුගේ ජංගම දුරකථනය අතට ගත්තා. ඔහු කාට හරි අමතන්න යන බව ඇය දන්නවා...

"මනෝජා ඇන්ටි... මම තාරක..."

උපේක්ෂා ඔහු දෙසම බලා උන්නා. ඔහු මේ දුක විඳින්නේ තමා වෙනුවෙන් කියලා ඇය දන්නවා.

"කො..හොමද පුතා..."

"ඇන්ටිට දැන් සනීපයි නේද..."

"අනේ සනීපයි පුතේ... ඔයා මට කරපු උදව්ව මං කවදාවත් අමතක කරන්නෑ..."

ඇය අසනීපයෙන් සිටිද්දී ඇයව කොළඹ පෞද්ගලික රෝහලකට ඇතුල් කළේ තාරකයි.

"ඒක මොකක්ද ඇන්ටි..."

"එ..හෙම කියන්නෙපා පුතා... මං තා..නිවෙච්ච දු..ප්පත් ගෑණි... අන්කල් නැති උනාට පස්සේ මං වින්ද දුක මායි දන්නේ... අසනීප වෙද්දී බැංකු පොතේ තිබ්බේ රුපියල් හත්සීයයි පුතේ... ඔයා මගේ හොස්පිට්ල් බිල ගෙවලා අරන් යද්දී මට ඇඬුණේ ඒකයි..."

"එ..හෙම නොකර කොහොමද ඇන්ටි... අම්මා කියන්නේ ඇන්ටිලු මාව ගෙදර නැවතිලා හැදුවේ... මගේ චූ කක්කා හිටන් පුතෙක්ගේ වගේ ඇඳපු ඇන්ටිට එහෙම කරනවද..."

උපේක්ෂා සියල්ල හොඳින් අසාගෙන උන්නා.





"ම..ට ද..රුවෙක් නෑ තමා පුතා... ඒත් ඇ..න් ම..ට දරු සෙනෙහස හරියට දැනෙනවා..."

"ඇන්ටි බයවෙන්නෙපා... මං ඔයාට ඉන්නවා... ඇන්ටි මොනාද මේ දවස්වල කරන්නේ..."

"මං පුතේ මේ වෙඩි බෙයාලා මහ මහ ඉන්නවා ඉතින්... අද මේ උදෙන්ම අලුත් බනිලා ටිකක් මහන්න ගත්තා..."

"තනියම..."

"අ..න්..කල් ඇවිත් ළඟ ඉන්නවා වගේ පුතා... දැන් ඉතින් කවුරු ජීවිතේට එන්නද..."

තාරක වාහනය පාර අයිනක නවත්වා උපේක්ෂා දිහා බැලුවා. තාම ඔහු ඉන්නේ දුරකථනය කනේ තබාගෙන.

"ඇ..න්ටි..."

ඔහු කතා කළේ වෙනස්ම හඬකින්.

"ම..ට අද ඇන්ටිගෙන් ලොකු උදව්වක් ඕන... ජීවිතේටම අමතක වෙ..න්නේ නැති උදව්වක්... මට මේ උදව්ව ඉල්ලන්න ඉන්නේ ඇන්ටි විතරයි..."

"මං ඒ උදව්ව චූටි පුතාට කළා කියලා හිතාගන්නකෝ..."

තාරකගේ මුවඟට හීන් හිනාවක් නැඟුණා.

"ඇන්ටි... මං ළඟ මේ වෙලාවේ ගෑණු ළමයෙක් ඉ..න්..නා..වා... හරිම අහිංසක හොඳ ගෑණු ළමයෙක්... දිල්ගේ වයසෙම වගේ..."

"ම්..."

"මං දන්නවා ඇන්ටි මාව කවදාවත් වරදවා තේරුම් ගන්නෑ කියලා..."

"ඔ..යා නරක කොල්ලෙක් නෙමේ... ඇත්තටම කිව්වොත් ඔයා දිල් වගේ කෙල්ලෙක් බඳිනකොට මට ලෝබයි..."

www.sinhalaelibrary.com

තාරක කතා කළේ නෑ.

"ඉතින් පුතේ..."

"ඒ ළමයා තනිවෙලා ඇන්ටි ඉන්නේ... ජීවිතේ පොඩි පොඩි කරදර වගයක් නිසා... මං දන්න ළමයෙක්... ඉතින් දැන් ගෙදර ඉන්න බැරි තත්වයක් ඇතිවෙලා තියෙන්නේ... මං ඒ ළමයට උදව් කරන්නම ඕන..."

උපේක්ෂාගේ දෙනෙත් තෙත්ව ගියා. ඔහු තමා ගැන කතා කරන්නේ කොච්චර හැඟීමෙන්ද කියලා ඇය දන්නවා. ඒත් මේ පපුව හාර දමන හැඟීමක්.

"මේ ගැණු ළමයෙක් නිසා ම..ට ආරක්ෂාවක් නැති තැනක නතර කරන්නත් බෑ..."

"ම..ට තේරෙනවා පුතා... කෙල්ලව එක්කගෙන එන්න..."

මනෝජා එහෙමම කිව්වා... තාරකට මොහොතක් කතා කරගන්න බැරි වුණා.

"ක..ම..ක් නෑ නේද ඇන්ටී..."

"එ..ක්..කං එ..න්න පුතා..."

"තැන්කියු ඇන්ටි..."

"මං කෙල්ලව බලාගන්නම්... කෙල්ල ඔයාගේ කවුරු උනත් කමක් නෑ... එක්කං එන්න..."

"මං එ..න්..නම් ඇන්ටි... බු..දු සරණයි..."

"බුදු සරණයි පු..තා..."

තාරක දුරකථනය තියලා දිග සැනසුම් සුසුමක් හෙළුවා. මේක පුදුමාකාර සැනසීමක්. තාරක එහෙමම ඇගේ හිසට අත තිබ්බා. කෙල්ල අඬනවා.

"ඇ..යි මේ..."

"මං නිසා..නේ මේ දු..ක..."





ඒ ඇඬුම පුදුමාකාරයි. තාරක ඒ හිස මෘදුව පිරිමැද්දා...

"අඬන්නෙපා... ඔයා හිතන තරම් පව්කාර නෑ... මං ඔයාව අම්මා කෙනෙක් වගේ කෙනෙක් ළඟට එක්කං යන්නේ... අපි එහෙට ගිහින් පස්සේ හිතමු කරන දෙයක්... හොඳද..."

කෙල්ල හිස වැනුවේ අසරණව...

"අපි මොනා හරි දැන් බඩ පැලෙන්න කමුද උපේක්ෂා නෝනා... මාර බඩගිනියි..."

ඔහු කියද්දී ඇය කඳුළු අතරින් සිනාසුණා.

තාරක උදේට කන්න නැවැත්තුවේ නුවර පාරේ තිබ්බ පුංචි අවන්හලක් ඉදිරියේ. සීතලට මහ පුදුමාකාර බඩගින්නක් එනවා. ඒටත් දැන් හිතට ටිකක් නිදහස්. අද මේ කෙල්ලව කොහේ හරි මඟකින් දමා ගියා නම් පුදුමාකාර දුකක් බරක් හිතට එකතු වෙන බව තාරක දන්නවා. දැන් ඒ බර නෑ.

"මො..නාද උපේක්ෂා කන්නේ..."

පුංචි මේසයට බර වෙද්දී ඔහු ඇහුවා. මෙතනට කඳු යාය ලස්සනට පේනවා. තාම කඳුකරයේ මීදුම් පහව ගිහින් නෑ. රැක් පුරා ළඟ උන්න පෙම්වතාගෙන් පාන්දර හිමිහිට රෑ ඇඳුමත් අරගෙන යන්න හදන පෙම්වතියක් වගේ මීදුම් පොකුරු හිමි හිමීට උඩට ඇදෙනවා. මේ මීදුම් ඉර පායද්දී ටික ටික දිය වෙලා යයි... ඒත් ඒ දියවෙන මීදුම් හවස් වෙද්දී ආයෙත් කඳු වටා එතෙනවා.

"අ..යි..යා ක..න දෙ..ය..ක් ක..න්නම්..."

"අද නම් දරුවෝ හොඳට කන්නෝන... ඊයේ රෑටත් කෑවේ නෑ..."

උපේක්ෂා හිස වැනුවා.

"මොනාද බ්‍රේක්ෆස්ට් ගන්න තියෙන්නේ..."

තාරක සුදු ඇඳගෙන හිටිය වේටර් වරයාගෙන් ඇහුවා... ඔහු මේසය

දෙපැත්තේ උණු වතුර වීදුරු දෙකක් තිබ්බා. ඒ වලින් යංතමට දුම් ආනවා.

"ඉඳි ආප්ප තියෙනවා සර්..."

"එහෙනං ඉඳි ආප්ප ගේන්න කරි එක්ක..."

"සර් ෆිෂ් කරිද චිකන් කරිද..."

"ෆිෂ් කරි හොඳයි..."

එළිමහනේදී කෙල්ලව හෝටලේ ඇතුලේ උන්නාටත් වඩා ලස්සනට පේනවා. ඒත් ගෑණු ළමයෙක් දිහා එහෙම ලෝබකමින් බලන්න හොඳ නෑ. පිරිමි ඇස් වලට හරි ඉක්මනට පෙරේත පාට එනවා.

"උපේක්ෂා..."

"අ..යියේ..."

"මනෝජා ඇන්ටි කියන්නේ අපේ පවුලට හිතවත්ම ඇන්ටි කෙනෙක්... ඔක්කොටම වඩා මට හරි හිතවත්... අම්මගේ හොඳම යාළුවෙක්... මාව පුංචි කාලේ මනෝජා ඇන්ටි බලාගෙනත් තියෙනවා... ඒ ඇන්ටිගේ අන්කල් නැතිඋනා... දෙන්නට ළමයි හිටියේ නෑ... ඒ නිසා අන්කල් නැතිඋනාට පස්සේ මනෝජා ඇන්ටි තනිවුණා... ගෑණි ජීවත් වුණේ ඔය ටෙඩී බෙයාර්ස්ලා හදලා.., හරි ලස්සනට ඒවා හදනවා... ගෙදර හාවෝ ටෙඩී බෙයාර්ස්ලා පිරිලා... මේ ළඟදි ඇන්ටිගේ ෂුගර් වැඩිවෙලා අසනීප උනා... ඒ වෙලාවේ ඇන්ටි කතා කලේ මට... අ..නේ චූටි පුතේ මාව චුට්ටකට ඩොක්ටර් ගාවට එක්කගෙන යන්නයි කියලා... මගේ පපුව පිච්චිලා ගියා... මං එහෙමම ඇන්ටිව ඩොක්ටර් ළඟට එක්කගෙන ගියා... ඩොක්ටර් බලලා කිව්වේ ඉක්මනට ඇන්ටිව හොස්පිටල් ඇඩ්මිට් කරන්න කියලා... ගෑණිට ඇඬුණා... පස්සේ මම හොස්පිටල් නැවැත්තුවා... උදේ හවා බලන්න ගියා... අන්තිමට සනීප වෙලා ඩිස්චාජ් කරගෙන ගෙදර එක්කගෙන ආවෙත් මම... එදා මගේ අත් දෙක අල්ලගෙන ඇඬුවා..."





උපේක්ෂා සියල්ල අහගෙන උන්නා... ඒ දුප්පත් ඇන්ටි වෙන මොනවා කරන්නද...

"මේ ලෝ..කේ අ..ය එ..හෙම ක..ර..න්..නෑ අයියේ... පැනඩෝල් පෙ..ත්..ත..ක් අ..ර..න් දෙ..න්..නෑ තමන්ට දෙයක් නැ..ත්..න..ම්..."

"ජීවිතේ හරි පුදුමයි උපේක්ෂා... එ..දා මනෝජා ඇන්ටිට එහෙම නොකළා න..ම්.. මං කොහොමද අද එයාගෙන් මේ උදව්ව ඉල්ලන්නේ..."

"ඒ උ..ද..ව්..ව..ත් අ..යි..යා ඉ..ල්ල..න්..නේ අ..යියා වෙ..නු..වෙන් නෙ..මේ..නේ..."

"අපි එහේ ඉමු... හිමිහිට බලමු ඊට ප..ස්සේ... මනෝජා ඇන්ටි හ..රිම හො..ඳ කෙ..නෙ..ක් හරි කරුණාවයි..."

"මං.. ඉ..ක්..ම..නට තීර..ණ..ය..ක් ග..න්..නම් අ..යියේ..."

තාරක හිනාවුණා.

"ජීවිතේ තීරණ එ..හෙම ඉ..ක්මනට ග..න්..නෙපා උපේක්ෂා... ප..ස්සේ පසුතැවෙන්න වෙනවා..."

දුම් දමන ඉඳි ආප්ප බන්දේසියකුත් ඒ වගේම දුම් දමන මාළු කරියකුත් වේටර් වරයා ගෙනත් තිබ්බා...

"ස..ර් අ..ල කරියයි පොල් සම්බෝලයි ගේනවා..."

"ඉ..ක්මනට ගේන්න..."

ඔහුට බෙදුවේ උපේක්ෂා... දුම් දමන ඉඳි ආප්ප ඇය මේ දැක්කමයි. නුවර එළියේදී මෙහෙම උණුවෙන් කැවේ නැත්නම් කන්න බෑ. ඉක්මනට කෑම සීතල වෙනවා...

"එක වසරේ ළමෙක්ද පහක් කන්නේ..."

උපේක්ෂා ඇගේ පිඟානට ඉඳි ආප්ප පහක් පමණක් බෙදා ගනිද්දී ඔහු බෑණලා තව ඉඳි ආප්ප පහක් දැම්මා. පුදුමයි. ඇයට හිතුණේ එපමණයි.



www.sinhalaelibrary.com

"ඉ..ති..න් ක..න්..න ළ..ම..යෝ..."

කෙල්ල නොකා ඔහු දිහා බලාගෙන ඉද්දදී තාරක කිව්වා.

"උපේක්ෂා..."

"අ..යියේ..."

"මං කොළඹ ගියාම නව ඇඳුම් ටිකක් අරන් දෙන්නම්... යට ඇඳුම් මො..නවත්ම නෑනේ.. නේ..ද..."

කෙල්ල අසරණව ඔහු දිහා බැලුවා.

"අ..යි..ය..ට මෙ..ච්..චර ව..දය..ක් දෙ..න්..නේ කො..හො..ම..ද..."

"ඒක වදයක් නෙමේ ළමයෝ... එහේ ගියාම ඔයාටත් පුළුවන් ටෙඩි බෙයාර්ලා හද හද ඉන්න... ඇන්ටි උගන්නයි..."

"මං ආ..ස..යි..."

"ටෙඩී බෙයාර්ලටද..."

"ම්..."

තාරක හිනාවුණා... ගෑණු ළමයින්ට තියෙන්නේ පුදුමාකාර ගතිගුණ කියලා ඔහුට හිතුණා.

"අපට කෝපි ටිකකුත් ගේනවද..."

උපේක්ෂා ඉඳි ආප්ප දහය කෑවේ ඔහු බලාගෙන ඉන්න නිසාමයි. කටක් කන හැම වාරයකම ඔහු තම පිඟාන දෙස බලනා බව උපේක්ෂා දැක්කා.

මීලග **"සඳරාජිනී"** කලාපය සමග
තවත් රසබර කොටසක්...






www.sinhalaelibrary.com

# ආදරය ගින්දරක්

## සුජීව ප්‍රසන්න ආරච්චි



"ඇ[illegible] සුදු සිතයි [illegible]...
[illegible] ගිය කළ [illegible]
නිහඬම අතර...
නුසම ගන්නා [illegible] මැවීම
කොතරම් දුෂ්කර [illegible]...!
ඒ චරිතය ආත්මයක් ව [illegible] ලේ නහර
දිගේ හදවතේ කකියන [illegible] මනස ඒම
කොතරම් දුර්ලභද...
ඒ ආත්ම මනසෙ [illegible] සැනෙස නිවන සඳුන්
කල්පයක් [illegible]
කොතරම් [illegible]...
[illegible] ප්‍රසන්න ආරච්චි නම වූ මේ ආදරණීය
[illegible] සිංහල නවකතාවේ පහන්
[illegible] වන්නේ ඒ නිසාය...
[illegible] සැනසීමක් යන ප්‍රාර්ථනා
[illegible]...නිවනක්...
[illegible] පහන්...නොමැකෙනම සංවේදී
සංසිඳීමක්...එසේනම් සුජීව ප්‍රසන්න ආරච්චිගේ
නවකතාවක පිටු අතර තනිවෙන්න...ඔබේ
තනියට අහිංසක චරිත ටිකක් එයි...
මේ කුරිරු, විසරු නිරියන් අයම ලෝකයේ
පිළිවලින් අපිරිසුදු නොවූ ඒ
අහිංසක චරිත ඔබේ හදවතේ [illegible]
පවත මත ජීවත් වෙයි...
ඒ අත්දැකීම මහ [illegible]
දෙයක්...
එය පහදන්නට සිංහල වචන
ප්‍රමාණවත් නැ...
පෙරළන්න ඒ ආත්ම මනස
ගවඩාව....
සිංහල නවකතාවේ පහන්
පොකුරින්
ඔබේ ලෝකය එළිය වෙයි...."

**සුජීව ප්‍රසන්න ආරච්චි**

www.sinhalaelibrary.com


නවකතා
තිලිණය
03
පොත
ආදරය
ගින්දරක්
www.sinhalaelibrary.com
සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්

එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...

සුජීව ප්‍රසන්න ආරච්චි

තාරකගේ ජංගම දුරකථනය නාද වුණේ ඔහු කෝපි එක බොන්න ගනිද්දීමයි. ඇමතුම ගන්නට පෙර තාරක ඇමතුම කාගෙන්ද කියා බැලුවා. ඇමතුම ආවේ දිල්කිගේ නිවසින්. ඒත් මේ කතා කරන්නේ ඇය නෙමෙයි කියලා තාරක දන්නවා. දිල්කි කවදාවත් ගෙදර ෆෝන් එකෙන් ගන්නෑ. ඇය ගන්නේ ඇගේ ජංගම දුරකථනයෙන්.

"හෙ..ලෝ..."

තාරක කතා කළා...

"පුතා මං ඇන්ටි කතා කරන්නේ..."

ගැණිගේ කටහඬ එච්චර හොඳ නෑ. දිල්කි ප්‍රශ්නය ලස්සනට අම්මට කියන්න ඇති.

"ආ ඇන්ටි කියන්න..."

"මො..නවද පුතා මේ කරන්නේ.. කොහෙද ඔයා ඉන්නේ..."

මෙහෙම කතා කරනවට තාරක කැමති නෑ. තාම කසාද බැඳලා නෑ. එහෙම එකේ කෙල්ලගේ අම්මටත් උත්තර දෙන්න යන්නේ මොකටද...

"ඇයි ඇන්ටි මං මොනාද කළේ..."

තාරක ඇහුවේ තරහින්...

"එහෙනම් මේ දිල් කියන්නේ..."



"නුවරඑළි ආව වැඩකට ඊ වුණා නැවතුණා... දැන් මේ කොළඹ එනවා... එච්චරයි... දිල්ට පිස්සු... ඇන්ටිට කියන්න තරම් දෙයක් උනේ නෑ..."

කතා කරන්නේ ඔහුගේ පෙම්වතියගේ අම්මා වෙන්න ඇති කියලා උපේක්ෂාට නිකමට හිතුණා. උපේක්ෂා නැගිටින්න හැදුවේ ඔහුට නිදහසේ කතා කරන්න දෙන්නෝන නිසා... ඒත් නැගිටින්න ගිය කෙල්ලව ඔහු අතින් අල්ලලා නැවත ඉන්දවලා කෝපි එක පෙන්නුවා.

මේ පුදුමාකාර ගතිගුණ... ජීවිතේ කවදා හෝ අත්වින්ද බවක් ඇයට දැනෙනවා. ඒත් ඊ මේ ආත්ම භවයෙදි නෙමේ.

"කොහොමත් හවස මේ පැත්තේ එන්නකෝ..."

"මට අද මහන්සියි ඇන්ටී... මම මෙහෙමම ගිහින් නිදාගන්නවා..."

"එහෙනම් ඊ වෙලා අපි එහේ එන්නම්කෝ... දැන් ඔයා කොහෙද ඔය..."

"මං මඟ ඇන්ටී... කොහෙද කියලා පේන්නෑ..."

තාරක දුරකථනය තිබ්බේ එහෙම කියලා. ඔහු උන්නේ ටිකක් තරහින් කියලා ඇය දන්නවා.

"අ..ඩියේ මේ කෝ..පි එ..ක..."

"අම්මටයි දුවටයි දෙන්නටම පිස්සු..."

ඔහු තනියෙන් බණිනවා.

"අපි අතර ප්‍රශ්නයක් උනාම කියමු... ඒත් ඒක මොකටද අම්මට කියන්න යන්නේ..."

මේ වලට මොනා කියන්නද කියලා උපේක්ෂාට තේරෙන්නෑ. නැවතත් දුරකථනය නාද වුණා. එවර ගත්තේ දිල්කි. තාරක වේගයෙන් ඇමතුම සම්බන්ධ කර ගත්තා.

"මො..නාද මේ කරන වැඩ දිල්..."



www.sinhalaelibrary.com

"මො..නා..ද මං කරපු දෙයක් නෑ..."

"අනිත් දවසේ අම්මට කියලා මට ෆෝන් කරවන්නෙපා... කියන්න තියෙන දෙයක් මට කියන්න..."

"හරි හරි... දැන් කොහෙද ඉන්නේ..."

"මං දන්නෑ..."

"එන ගමන් මේ පැත්තෙන්ම එන්න..."

"ඇයි ඉතුරු ටිකත් අම්මා ලව්වම කියන්නද..."

"මොකද ඔච්චර කේන්ති ගන්නේ... මොනාද ඔයාට වෙලා තියෙන්නේ..."

තාරක කතා කළේ නෑ. කතා කළොත් මොනවා කියවෙනවද කියලා ඔහුම දන්නෑ. ජීවිතේ එහෙම ප්‍රශ්න හදාගන්න ඔහු කැමති නෑ.

"එන ගමන් එන්න බැරිනම් රෑට ඩිනර් ගන්න එන්න... අද අම්මා ස්පැගටි හදනවා..."

"මං නිදාගන්නවා දිල්... මොන ස්පැගටිද..."

ඒත් සමගම වේටර්වරයා පැමිණ මෙසයේ තිබූ පිඟන් කෝප්ප එකතු කළා.

"මිස් කොෆි එක ගන්නද..."

වේටර්වරයා ඇසුවා. උපේක්ෂා කතා නොකර හිස සැලුවා.

"තාරක..."

දිල්කි අමුතුම හඬකින් ඇසුවා.

"ඇයි..."

"ඔ..ය නා..ම හොටෙල් එකේද..."

"නෑ මේ මඟ... කන්න නැවැත්තුවා..."

"කවුද ඉ..න්නේ ඔතන..."

"මේ කට්ටිය ඉන්නේ ඕන තරම්..."





"වේටර් මිස් කිව්වේ කාටද..."

තාරකට උපේක්ෂා දෙස බැලුණා.

"කවුද දන්නේ දිල්..."

"හ..රි ඔයා එ..න්..න..කෝ..."

"ඔ..කේ..."

තාරක එහෙමම දුරකථනය තියලා දිග සුසුමක් හෙළුවා. ඔහු තමා නිසා ලොකු ප්‍රශ්නයකට හිරවෙලා ඉන්න බව උපේක්ෂා දන්නවා.

"අපි යං උපේක්ෂා..."

"ම..."

වාහනයට නැගලා සෑහෙන දුරක් යන තෙක් ඔහු කතා කළේ නෑ.

"අ..යි..යේ..."

"ම..."

"කො..ළ..ඹ..දි..."

"ම..."

"නෑ මෙ..හෙම අ..යිය..ගේ වාහනේ මං ය..න එක හො..ඳ නෑ නේ..ද..."

උපේක්ෂා එහෙම අහද්දී තාරකට දුක හිතුණා. කෙල්ල කතා කරන ඒවා අහගෙන ඉඳලා බයවෙලා කියලා තාරක දන්නවා.

"උපේක්ෂා..."

"ම..."

"දැන් අපි දෙන්නා අර මහ වැස්සේ... එක කාමරේක... එක ඇඳක් උඩ එකම බ්ලැන්කට් එක පොරවගෙන රෑ හිටියා..."

"ඔ..ව්..."

"මොනවා හරි නරක දෙයක් උ..නා..ද..."

කෙල්ල හරි හත්තියෙන් නෑ කියන්න වගේ හිස දෙපසට වැනුවා.



www.sinhalaelibrary.com

"එ..එ..වරයි... අපි ය..න්... ඔයාව මනෝජා ඇන්ටිට බාර දීලා තමා මං ගෙදර යන්නේ... තේරුණාද..."

මෙහෙම තමාව ආරක්ෂා කරන්න ඔහුත් තමාත් අතර තියෙන බැඳීම මොකක්ද... ඒ බැඳීමට නමක් නෑ. ඒත් ගෙවුණු පැය දහය පහළොව පුරා මොනවා නමුත් ලොකු බන්ධනයක් ජීවිතේ ඇතිවුණා වගේ හැඟීමක් ඇයට දැනෙනවා.

"උපේක්ෂා ගෙදරින් එළියට නම් බහින්න බැරිවෙයි ටික කාලයක්..."

"මං මො..න..වා හ..රි හි..ත..න්..නම් අයියේ..."

"ම.. හිතලා කියන්නකෝ... පුළුවන් උදව්වක් මාත් කරන්නම්..."

ඔහු කරන්නේ කෙනෙකුට කරන්න පුළුවන් උදව් නොවේ. සාමාන්‍ය කෙනෙක් නොකරන තරම් උපකාර. ඒ පිහිට දෙවියෙක්ගෙන් මිසක ජීවත් වෙන කෙනෙක්ගෙන් කෙනෙක් ඉල්ලන්නෑ. දෙන්නෑ කියලා දන්න නිසා.

**** **** **** ****





www.sinhalaelibrary.com

**මනෝජා** උන්නේ බත්තරමුල්ලේ දියවන්නා වෙල් යාය කෙළවර තනි තට්ටුවේ පුංචි ගේක. ඒ නිවස වෙත යන්නට තිබ්බේ දියවන්නා වෙල් යාය මැදින් ගුරු පාරකින්. ගුරු පාරේ යද්දී පාට පාට බෝගන්විලා මල් ගස් වලින් වටවූ පුංචි උළු ගේ පේනවා. මේ ගෙදරට තාරක හරි ආසයි. ඔහු මේ ළඟින් යනව නම් මේ ගෙදරට ගොඩවෙලා තේකක් බීලා යන්න කවදාවත් අමතක කරන්නෑ. නිවස ඉදිරිපිට මිදුල කෙළවර මායිමෙන් එහා තියෙන්නේ දියවන්නා වෙල් යාය. මිදුලේ බෝගන්විලා අතර ඉඳගෙන වෙල් යාය දිහා බලද්දී හිතට එන්නේ හරි නිව්ච්ච හැඟීමක්.

"උපේක්ෂා..."

"අයියේ..."

"අර තියෙ..න්..නේ මනෝජා ඇ..න්ටිලගේ ගේ..."

ජීවිතේ දුෂ්කරම දවස් ටිකක් ගත කරන්න ලැබෙන තැන හරි සුන්දරයි කියලා උපේක්ෂාට හිතුණා.

"හ..රි අ..හි..ංස..ක ගෙය..ක්..."

"එ..හෙ..ම හිතෙනවද..."

"ම්..."

"මටත් මේ ගෙදරට එන හැම වෙලාවෙම එහෙම හිතෙනවා..."

"උපේක්ෂාට කැමති කාලයක් මේ ගෙදර ඉන්න පුළුවන්... කලබල නොවී හිමිහිට හිතන්න... හිතන්නෝන කියලා හිතුවම උපේක්ෂා මොනවත් හිතන්නෑ... නිස්කලංකේ ඉන්නකොට තමා හිතෙන්නේ..."

ඔහු මෙහෙම මෙහෙම ජීවිතේ කියලා දෙද්දී ළඟින් ඉඳගෙන ඔහුගෙන් ජීවිතය ඉගෙන ගන්න ඇයට ආසයි.

"මා..ත් පුළුවන් වෙලාවට එන්නම් උපේක්ෂාව බලලා යන්න..."

තව ටික වෙලාවකින් ඔහු වෙන්ව යනවා නේද කියලා හිතද්දී උපේක්ෂාගේ දෙනෙත් යංතමට තෙත්ව ගියා. දැන් මේ මොහොතේදී මේ ජීවිතයේ දූන්න එකම නෑයා ඔහු. එකම මිතුරා ඔහු. ඒ නෑකම කොයි තරම් පිරිසිදු නෑකමක්ද... ඒත් ඒ තරම් පිරිසිදු වුණේ ඔහු නිසා.

තාරකගේ වාහනය මනෝජාගේ නිවසේ බෝගන්විලා ගස් අතර නැවතුණා. උපේක්ෂාට බැලුණේ ඔහු දිහාව. ඒ ඇස්වල කඳුළ...

"ඇ..යි ළ..ම..යෝ මේ..."

කෙල්ලට කතා කරගන්නට බෑ. ඊයේ රෑ වූ හමුවීම වගේම මේ පුංචි වෙන්වීමත් ඇයට දරාගන්නට බැහැ. තාරක ඒ ඇස්වලින් ගොඩක් දේවල් තේරුම් ගත්තා.

"මං උපේක්ෂාව බලන්න එන්නම්... මං ඉන්නවනේ... බයවෙන්නෙපා... බහිමු... ඔයා පර්ස් එක විතරක් අරන් බහින්න... මං ඇඳුම් බෑග් එක හදලා ගෙනත් දෙන්නම්... හොඳද..."

උපේක්ෂා තොල් පට තද කරගෙන හිස වැනුවා.

"බ..හි..මු..."

උපේක්ෂාත් තාරකත් බහිද්දීම වගේ මනෝජා ගෙයි ඇතුලේ ඉඳගෙන දොරකඩට ආවා.

මනෝජා උපේක්ෂා දිහා බැලුවෙත් උපේක්ෂා මනෝජා දිහා බැලුවෙත් එකම මොහොතෙයි. "ල..ස්ස..න කෙල්ලෙක්..." මනෝජාට ඇයව දුටු





හැටියේම හිතුණා. මනෝජා මිදුලට ආවේ සිනාසීගෙනමයි. ඇගේ මුහුණේ වූ කරුණාවන්ත පාට උපේක්ෂාගේ හදවතට තුනී සැනසිල්ලක් ගෙන දුන්නා.

"ම..නෝජා ඇන්ටි මේ උපේක්ෂා... උපේක්ෂා මේ තමා මනෝජා ඇන්ටි..."

උපේක්ෂා මිදුලේදීම ඇයට පහත් වී වැන්දා... මනෝජාගේ පපුව බුරුල් වීගෙන ගියා. ඇය එහෙමම උපේක්ෂාගේ උරතල වලින් අල්ලලා නැගිට්ටෙව්වා... තමාටත් දරුවෝ හිටියනම් අද මේ තරමම දුවෙක් ඉන්නවා නේද කියලා මනෝජාට හිතුණා.

"අපි ගෙට ය..න් පුතා..."

මනෝජා කිව්වේ කෙල්ලගේ හිස අතගාගෙනමයි. ඔහු කිව්වා හරි නිවස පුරාම ටෙඩී බෙයාර්ලා... හරියට පුංචි බබෙක් ඉන්න ගෙයක් වගේ. සාලයේ කොනක මේසයක බාගෙට නිම කළ බග්ස් බනී හාවෝ විස්සක් විතර උන්නා. ටෙඩී බෙයාර්ස්ලා, බනීලා, ට්‍රීව්ටිලා ඔක්කොම තමා දිහා හරි දුකෙන් බලා ඉන්නවා වගේ උපේක්ෂාට හිතුණා.

"ඉඳගන්න පුතා... ඔයත් ඉඳගන්න පැටියෝ..."

මනෝජා කෙල්ලගේ උරතල වලට දැත් තියලා කෙල්ලව වාඩි කෙරෙව්වා. කොණ්ඩය කොටට කැපූ සුදුම සුදු කාන්තාවක් වූ මනෝජා වෙතින් ආවේ හරිම සරල කරුණාබර පෙනුමක්.

"ඇන්ටි උපේක්ෂා මං හොඳටම දන්න ළමයෙක්... මේ දවස්වල උපේක්ෂාට පොඩි පොඩි ප්‍රශ්න ටිකක් තියෙනවා... ගෙදර ඉන්න බැරි තත්වයක් තියෙන්නේ..."

"ඒවා අපි පස්සේ කතා කරමු පුතා... ඔයාට ඕන උපේක්ෂාව මෙහේ නවත්ත ගන්නනේ... කෙල්ල මෙහේ ඉඳියි... මාත් තනියමනේ ඉන්නේ පුතා... අපි පුතේ මේ හාවෙක් හදාගෙන තේනක් බීලා ඉමු..."



www.sinhalaelibrary.com

උපේක්ෂා පොඩි ගෑණු ළමයෙක් වගේ හිනාවුණා. කෙල්ලගෙන් එන්නේ හරි පුදුම හුරු පුරුදු ගතියක් කියලා මනෝජාට හිතුණා.

"උපේක්ෂා හරි හොඳ ළමයෙක් ඇන්ටී... ඇන්ටීට ආදරෙන් ඉඳී..."

"මාත් හරි පාළුවෙන්නේ උන්නේ පුතා... දවල්ට නම් මේ හාවෝ හඳ හදවත් ඉන්නවා... හවස් වෙද්දී ඉතින් හරිම පාළුයි... ඉන්න මං බොන්න මොනා හරි හදාගෙන එන්න... පුතාලා කාලද..."

"අපි මඟින් කෑවා ඇන්ටී..."

මනෝජා කුස්සියට ගියාම තාරක ඉඳගෙන උන් පුටුවෙන් නැගිටලා ඇවිත් උපේක්ෂා ඉන්න සැටියෙන් ඉඳ ගත්තා.

"මනෝජා ඇන්ටී හොඳයි නේ..ද..."

"හ..රි හො..ඳයි... අයියට පින් මාව මෙහේ නවත්තනවම..."

"අම්මා කෙනෙක් වගේ ඔයාව බලාගනී... නිස්කලංකේ ඉ..න්..න... මං මෙ ගමන්ම ඇඳුම් ටිකක් ගෙනත් දෙ..න්..න..ම්..."

"අ..යි..යට කරදරයි..."

"උ..ඩ ඇඳුම් නම් මට ගාණට ගන්න පුළුවන්... යට ඇඳුමුත් බලලා ගන්නම්... සයිස් දෙක තුනකින්... ම්..."

කෙල්ලගේ දෑසින් කඳුළක් පැන්නා.

"මං.. ආ..ත්..ම ගා..ණ..ක් මේ ණය ගෙ..ව..න්..නම් අයියේ..."

"අද ඉඳලා අඬන්නෙපා..."

මනෝජා දෙන්නටම වැල් දොඩම් බීම දෙකක් හදාගෙන ආවා... සාලයට එද්දීම මනෝජා දැක්කේ දෙන්නා එක ළඟ ඉන්නා දර්ශනය. "තාරකට ගැලපෙන්නේ මේ වගේ කෙල්ලෙක්ව දිල්ව නෙමේ..." ඇය සිතින් කිව්වා.

"බො..න්..න පුතා.. මේ ගෙදර වැලේ පැහෙන්... හරි රහයි..."

උපේක්ෂා වැල් දොඩම් වීදුරුව ගත්තේ හරි කෘතවේදී විදිහට මනෝජා





දිහා බලලා.

"මං උපේක්ෂාට මේ කාමරේ ලෑස්ති කරලා දෙන්නම් පුතා... අපි හවස්වෙලා අස් කර ගමු කෙල්ලේ හොඳද..."

"හො..ඳයි ඇ..න්..ටි..."

"මං හවස් වෙලා ආයෙත් එනවා ඇන්ටී... උපේක්ෂාගේ ඇඳුම් සේරම අරගෙන... දැනට ඕක ඇඳගෙන ඉන්න උපේක්ෂා..."

කෙල්ල හිස වැනුවා.

"ඇන්ටී..."

"පුතා..."

"මේක ඇන්ටී වියදමට තියාගන්න... ගෙදරට බඩු ටිකක් එහෙම ගන්නෙපැයි..."

"ක..ම..ක් නෑ පු..තා... මං ගා..ව..ත් තියෙනවා..."

"ඇන්ටී මේක ගන්නකෝ..."

තාරක යන්න නැගිට්ටා. පපුව කඩාගෙන යනවා වගේ ඇයට දැනුණා. ඒක පුදුමාකාර හැඟීමක්. එහෙම දැවිල්ලක් මින් පෙර දැනිලම නෑ.

"ප..රි..ස්..ස..මින් ඉ..න්..න... ඕන දෙයක් ඇන්ටීට කියන්න... මේ මගේ දෙවෙනි අම්මා..."

එහෙම කියද්දී මනෝජාගේ දෑස් තෙත්වෙලා ගියා.

"මං ගිහින් එ..න්..නම්..."

කෙල්ල එහෙමම සාලේ දණ ඔබලා තාරකට වැන්දා. තාරකට බැලුනේ මනෝජා දිහාව. "බලන්න" කියන්නාක් බඳු බැල්මක් ඒ ඇස්වල තිබ්බා.

"අද ඉඳලා ජීවිතේ අලුතින් පටන් ගන්න... අපි ඔයාට උදව් කරනවා.. හොඳද... අඬන්න බෑ..."

"කෙල්ල ගිනාවෙලා ඉඳී... මං බලාගන්නම් පුතා... ඔයා



www.sinhalaelibrary.com

බයවෙන්නෙපා..."

"මේක ඇ..න්ටී අපි තුන්දෙනා විතරක් දැනගත්තම ඇති..."

"ඒක එහෙමම වෙන්නෝන... පුතා ඒක හිතන්නෙපා..."

තාරක නැවත වතාවක් ඒ අසරණ අහිංසක දෑස් දෙස බැලුවා. දමා යන්නට නොහිතෙන තරම් හැඟීමක් ඔහුට එනවා.

"බු..දු ස..ර..ණයි..."

"බුදු සරණයි අයියේ..."

තාරකගේ වාහනය දියවන්නා වෙල් යාය මැදින් වැටුණ පාරේ නොපෙනී යනතුරු උපේක්ෂා දොරකඩට වී බලාගෙන උන්නා. එහෙමම ඇගේ දෙනෙත් කපාගෙන කඳුළු කැට දෙකක් ගලාගෙන ගියා. කාලාන්තරයක් ජීවිතේ උන් කෙනෙක් දමා යද්දී හදවතට දැනෙන පාළුව දුක ඇයට ඒ වෙලාවේ දැනුණා.

"තා..ර..ක හොඳ කොල්ලෙක්..."

මනෝජා උපේක්ෂාගේ උරතලයට සුරත තබා කිව්වා.

"එ..යා දෙ..වි..යෙ..ක් ඇ..න්ටී..."

උපේක්ෂා උගුරෙන් වගේ කිව්වා. කෙල්ල ඔහු ගැන මේ තරම්ම භක්තියකින් කතා කරන එක ගැන මනෝජාට පුදුමයක් නෑ.

"එ..න්..න පුතේ... මං ඔයාට මගේ පුංචි ගේ පෙන්නන්නම්... අද ඉඳලා ඉතින් ඔයත් මෙහේ කෙනෙක්නේ..."

"මේ අ..න්..ක..ල්ද ඇ..න්ටී..."

"ම්.. මගේ ප..ණ... එයාට තාරක වගේ පුතෙක්ව ඔයා වගේ දුවෙක්ව දෙන්න මට වාසනාව නැතිවුණා... ඒත් එයා හැමදාම කිව්වේ පුතේ මගේ ඩෝටර් ඔයා කියලා... හොඳ අයව වැඩි කාලයක් දෙවියෝ මේ ලෝකේ තියන්නෑ... ඉක්මනට එයා ගාවට ගන්නවා... ඉතින් ගියා..."

ඒක ඇත්ත. තාත්තටත් උනේ ඒක. මේ අමනුස්ස ලෝකේ දෙවිවරු





වගේ මිනිස්සුන්ට ඉන්න බෑ.

"අන්කල් ලස්සනයි නේද උපේක්ෂා..."

"හ..රි ල..ස්ස..නයි ටෝනි රණසිංහ වගේ ඒ දවස්වල..."

මනෝජා හරි හයියෙන් හිනාවුණා.

"ඇත්ත ඇත්ත... ඒ දවස්වල හැමෝම ඒක කිව්වා..."

"ඇන්ටිගේ මේ ලස්සන කොණ්ඩේ..."

"අනේ ගියා කෙල්ලේ... බබාලා ලැබෙන්න කියලා දිගටම බෙහෙත් බිව්වා... ඒවලටද කොහෙද කොණ්ඩේ ඔක්කොම ගියා... ය..න්.. මේ තියෙන්නේ මගේ ටෙඩි බෙයාර්ලා හදන මේසේ... උදේ ඉඳලා මේ බග්ස් බනීලා ටික හදනවා..."

"මා..න් ආස..යි ඇ..න්..ටී ඉ..ගෙ..න ග..න්..න..."

"මං උගන්නන්නම්... ඔයා මට වඩා ලස්සනට බෙයාර්ස්ලා හදයි... මේවා කෙල්ලෝ කරන වැඩ... මේ කාමරේ අපි අස් කරගමු... මගේ රෙදි මේ අලා තියෙන්නේ..."

"මං අ..ස් ක..ර..ග..න්..නම් ඇන්ටිඃ"

"දෙන්නම අස් කරමු... ඇඳනම් පුංචියි කෙල්ලේ..."

"අ..නේ මේ හො..ඳයි ඇ..න්..ටී..."

මනෝජා ඇවිද්දේ කෙල්ලගේ අතින් අල්ලගෙනමයි.

"අද ඔයත් ඉන්න නිසා රෑට හොඳට හදමු... වෙනදට නම් මං වැඩිය මොනවත් හදන්නෑ... තනියම එහෙම හදන් කන්න කම්මැලියි පුතේ..."

"ගේ හ..රි පිළිවෙලයි ඇ..න්..ටී..."

"ඒක පුරුදු උනේ අන්කල්ගෙන්... පුදුම පිළිවෙලක් එයාට තිබ්බේ... බැඳලා එද්දී මං එක විදිහක කෝලමක්... සෙරෙප්පු දෙකත් දාගෙන ඇඳ උඩට එන්නේ... මාව ගාණට හැදුවා.. හදලා එයා ගියා..."

එහෙම කෙනෙක් ඉඳලා ඇලා ගියාම කොච්චර දුකද... අහිමිවීම ජීවිත



www.sinhalaelibrary.com

ඇතුලේ මවන්නේ නිමා නොවන දුක් මාවතක්. ඒ මාවතේ කී දෙනෙක් තනිවම යනවද...

"අපි රෑට නූඩ්ල්ස් හදමු... රෑ වෙලා උණුවෙන් හදාගෙන කමු..."

"ම්..."

මනෝජා උපේක්ෂාගේ අතින් අල්ලාගෙනම මිදුලට ආවා. හැන්දෑ හිරු දියවන්නා වෙල් යාය මත්තෙන් හිම්හිට බැහැගෙන යමින් තිබ්බා.

"මේ ගාඩ්න් එක මං අන්කල් නැතිඋනාට පස්සේ හැදුවේ... මේ බෝගන්විලා ගස් මැද්දට වෙලා ඔය දියවන්නා යාය දිහා බලන් ඉද්දී හිතට හරි සනීපයි..."

"ඇ..ත ඉ..ඳලා එ..ද්දී ල..ස්සනට පේ..නවා ඇ..න්ටි..."

"ම්.. පු..තේ..."

මනෝජා වෙනස්ම කටහඬකින් කතා කළා.

"ඇ..න්ටි..."

"මං පුතාගෙන් විස්තර අහන්නෑ... ඒත් ඔයා ලොකු දුකකින් ඉන්න බව පේනවා... ඔය කාලෙදි එච්චර කඩා වැටෙන්නෙපා... ඔයාගේ මූණේ එච්චරම අවාසනාවක් නෑ... සතුටින් ඉන්න බලන්න... ගොඩාක් දුක් විඳින්න ගත්තාම ඒ දුකට ඇබ්බැහි වෙනවා... එතකොට හිතට සතුටක් විඳින්න දන්නෑ..."

"ම..ට තේ..රේ..නවා ඇ..න්..ටි..."

"ජීවිතේ සතුට කියන්නේ සැනසීම උපේක්ෂා... ඒක විතරමයි..."

"මං ආ..වේ..ත් ඒ සැ..නසීම හො..යා..ගෙන ඇ..න්..ටි... අනිත් ඔක්කොම ම..ට තිබ්බා..."

"මට තේරෙනවා... ඒක ඔයාට ලැබෙයි... පුංචි පාරවල් වල යන අයට ගොඩාක් දේවල් ලැබෙනවා..."

මනෝජා කෙල්ලගේ බාහුව අතගාලා කිව්වා. උපේක්ෂා බෝගන්විලා





මල්ක් මැද තිබූ පුංචි බටර් පාට මල් රේණුව නිය පිටින් කඩලා ගත්තා.

"මං පහන තියලා වැඳලා එන්නම් කෙල්ලේ..."

මනෝජා ගියේ කෙල්ලව බෝගන්විලා ගස් මැද තනි කරලා... උපේක්ෂා ඇගේ පසුපස ගියේ ඒ බුදු පහනටම වඳිනවා කියලා හිතාගෙන...

ඊයේ ග්‍රෑන්ඩ් හෝටලයේදී වූ සිදුවීම් එකින් එක උපේක්ෂා සිහි කළා... රෑ දූවගෙන ඇවිත් ඇර තිබූ කාමරයකට ගොඩ වුණේ මේ මොනවත්ම සිතන්නේ නැතුවයි. ඒත් දෙවියන් මේ බියකරු රාත්‍රියේදී තමාව ඇරලවා තිබුණේ තවත් දෙවියෙකුගේ කාමරයකටයි. ඔහු නොවන්නට පෙරදා රෑයේදී මේ ජීවිතයට මොනවා වෙන්නට තිබ්බාද...

මේ මොහොතේදී හදවතට පුංචි හරි නිවනක් සැනසීමක් දැනෙනවා නම් ඒ සැනසීම හදවතට දුන්නේ ඔහු... ඒ වෙච්ච පිහිට දෙවියෙක් වත් වෙයි කියලා හිතන්න අමාරුයි. පූජා වට්ටි තබා තිර රෙදි තබා පඬුරු බැඳ දෙවියන්ගෙන් දෙයක් ඉල්ලා ගන්නට කොතරම් දුක් විඳින්න ඕනෙද... දෙවියන් පවා එහෙම වෙද්දී ඔහු මේ අනාථ ජීවිතයෙන් කිසිවක් බලාපොරොත්තු නොවී අරම පිහිට උනේ කොහොමද...

මේ ගෙදරට ඔහු තමාව ඇරලවූ අයුරු හරි පුදුමයි... හරියට තමාව අම්මාගේ ගෙදර නැවැත්තුවා වගෙයි... මේ තරම් පින්බර ගැණු ඉන්නා ලෝකයක තමාට ලැබුණේ කොහොම අම්මා කෙනෙක්ද කියලා උපේක්ෂා හිතුවා...

"අනේ පු..තේ ඔයත් වඳින්න ආවද... මෙච්චරයි පුතේ සැනසීම..."

මනෝජා කිව්වේ බුදු පහනට වැඳලා හැරෙන ගමන්. ඇය පිටුපස වැඳගෙන උන් කෙල්ලව ඇය දැක්කේ එවිටයි.

"පුතා ඇඳුම් ගෙනාවාම අපි වොෂ් එකක් දාගමු..."

ඔහු දැන් සාප්පු ගානේ ඇවිද ඇවිද ඇඳුම තෝරනවා ඇති... උපේක්ෂාට ඒ දර්ශනය මැවිලා පේනවා. මේ වෙන පිහිටට ජීවිතයේ



www.sinhalaelibrary.com

උතුම්ම දෙයක් ඔහු වෙනුවෙන් කරන්න ලැබෙනවනම්...

"අද ඔයා ඉන්න නිසා පාළු නෑ... නැත්නම් මේ වෙලාවට පුදුම පාළුයි..."

"රැටත් ටෙඩී බෙයාර්ලා හදනවද ඇන්ටි..."

"මහන්නේ නම් නෑ පුතේ... ඔය ඇස් එහෙම රෑට අල්ලනවා... නැත්නම් අලුත් ටෙඩී බෙයාර් කෙනෙක්ව ඩිසයින් කරනවා... ළඟදි හැදුවා ලස්සන තාරාවෙක්ව... ඒක හොඳට ආවා..."

"ඩෝල්ලා හදන්නෑ ඇන්ටි..."

"අ..නේ නෑ.. පැටියෝ... ඩෝල්ලා හදනකොට මට දුකයි... බබාලා නැති ම..ට ඩෝල්ලා දකිද්දී දුකයි..."

ජීවිතේ නොලැබීම හදවතට කොච්චර නම් දුක් දෙනවද...

"අපි ගිම්ගිට හදමු... දැන් ඔයත් ඉන්නවනේ... කොළඹ ෂොප් එකක ඕඩරයකුත් තියෙනවා ළඟදි දෙන්න..."

මනෝජා නූඩ්ල්ස් පැකට් එකකුත් කැරට්ත් ලීක්සුත් ගත්තා.

"ෂුගර් තියෙනව නම් ඇන්ටිට නූඩ්ල්ස් හොඳ නෑ..."

මනෝජා හිනාවුණා.

"ඇත්ත පුතේ... හොඳම නෑ... අද ඉතින් ඔයා ඉන්නවනේ... කොහොමද දන්නේ නූඩ්ල්ස් හොඳ නෑ කියලා..."

"ඉ..ස්..ස..ර තා..ත්..තට තිබ්බා..."

"තාම තියෙනවද..."

"ම..ගේ තා..ත්..තා නැ..ති වු..ණා ඇ..න්ටි..."

"අ..නේ..."

"ඒ..ක..යි එ..යාගේ දු..වගේ ජීවි..තේට මෙ..හෙම වු..ණේ..."

මනෝජා කෙල්ලගේ බාහුව පිරිමැද්දා...

"ආදරේ අය ඇලා යන්නෑ පුතේ... එයාලා ඉන්නවා... ඔයා දන්නවද...





අන්කල් මෙහේ ඉන්නවා... මට ඒක දැනෙනවා..."

"ම..ට..ත් දැ..නෙ..නවා ඇන්ටි... තාත්ත ඉ..න්..නවා වගේ..."

"තාත්තා මේ පුදු දුවට ආදරෙන් ඉ..න්න ඇති..."

"ම..ට මෙ ලෝකේ උ..න්නේ එච්චරයි ඇන්ටි..."

මනෝජා කෙල්ල දෙස බලාගෙනම උන්නා.

"දෙයියොත් පුදුමයි... ඉන්න එක්කෙනාව අරගෙන යනවා... එක්කං යන්න කී දෙනෙක් නම් ඉන්නවද..."

"ම්.. එයාලා හොඳට ඉන්නවා..."

මනෝජා නූඩ්ල්ස් තම්බන්න සාස්පානකට වතුර තිබ්බා.

"මං කැරට් කපන්නද ඇන්ටි..."

ඇය හිනාවුණා.

"ප..ස්සේ කරමුකෝ... අද මං උයන්නම්... නූඩ්ල්ස් හදලා අපි එග් කරියක් හදමු... හොඳ තෙම්පරාදුවක් ඇලා..."

"හොඳම නැති ඒවා ඇන්ටි කරන්නේ..."

කෙල්ල හිනාවෙලා කිව්වා.

"ඕක ඉස්සර අන්කලුත් කියනවා... මට තෙල්ලේ රහට කන්නෝන... දැන් නම් කන්නෑ... ඉස්සර එහෙමයි... දැන් කන්නේ ඉතින් ජීවත් වෙන්න විතරයි..."

"එලෝලු එක්ක තමා කන්නෝන... එතකොට කමක් නෑ..."

"ඇත්ත ඇත්ත... ඔයා ලස්සන එලෝලුම කාලද කොහෙද..."

ඇය බිම බලාගෙන හිනාවුණා. ඇත්තටම ඇය මස් මාළු වලට වඩා එළවළු කන්න ආසයි.

"පුතේ..."

"ඇන්ටි..."

"ඔළුවට ටිකක් පැදෙන්න දෙන්න... මං දන්නවා ඔයාට ප්‍රශ්න ඇති..."



www.sinhalaelibrary.com

"ජීවි..තේ අලු..ති..න් පට..න් ග..න්..නයි ඇන්ටි ඕ..න..."

"පරණ ජීවිතේ සැනසීමක් නැත්නම් කරන්නෝන හොඳම දේ ඒක..."

"ඇ..න්..ටි ම..ට ටි..ක දු..වස..ක් මෙ..හේ ඉ..න්..න දු..න්..නො..ත්..."

කැරටි කපමින් උන් මනෝජා කෙල්ල කියාගෙන ආපු දේ නැවැත්තුවා.

"ඔයා දන්නවද උපේක්ෂා..."

"ම්..."

"ඔයා ඇවිත් තාම පැයයි දෙකයි... ඒ ටිකට පුතේ මං ඔයාව හොඳට තේරුම් ගත්තා... මට රත්තරන් නරක මිනිස්සු අඳුන ගන්න බෑ... ඒත් හොඳ අයව මට හොඳට තේරෙනවා... ඔයා මෙහෙන් කවදහරි යන්නෝන... ඒ ඔයාගේ ලස්සන ජීවිතේකට... එතකල් ඔයා මේ ගෙදර කෙනෙක්... එච්චරයි..."

මනෝජා එහෙම කියද්දී උපේක්ෂාගේ දෙනෙත් වල කඳුළු පිරුණා. ජීවිතයේ දුෂ්කරම මොහොතක ඇතිවූ මේ නෑකම මොන තරම් පුදුමාකාරද...

*** *** *** ***





**තාරක** උපේක්ෂාට තේරුවේ ඇයට ගෙදරට අඳින්න වගේ ගැළපෙන ඇඳුම් ටිකක්. නිමි ඇඳුම් සාප්පුවේ ඇයට ඇඳුම් තෝරද්දී තාරකටම පුදුමයි.

"දෙයියෝ මටම මේ වැඩේ බාර දුන්නේ ඇයි... දෙයියොම තමා දන්නේ..."

තාරක හිතුවා. ඔහු ඇයට සායවල් තුන හතරකුත් බ්ලවුස් හතර පහකුත් ගත්තා. තමාට ඇඳුමක් ගනිද්දිවත් ඔහු මේ තරම් පිළිවෙලට ගලපලා තෝරගෙන නෑ. ජීවිතේ ප්‍රථම වතාවටයි ඔහු මෙහෙම් කෙල්ලෙක්ගේ රූපයක් හිතේ මවාගෙන ඇඳුමක් තේරුවේ. "කෙල්ලට මොක ඇන්දත් ලස්සනයි" ඔහු එහෙමයි හිතුවේ.

තාරක ඇයට රෑ ඇඳුම් දෙකකුත් තුවායකුත් ගත්තා... අමාරුම දේ උනේ ඇයට යට ඇඳුම් තෝරන එක. ඒත් තාරක මොනවත් හිතන්නේ නැතුව ඇයට යට ඇඳුම් ටිකක් තේරුවා... "කෙල්ල ගොඩක් මහතත් නෑ... කෙට්ටුමත් නෑ... ඒ නිසා මේවා හරියයි..." ගෑණු ළමයින්ගේ යටි කලිසම් මේ තරම් පාට පාටින් මහන්නේ මොකටද කියලා ඔහු හිතුවා.

ඔහු සියල්ලම ගෙන යළිත් මුල සිට දිග හැර බැලුවා. "මං ඔයාව හදාගන්න අරන් වගේ... එහෙමත් හොඳයි..." තාරකට එහෙමයි හිතෙන්නේ.



www.sinhalaelibrary.com

එක දෙයක් ඔහු හිතුවා. මේ සියල්ල කරන්නේ හරි පිරිසිදු සිතින්. ඒ පිරිසිදුකම රකින්න බැරි වූ දවසට මේ සියල්ලේ තියෙන වටිනාකම නැතිවෙනවා.

සියලුම ඇඳුම් ගෙන තාරක ඒවා තරමක සූට් කේසයක්ද ගෙන එහි පිළිවෙලට දැම්මා. ඔහුගේ මුවගට තුනී සිනාවක් නැගුණා.

"ඔයා මගේ දුවෙක් වගේ ඉන්නවනම් මං හදා ගන්නම්... මේ වැඩේටත් මං ආසයි..."

තාරක ඇයට සකස් කළ සූට් කේස් එක වාහනයට දමද්දී හරි ලෝබයි. ඔහු වාහනය මඟින් නවත්තලා ෂැම්පු බෝතලයකුත් සබන් කැට දෙකකුත් ටූත් බ්‍රෂ් එකකුත් ගත්තා.

"මේ බේබි ක්‍රීම් එකකුත් දෙන්න..."

කෙල්ල ඒකට ආස වෙන බව ඔහු දන්නවා. ඔහුගේ දුරකථනය නාද වුණේ තාරක නැවත වාහනයට එද්දියි... කතා කරන්නේ අම්මා.

"අ..ම්..මා..."

"කොහෙද පුතා..."

"දැන් මේ ළඟ අම්මා... පැය බාගෙන් ගෙදර..."

"අර ළමයා දැන් දහපාරක් විතර ගත්තා... ආවද ආවද කියලා අහනවා..."

"මං ඉක්මනට එන්නම් අම්මා..."

"ම්.. ක..න්..න එ..න්..න..."

තාරක දිග සුසුමක් හෙළුවා. දිල්කි දිගටම උන්නේ සැකෙන් කියලා තාරක දන්නවා. "ඔයා දිල් මගේ ජීවිතේ හම්බවෙච්ච හොඳම කෙනා නෙමේ... මොනා කරන්නද... අපි දැන් බඳින්නනේ යන්නේ... බැඳලා බලමු..." තාරක සිතුවේ එහෙමයි.

තාරක බෝගන්විලා ගස් අතර වාහනය නවත්වද්දීම ඇය දුවගෙන





ආවා. දොරකඩ දල්වා තිබූ විදුලි පහන් එළියෙන් තාරක ඒ මුහුණ දැක්කේ ලා කහ පාටට...

තාරක බැස්සේ ඒ මුහුණ දෙස බලාගෙනමයි. උදේ පාන්දර නුවරඑළියේ සිට එන්නට පටන් ගත් ගමන් තවමත් ඔහු මඟ... ඒ තමා වෙනුවෙන් නේද කියලා ඇය හිතුවා.

"අ..යිය..ට ම..හ..න්..සි..ත් ඇ..ති උ..දේ ඉඳලා..."

"හිතේ නිදහසේ ගෙදර යන්නෙපැයි උපේක්ෂා..."

අනුන්ගේ ප්‍රශ්න වලට තමන්ගේ හිතේ නිදහස නැති කරගන්න අය අද නෑ.

"එ..න්..න..කෝ..."

තාරක කෙල්ලට කතා කරගෙනම ගිහින් ඩිකිය ඇරියා... දවස් හතර පහක ට්‍රිප් එකක් යද්දී ගෙනයන තරම් ලොකු සූට් කේස් එකක් එහි තිබුණා. "අ..නේ දෙයියනේ මෙ..ච්චර ලොකු එ..ක..ක්..." උපේක්ෂාට පුදුම හිතුණා.

"මේ අ..යියේ..."

"දිගටම ඉ..න්..නෙපැයි ළමයෝ..."

"අ..නේ ම..ට ඇ..ඳුම..ක් දෙ..ක..ක් තිබ්..බම..."

කොල්ලා ඉණට අත් දෙක තියා ගත්තා.

"අර ඔළුව හොඳ නෑ කියපු කතාව ඇත්තද කොහෙද... ඇඳුමක් දෙකක් තිබ්බම ඇති..."

කෙල්ලගේ දෑස් සිනාබරව බිමට යොමු වුණා. ඔහු එහෙම කියන්නේ අහිතකින් නොවන බව ඇය දන්නවා.

"මං හොඳම ඇඳුම් ගත්තේ නෑ... ගෙදරට අඳින්නනේ... කොටින් වගේ සැහැල්ලු ඇඳුම් ගත්තේ... හොඳද..."

"ම්..."

"මදි පාඩුවක් පස්සේ ගමු... මං එනවනේ... යට් බලන්න..."

"හො..ඳයි අයියේ..."

තාරක සූට් කේස් එක රැගෙන ගෙට ගොඩ වුණා. ඒ ඇඳුම් ටිකට සෑහෙන ගාණක් යන්නත් ඇති.

"දැන් වොෂ් එකක් අරගෙන මේ ඇඳුමක් ඇඳගෙන ටිකක් නිස්කලංකේ ඉ..න්..න තේරුණාද..."

කෙල්ල හිස වැනුවා... ඒ ඇස්වල කඳුළු...

"මං එහෙනම් යනවා උපේක්ෂා... මං උදේට ගන්නම්..."

"හො..ඳ..යි අ..යියේ..."

ඔහු යන්නට පෙර ඒ දෑස් දිහා බැලුවා. කඳුළු අලුත් වන තෙත පාට ඒ ඇස් පුරාම. "පින් දෙන්නත් එපාලුනේ... මං මො..නා කියන්නද..."

ඔහු ඈත දියවන්නා මාවත දිගේ යනවා ඈය බලාගෙන උන්නා. මඟ තොටකදීවත් ඔහුට කරදරයක් වෙන්නෙපා කියලා ඈය පැතුවා.

*** *** *** ***





ඔහු ගෙන ආ සූට් කේස් එක ඇඳ උඩ තියලා අරිද්දී උපේක්ෂාගේ පපුව හෙල්ලිලා ගියා. ඒ ඇස් තෙමීගෙන ගියේ ඈයටත් නොදැනීම වගේ. "ඔයා වගේම මාව බලාගන්න කෙනෙක් කොහොමද තාත්තේ මේ ලෝකේ ඉන්නේ... පුදුමයි..."

"මට මගේ අම්මා තාත්තවත් මෙච්චර ඇඳුම් ගොඩක් තෝරලා නෑ.. අ..නේ... නයිට් ඩ්‍රෙස් දෙකකුත් අරගෙන..."

උපේක්ෂා තොල් පට තද කරගෙන ඒ රෑ ඇඳුම් දෙක උකුලට ගත්තා. එකක් රෝස පාටයි. අනික සුදු පාටයි.

"පව්... ඔයා කොහොම මේ යට ඇඳුම් තේරුවද දන්නෑ... ඔයා එහෙම කරන්න ඕන කෙනෙක් නෙමේ..."

ඈය ඒවා ඇගේ වතට තබා බැලුවා... ඒවා ගාණටම වගේ... "ඔයා ඔයාගේ දිල්ට වත් මේ තරම් ඇඳුම් ගොඩක් අරන් දීලා නැතුව ඇති..." බෑගයේ කොනක තිබූ සබන් ෂැම්පු ක්‍රීම් දකිද්දී උපේක්ෂාගේ හදවත උහුලාගන්නට බැරිම දුකකින් ඇවිලීගෙන ගියා.

"කෙනෙක්ව බලා ගන්නෝන කොහොමද කියලා ඔයා දන්නවා..."

ඒත් එහෙම බලාගන්න තමා කවුද... නීතියෙන් බලා ගන්න බැඳිලා ඉන්න අයවවත් බලාගන්නේ නැති ලෝකයක් මේක... "ඔයා මෙහෙම



www.sinhalaelibrary.com

කරද්දී ජීවිතේ හරි පුංචියට හරි අලුතෙන් පටන් ගන්න මට හරි ආසාවක් එනවා තාරක අයියේ... හැමදේම අමතක කරලා... අලුතෙන්ම පුංචි ජීවිතයක් පටන් ගන්න තියෙනව නම්... මේ පුංචි ඇඳුම් ටිකත් එක්කම..."

උපේක්ෂා ඒ ඇඳුම් ටික එහිම ලස්සනට නවා තැබුවා... ඊටත් පසු ඇය ඔහු ගෙන ආ අලුත් තුවායත් දම් පාටට හුරු සායත් සුදු ටී ෂර්ට් එකත් ඇය ගත්තා. යට ඇඳුම් ටික ගනිද්දී තවත් පාරක් කෙල්ලගේ හිත දුකින් බර වුණා.

"ඔයා වගේ කෙනෙක් ලබන ඔයාගේ දිල් හරි වාසනාවන්තයි... එයා ඒක දන්නවද දන්නෑ..."

ඇය නාන කාමරයට ගියේ එහෙම හිතමින්...

*** *** *** ***

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..





දියවන්නාවේ පුංචි නිවසේ ගෙවන පළවෙනි රාත්‍රිය උපේක්ෂාට හරි අහිංසක රැයක් වුණා. කොහොමත් කෙල්ල උන්නේ ටිකක් මානසිකව නැගිටලා. ඔහු ගෙන ආපු අලුත් ඇඳුම් හදවතට වෙනස් නැවුම් බවක් ගෙන දෙන්නක් වුණා.

"එයාට තියෙන්නේ හරි චාම් අදහස්... එයා තෝරන ඒවත් හරිම චාම්... ලස්සනයි..."

කැඩපතේ උන් අලුත් උපේක්ෂා දෙස උපේක්ෂා බලාගෙන උන්නා.

"ජීවිතේ චුට්ටක් නැගිටලා ඉන්න හරි ආසයි... ඒත් මට මේ මිනිස්සු ඉන්න දෙයිද..."

ඔහු තෝරා ගෙනවිත් තිබූ යට ඇඳුම් හරි සනීපයි... ඒවා හිතටත් වඩා සුවයක් ගෙන ආවේ කෙල්ලගේ හදවතට...

"ෂා.. ලස්සන බලවුස් එ..ක... සෝ චාම්..."

මනෝජා කෙල්ලගේ උරතල වලින් අල්ලලා හැඩ බලමින් කිව්වා.

"අ..යියා තෝ..රලා තියෙන්නේ ඈන්ටි..."

"තාරක කොච්චර ශ්‍රේට්ද..."

"ම්... අ..යියව බඳින ග..ර්ල් හ..රි වාසනාවන්තයි ඈන්ටි..."

මනෝජා හිනාවුණා.

"ඒ ග..ර්ල්ව දන්නවද..."

"මං දැකලා නෑ ඇ..න්..ටි.. ඒත් අයියා කි..ව්වා..."

"ම.. දිල්කි... සල්ලි ගහක පිපිච්ච මලක්... ඒත් පුතා..."

"ඇයි ඇන්ටි..."

"මෙ මේකව පුංචි කාලේ ඉඳලා දන්නවා... ඒ දෙන්නා ගැළපෙන දෙන්නෙක් නෙමේ... තාරක පුතා වෙනස්ම කෙනෙක්... දිල්කි ඒ වෙනසට ගැළපෙන්නෑ... ලව් කරද්දී උපේක්ෂා පුදුම ගැළපීමක් තියෙන්න ඕන... ලස්සන මැච් එකක්..."

උපේක්ෂා මොනවත් කිව්වේ නෑ... එහෙම කියන්නේ කොහොමද...

"ඒත් උපේක්ෂා ඒ මැරේජ් එක කෙරෙනවා..."

"ම..."

"දෙන්නා දෙපැත්තට යයි... ඒකද ෆැමිලි ලයිෆ් එක..."

ඒත් එහෙම නොගැළපෙන බැඳීම් එක්ක විවාහයක් දිගට තියෙන්නේ නෑ.

"අපි තව ටිකක් රෑ වෙලා කමු... මං කෝපි ටිකක් හැදුවා... බොමු..."

උපේක්ෂා හිනාවුණා.

"තරක පුරුදු නේද..."

"ඒකනේ..."

"අදට බොමු... අද හොඳ දවස..."

උපේක්ෂාත් මනෝජාත් ගේ දොරකඩ ගඩොල් ඇල්លූ පඩිය උඩ වාඩි වුණා. එතන සනීපයි. දියවන්නා වෙල් යාය සිපගෙන එන සුළඟ එහෙමම එන්නේ මේ ගෙදර මිදුලට...

"මේ තමා මං ආසම තැන උපේක්ෂා... මෙතනට වෙලා සමහර දවස්වලට මං රෑ ගණන් ඉන්නවා... පහුණු වෙසක් එකට මං මිදුලේ පහන් පත්තු කරලා පාන්දර එක වෙනකල් හිටියා... පාර දිහා බලාගෙන..."





"තු..නියම ඇන්ටිට පාළුත් ඇති..."

"හරි පාළුයි... දවසක් මං මෙහෙම ඉඳගෙන ඉන්නකොට මහ රෑ තාරක පුතා ආවා... මෙතනින් යද්දී..."

"හා..."

"අනේ කොල්ලා මට ආප්පත් අරන් ආවේ... මං පස්සේ තේ හැදුවා... ඔය ඔතනට වෙලා ආප්ප එහෙම කාලා තේ බීලා ගියේ... රෑ එකොළහට විතර... එයා එහෙමයි..."

ඇත්තටම ඔහු එහෙමයි. ඒ ගතිගුණ කෙනෙකුට පිහිටන්නේ නැති තරම්...

"උපේක්ෂා..."

"ඇන්ටි..."

"ඉස්සර ඉඳලා පුතේ මට පොඩි බලගතු බලයක් තියෙනවා..."

"ම..."

"නිකං මායා බලයක් වගේ දෙයක්..."

"හා..."

"මට පුතේ දෙයක් වෙන්න කලින් ඒක මෙහෙම වෙනවා කියලා කියන්න පුළුවන්... අන්කල් දාලා යන්න මාසෙකට කලින් මට දැනුණා එයා මාව දාලා යන්න යන විත්තිය... මං ඒ මාසෙම එයාව පුදුම තරම් සතුටින් තිබ්බා... උදේ එයා නැගිටිනකොට මං ලස්සන කෑම මේසේ දාලා තියනවා... එයාට පුදුමයි..."

"අ..න්..ක..ල් නැතිවුණා..."

"ම.. මට ඒක පෙ..නු..ණා පුතේ... ඒක වෙලාවකට දුකක්..."

උපේක්ෂා ඈය දිහාම බලා උන්නා.

"ඔයා දිහා බලාගෙන ඉඳිද්දී මට දෙයක් කියන්න පුළුවන්..."

"හා.. කි..ය..න්..නකෝ ඇ..න්..ටි..."



www.sinhalaelibrary.com

"ඔයා පුතේ හිතන තරම්ම ඔයාගේ අනාගතේ අඳුරු නෑ... ඔයා ලස්සන බබාලා හදලා ලස්සනට ජීවත් වෙයි... ඔයා මහත්තයත් එක්ක බබාලවත් අරගෙන මෙ නාකි මාවත් බලන්න එනවා... ඔව්..."

උපේක්ෂා බලාගෙනම උන්නා.

"ඒ නිසා පුතේ... දුක් පපුවට ගන්නෙපා... සැනසීමෙන් ඉන්න බලන්න..."

"මං ඉ..න්..න බ..ල..නවා ඇන්ටි..."

"දුක් විඳපු කෙනෙක්ට දෙයියෝ සැපත් දෙනවමයි... එයා දුක් දීලා බලනවා අපි සැපක් විඳින්න සුදුසුද කියලා... ඒ දුක් කරදර මැද්දෙත් අපි පිරිසිදුව ජීවත් උනොත් පුතේ... දෙනවා කියන්නේ අදහගන්න බැරි දේවල් දෙනවා... ඔ..යාට එ..හෙම දෙයි..."

උපේක්ෂා ඒ කතාව අහගෙන හිටියේ හරි භක්තියෙන්... ඇය කියන්නේ ජීවිතයේ ඇත්ත කියලා උපේක්ෂා දන්නවා. මේවා කියන්නේ නිකං පුයර ගාගත්ත ගෑණියෙක් නෙමේ. හොඳට දුකින් කඳුලින් පදම් වෙච්ච ගෑණියෙක්.

ගෙදර දුරකථනය නාද වුණේ ඒ මොහොතේදී. මනෝජා ගිහින් ගත්තා.

"ආ ඉ..න්..න පුතේ... ඔ..ව් පු..තේ මව් පු..තේ අ..නේ ම..ගේ දුවෙක් වගේ... නෑ.. නෑ හරි හොඳට පුරුදුයි... ද..න් ම..ගේ හොඳම යාළුවා උපේක්ෂා... ඉ..න්න පුතේ... උපේක්ෂා..."

මනෝජා දුරකථනය අල්ලාගෙනම කතා කළා.

"තාරක පුතා කතා කරන්නේ..."

"පව් ගෙදර ගිහිල්ලත් කතා කරනවා..." ඇය දුරකථනය අතට ගත්තේ එහෙම හිතමින්.

"අ..යියේ..."

"කොහොමද උපේක්ෂා ජීවිතේ..."

"අ..යිය්..ට පි..න් මා..ව ඇ..න්ටි ළ..ඟට ඇරලුවට..."

"ඇන්ටි හොඳයි නේද..."





"ම්.. හොඳ අම්මා කෙනෙක් වගේ..."

කෙල්ල කියන ඒ කතාව මනෝජාත් අහගෙන.

"අ..යියේ..."

"අ..ර ඇඳුම්..."

"මහ ගොඩේ පාටයි නේ..ද..."

"අ..නේ... ඇයි එහෙම කියන්නේ... හොඳ ඒවා ගෙ..න..ත්... ම..ට ජීවිතේ එ..ච්චර ඇඳුම් ගොඩක් ලැබිලම නෑ..."

"මාත් දරුවෝ එච්චර ඇඳුම් ගොඩක් එකපාර අරගෙනත් නෑ..."

"ඔ..ක්..කොම ගා..ණට..."

"යට ඒවා..."

"ම්... දැ..න් ඇඳන් ඉ..න්..නේ ඒවා තමා..."

"එහෙනම් දරුවෝ අද සැනසිල්ලේ නිදා ගන්න... හොඳද... අපි හිමිහිට කතා කරමු..."

"හො..ඳයි අයියේ..."

"දැන් මොකද කරන්නේ..."

"මෙ කෝපි එකක් බිබී ඇන්ටිත් එක්ක එළියේ කතා කර කර හිටියා..."

"මාත් දවසක් ඇවිත් ඔතනට වෙලා ඇන්ටිත් එක්ක ආප්ප කෑවා..."

"ඇ..න්..ටි කිව්වා... ඒවා මතක් කර කර තමා උන්නේ..."

"ම්.. මං තියනවා එහෙනම්..."

"හො..ඳයි අයියේ... බුදු සරණයි..."

උපේක්ෂා දුරකථනය ළඟින් ආවේ ඇස් පිහදමමින්මයි.. මනෝජාට ඒ දිහා බලද්දී ගොඩක් දේවල් හිතුණා. ඇය ඒත් කිව්වේ නෑ. මේ කඳුළු පාරවල් ගොඩක් දුර යයි... ගෑණු ළමයින්ගේ කඳුළු පාරවල් එහෙමයි..

ආයෙමත් පඩිය උඩින් ඉඳගත්තට පස්සේ මනෝජා කෙල්ලගේ හිස මොහොතකට අතගෑවා. ජීවිතේ පතුලටම වැටුණ තමාට මෙහෙම කරුණාවක්



www.sinhalaelibrary.com

ලැබෙනවා කියලා හිතද්දිත් පුදුමයි.

"තාරක පුතා මොනාද කියන්නේ... ම..."

"එ..යා හ..රියට ඇන්ටි තාත්තා කෙනෙක් වගේ..."

"හොඳ පිරිමි ගැන හිතන්නේ එහෙම තමයි... මටත් අන්කල් ගැන හිතුණේ එහෙමයි... එයාට එළියට යද්දී මාව ප්‍රින්සස් කෙනෙක්ව වගේ සරසාගෙන යන්න ඕන... ගෙදරින් එළියට යද්දී දහපාරක් මං දිහා බලනවා... ඇඳ හොයනවා... ඒ දවස්වල මට ඒක වදයක්... ඒත් දැන් තමා තේරෙන්නේ... තාත්තලා එහෙමයි... ලෝකෙට ඇදයක් පේන්න දරුවෝ පාරට යවන්න තාත්තලා ආස නෑ..."

"ම..."

"කොල්ලා ඔවා හරි පිරිසිදුව කරන්නේ..."

"මං ඒක හොඳටම දන්නවා ඇන්ටි..."

උපේක්ෂා ඇත දියවන්නාව දෙස මොහොතක් බලාගෙනම උන්නා... දියවන්නාව දෙසින් එන සුළඟ පුදුම සනීපයි...

"උපේක්ෂා..."

"ඇන්ටී..."

"මෙ ළඟ පන්සලක් තියෙනවා... අපි වෙලාවක යන්... ටිකක් හවස් වෙන්න..."

"ම..ට..ත් ආසයි ඇන්ටි..."

"හිත තැන්පත් වෙනකොට පුතේ දුක අඩුවෙනවා..."

"ම..."

මෙ හිත තැන්පත් කරගන්න පුළුවන් නම් ඊට වඩා සැපක් නෑ කියලා උපේක්ෂා හිතුවා. ජීවිතේ සිද්ධ උනේ මහ පුදුමාකාර දේවල්... ඒ ගැන මතක් කරන්න ඒවා දැන් උපේක්ෂා ආස නෑ...

*** *** *** ***





www.sinhalaelibrary.com

තාරක ඇඟ සෝදාගෙන එද්දීම ඔහුගේ ජංගම දුරකථනය නාද වුණා. කතා කළේ දිල්කි. තාරක සරමට ගැටයක් ගහගෙනම දුරකථනය අතට ගත්තා.

"ගෙදර ආවද..."

තාරකට දුක හිතුණා... ඒ වචන සැර වැඩියි කියලා ඔහුට හිතුණා.

"දැ..න් ආවේ දිල්... වොශ් එකක් දාගත්තා..."

"උදේ නුවරඑළියෙන් පිටවෙච්ච කෙනා දැන් ගෙදර ආවේ..."

"ම..."

"ඔයා තුනට හතරට කලම්බු ඉන්නෝන තාරක..."

"මං හිමින් ආවේ දිල්..."

දිල්කි හිනාවුණා. ඒක අමුතුම හිනාවක්.

"දැන් පැය දෙකකට විතර කලින් ඔයා නෝලිමිට් සාප්පුවේ මොනාද කළේ..."

තාරකට හීල්ලුනා... කවුරු හරි දැකලා දිල්කිට කියන්න ඇති...

"මං හිටියේ නෑ දිල්..."

"නෑ ඔයා හිටියා... කුෂී දැකලා තියෙනවා... මට දැන් කිව්වේ..."

"මං වගේ වෙන කෙනෙක් වෙන්න ඇති දිල්..."

"හරි මං උදේ එන්නම්කෝ... කොහෙවත් යන්නෙපා... කෙළින්ම අපේ ගෙදර එන්නේ... හොඳද..."

"ඉතින් මාව එක්කං යන්න ඔයා එන්නෝනයැ... මං එන්නම්..."

"නෑ මං එන්නම්... ඔයා පනිනවා..."

"දිල්..."

තාරක වෙනස්ම හඬකින් කතා කළා.

"ඇයි..."

"අපි මැරි කරනවනම් දිල් මීට වඩා ලස්සනට ඉන්නෝන නේද..."

"එහෙම ඉන්නැත්තේ ඔයානේ.:"

"හ..රි.. ඒ වරදත් මගේනේ... මං උදේට එන්නම්..."

"නෑ... ගෙදර ඉන්න මං එනවා..."

"හොඳයි..."

"ගුඩ් නයිට් මං තියනවා..."

එච්චරයි... තාරකට හිල්ලුනා... ආදරයක් නැතුව බැඳීමක් ඇති කර ගන්න එක කොච්චර අමාරු දෙයක්ද කියලා දැන් තාරකට හිතෙනවා.

"යං පුතා කන්න..."

අම්මා ඇවිත් කතා කරද්දී තාරක අහිංසකව හිනාවුණා.

"අම්මා කෑවද..."

"ඔක්කොම කාලා නිදි... මං ඔයත් එක්ක කන්න හිටියා... අද පිට්ටු හදලා තියෙන්නේ... ඔයා ආසනේ..."

"පිට්ටු කෑල්ලක් කමු එහෙනම්..."

"දිල් කතා කළාද..."

පියගැට පෙළ බහිද්දී අම්මා ඇහුවා... තාරක හිස වැනුවා.

"එච්චර හොඳින් නෙමේ කතා කළේ..."

"ඔ..ව්..."





"මොකද පුතා..."

"එහෙම දෙයක් නෑ අම්මා... බැඳලා බලනවා..."

වසන්තිගේ දෙපතුල් සීතල වීගෙන ගියා.

"මොකද එහෙම කියන්නේ..."

"දැන් කියන්න කිසිම දෙයක් නෑ අම්මේ..."

"ප්‍රශ්න දාගන්නැතුව ඉන්න පුතා..."

"පුළුවන් හොඳම විදිහට ඉන්න බලනවා අම්මේ..."

වසන්තිට හරි දුකක් දැනුණා... තාරක ඉන්නෙත් සතුටින් නෙමේ කියලා ඇයට හිතුණා. වසන්තිට මතක් වුණේ මනෝජා මේ කසාදේ තීන්දු කරපු අලුත කියපු කතාවක්... "මේ කසාදේ හොඳට හිතලද වසන්ති තීන්දු කළේ..." එදා ඒ ගැන ඒ තරම් වසන්ති හිතුවේ නෑ. ඒත් අද මොකක්ද බයක් වසන්තිට දැනෙනවා.

"දිල්ගේ අම්මත් කතා කළා..."

වසන්ති කොල්ලට පිට්ටු කෑලි දෙකක් බෙදමින් කිව්වා.

"ම..ටත් ක..තා කළා..."

"ඇයි ඒ පුතා..."

"ප්‍රශ්න අහන්න... මං ගියේ ගමනක්නේ අම්මා... නරක ගමනක් නෙමේ... මං ආස නෑ එහෙම ඔයාවත් අහන්නැති දේවල් වෙන කෙනෙක් අහනවට..."

පිරිමි දරුවොත් එක්ක වැඩ කරන්න ඕන හරි පරිස්සමින්. ඒක වසන්ති දන්නවා... ඒත් දිල්වත් ඇගේ අම්මාවත් ඒක දන්නේ නැතැයි වසන්තිට හිතුණා.

"අ..ම්මේ..."

"ම්..."

"මං බැඳලා මෙහෙම නේද ඉන්නේ..."

"ඇයි පුතා..."

"නෑ ගෙදරම ඉන්න මං ආසයි..."

"මේ සාගරේ වගේ ගේ ඔයාගේ පවුලට විතරක් නෙමේ පුතා ඔයාගේ දරුවන්ගේ පවුල් වලටත් ඇති..."

"ඇහුවොත් අම්මා කියන්න..."

"ඒවා ඔය දෙන්නා කතා කරලා තීරණය කරන්න පුතා... මං කොහොමද කියන්නේ..."

"ම්... පිට්ටු රහයි අම්මා..."

"ඔයා ආස නිසා ඔය පද්මට කියලා හැදෙව්වේ... මේ මස් කරි දාගන්න තව ටිකක්..."

"කිරියි ලුණුමිරිසුයි එක්ක රහයි..."

මීලඟ "සඳරාජිනී" කලාපය සමඟ
තවත් රසබර කොටසක්...






www.sinhalaelibrary.com

# ආදරය ගින්දරක්

සුජීව ප්‍රසන්න ආරච්චි



හැමදාම මට මොකක්ද අඩුවක් දැනුණා... ඒක විස්තර කරන්න මට තේරෙන්නේ නෑ... හිතං මොකක්ද දෙයක් නැහැ වගේ මට නිතරම දැනෙන්න ගත්තා... ඔයා ආත්මෙක මට හිමුණා දෙයක් මේ ආත්මේ මට නෑ වගේ මට දැනෙන්න ගත්තා... මම හොඩක් හිතුවා... අයි මට මෙහෙම හිතෙන්නේ කියලා... ඒත් තේරුමක් තිබුනේ නෑ... ඒක දවසක මම ඔයාව දැක්කා... ඔයාගේ ඇස් දෙක මගේ ඇස් ඉස්සරහට ආවා... එදා මට පුදුම හිතුණා... පස්සෙන් පසු මම තේරුම් ගත්තා මේ ආත්මේ අඩුවක් වගේ තේරුනේ ඔයා නැති එක කියලා... මගේ ජීවිතේ මේ දැනෙන අඩුව ඔයා කියලා මම හරියටම තේරුම් ගත්තා... මෙකයි... අපි පහුගිය ආත්මෙක එකට උන්නා... සමහරවිට මේ ආත්මෙට ගෙන හිමුණා අතීත ආත්මේ වෙන්න ඇති... ඉතින් මොකද කරන්නේ... ඔයා හිතනවද මට මේ ආත්මේ ඔයා නැතුව ජීවත්වෙන්න පුළුවන් කියලා... එහෙම වුනොත් මට නැති දාම ලොකු අඩුවක් දැනෙයි... හිතං හිස් ගතියක්... මොකක්ද නෑ වගේ... එහෙම වෙන්නේ නොහොඳ... එතකොට ජීවිතේ සම්පූර්ණ නැහේ ඔයා... ඉතින් මම තීරණය කළා ඔයාගේ ජීවිතේ කොටසක් වෙන්න... ඇත්තම කතාව මෙකයි... මට ඕන ඔයාව මගේ කරගන්න... මොකද ඔයා නැතුව පැ මම සම්පූර්ණ නෑ... [illegible] ඔයාටම කියනම්... හෝදි... ඉතින් කියනවා මම ඔයාට හරි ආදරෙයි... හොඩක්... කියන්න බැරි තරම්........"

www.sinhalaelibrary.com


නවකතා තිළිණය
04 පොත
ආදරය ගින්දරක්
එය ඇහිවූ දා සිට සැනසීමක් නැත...
www.sinhalaelibrary.com
සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්

එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...

## සුජීව ප්‍රසන්න ආරච්චි

ඔකද්දී ඔහුට සිහිවූයේ උපේක්ෂාව... කෙල්ල කැවද දන්නෑ... පව්... ඇය ගැන හිතද්දී පපුවට එන්නෙ වෙනස්ම හැඟීමක්. ඒ හැඟීම පපුවේ තියෙද්දී හදවතට වෙනස්ම නිවනක් දැනෙනවා. ඒ නිවන පුදුමාකාරයි.

"අ..ම්මේ..."

"ම්..."

"තනියමම ඉන්න තිබ්බනම් හොඳයි අම්මේ..."

"මො..නාද මේ කියන්නේ... ආ..."

"නෑ මං නිකං කිව්වේ..."

"ජීවිතේ පටන් ගන්නකොටම අවුල් කරගන්නෙපා පුතා..."

තාරක කතා කළේ නැහැ. ජීවිතේ තවම අවුල් වෙන්න පටන් ගත්තේ නෑ කියලා ඔහු හිතුවා. ඒත් දැන් මේ ජීවිතේ හැම දෙයක්ම එහෙමම බාර ගන්න තාරක සූදානම්. දුප්පත් පවුලක දුප්පත් කොල්ලෙක් වෙලා ඉපදුනානම් කියලා තාරකට හිතුණා. තාරක උඩට ආවේ අම්මා හදලා දුන්න තේකත් අරගෙනමයි... ඇඳට බර වෙද්දී තාරකට සිහි උනේ පෙරදා රාත්‍රිය... නුවරඑළියට නා කපන්න වැහැපු ඒ රාත්‍රියේ කෙල්ල උන්නේ අඟල් දහයක් පහළොවක් එහායින්...

"ඒ රෑ මොනවා හරි උනා වගේ..."



ශරීර වලින් කිසිම දෙයක් නොවී හදවත් වලින් කොතරම් නම් දේවල් වේන්නට පුළුවන්ද... උපේක්ෂාට කතා කරන්න හිතුණත් තාරක කතා කළේ නෑ. ඒ පපුවටත් පෑදෙන්න දෙන්න ඕන... තාරක හිතුවේ එහෙමයි...

උපේක්ෂා ඇඳට ආවේ ඔහු ගෙනවිත් තිබූ ලා දම් පාට කොට්න් රෑ ඇඳුමත් ඇඳගෙනමයි. මේ ඇඳුම් අඳින හැම වාරයකම ඇගේ පපුවත් වතත් මොනවායින්ද වගේ පිච්චෙනවා. ඒක මහ පුදුමාකාර පිච්චීමක්.

උපේක්ෂා රෑ ගවුම දාගෙන මනෝජාගේ කාමරයට ආවා...

"ෂා.. ලස්සන නයිට් ඩ්‍රෙස් එකක්... තාරක ලස්සනට තෝරලා... එයාට හොඳ ඇහැක් තියෙනවා..."

ඒ ඇහින් ඔහු තෝරපු ඔහුගේ පෙම්වතියව බලන්න උපේක්ෂාට ආසයි...

"එහෙනම් පුතේ නිදාගන්න... මොනව හරි ඕන උනොත් මට කතා කරන්න... මං ඉන්නේ අඩ නින්දේ..."

"හො..ඳයි ඇන්ටි..."

"තනියම ඇඳේ නිදාගන්න පාළුනම් මගේ ටෙඩියෙක් ඇඳේ තියාගන්න..."

"මං එ..කෙ..ක්..ව ග..ත්..තා ඇන්ටි..."

කෙල්ල හිනාවෙලා බිම බලාගෙන කිව්වා.

උපේක්ෂා ඇඳ අද්දරටම ඇවිත් මනෝජාගේ දෙපා අල්ලලා වැන්දා...

"අ..නේ.. බුදු සරණයි පුතේ... කෝ එ..න්..න කිස් එකක් දෙන්න..."

මනෝජා කෙල්ලව දැතින්ම වැළඳගෙන ඉම්බේ දුවෙක්ව ඉඹිනවා වගේ.

"ම්.. ගෙදර කියලා හිතලා නිදාගන්න... අපි උදේට කිරිබත් හදමු..."

කෙල්ල යන දිහා මනෝජා බලාගෙන උන්නේ හරි හැඟීමෙන්... ඇයට බැලුණේ ඇගේ සැමියගේ රූපය දිහාව... "අපේ ගෙදරට දුවෙක්



www.sinhalaelibrary.com

ඇවිත්... ඔයා හිටියනම් කෙල්ලට හරි ආදරේ වෙයි... ඔයා ආස උනෙත් දුවලටනේ..." මනෝජා සිතුවා.

උපේක්ෂා ඇඳ මත ඉඳගත්තේ හිතින් ඔහුගේ දෙපා වදිමින්. මේ තියෙන සැනසීම දුන්නේ ඔයා... මාව රැක ගත්තේ ඔයා... මගේ ජීවිතේ උදාවෙන හැම රැකම මං හිතෙන් ඔයාට වැඳලා නිදාගන්නේ... මගේ හිතට තියෙන සැනසීම එච්චරයි...

ජීවිතය කොච්චර පුදුමාකාරද කියලා උපේක්ෂාට හිතෙනවා... පෙරදා රාත්‍රියත් මේ දැන් උදාවූ රාත්‍රියත් අතර ඇත්තේ කොතරම් ලොකු වෙනසක්ද...

"කොච්චර දුකක් තිබ්බ රැක් උනත් ඊයේ රෑට මං ආසයි... ඒ රෑ හරි පුදුමාකාරයි..."

ඒත් මේ සැනසීම කොතරම් කාලයකටද... රංගනත් ඔහුගේ පියාත් අම්මාත් තමාව පිස්සු බල්ලන් සේ සොයන බව උපේක්ෂා දන්නවා.

"ඇයි මං නීතියෙන් ඒ බල්ලට බැඳුනේ... ඇයි ග්‍රෑන්ඩ් හෝටලේදී මං ගන්න තිරණේ මට වෙඩින් එකට කලින් ගන්න බැරි වුණේ..."

උපේක්ෂා දහ අතේ සිතුවා. එහෙම හිතෙන්නේ අද... ඒත් ඒ මොහොතේදී ඒ තරමටම තමා අසරණව උන් බව ඇයට මතකයි.

"මේ පුංචි ගෙදර ටික කාලයක් මට ඉන්න ලැබෙන එකම ලොකු දෙයක්... එහෙම ඉඳලා ජීවිතේ ගැන හිතනවා..."

අලුත් රෑ ඇඳුමින් එන්නේ සනීප සිහිල් සුවඳක්... කෙල්ලට ඇස් පියවුණේ ඒ සුවඳ සමඟමයි...

*** *** *** *** ***





උදේ මනෝජාගේ ගෙදරට ගිහින් උපේක්ෂාව ටිකකට බලන්න තාරකට ලොකු ඕනකමක් තිබ්බා. නන්නාඳුනන ගෙදරක කෙල්ලෙක්ට එකවර ජීවිතේ පිළිවෙලක් කර ගන්න කොච්චර අමාරුද කියලා තාරකට තේරෙනවා.

"උපේක්ෂා හොඳයි... ඒ හොඳකම මනෝජා ඇන්ටිට තේරෙනවා... ඒ හින්දා දෙන්නා ආදරෙන් ඉඳී..."

කෙනෙකුව හදාවඩා ගනිද්දී මේ තරමම සතුටක් එන බවක් තාරක දැනං උන්නේ නෑ. උදේ ඇඟ සෝදාගෙන එද්දීම දිල්කි තාරකගේ කාමරයේ ඇඳ උඩ ඉඳගෙන උන්නා...

තාරක ඇත්තටම වෙනසක් නැතුව දිල්කි එක්ක හිනාවුණා. මොනවා උනත් ඇය හරි ලස්සනයි. බටහිරට හුරු ඒ ලස්සන කෙනෙක්ගේ ඇස් ඒ වතටම අලවන තරම් එකක්.

"ගුඩ් මෝනිං බබා... ඉ..තින්..."

තාරක ඇදේ ඇය ළඟින්ම ඉඳගත්තා.

"උදෙන්ම වොෂ් එකක් ආගෙන පනින්නනේ හිටියේ..."

තාරක හිනාවුණා.

"මං කිව්වනේ මං ඔයා එනකල් ඉන්නවා කියලා..."



www.sinhalaelibrary.com

"චේන්ජ් එකක් දාගන්න එහෙනම්... එහෙන් බ්‍රේක්ෆස්ට් ගමු..."

"මෙහෙන් කාලා යං..."

"මහ්... එහේ අම්මා බලාගෙන ඉන්නවා..."

තාරක කතා කළේ නැහැ. මේ පාන්දර ඇවිලෙන්න ඔහුට ඕන උනෙත් නෑ.

"අද ලන්ච් වලට මල්කි අක්කලත් එනවා... අපි ලන්ච් වලටත් ඉඳලම යන් හොඳද..."

"හොඳයි... ලන්ච් වලටත් ඉන්නවා..."

තාරක අල්මාරිය ඇරලා ඇඳුමක් තේරුවා. අද හිතට එච්චර හරි නැති දවසක්.

"තාරක..."

"ම්..."

"ඇයි ඊයේ එන්න රෑ උනේ..."

"මං කිව්වේ මං හිමිහිට ආවේ... දැන් ඒ ප්‍රශ්නේ ඔයා අදටත් ගෙනාවද..."

"මං ප්‍රශ්න ගේන්නෑ... ඔයානේ ප්‍රශ්න දාන්නේ..."

"දැන් ගිය සතියේ ඔයා අර බොරැල්ලේ යාළුවෙක්ගේ පාටියට ගියා..."

"ඔව්..."

"එද්දී කීයද..."

දිල්කි බිම බලා ගත්තා.

"රෑ එකයි... නේ..ද..."

"ඉතින් ඒ මගේ ක්ලාස් මේට්ල්ස්ලා හම්බ උන නිසානේ..."

"එයාලත් එක්ක ජොලියේ ඩාන්ස් කළා..."

"ඔව්..."

"මං ඇහුවද ඔයාගෙන් ඒ ගැන..."





"ඉතින් අහන්නකෝ... පාටියකට යන්න බැරිද... සමහර පාටීස් වලට ගියාම ඊටත් වඩා රෑ වෙනවා... ගත්තා වාහනේ ආවා..."

"ඔයා ඒ පාටියට යන්න මට කතා කළේ නෑ..."

"ඒකට කාගෙවත් බෝයි ෆ්‍රෙන්ඩ්ස්ලා ආවේ නෑ..."

තාරක හිනාවුණා.

"එතකොට ඔයා ගිය මාසේ ගෝල් ගියා..."

"ඔව්..."

"කිව්වේ දවස් දෙකකින් එනවා කියලා ආවේ සතියකින්... ඇයි ඒ..."

"මං ගියේ අම්මත් එක්ක..."

"ඒත් ලයිට් හවුස් හොටෙල් එකේ රෑ ඔයා තනියම හිටියා.. නේද..."

දිල්කි පුදුමයෙන් වගේ තාරක දිහා බැලුවා. "ඒවා මෙයා දන්නේ කොහොමද..." ඇය හිතුවා.

"නේ..ද..."

"මං හිටියේ අම්මත් එක්ක..."

තාරක ලස්සනට හිනාවුණා.

"ඔයා එදා රෑ... ඒවා ඕන නෑ දිල්..."

කියන්න ගිය දේ තාරක ගිල ගත්තා.

"ඔයා කොයි වෙලාවෙද ගෙදර ඉන්නේ... මට කියන්න බලන්න..."

"ගෙදරට හිරවෙලා ඉන්නේ මොකටද..."

"බැන්දට පස්සෙත් එහෙමද ගෑණු ළමයා..."

"ආ හිතං ඉන්නේ මං බබාලා හදාගෙන හොදි හැදි ගගා ඉඳී කියලද... මේ තාරක මං එහෙම ගර්ල් කෙනෙක් නෙමේ හොඳද..."

"දන්නවා... ඒවා දැනගෙනම තමා මං මේ ඔයාව මැරි කරන්නේ..."

"ඉතින්..."

"ඉතින් බැඳලා බලමු.. නේද..."



www.sinhalaelibrary.com

"අද මොනාද වෙලා තියෙන්නේ ඔයාට..."

තාරක කතා කළේ නෑ. ඔහු සරල ඩෙනිම් කලිසමකුයි සුදු ටී ෂර්ට් එකකුයි තෝර ගත්තා.

"මළ ගෙදරක නෙමෙනේ යන්නේ..."

"මං උදේට අඳින්නේ සුදු දිල්... රෑට කළු..."

"අර මිනිස්සුත් එනවනේ..."

"ඉතින් ආපුදෙන්..."

දිල්කි කතා නොකර රවාගෙන උන්නා. තාරක ඇඳුම ඇඳගෙන අතින් හිසකෙ හදාගෙන ජංගම දුරකථනයත් යතුරත් අතට ගත්තා.

"හරි මං රෙඩි..."

දිල්කි නැගිට්ටේ කේන්තියෙන්මයි. ගාල්ලේදී සිදුවූ දේවල් තාරක දන්නේ කොහොමද කියලා ඇය පහළට යද්දී හිතුවා. ගාල්ලේ ලයිට් හවුස් හෝටලයේදී සිදුවූ සියල්ලම ඔහු දන්නවා නම් තමාව බඳින්නේ වත් නැති බව දිල්කි දන්නවා.

"ආ ඉතින් ඔය යන්නද... ඉන්න දුවේ කෑම ටිකක් කාලම යන්න..."

"බෑ ඇන්ටී අම්මා තාරකටත් එක්කම බ්‍රේක්ෆස්ට් හදනවා..."

අම්මට බැලුනේ තාරක දිහාව... ඇයට ඊයේ ඔහු කියූ දේවල් සිහිවුණා.

"ම්..."

තාරක අම්මට වැන්දේ දිල්කිට යන්න ඇරලා.

"මං යනවා අම්මා... අම්මා කන්න..."

"ම්.. බුදු සරණයි..."

වසන්ති යන දෙන්නා දිහා බලා උන්නේ පපුවේ මොකක්දෝ ගින්දරක් එද්දී...

*** *** *** *** ***





තාරක දිල්කිගේ නිවසින් පිටවුණේ දවල් එකට පමණ. ඒ ගෙදර සෙනඟ පිරිච්ච ගෙයක්. තාරක එහෙම කානිවල් වගේ තියෙන ගෙවල් වලට ආස නෑ. එහෙම ගෙදරකදී දැනෙන්නේ පුදුමාකාර අසහනයක්.

"හෙට අම්මගේ බර්ත් ඩේ එක... රෑට එන්නෝන හොඳද..."

"පාටියක්ද..."

"ම්... ස්මෝල් පාටි එකක්... දන්නැද්ද..."

තාරක වාහනයට නැග්ගේ මොනවත්ම නොකියා.

"දිල්..."

දිල්කි වාහනයේ රියදුරු අසුනට බර වුණා.

"ඇයි..."

"අම්මට කියන්න හෙට පාටි නොදා පොඩි පින්කමක් කරන්න කියලා... මාත් ඕන සපෝට් එකක් දෙන්නම්..."

"ඒක හරි බෝරිං අනේ... අම්මා සර්වන්ට් අතේ පන්සලට ආනේ යවනවා නිතරම... මය ඩොනේෂනුත් දෙන්නේ පන්සලට..."

"හරි හරි... මං ගියා..."

තාරක සෑහෙන දුරක් යන තෙක් හිතුවේ දිල්කි ගැන... "ඔයාව හදාගන්න පුළුවන් නම් මට ලස්සන නෝනා කෙනෙක් වෙයි. බලමු..." ඇත්තටම තාරක එහෙම හිතුවා.



www.sinhalaelibrary.com

"අද වෙන මොනවත්ම කරන්න හිතේ නිදහසක් නෑ... උපේක්ෂාවත් බලලා ගෙදර යනවා... හෙටම වැඩ පටන් ගන්නවා..."

තාරක එහෙම හිතුවා. ඔහු දියවන්නාව දෙසට වාහනය දැම්මෙ එහෙම හිතාගෙනයි. කෙල්ල ජීවිතේට මොනා කර ගනීද කියලා ඔහු හිතුවා. මුල ඉඳන් හැමදේම පටන් ගන්න එකත් පුදුම අමාරු දෙයක්.

**"උපේක්ෂාට ඒක කරන්නම වෙනවා... පුළුවන් උදව්වක් මං කරනවා... ඒත් හැමදේම තියෙන්නේ කෙල්ල අතේ..."**

නීතියෙන් කෙනෙක්ට බැඳිච්ච ජීවිතයක් මෙහෙම හැංගීලා ගත කරන්න පුළුවන්ද... ඒ ගැන තාරකට හිතාගන්නට බෑ.

තාරක මඟින් වාහනය නවත්තලා බටර් කේක් එකක් ගත්තා. කොහොමත් උපේක්ෂා උන්නත් නැතත් ඔහු ඒ ගෙදරට යන්නේ මොනවා හරි අරගෙනයි.

උපේක්ෂා ඈතදීම ඔහුගේ වාහනය එනවා දැක්කා. ඒ මොහොතේදී ඇය උන්නේ හාවෙකුගේ ඇස් අල්ලමින්නුයි. උදේ ඉඳලා කෙල්ල බනි හාවුන් පනහකගේ පමණ ඇස් ඇල්ලුවා... ඒක හරි සුන්දර අත්දැකීමක්.

ඔහු ඈත එනවා දකිද්දී උපේක්ෂා එහෙමම නැගිටලා බෝගන්විලා මල් ගස් පිරුණ මිදුලට ආවා. තාරක ඈත තියාම කෙල්ල දිහා බලාගෙන උන්නා. ඇය මේ ඇඳගෙන ඉන්නේ ඊයේ තමා තෝරපු ඇඳුම්... ඒ රතු පාට ගවුමට කෙල්ල ලස්සනට ඉන්නවා කියලා ඔහුට හිතුණා.

ඇත්තටම ඔහු දුවෙක්ට ඇඳුමක් තෝරපු තාත්තා කෙනෙක් වගේ සතුටු වුණා. ඒ සතුට මිල කරන්න බැරි තරම් අහිංසක සතුටක්. එය එහෙමම හදවතේ රහසිගතව පිපී තිබ්බදෙන් කියලා තාරක හිතුවා. ඇය දොර ළඟටම ආවා...

**"ළමයට ගවුම ලස්සනට තියෙනවා නේද..."**

ඒ තරම් ළඟ ඉඳගෙන ඔහු බලද්දීත් ඇගේ හිතට අපහසුතාවයක් දැනුණේ නෑ.





**"ඇන්ටි අඳින අඳින ඇඳුමට ලස්සනයි කියනවා... මේ දැන් නාලා ඇන්දේ..."**

කෙල්ල ඉන්නේ සතුටින් කියලා ඒ මුහුණින් පේනවා.

**"මො..නාද මෙතනට වෙලා කළේ..."**

**"බනීලගේ ඇස් මැහුවා අයියේ... මේ..."**

**"ම්..."**

ඒ ඇස් එහෙමම නතර වෙලා තිබ්බා. උපේක්ෂා ඔහුට කෘතගුණ සළකන්න වගේ ඔහු දිහා බලාගෙන උන්නා.

**"කො..හොමද දරුවෝ මෙහේ..."**

**"අ..යියට පි..න් මා..ව මෙ..හෙම..."**

බලාපොරොත්තු නොවූ ලෙස කෙල්ලට ඇඬුණා.

**"අඬන්නෙපා... සතුටින් ඉන්න... එච්චරයි මටත් ඕන..."**

තාරක ඇයත් සමඟම ඇතුළට ආවා.

**"කෝ මනෝජා ඇන්ටි..."**

**"මේ ළඟට ගියා... පමුණුවට... නූල් වගයක් ගේන්න..."**

තාරක පුටුවේ ඉඳගෙන ඇය දිහාම බලා උන්නා.

**"මට හරි සතුටුයි උපේක්ෂා මෙහෙම ඉන්න එක... මේ පැය ටිකට තවත් ලස්සන වෙලාදත් කොහෙද..."**

ඇය යංතමට හිනාවුණා.

**"මං තේ හදන් එන්නද..."**

**"බොමු ප්ලේන්ටියක්... මං බටර් කේකුත් ගෙනාවා..."**

**"එහෙනම් මං කපන්නම්..."**

**"කපලා තේ බොමු..."**

තාරකත් ඇයත් සමඟම කුස්සියට ආවා.

**"ඇන්ටි පුදුම හොඳයි... රෑත් ඇවිත් මාව බලනවා... අපි උදේ කිරිබත් හැදුවා... කද්දි ම..ට අයියව ම..ත..ක් වු..ණා..."**

ඒ ඇස් දිහා බලාගෙනම ඉන්න හිතෙන්නේ ඇයි කියලා ඔහුට තේරෙන්නෑ.

"උපේක්ෂා..."

"අ..යියේ..."

"ගෙදර ත..ත්වේ බලාගන්න ඕ..න..ද..."

උපේක්ෂා නැයි කියන්න වගේ හිස දෙපසට වැනුවා.

"අ..යියා මට පුංචි පාරක් පෙ..න්..නුවා... මං ඒ පාරේ හිමිහිට ය..න්..නම්... මට එ..ක උද..ව්..වක් වි..තරක් ක..ර..න්..න..."

"මො..ක..ක්..ද උපේක්ෂා කියන්..න..."

"ඔ..යාගේ..."

"ම්..."

"ෆොටෝ එ..ක..ක් මට ගෙ..න..ත් දෙ..න්..න..."

"ඇයි උපේක්ෂා... මොකටද..."

"ඊ..ට වැ..දලා නිදාගන්..න..."

උපේක්ෂා එහෙමම ඒ වචන ටික කිව්වා. තාරක ඇය දිහා බලාගෙනම උන්නා...

ජීවිතයේ ප්‍රථම වරට ගැණු හදවතක් ගැන තාරකට අසාමාන්‍ය තෘෂ්ණාවක් ආවා. උපේක්ෂා මෙහෙම කියන්නේ මුළු හදවතින්ම කියලා තාරක දන්නවා. ජීවිතේ ගැන මනුස්සකම් ගැන බොරු පූවානම් කියවන්න පුළුවන් තත්වෙක නෙමේ ඇය උන්නේ. ඒ බව ඔහු දැනගෙන උන්නා.

"උපේක්ෂා සතුටින් හිටියොත් මට ඒ ඇති..."

"මං එ..හෙම ඉ..න්..න බලනවා අයියේ... අයියා උදව් කළේ ජීවිතේ හරි අමාරුම තැනකට වැටිච්ච කෙල්ලෙකුට... ඒ ගැන කියන්න... ම..ට..."

ඇයට ඇඬෙන්නට ගියා... තාරක ඒ හිස මෘදුව ටික වේලාවක් පිරිමැද්දා...

"ඔ..ව්.. මං උපේක්ෂාට උදව් කළා... ඔයා දන්නවද... ඒකෙන් මාත්





ලොකු සැනසීමක් ලැබුවා..."

"අ..නුන්ට දෙයක් කරලා එහෙම සැනසෙන්නේ හ..රි උ..තුම අය අයියේ..."

තාරක හිනාවුණා... ඒ හිනාව හරි මනුස්ස පාටයි.

"ආ..."

උපේක්ෂා කපාපු කේක් පීරිසියකට අලා ඔහුට පෑවා.

"උපේක්ෂත් කන්න..."

"ම්..."

ඇය ඔහුට ගොඩක් හිතල හිතලා තේකක් හැදුවා... ඔහු බොන්නට ආශා කරන්නේ ප්ලේන්ටී... බටර් කේක් එක්ක රහ ප්ලේන්ටි තමා...

"ගොඩක් පරිස්සම් වෙලා ඉන්න උපේක්ෂා... මනෝජා ඇන්ටි එක්ක උනත් එළියට යන්නෙපා..."

"හො..දයි අයියේ..."

"ගෙදරටම වෙලා හිරවෙලා ඉන්නත් බෑ තමා..."

"එ..හෙම නෑ අයියේ... මනෝජා ඇන්ටි එක්ක ඉඳිද්දී පාළු නෑ... මේ ටෙඩී බෙයාර්ස්ලත් ඉන්නවනේ..."

"මං වෙලාවක ඊක ඔය රවුමක් එක්ක යන්නම්... මඟින් ආප්පයක් එහෙම කාලා රවුමක් අලා එමු..."

උපේක්ෂා හිස වැනුවා. ඇය උන්නේ ඔහු දිහාම බලාගෙන... ඒ බලා ඉන්න අතරවාරයේදී ඔහුත් ඇය දෙස බැලුවා. දෙන්නගේ නෙත් හතර ගැටුණා. එහෙමම තත්පර කිහිපයක් ගෙවුණා.

"ඇස් දෙකේ මොනවද ලියලා තියෙනවා වගේ..." ඔහුට එසේ සිතෙයි.

"මොනාද උපේක්ෂාට ගෙනත් ඕන... හෙට අනිද්දා එද්දී මං ගේන්නම්..."

"අ..නේ අ..යියා සේ..රම ගෙ..න..ත් දුන්නනේ..."

"තියෙන යට ඇඳුම් ඇද්ද..."



www.sinhalaelibrary.com

එහෙම අහද්දී ඇයට පුදුමාකාර දේවල් හිතෙනවා. උතුරා යන මනුස්සකමක් තියෙන කෙනෙකුට ඇරෙන්න එහෙම අහන්නත් බෑ.

"අ..නේ ඇ..ති අයියේ..."

"මං එන වෙලාවක ඔය ෂැම්පු සබන් ක්‍රීම් ටිකක් ගෙනත් දෙන්නම්... ගාලා නාලා ලස්සනට ඉන්න ආසනේ නේද..."

ඒ පිරිසිදු පාට කෙල්ලගේ මුහුණින් පෙනෙයි.

"හාමෝ මහන්න දැන් දන්නවද..."

"ටිකක් දන්නවා... මං ඇන්ටිගෙන් ඉගෙන ගන්නවා අයියේ..."

"ඒ වැඩේ මරු නේද..."

"ම්..."

"ඒ වැඩේ ඉගෙන ගන්න... අපි කාලෙක පුංචි සොෆ්ට් ටොයිස් වැඩපලක් දාමු..."

උපේක්ෂාට එහෙම කියද්දී ආසයි.

"ඒ වැඩ ළමයා දන්නවනේ නේද... තාත්තගේ ගාමන්ට් එකේ වැඩ කළා කිව්වේ නේද..."

"ඔ..ක්..කො..ම ද..න්..නවා අයියේ..."

"අපි කරමු... උපේක්ෂා ඉගෙන ගන්න... වටිනම දේ මොකක්ද දන්නවද උපේක්ෂා..."

"මො..ක..ක්..ද අයියේ..."

"හිත වට්ට ගන්නෙපා... වැටෙන්න වගේ යනවනම් මට කතා කරන්න... මං ඔයාට කඩා වැටෙන්න දෙන්නෑ..."

ඇය පුංචි දෙවියෙක් දිහා බලාගෙන ඉන්නවා වගේ ඔහු දිහා බලා උන්නා.

*** *** *** *** ***





www.sinhalaelibrary.com

උපේක්ෂා ප්‍රථම වරට මැහුවේ ලස්සන හිම වලහෙක්. ඒ හිම වලහා අවසාන වෙද්දී කෙල්ලගේ දෑසට කඳුළු පිරුණා. ඇය එය දෝතට අරගෙන බලාගෙනම උන්නා... ඊටත් පස්සේ මේසේ උඩ තියලා වටේට කැරකි කැරකී බලා උන්නා...

මේ හිම වලහා ඇගේම නිර්මාණයක්. මනෝජා ඇයට බ්ලොක් එක හදාගන්න උදව් කළා විතරයි. තාත්තා ජීවතුන් අතර සිටිද්දී පැටින් මේකින් ගැන ඇය හොඳ අවබෝධයක් ගත්තා... උපේක්ෂා මේ වැඩ කරද්දී ප්‍රථම වරට ඒ දැනුම යොදා ගත්තා. සාම්පලයක් ලස්සනට හදන්නේ කොහොමද කියලා ඇය හොඳට දන්නවා.

හදපු හිම වලහට ඇය රතු රිබන් පටියකින් බෙල්ලට බෝ එකක් ගැහුවා. ඊට පස්සේ ඌව දෝතින්ම රැගෙන මුහුණට තබා සිප ගත්තා.

උපේක්ෂා එය රැගෙන ගියේ දොරකඩ පඩියේ වාඩිවෙලා බෝගන්විලා ගස් දෙස බලාගෙන වැඩක් කරමින් උන් මනෝජා ළඟට... දැන් උපේක්ෂා මේ ගෙදරට ඇවිත් සතියක් විතර වෙනවා. ඒ සතියට ඇයයි මනෝජයි අම්මයි දුවයි වගේ ළං වුණා. මනෝජටත් උපේක්ෂාව නැතුවම බැරි වුණා. "ඔයා නම් පැටියෝ ගිය ආත්මේ මගේ දුවෙක්ම වෙන්න ඇති..." මනෝජා මේ කතාව හතර පස් සැරයක්ම කිව්වා.

"සුදු ඇන්ටි..."

ඒ උපේක්ෂා ඇයට දාපු අලුත් නම. ඒ නමට කෙල්ලත් ආසයි. මනෝජත් ආසයි. කොහොමත් මනෝජා හරිම සුදුයි.

"කො..හෙද හිටියේ..."

"කාමරේ..."

කෙල්ල දෙයක් පිටුපසට කරගෙන සඟවාගෙන ඉන්නා බව මනෝජාට පේනවා.

"බඩුවක් පෙන්නන්න යන්නේ..."

"ඉතින් පෙන්නන්නකෝ ඔය බඩුව... අගේ නොකර..."

මනෝජා හුරතලේට කිව්වා. කෙල්ල හිනාවෙලා ළඟට ආවා.

"මට ඕන හොඳ විවේචනයක්..."

"හරි..."

"වර්ණනා කරන්නෝන පස්සේ... මුලින් අඩුපාඩු කියන්නෝන..."

"හරි..."

උපේක්ෂා ඇය හැදූ ඇගේ පුංචි නිර්මාණය දෝතින්ම ඇයට පිළිගැන්නුවා.

"ස්වීට්..."

මනෝජාගේ මුවින් ඉබේටම ඒ වචන පිටවුණා. ඇය පුදුමාකාර උනන්දුවකින් කෙල්ල හදපු හිම වලහා දිහා බලාගෙන උන්නා. ඊටත් පස්සේ ඌව ඒ පැත්ත මේ පැත්ත පෙරලලා බැලුවා. මනෝජාට ලොකු දෙයක් වැටහෙනවා. ගෙදරට ඇවිත් ඉන්නේ නිකම්ම කෙල්ලෙක් නොවේ කියලා ඇයට වැටහෙනවා.

"පු..තේ..."

"ඇ..න්..ටි..."

"ඔහොම ඉඳගන්න මැණික..."





උපේක්ෂා පඩිය උඩ ඇය ළඟින්ම ඉඳගත්තා. ඊටත් පස්සේ ඇය කෙල්ලගේ අත අල්ලගෙන පිරිමැද්දා...

"මං කෙල්ලේ ටෙඩි බෙයාර්ස්ලා දහ පාළොස් දාහක් හදලා තියෙනවා... මේ අත් දෙකින්..."

"ම්..."

"එතකොට ටෙඩී බෙයාස්ලා ලක්ෂ ගාණක් මං දැකලා තියෙනවා... සාප්පුවල මැගසින් වල කැට්ලොග් වල ප්‍රදර්ශනවල... තේරුණාද..."

"ඔ..ව්..."

"එහෙම පුංචි දේකින් ලේසියෙන් මාව පුදුම කරවන්න බෑ... දැකලා දැකලා ලොකු අමුත්තක් පේන්නෑ..."

"ම්..."

"ඒත් මේකා දැක්කහම මට හරි ආස හිතුණා... ලස්සනට ෆිනිෂ් කරලා... හ..රිම ස්වීට්... කියුට්... හුරතල්... විෂ් යූ ඕල් ද බෙස්ට් මැණික..."

ඇය කිව්වේ කෙල්ලගේ හිසකේ අතගාලා වගේ.

"ඇ..ත්තටම ල..ස්ස..නයිද ඇන්ටි..."

"ම්... අපි තව හදමු... මේ නාකි අත්වලට වඩා හුරතල් නිර්මාණ ඔය සුදු අත්වලින් එනවා..."

"ඒ වු..ණා..ට ම..ට උගන්නපු මේ අත්දෙකට මං හරි ආදරෙයි..."

උපේක්ෂා පහත් වී මනෝජාගේ වියපත් දෑත් ඉම්බා. මනෝජාගේ දෑස් කඳුළින් පිරුණා.

"මූගෙන් ටිකක් වැඩිපුර හදමු..."

"මං හ..දන්න ග..න්..න..ම් ඇන්ටි..."

"ඊට පස්සේ මොකාද හදන්න ගන්නේ..."

"ෆ්රැන්ක්ලින්ව... අර කාටූන් එකේ ඉන්න හුරතල් ඉබ්බව..."

"ම්... ඌ ලස්සනයි තමා..."



www.sinhalaelibrary.com

"ඇන්ටි මට රෙදි ගෙනත් දෙන්න... ඩාක් ග්‍රීන් ඩබල් ජර්සි රෙද්දයි ලයිට් ග්‍රීන් චයිනිස් සැටින් රෙද්දයි... තව වැපටා මෙටීරියල් ටිකකුත් ඕන..."

මනෝජා පුදුමයෙන් කෙල්ල දිහා බලා උන්නා.

"ඔ..යා පු..තේ මේ... මේ මෙටීරියල් ගැ..න ද..න්නේ..."

උපේක්ෂා හිනාවුණා.

"මං පැටින්..."

"කියන්න පුතේ..."

"මගේ තා..ත්..තට ගා..ම..න්ට් ෆැක්ටරි එ..ක..ක් තිබ්බා... මං ඒකේ පැ..ට..න් මේකර්..."

කෙල්ල දිහාම මනෝජා බලා උන්නා.

"ප..ට් තා..ත්තා දාලා ගියානේ..."

"ඒක..නේ... මං හදන්න ගන්නම් ඇන්ටි..."

"අපි මේක ටිකක් ලොකුවට කරමු ඉස්සරහට..."

"අයියත් කිව්වා... මං ඉස්සෙල්ලා ඉගෙන ගන්නම් ඇන්ටි..."

මනෝජා තවමත් හිම වලහාගේ හැඩ බලනවා.

"පුතේ..."

"සුදූ ඇන්ටි..."

"මේ ජොලියත් සමරන්න කියලා හිතාගෙන හවසට හදමුද හොඳ ෆ්‍රයිඩ් රයිස් ටිකක්..."

උපේක්ෂා හිනාවුණා.

"ඊයෙත් රෝල්ස් කෑවා..."

"දැන් ඉතින් ෂුගර් ටිකක් වැඩි උනත් මොකද කෙල්ලේ... මාව බලාගන්න උඹ ඉන්නවනේ..."

"තෙල් ටිකක් අඩුවෙන් දාලා හදමු... ම්..."

උපේක්ෂා හිම වලහාව ආදරයෙන් උකුලේ තියා ගත්තා.





"සුදු ඇන්ටි..."

"ම්..."

"මං මේ..ක ඇන්ටි..."

"ඉතින්..."

"අයියට දෙ..න්..න..ද..."

මනෝජාගේ මුව පුරා ලස්සන සිනහවක් පැතිරුණා.

"හදපු පළවෙනි එකනේ නේද..."

"ස්නෝ වෙඩිලා නෙමේ ඇන්ටි... මේ ජීවිතේම උ..නත් මං අයියට දෙනවා..."

"ම.. අපි ලස්සනට පැක් කරලා දෙමු..."

"හා..."

"මේ පුංචි හිම වලහගේ මූණ දකිද්දී එතකොට ඔයාට මේ අසරණ අනාථ කෙල්ලව මතක් වෙයි..." ඇය හිම වලහාගේ මූණ දිහා බලාගෙන හිතුවා...

"ටික දවසකින් ඔයාව දැක්කෙත් නෑ... වැඩ ඇති... එහෙම කතා කරලා ඔයාට කරදර කරන්නේ කොහොමද... එනකං මං බලාගෙන ඉන්නවා..."

හදවත තුල් තුල් ඇද අදින ගෙත්තම පුදුමාකාරයි... එයාව බඳින්න ගර්ල් කෙනෙකුත් ඉන්නවා... එහෙම එකේ මං එයාගේ ජීවිතේට නරකක් වෙන්න ලංවෙන්න නරකයි. එහෙම උනොත් ඒක ලොකු පවක්. ලොකුම පවක්.

*** *** *** *** ***



www.sinhalaelibrary.com

**කෙල්ල** මනෝජා වටේ කැරකුනේ ඇයට වත් තාරකට ඇමතුමක් දීලා බලන්න කියන්නයි. ඒත් එකපාර එහෙම කියන්නත් ඇයට මොකක්ද වගේ.

මනෝජා ඇන්ටි තමා ගැන අහිතක් නොහිතන බව ඇය දන්නවා. ඒත් කසාඳ බඳින්න උන්න කොල්ලෙක්ට තව කෙල්ලෙක් කතා කරන එකේ නරකක් තියෙනවා. "ඒත් දවස් තුනකින් නින්ද ගියෙත් නෑ..." මේ දුක පුදුමාකාරයි.

"ඇයි කෙල්ලේ... මොකද මේ මූණම එල්ලගෙන... දවලුත් මං දැක්කා පඩියට වෙලා දුකෙන් ඉන්නවා..."

උපේක්ෂා බිම බලාගෙන අසරණව හිනාවුණා.

"සු..දු ඇ..න්ටි..."

"ම්..."

"අ..යි..යා..."

"කොල්ලව දැක්කෙත් නෑ නේද..."

"ම්.. වැඩ ඇති..."

"ඒකටත් ටික ටික ප්‍රශ්න තියෙනවා..."

"ම්.. මට තේරෙනවා... මං ඇ..න්ටි කෝ..ල් එ..ක..ක්.."





"අනේ මැණික... ඉතින් ගන්නකෝ... ඒකටනේ කතා කරන්නේ... හිතනවා ඇති ඒකව මතක් වෙන්නෙවත් නැතුව ඇති කියලා..."

"වෙන දෙයක් නොහිතෙන තරම්" උපේක්ෂාට කියන්නට හිතෙන්නේ එහෙමය.

"පු..තේ..."

"සුදු ඇන්ටි..."

"ඒ ගමන් අහන්න පැටියෝ ඔයා මාත් එක්ක මේ ළඟ සුපර් මාර්කට් එකට ගියාට කමක් නැද්ද කියලා... දැන් රෑ වෙලා නිසා මට යන්න බයයි... මගේ බෙහෙත් ටිකත් ගන්න ඕන ෆාමසියෙන්..."

"මං අ..හ..න්..නම් ඇන්ටි..."

උපේක්ෂා සාලයේ වූ දුරකථනය වෙත ගියේ හරි ආශාවෙන්. "ඇත්තටම ඔයා හිතනවද දන්නෑ ඔයාව මතක් වෙන්නෑ කියලා... ඒත් දැනෙනව නම් ඔයාට මට හිතෙන තරම් ඔයාව පුදුමත් හිතෙයි..."

ඔහුගේ ජංගම දුරකථනය එහා පසින් නාද වෙද්දී ඇයට හුස්ම ගන්නවත් බැරි තරම්.

"අ..යියේ මං..."

ඔහු මොහොතක් කතා කළේ නෑ.

"මාත් එක්ක ළමයා තරහ වෙලත් ඇති..."

"මම... ලෝකෙම එ..ක්..ක තරහ වෙ..න්..නා..ම් අයියත් එක්ක බෑ..."

ඇත්ත කතාවත් එහෙමයි. මේ ලෝකේ දුටු උතුම්ම කෙනා එක්ක තරහ වෙන්නේ කවුද...

"අ..යි..යා ක..තා ක..ළේවත් නැ..ති නිසා ග..ත්..තේ... ස..නීපෙන් ඉ..න්..නවද බල..න්..න..."

"මං එ..න්..නම උන්නේ උපේක්ෂා... මේ වැඩ පිරිලා තිබ්බා... මේ දැනුත් වැඩ..."



www.sinhalaelibrary.com

"අ..නේ එ..හෙනම් මං තියන්නම්..."

"හිටු ඔහොම..."

ඔහු කිව්වේ එහෙම. කෙල්ලට හිනා.

"සනීපෙන් ඉන්නවද නංගී..."

"ම්.. ගොඩක් සනීපෙන් ඉන්නවා..."

"ඔයාව දකින්න නැති එක තමයි දුක..." කියන්නට හිතෙන්නේ එහෙම... ඒත් කොහොම කියන්නද...

"මං දැන් ටෙඩි බෙයාර්ස්ලා හදනවා... අලුත් උන්..."

"ආ... එන්න ඕන බලන්න... උන් අහිංසකද..."

"ම්... හ..රි අහිංසකයි... දැන් පනහක් විතර හදලා තියෙන්නේ... අද ගෙනියන්නත් හැදුවා ශොප් එකකට..."

"ඉතින්..."

"මං දුන්නෑ..."

"ඇ..යි අර..."

"අ..යිය..ට පෙ..න්..න..ලම දෙන්න ඕ..න..."

තාරක මොහොතක් නිහඬව උන්නා. ඒ ගරු කිරීම ඇතුලේ ලොකු මනුස්සකමක් තියෙනවා.

"මං උදෙන්ම එන්නම් බලන්න..."

"හා... මං එ..හෙ..නම් තියන්නම් අ..යියේ... උ..දේ ගෙදරින් කාලද අයියා එන්නේ..."

"ම..ට උපේක්ෂා..."

"ම්..."

"හොඳ පොල් රොටි පාරක් හදලා තියන්න කියන්නකෝ... මනෝජා ඇන්ටි රහට හදනවා..."

"හා.. පොල් රොටියි මාළු ඇඹුල් තියලුයි කට්ට සම්බෝලයි..."





"මරුනේ... මං උදෙන්ම එන්නම්..."

"හා.. බුදු සරණයි අයියේ එහෙනම්..."

"බුදු සරණයි..."

"ආ... අයියේ මේ... මනෝජා ඇන්ටි ඇහුවා ළඟ සුපර් මාර්කට් එකට මං එක්ක යන්නද කියලා..."

"ළඟටනේ... ය..න්..න... පරිස්සමින් නංගී..."

"ම්..."

හදවතට ලේ ගලන්නේ දැන් කියලා කෙල්ලට හිතෙනවා. ඒක පපුවටම දැනෙනවා.

"ඔන්න දැන් තමා සිරික්කිය එ..න්නේ..."

ඒ ඇස් බිමට බරවෙන්නේ හරි ලස්සනට...

"උදේට එනවලු... පොල් රොටි ඕනලු..."

"දවසක් මං උදේ හදලා තිබ්බා... කොල්ලත් ආවා... රොටි හතරක් විතර කෑවා..."

"මාළු ටිකකුත් ගමු සුදු ඇන්ටි..."

"ම්... ඇඹුල් තියලුයි පොල් රොටියි රහ තමා..."

"එහෙනම් යං... ළඟට නිසා කමක් නෑ කිව්වා..."

"අපි පරිස්සමින් යං..."

"ම්..."

උපේක්ෂා ඇඳුමක් දාගන්න ආවේ ඇය හැදූ සුරතල් සතුන් ටික දිහා බලාගෙනම... ඒ ටික අද ඇත්තටම ශොප් එකකින් ඇවිත් ගෙනියන්න හැදුවා. ඒත් ඇය දුන්නෙ නෑ.

"බිස්නස් කරන එක නෙමෙ පුතේ වටින්නේ... ඒ මනුස්සකම..."

මේවා ඔහුට පෙන්නලාම විකුණමු කිව්වම මනෝජා ආදරයෙන් එහෙම කිව්වා. මේ පුංචි අහිංසක සතුන් පිටුපස උන්නේ තමා නෙමෙ



www.sinhalaelibrary.com

ඔහු... ඔහු නොවන්නට මේ දෛවය වෙනස්. ගොඩක් වෙනස්.

"යං..."

වෙලාව රෑ හතහමාරට විතර ඇති... කෙල්ල මේ පිටතට යන්නේ සෑහෙන දවසකට පස්සේ.

"අපි ත්‍රීවීලර් එකක් අරන් යං පුතේ..."

"ටිකක් පයින් යන එක හොඳනේ... එක්සයිස් එකක්නේ සුදු ඇන්ටි..."

"වෙන දවසක එක්සයිස් එකට ඇවිදිමු කෙල්ලේ..."

උපේක්ෂා හිනාවුණා.

"මාව නම් හඳන්නම බෑ නේද මැණික..."

"අන්කල් කියලා තියෙන්නේ ඒකනේ..."

"මං හූ කිය කිය අඬනවා..."

මේ ගෙදරට එද්දී අන්කල් නැති වෙලා උන්නේ අපරාදේ කියලා උපේක්ෂා හිතනවා.

දෙන්නත් එක්ක ගියේ බත්තරමුල්ල සුපිරි වෙළඳ සැළකට... උපේක්ෂා උන්නේ තරමක බියකින්. රංගනත් අම්මාත් ඇරෙන්නට කවුරු දැක්කත් ඇයට කමක් නෑ... ඒ දෙන්නා මේ වලට එන්නෑ කියලා උපේක්ෂා දන්නවා.

"පු..තේ..."

"සුදු ඇන්ටි..."

මනෝජා කෙල්ලගේ අතින් අල්ලලා කෙනෙක් දිහා බලාගෙන උන්නා. මනෝජා බලා උන්නේ සුපිරි වෙළඳ සැලේ කොනක රූපලාවන්‍ය රාක්කය අසළ උන් යුවතියක් දෙස.

"ඒ කවුද දන්නවද පුතේ..."

"කවු..ද සු..දු ඇ..න්ටි..."

"දිල්... තාරක පුතාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්..."

උපේක්ෂාගේ පපුවට මොනවද උනා. ඇය නිල් පාට ජීන්ස් කලිසමට





රතු පාට ටී ෂර්ට් එකක් ඇඳ උන් ඇය දෙසම බලාගෙන උන්නා.

අතකින් සෙල් ෆෝන් එකක් ගෙන ලස්සන සුදු අත් බෑගයක දමාගෙන උන් ඇය ඇත්තටම සුන්දරයි.

"හ..රි ල..ස්..ස..නයි ඇන්ටි..."

"ම... ලස්සනයි තමා..."

ඒ මොහොතේ දිල්කි හැරිලා බැලුවා. ඇගේ දෙනෙතට මනෝජාව ලක්වුණා..

මනෝජා දිල්කි වෙත ගියේ කෙල්ලගේ අතිනුත් අල්ලගෙනමයි... දිල්කි බලා උන්නේ මනෝජා දිහා නෙමෙ. මනෝජා සමග එන ලස්සන කෙල්ල දිහා. මනෝජා ඉන්නේ ගෙදර තනියම කියලා දිල්කි දන්නවා. දවසක් දෙකක් ඇය තාරක සමඟ ඒ ගෙදරට ගිහින් තියෙනවා. ඇරත් තාරකගේ ගෙදර සමීපම කෙනෙක් විදිහට දිල්කි මනෝජාව හොඳට දන්නවා.

"කො..හොමද දුව..."

"ඇන්ටිත් ෂොපින් ආවද..."

උපේක්ෂා දිගටම බලාගෙන උන්නේ ඇය දිහාව. "ඔයාට ඉන්නේ ලස්සන ගෑණු ළමයෙක්... ඒත්..." හිතට ආපු දේ ඒ වෙලාවේ ඇය හිතුවේ නෑ.

"අනේ තනි මට මේ මොන ෂොපින්ද දිල්... අපි දෙන්නා මේ බඩු ටිකක් ගන්න ආවා..."

දිල්කි යංතමට උපේක්ෂා දිහා බැලුවා. "ටිකක් ආඩම්බරයි... කට පුරා හිනාවෙන්නෑ..." උපේක්ෂා ඇයත් සමඟ හිනාවෙන ගමන් හිතුවා.

"ආ.. මට අඳුන්නලා දෙන්නත් බැරි වුණා... මේ පුතේ දිල්කි... මං දන්න දුවෙක්... දිල් මේ දුවේ මගේ රිලේෂන් වෙන දුවෙක්..."

දිල්කි උපේක්ෂා දෙස බලා යංතමට හිස වැනුවා. "ඔයයි එයයි



www.sinhalaelibrary.com

කොච්චර වෙනස්ද තාරකයියේ..." උපේක්ෂා හිතුවා.

"එහෙනම් ඇන්ටි මං යන්නම්..."

"දුව තනියමද ආවේ..."

"ඔ..ව්... මේ කොස්මෙටික්ස් වගයක් ගන්න... සී යූ ඇන්ටි..."

"සී යූ දිල්..."

මනෝජා තාරක ගැන සඳහනක් වත් කළේ නෑ. ඒක කවදාහරි ප්‍රශ්නයක් වෙන බව ඇය දන්නවා. "දුවටයි අම්මටයි ඉව තියෙනවා." මනෝජා හිතුවා.

"පු..තේ..."

"සුදු ඇන්ටි..."

සුපර් මාර්කට් එකෙන් පිටතට ඇවිදගෙන එන අතරතුර දෙන්නා කතා කළේ.

"මො..ක..ද හිතෙන්නේ..."

උපේක්ෂාට මොනවත් කියාගන්න බෑ.

"එ..යා ල..ස්ස..නයි ඇන්ටි..."

"ල..ස්ස..නයි තමා පුතේ... මං ඇහුවේ ඒක නෙමේ... මේ දෙන්නව තිබ්බාම..."

උපේක්ෂා අඩි දෙක තුනක් ඇවිදගෙන ගියා.

"ඒ දෙ..න්..නා චු..ට්..ට..ක් වෙ..නස්..."

මනෝජා හිනාවුණා.

"චුට්ටක් නෙමේ පුතේ... අහසට පොළොව වගේ... ඔය කසාදේ තීන්දු කරලා ගෙදර පාටියක් තිබ්බා..."

"ම්..."

"මට එදාම හිතුණා... මට මේකා ගැන දුක හිතුණා..."

"ඒත් ඇන්ටි..."





"ඒ කසාදේ වෙනවා තමා... මේ ලෝකේ එහෙමනේ පුතේ..."

"ම්..."

"දිල් ඔයා දිහාත් හොඳට බැලුවා... එයාට වඩා ඔයා ලස්සනනේ..."

"අනේ ම..ගේ ල..ස්..ස..න..."

"මං කිව්වම පිළිගන්නෑ... කවදහරි කොල්ලෙක් කිව්වාම පිළිගනී..."

උපේක්ෂා හිනාවුණා විතරයි. දිල්කි උන්නේ ලස්සන රත්තරන් බඩු දාගෙන. "තාත්ත අරගෙන දීපු රත්තරන් බඩු ටික අපරාදේ... ලස්සන ඒවා ටික..." ඒත් දැන් ඒවාට ලෝබකමක් නැත. ඒවා ගන්නට කවදාවත් ඒ ගෙදරට යන්නේ නැත. අත කනකර ඉතිරි වූයේ මේ මාලයත් කරාබු ජෝඩුවත් පමණි.

*** *** *** *** ***

සිංහල EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

**තාරක** වාහනය පාර්ලිමේන්තු පාරෙන් දියවන්නාව වෙල අද්දර පාරට දමද්දීම ඇය දැක්කා. ඇත්තටම කිව්වොත් ඇය මේ පාන්දර ඔහුම ගෙනවිත් දුන් ඇඳුමක් ඇඳගෙන බලාගෙන උන්නා.

කෙනෙක්ට අයිති වූ ජීවිතයක් ගැන මෙහෙම පුංචි හරි ලෝබකමකින් හිතන එක පවක්. ඒක උපේක්ෂා දන්නවා... "එයාලා බැඳලා සතුටින් ඉඳී... මොනවද අඩු..." උපේක්ෂා හිතුවා.

ඒත් ඔහු මේ ජීවිතයේ අමාරුම මොහොතක කළ උපකාරය කෙල්ලට අමතක කරන්නම බෑ. ඒ දේ අමතක කරලා ආන්න පුළුවන් නම් තමා ගුණමකු කෙනෙක්. ඒ උපකාරය එක්ක බැඳිච්ච අසාමාන්‍ය බැඳීමක් තියෙනවා. ඒ බැඳීමට නමක් නෑ. ඒත් ඒ බැඳීම හදවතට ලොකු සතුටක් ගෙන දෙනවා.

අද ඔහු එනවා කියන සතුටට ඊයේ රෑ පුරාම හිටියේ සතුටින්. එහෙම වෙන්නේ ඇයි කියලා ඇය දන්නේ නෑ. එහෙම නොදන්නා හැඟීමක් පපුවේ සරන ප්‍රථම අවස්ථාව මේක.

උදෙන්ම ඇයයි මනෝජයි නැගිටලා පොල් රොටී හැදුවා. මනෝජා හදලා දීපු රොටී මිශ්‍රණය තවලා රොටී හැදුවේ ඇය. තෙල් ගාපු පිඟානේ පිටි තවද්දී ඒක ලස්සනට කරන්න ඕන. රොටී පුච්චලා මේසේ දැම්මෙත්





උපේක්ෂාමයි. ජීවිතේ මෙහෙම දේවල් කරලා කවදාවත් ඇය මේ තරම් සතුටක් ලබලා නෑ.

මේසේ ලෑස්ති කරලා ඔහුට සුදු පෝසිලේන් පිඟානකුත් තියලා ඇය ඒ ළඟින්ම සර්වියට් එකකුත් ලස්සනට නවලා තිබ්බා.

"ආවාම පුතේ අපි තව පොල් රොටී තුන හතරක් පුච්චමු..."

"උණුවෙන් දෙන්න නේද සුදු ඇන්ටි..."

"ම්..."

උපේක්ෂා හරි ආසාවෙන් දොරකඩ බලාගෙන උන්නා... අද ඔහු හරි ලස්සනයි. ලා කෙහෙල් දල්ලේ පාට කමිසය ඒ මුහුණට අලුත් පාටක් ගෙනල්ලා තිබ්බා.

"ගු..ඩ් මෝ..නිං උපේක්ෂා..."

"ගු..ඩ් මෝ..නිං අයියේ..."

"ෂර්ට් එක ලස්සනයි නේද..."

ඇය කමිසේ දිහා බලද්දීම ඔහු ඇහුවා.

"හරිම ල..ස්..ස..නයි..."

"අපේ අම්මා ගෙනත් නංගී..."

ඒ අම්මා පුතාට හරි ආදරේ ඇති කියලා උපේක්ෂාට හිතුණා...

"කෝ ඉතින් ළමයා හදපු සොෆ්ට් ටෝයිස්..."

"මෙ..හෙට එ..න්..න අයියේ..."

උපේක්ෂා කාමරයේ ලස්සනට ඔහුට පෙන්නන්නට තබා තිබූ සත්තු ටික පෙන්නුවා. ඒ ටික දකිද්දී තාරකට සිහිවුණේ එදා රෑ කාමරයේ ඇඳ යට රිංගපු කෙල්ලව. "එයාට පොඩි මෙන්ටල් අප්සට් එකක් තියෙනවා..." එහෙම කිව්වේ ඇයව විවාහ කරගත් සැමියා. එහෙම කිව්වේ මෙහෙම කෙල්ල ගැන නේද කියලා ඔහු හිතුවා.

"ඈ..යි අයියේ..."

"නංගී..."



www.sinhalaelibrary.com

"ම්..."

"එ..න්..නකෝ..."

කෙල්ල ඔහු ළඟටම ආවා. ඔහුගේ අත එහෙමම ඇගේ හිසට ගියා.

"එදා රෑ..."

"ම්..."

"ග්‍රෑන්ඩ් හෝටලේ මං හිටපු කාමරේට ආවේ..."

"ඔ..ව්..."

"අරයා එද්දී ඇඳ යටට රිංගුවේ..."

"ඔව් අයියේ..."

"එ..දා ඒ වෙලේ.. මට හිතුණා මේක..."

"මො..ක..ක්ද අයියේ..."

"මේ හරි වටින කෙල්ලෙක් කියලා..."

ඔහුගේ අත හිස මත තියෙද්දීම ඇගේ දෑස්වල කඳුළු පිරුණා. ඒවා එහෙමම වැටුණා. ඔහු බලාගෙන.

"එ..දා අයියා ම..ට පිහිට නොවුණා..නම් මං මෙ..හෙම..."

"නෑ, නංගී... ඒක නෙමේ වටින්නේ..."

"නෑ... ඒකයි වටින්නේ... මගේ දෛවය මං දන්නවා..."

උපේක්ෂා අඬ අඬාම කිව්වා.

"හ..රිම ල..ස්ස..න..යි.. ස්වීට්..."

ඇය කඳුළු පිහදාගෙනම ගිහින් ඇය මැසූ පළවෙනි හිම වළහාව ගත්තා. ඒක පොලිතින් වල ඔතලා ලස්සනට රතු රිබන් වලින් ඔතලා තිබ්බේ.

"මේ..ක අයියේ..."

"ම්..."

"මං හ..ද..පු පළවෙනි ස්නෝ ටෙඩී..."

"ම්..."





"මේ..ක අ..යියට මං මැහුවේ..."

ඔහු දෝතින්ම ඒ හිම වළහාව ගත්තා.

"මං දෙයක් කියන්නද..."

"ම්..."

"මේ ම..ට ලැබිච්ච ලස්සනම ප්‍රසන්ට් එක..."

ඒ වචන ටික ඇයට ඇති...

"මූ හොඳයි මගේ ඇඳ උඩට... රෑට පාළුවට කතා කර කර ඉන්න පුළුවන්..."

උපේක්ෂා ලස්සනට හිනාවුණා. "එතකොට මාවත් මතක් වෙයි ඔයාට..."

"ඇක්කද කෙල්ලගේ වැඩ පුතා..."

"ඒකනේ ඇන්ටි..."

"දැන් මට වඩා ලස්සනට හදනවා..."

"ඔයා ළමයට හොඳට උගන්නලා..."

"කෙල්ලගේ ඇඟේ තියෙනවා පුතා..."

දෙන්නගේ කතාවලට කෙල්ල බිම බලාගෙන හිනා වෙනවා.

"අ..පි ක..න්..න යං අයියේ..."

"පොල් රොටිද..."

"ම්..."

"අපි උදේ ඉඳලා රොටි හදනවා..."

"මට සුවඳ ආවා එද්දිම..."

අද ඇගේ හිතට කාලාන්තරයකට පසු සතුටු දවසක්. තාරක මේසෙන් වාඩි වුණේ ඇය දෙස බලාගෙනමයි.

"දිගටම සොෆ්ට් ටෝයිස් හදන්න..."

"හොඳයි අ..යියේ..."

"මං ඉන්ටර්නෙට් එකෙන් තව ඩිසයින් බලලා ගෙනත් දෙන්නම්..."



www.sinhalaelibrary.com

ඔහුට ඇය පොල් රොටිත් මාළුත් කට්ට සම්බෝලත් බෙදුවා.

"නංගිත් කමු..."

"අයියා කන්නකෝ... උණුවෙනුත් අරගෙන එන්නම්..."

"එන්න මෙතනට වෙලා ඉන්න... ඇන්ටි ආයි..."

උපේක්ෂා හිනාවෙලා ඔහු ළඟ වාඩිවුණා.

"ඇන්ටි පිටි ටික අනලා දුන්නා... හැදුවේ ම..ම..."

එහෙම කියන්න ඇයට ආසයි... ඔහු ළඟ ඉඳිද්දී මොනවා වෙනවද කියලා ඇයටම තේරෙන්නේ නෑ.

"අද ඔයාලට රොටි මදිවෙයි..."

"ඔක්කොම ක..න්..න..."

ඔහු දිහා බලාගෙන ඉඳිද්දී ඇයට සිහිවුණේ ඔහුගේ පෙම්වතියව. මේ රන්කඳ අයිති ඇයට...

"අ..යියේ..."

"ඒ..යා..."

"ක..චු..ද උපේක්ෂා..."

"ඒ..යා.. අයියගේ ගෑණු ළ..ම..යා..."

"ඉ..තින්..."

"නෑ... ඒ..යා හ..රි ල..ස්..ස..න..යි..."

තාරක ඇය දිහාම බලාගෙන උන්නා. උපේක්ෂා දිල්කිව දැක්කේ කොහොමද...

"ඇන්ටි ෆොටෝ එකක් පෙන්නුවද..."

"නෑ... අපි ඊයේ සුපර් මාර්කට් ගියානේ..."

"ම්..."

"එයත් සුපර් මාර්කට් එකේ උන්නා..."

"දිල්..."

"ම්.. හරිම ලස්සනයි..."





ඔහුගේ දෙනෙත් බර වුණා. "මොනවද හිතනවා ඒ පාර..." ඇය හිතුවා.

"ක..තා කළාද..."

"ඇන්ටිත් එක්ක කතා කළා..."

ඉන් පස්සේ තාරක ටික වේලාවක් කතා කළේ නෑ. ඒක කිව්වේ අපරාදේ කියලා ඇයට හිතුණා.

"නංගි..."

"ම්..."

"මීට පස්සේ එළියට යන්නෙපා..."

"රෑ වෙච්ච නිසා ගියේ... ආයේ ය.න්නෑ..."

"ඒක එච්චර හොඳ නෑ..."

"මට තේරෙනවා... ය..න්..න ඕනෙත් නෑ අයියේ..."

"ඇන්ටි ඔයාව අඳුන්නලා දුන්නද..."

"ම්... රිලේෂන් කෙනෙක්ගේ දුවෙක් කියලා..."

"එහෙම කිව්ව එක හොඳයි..."

මනෝජා තවත් උණු පොල් රොටියක් හදාගෙන ආවා.

"අද දවල්ට කන්නෙත් නෑ ඇන්ටි..."

"පුතා දවාලක කන්නත් එන්නකෝ... අපි රහට හදලා තියන්නම්..."

උපේක්ෂා කටට අතක් තියාගෙන හිනාවුණා.

"මෙකි දැන් මට කන්න දෙන්නෙත් නෑ... ෂුගර්ලු... තෙල්ලු... කොලෙස්ටරෝල්ලු..."

"හොඳ නෑ තමා ඇන්ටි... ලෙඩ වෙච්ච හැටි මතකනේ... ඩොක්ටර් මොනාද කිව්වේ... කුරුල්ලෙක් වගේ කන්න කිව්වා..."

උපේක්ෂාට ආයෙත් හිනා.

"සුදු බත් ටික කන්නෑ ඒකට තෙල් ආලා කැරට් ආලා බිත්තර ආලා ෆ්‍රයිඩ් රයිස් හදනවා..."

තාරකයි මනෝජයි මූණට මූණ බලාගෙන හිනාවුණා.

"මටත් ඔයා ගෙනත් දුන්නේ හොඳ දුවෙක්... මට අන්කල්වමයි මතක් වෙන්නේ..."

"අයියා දන්නවද අන්කල් ගහනවලු කරන වැඩවලට..."

මනෝජා මහ හයියෙන් හිනා වෙනවා.

"අපි වෙලාවක ඇන්ටි අන්කල්ව මතක් කරලා හොඳ දානයක් දෙමු..."

"ආසාවෙන් පුතේ ඉන්නේ..."

"බලලා ඇන්ටි කියන්නකෝ..."

ඔහු කාලා ඉවර වෙද්දී ඇයට දුකයි. තව ටිකක් වෙලා ඔහු ඉන්නවනම් ඇය ආසයි.

"නංගී..."

"අ..යියේ..."

"ම්.. මෙකෙන් ඕවා හදන්න ඕන බඩු ටිකක් ගෙන්න ගන්න..."

තාරක මුදල් ටිකක් ඇයට දිගු කළා. "එපා කියන්නේ කොහොමද ඔයාට..."

"ගොඩක් ඕන වෙ..න එ..කක් නෑ අයියේ..."

"මෙකෙන් ගෙන්න ගන්නකෝ... මං අනිත් පාර එද්දී..."

"තව ගොඩක් හදලා තියන්නම්..."

කෙල්ල ඔහු කියාගෙන ආ දේ සම්පූර්ණ කළා. තාරක ඇය දෙස බලා සිනාසුණේ හරි ආදරයෙන්...

*** *** *** *** ***

**"සඳරාජිනී"** - 05 කලාපය සමඟ
තවත් රසබර කොටසක්...



www.sinhalaelibrary.com



සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්



"හැ දෙන මට මොකක්ද අලුතින් දැනුණා... ඒක විස්තර කරන්න මට තේරෙන්නේ නෑ... ඔයා මොකක්ද දෙයක් හැබෑ වගේ මට නිතරම දැනෙන්න ගත්තා... ඔය ආත්මෙක මට තිබුණ දෙයක් මේ ආත්මෙ මට නෑ වගේ මට දැනෙන්න ගත්තා... මම හොයන් හිටියා... ඇයි මට මෙහෙම හිතෙන්නේ කියලා... ඒත් තේරුමක් තිබුණේ නෑ... එක දවසක මම ඔයාව දැක්කා... ඔයාගේ ඇස් දෙක මගේ ඇස් ඉස්සරහට ආවා... එදා මට පුදුම හිතුණා... පස්සෙන් පසු මම තේරුම් ගත්තා මේ ආත්මේ අලුතින් වගේ තේරුණේ ඔයා හැටි එක කියලා... මගේ ජීවිතේ මේ දැනෙන අලුත් හිත කියලා මම හරියටම තේරුම් ගත්තා... මොකයි... අපි පසුගිය ආත්මෙක එකට උන්නා... සමහරවිට මේ ආත්මෙට ළඟම තිබුණ අතීත ආත්මේ වෙන්න ඇති... ඉතින් මොකද කරන්නේ... ඔයා හිතනවද මට මේ ආත්මේ ඔයා නැතුව ජීවත්වෙන්න පුළුවන් කියලා... එහෙම වුණොත් මට හැමදාම ලොකු අඩුවක් දැනෙයි... ඔයා නැති තනියක්... මොකක්ද නෑ වගේ... එහෙම වෙන්නේ කොහොමද... එහෙනම ජීවිතේ සම්පූර්ණ නැහැ නිසා... ඉතින් මම තීරණය කළා ඔයාගේ ජීවිතේ කොටසක් වෙන්න... ඇත්තම කතාව මෙහෙයි... මට ඔය ඔයාව මගේ කරගන්න... මොකද ඔයා නැතුව අද මම සම්පූර්ණ නෑ...
ඒක වගේ ආත්මාර්ථකාමී දෙයක්... මොනවා කරන්නද... ජීවත්වෙන්න ඔයාවම ඕනෙනම්... ඇද... ඉතින් කියනවා මම ඔයාට හරි ආදරෙයි... ගොඩක්... කියන්න බැරි තරම්........"

www.sinhalaelibrary.com



ආදරය ගින්දරක්
එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...
නවකතා තිළිණය
06 පොත
www.sinhalaelibrary.com
සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්

එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...

සුජීව ප්‍රසන්න ආරච්චි

ජීවිතය ගැන ඒ තරම්ම බලාපොරොත්තු සුන්වෙලා කතා කරන්නේ ඇයි... ඔහු වගේ කෙනෙක් එහෙම කතා කරන්න හොඳ නෑ.

"අ..යියා කරදරෙන් වගේ..."

"වගේ නෙමෙ නංගී මං කරදරෙන්..."

"ඇයි අයියේ..."

ඇගේ ඇඟිලි දහයම ඒ නළලතට ඇවිත් නතර වුණා... ඔහු ඇය දෙස බැලුවේ හිස එහෙමම පිටුපසට බර කර තිබෙද්දීයි.

"ජීවිතේට මොකක්ද නරකක් වෙන්න යනවා වගේ මට දැනෙනවා නංගී..."

"අ..නේ අයියගේ ජීවිතේට..."

"ම්..."

"එ..ච්චර පච්කාර නෑ අයියා..."

ඔහු හිනාවුණා. ටික වේලාවක් යනකල් තාරක කතා කළේ නෑ. ඔම්ලට් පාන් හදා ගෙන සාලයට එමින් උන් මනෝජා කෙල්ල ඒ ඔළුව මසාජ් කරනවා දැක්කා. ඇය එහෙමම නතර වුණා. "ඔහොම කරපුදෙන්... පස්සේ කෑම දෙනවා..." ඒත් ඒ දර්ශනය දිහා ඇය මොහොතක් බලාගෙන උන්නා.





"දෙයියොත් පොට්ටයෙක් වගේ ඉන්න හොඳ නෑ... කරනවනම් දෙයක් මිනිස්සුන්ගේ පණ තියෙද්දී කරන්න ඕන..."

ඇය දෙවියන්ට ඒ බැන්නා නෙමෙ. දෙයක් මතක් කළා විතරයි.

"නංගී..."

ඇය සමාධියකට සම වැදිලා වගේ හිටියේ. ඒ හිස පුරා ඇඟිලි තුඩු ගෙන යද්දී එහෙමයි. හිතට එන සමහර දේවල් ඇය එහෙම පපුවේ තද කර ගන්නවා.

"අ..යියේ..."

"මාත් එ..ක්..ක තරහද..."

එවර නම් ඇය සිනාසුණා.

"තරහ වෙන්න ලෝකයක් තියෙද්දී මං මේ අහිංසක අයියා එක්ක තරහ වෙන්නේ මොකටද..."

"මං ගෙ..දර එ..න්..නෙපා කිව්වට..."

"මට ගහලා ය..න්..න... බැණලා ය..න්න... මං තරහ වෙයිද කියලා බලන්න..."

ඒ වචන හරි පුදුමාකාරයි.

"ඉරිදා උදේ මං මෙහේ එන්නම්..."

"එ..දාට ඇවිත් කොහොමද... එදාට..."

"නිකං එනවා නංගී..."

කෙල්ල මොනවත් කිව්වේ නෑ.

"දැ..න් කොහොමද අයියේ හිසරදේ..."

තාරක හිනාවෙලා උඩ බැලුවා.

"කොහේ ගියාද කියලා නෑ..."

"අයියේ..."

"ම්..."



www.sinhalaelibrary.com

"මෙහෙමම දුකින් ඉන්නෙපා..."

"දුකින් ඉන්නවා නෙමේ නංගී..."

"එහෙනම්..."

"දුක ජේනකොට දුක දැනෙනවා..."

"එ..යා..."

"ක..වු..ද..."

"දි..ල්..කි..."

"ඉති..න්..."

"හො..ඳයි..නේ... හරි සතුටින් දෙන්නට ඉ..න්..න පුළුවන්නේ... ගෑණු ළමයෙක්ගේ චූටි චූටි දේවල් තියෙනවා තමා... මගෙත් ඇති... මහත්තයා දැනගන්න ඕන කෙල්ලව හදලා ගන්න..."

"දි..ල්..ව..."

"ම..."

"එයාව හදන්න බෑ..."

"ඒ අයියා හිතන හැටිනේ..."

"එයා හැදිලා ඉවරයි උපේක්ෂා..."

"ආදරේට කරන්න බැරි මොනාද අයියේ..."

"ඒකම තමා ප්‍රශ්නේ..."

"මොකක්ද..."

"ආදරේ..."

"ඇයි..."

ඔහු මොහොතක් නිහඬව ඉඳ පුටුවේ පැත්තකට හැරුණා.

"කිරි නැතුව කිරිබත් හදන්න බෑ උපේක්ෂා..."

ඒක පුදුමාකාර උපහැරණයක්. ඔහු කියන්නේ කිරි කියන්නේ ආදරේ කියලද... කිරිබත් කියන්නේ පවුල් ජීවිතේ කියලද...



www.sinhalaelibrary.com



මනෝජා සැන්ඩ්විච්ස් ටික අරගෙන ආවා.

"ක..න්..න පුතා..."

"ඔය දෙන්නා අද කන්නේ මොනාද..."

"අපි කද්දි රෑ දහයවත් වෙනවා... නේද පුතේ..."

උපේක්ෂා හිනාවුණා.

"ඇන්ටි..."

"පුතේ..."

"ඉරිදට උපේක්ෂව ගෙදර තනියම ආලා එහේ එන්නෙපා..."

"හොඳයි පුතේ..."

"අපි තුන්දෙනා ඉරිදා රෑට කොහේ හරි ඩිනර් ය..න්..."

මනෝජයි උපේක්ෂායි මූණට මූණ බලාගත්තා.

"ඔය පුංචි රෙස්ටොරන්ට් එකක... ම්... ඇඳගෙන ඉන්න හතට විතර..."

"හොඳයි පුතේ... මාත් ඔය කට්ටිය එක්ක ඉන්න දැන් ආස නෑ... මෙකිව ආලා යන්න මටත් හිතක් නෑ... ඒත් මං ඇහුවා එහේ යන්ද කියලා..."

"එපා... මං එන්නම්..."

හිතට අසාමාන්‍ය බරක් නැත්නම් දුකක් ආවාම කෙනෙක්ගේ මුහුණින් මතුවන විඩාබර බව ඒ මුහුණ පුරා තිබ්බා.... ඒ දිහා බලන්න පවා අමාරු තත්වයක් තිබ්බේ.

"මං ගිහින් එන්නම් උපේක්ෂා... යනවා ඇන්ටි..."

බලාපොරොත්තු නොවූ මොහොතක තාරක නැගිට්ටා. උපේක්ෂාට දැනුණේ පපුව හිරවුණාක් වගේ හැඟීමක්.

"ය..නවා නංගී..."

ඔහු කෙල්ලගේ හිස අතගාගෙනම මිදුලට බැස්සා. උපේක්ෂාත්

මනෝජාත් බලා උන්නේ කර කියා ගන්නට දෙයක් නැතුව වගේ. ඔහු එහෙමම වාහනය රිවස් එකට අරගෙන ඉදිරියට යන්නට මොහොතකට පෙර උපේක්ෂා දිහා බැලුවා.

රැයේ ඇඳිරිය තිබ්බත් ඒ ඇස්වල තිබ්බ දුක හඳුනා ගන්නට ඇයට පුළුවන් වුණා. හේතුවක් නැතුවම ඇගේ දෙනෙත් තෙත්වෙලා ගියා.

"පු..තේ... කො..ල්ලට මො..නාද වු..ණේ එ..කපාර..."

"එ..යාට මො..නාද ලොකු දෙයක් වෙලා වගේ සුදු ඇන්ටී..."

"මහා දුකක් හිතේ හිර කරගෙන ආවේ..."

"ම්.. ඒ දුක මට දැනුණා..."

උපේක්ෂාගේ දෙනෙතින් එහෙමම කඳුළක් ගලාගෙන ගියා. මනෝජා ගෙට යන්නට හැදුවා. ඒත් උපේක්ෂා ඇගේ අත අල්ලා ගත්තා.

"සුදු ඇ..න්ටී..."

"පු..තේ..."

"එ..යා..ගේ ඔ..ය තියෙන දු..ක පිටිපස්සෙ..."

"ම්.."

"මා..ත් ඉ..න්..නවා කියලා ඔ.යාට හිතෙ..නවද..."

උපේක්ෂාට ඇත්තටම එහෙම ඇහුණා... මනෝජා ඇගේ උරතලය පිරිමැද්දා.

"දු..ක පිටිපස්සේ ඔයා ඉන්නවනම් පුතේ..."

"ම්..."

"දු..කක් දැනුණාම ඔයාව බලන්න එන්නෑනේ.. නේද..."

මනෝජා එහෙම කියලා බිම බලාගත්තා. උපේක්ෂා කතා කළේ නෑ.

"එයා ලොකු දුකක් හිතේ තද කරගෙන ඉන්න බවනම් පේනවා ඇන්ටී.. පව්..."

"සුළි කුණාටුවක් ළඟ එනකොට..."





"ම්..."

"දැනෙනවා... ඒකටත් දැනිලා ඇති... සමහර දේවල් ජීවිතේ සිද්ධ වෙනකොට පුතේ... හිත හිරි වැටෙනවා... ඔව්..."

"ම්.. ම..ටත් එ..හෙම වු..ණා ඇන්ටී..."

"ඒකට හිත හදාගන්නම වෙනවා.."

"ඔ..ව්.. එයාට හිත හදාගෙන ඒ ජීවිතේට මූණ දෙන්නම වෙනවා... ඒත් සුදු ඇන්ටී..."

"ම්..."

"ගන්න තීරණ කොච්චර භයානකද කියලා තේරෙන්නේ... ඒවා ගත්තට පස්සේ... ම..ම අ..ද මෙ..හෙම ඉ..න්නේ... ඒ නිසා.. ම..ගේ කියන සේරම නැති කරගෙන... ජීවිතේ එක තීරණයක් ගන්න එයාලා මාව තල්ලු කළා... අන්තිමට මං ඒ දෛවය බාර ගත්තා... ඒත්..."

"දැන් ඔවා හිතන්නෙපා පුතේ..."

"ජීවිතේට අත දුන්න කෙනෙක් මෙහෙම වැටිලා ඉන්නකොට දුකයි ඇන්ටී..."

"මටත් දුකයි... මං රෑ වෙලා කොල්ලට ගන්නම්..."

"ඔ..ව් පුළුවන් නම්..."

උපේක්ෂා බැගෑපත් වුණා. මනෝජා ගෙට ආවත් උපේක්ෂා දිගටම මිදුලට වෙලා උන්නා.

*** *** *** *** ***



www.sinhalaelibrary.com

**මනෝජා** තාරකට ගත්තේ රෑ දහයට විතර... මනෝජා මේ ඇමතුම ගත්තේ ජීවිත දෙකක් ගැනම හිතලයි.

"පු..තේ ම..ම..."

"ඇන්ටී... මං හිතුවා නංගි කියලා..."

"කෙල්ල නිදි... කියව කියව ඉඳලා නිදාගන්න ගියා.. ඔයාගේ ටී ෂර්ට් එකකුත් ඇඳගෙන... ඒකිට ඒක ගාණට..."

"ප..චි..."

මනෝජාට කොහෙන් පටන් ගන්නද කියලා හිතාගන්නට බැහැ.

"පුතේ මං ගත්තේ..."

"මගේ දුක අහන්න... නේද..."

"ඔයා ඉන්නේ දුකින් කියලා කෙල්ලත් ඉන්නේ හරි දුකින්... ඒකි එහෙමයි..."

"මේක මහ පුදුම දුකක් ඇන්ටී..."

"ඔයා පුතේ ඔය දුකින් ඉන්නේ මැරේජ් එක ගැන හිතලද..."

"නෑ..."

"එහෙනම්..."





"මැරේජ් ලයිෆ් එක පටන් ගන්න කෙනා ගැන හිතලා..."

"ඇයි පුතා... මොකක්ද ප්‍රශ්නේ..."

"සමහර දේවල් ඔයාට කියන්න උනාට මට ලැජ්ජ නෑ ඇන්ටී..."

"ම්..."

"මට දිල් ගැන ගොඩාක් දේවල් ආරංචි උනා..."

"ම්..."

"ඒත් මං මොනවත් හිතුවෙම නෑ..."

"ම්..."

"අද දිලුයි මායි ලන්ච් වලට ගියා..."

"ඉතින්..."

"දිල් ටොයිලට් ගියා... මට කෝල් එකක් ආවා... මගේ යාළුවෙක්... ඌ ෆෝන් නම්බර් එකක් දුන්නා... ලියාගන්න මං අතේ පෑනක් තිබ්බෙ නෑ..."

"ම්..."

"මං දිල්ගේ බෑග් එක ඇරලා පෑනක් බැලුවා..."

"ඉතින්..."

"ඒකේ ඇ..න්ටි යූස් ක..රපු බර්ත් කන්ට්‍රෝල් ටැබ්ලට් ෂීට් එකක් තිබ්බා... ඒකෙන් ටැබ්ලට් විස්සක් විතරම බීලා..."

"අ..නේ දෙයියනේ..."

"මා..යි එ..යයි අතර මෙච්චර දුර දේවල් වෙලා නෑ ඇන්ටී... එතකොට..."

"ම..ට හැ..ම දේම තේරෙනවා පුතේ... ඔයා ඇහුවද..."

"නෑ... ඒත් මං මගේ හිතෙන් අහනවා..."

මොනවා කියන්නද කියලා මනෝජාට හිතාගන්නට බැහැ.

"ඒත් මට දිල්ව මැරි කරන්න වෙනවා ඇන්ටි... මං මේවා අම්මටයි තාත්තටයි කොහොමද කියන්නේ..."

"ඔ..ව්..."

"ජීවිතේටම මොනාද වෙලා වගේ ඇන්ටි..."

"ඔයාට හිතන්නම වෙනවා පුතේ..."

"හිතුවත් ඇන්ටි..."

"ජීවිතේනේ පුතේ..."

"මං කාගෙන් කියලා පිහිටක් ඉල්ලන්නද..."

මනෝජා දිග සුසුමක් හෙළුවා.

"ජීවිතේ කියන්නෙ දුර ගමනක් පුතේ..."

"ඒ දුර යන්න අත ගන්න ඕන ලබන ආත්මෙත් ෂතන්න පුළුවන් කෙනෙක්ව ඇන්ටි..."

www.sinhalaelibrary.com

"එ..හෙම කෙ..නෙ..ක් ඔ..යාට ඉ..න්නවද පු..තේ..."

තාරක හිනාවුණා.

"ඔයා මාව දන්නවා ඇන්ටි..."

"හොඳට දන්නවා..."

"මට මේ ගමන යන්නම වෙයි... කෙල්ලව බලාගන්න..."

"ම්..."

"මං තියන්නම් ඇන්ටි... ගු..ඩ් නයිට්..."

"ගුඩ් නයිට් පුතා... බුදු සරණයි..."

මනෝජා දුරකථනය තිබ්බේ ලොකු සුසුමක් හෙළලා. ඇය හැරෙද්දී කෙල්ල ඒ ළඟම බිත්තියට බරවෙලා ඉන්නවා.

"තාරක පුතාට ග..ත්..තේ..."





"මං ද..න්..නවා ඇන්ටි..."

"පුදුම දෙයක්..."

"ඇයි ඇන්ටි..."

මනෝජා ගිහින් ඇඳේ ඉඳගත්තා. ඇය ඔහු කියූ සේරම උපේක්ෂාට කිව්වා.

"එ..ත..කො..ට..."

"එයාවම තමා තාරක බඳින්නේ..."

උපේක්ෂා පුදුමයෙන් බලා උන්නා.

"ජීවිතේ එහෙම දේවල් වෙනවා පුතේ..."

"එ..ත..කොට ඒ ව..ටි..න ජීවිතේ..."

"දවසක ඒකා එයි... ඔය ඔක්කොම ආලා... ඒක මට විශ්වාසයි..."

"කො..හෙ..ට..ද එ..න්..නෙ ඇන්ටි..."

"කොහෙට ආවත් ඉස්සෙල්ලම එන්නේ ඔය දියවන්නා වෙල්යාය ළඟින් වැටිච්ච පාරෙන්..."

"ඇයි ඒ..."

"ඔයාව ටිකක් බලලා ය..න්..න..."

උපේක්ෂාගේ දෙනෙත් තුනී තෙත පටලයකින් වැසී ගියා.

"සු..දූ ඇන්ටි..."

"පු..තේ..."

"ඒ ජීවිතේ ස..තුට වෙ..නුවෙන්..."

"ඉතින්..."

"මේ කෙල්ලට කරන්න දෙයක් නැද්ද..."

"තියෙනවා..."

"මොකක්ද..."

"බලාපොරොත්තුවක් වෙන්න... පුංචි තරුවක් වෙන්න..."

"වෙ..ලා..."

"ඒ අහසේ නැවතිලා ඉන්න... ඒ ඇති... කවදහරි කොල්ලා උඹව හොයාගෙන එයි..."

උපේක්ෂා මනෝජා දිහාම බලාගෙන උන්නා.

"කො..හො..ම..ත් සු..දු ඇ..න්ටි මේ කෙ..ල්ල මෙ..හෙ..මම ඉඳී... එයා ජීවිතේ දැක්ක හොඳම කෙනා..."

මනෝජා උපේක්ෂාගේ මුහුණ අතගාලා දිග සුසුමක් හෙළුවා. උපේක්ෂා ඇගේ ඇඳට ගිහින් ඇලවුණේ ඔහුව හිත පුරා ඇඳගෙන...

*** *** *** ***

www.sinhalaelibrary.com





රංගන ඔහුගේ සහචරයන් තිදෙනෙක්ව බත්තරමුල්ල අවට ප්‍රදේශයට දිනපතා යැව්වා. දියවන්නාව පිහිටියේත් බත්තරමුල්ලට ආසන්නවමයි. උපේක්ෂාව සොයා බයිසිකල් කරුවන් ඒ අවටත් සැරිසැරුවා.

"පාලිත මං ස..ර්..."

රංගන කණ්ඩායමේ නායකයාට කතා කළා.

"ඔ..ව් ස..ර්..."

"මොකද තත්වේ..."

"අපි තාම හොයනවා ස..ර්... පොටෝ එකේ හිටපු කෙල්ලට සමාන කෙල්ලෙක් තාම දැක්කේවත් නෑ... හැම පාරකම අපි යනවා..."

"රෑ හත අට වෙනකල් සර්ච් කරනවා..."

"ඔ..කේ ස..ර්..."

"රෑ වෙලා තමා එළියට එන්නේ... හැම සුපර් මාර්කට් එකකම බලනවා... දැක්කොත් ඒ වෙලාවෙම මට කෝල් කරනවා... පනින්න දෙන්නෙපා..."

"ඔ..කේ ස..ර්..."

"මට සෙනසුරාදා වෙද්දී කෙල්ලව හොයා ගන්න ඕන..."

ගොදුර ඉක්මනින්ම තමාට අසුවන බව රංගන දන්නවා. මේ ටවුමක

හැංගිලා ඉන්න බෑ.

"උඹ ලැබිච්ච දවසට මං උඹට පෙන්නන්නම් මේ රංග කවුද කියලා... එක තත්පරයයි මිස් වුණේ... උඹ පැන්නා..."

රංගන උන්නේ නොසන්සිඳුන කේන්තියකින්... ඔහු මේ සිදුවීමෙන් පස්සේ කාවවත් හමුවුණේ වත් නෑ.

"උඹේ තටු කපන්නේ කොහොමද කියලා මං දන්නවා..."

රංගන මේසයට ගසමින් සිතා ගත්තා.

*** *** *** ***

සිංහල EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..





බ්‍රහස්පතින්දා රෑ මනෝජාට පුදුමාකාර විදිහට උණ ගත්තා... දවල් ඉඳලා කෙල්ල ඇය ළඟ ඉඳගෙන කරන්න පුළුවන් හැම ප්‍රතිකාරයක්ම කරනවා. ඒත් ඇයට ගුණයක් නෑ.

රෑ වෙද්දී ඇයව වෙව්ලන්න ගත්තා. ඇය උන්නේ සිහිනැති වෙලා වගේ.

"ඇන්ටි... අනේ පු..දු ඇන්ටි..."

"ම..ට පු..තේ..."

"ඇයි කියන්නකෝ..."

"ම..ට අමාරුයි පු..තේ..."

"මං අයියට ක..තා කරන්නම්... බෙහෙත් ටිකක් ග..න්න යං.. ම්..."

"අ..නේ ඒකට..."

"කමක් නෑ... රෑට වැඩි උනොත්..."

ඇය දුවගෙන වගේ දුරකථනය ළඟට ගියා. ඒත් ඔහුගේ ජංගම දුරකථනය ක්‍රියා විරහිතව තිබ්බා.

"අනේ දෙයියනේ... දැ..න් මො..නවා ක..ර..න්..න..ද..."

"අ..යියගෙ ෆෝන් එක වහලා පුදු ඇන්ටි... මං ගෙදරට ගන්නද..."

මනෝජා අතින් එපා කිව්වා.



www.sinhalaelibrary.com

"එහෙනම් අපි දෙන්නා යං... මං ත්‍රීවීලරයක් ක..තා කරගෙන එ..න්නම්..."

"එ..පා පු..තේ..."

"එපා කියලා කොහොමද... ඉ..න්..න..."

කෙල්ල වෙව්ලමින් වගේ සෙරෙප්පු දෙකත් දාගෙන පාරට බැස්සා... මුළු පරිසරය පුරාම තිබ්බේ පුදුමාකාර අන්ධකාරයක්. ත්‍රීවීලරයක් අල්ලා ගන්නට නම් පාර්ලිමේන්තු පාර ළඟටම යන්නට ඕන...

උපේක්ෂා දුවගෙන වගේ ගියේ... අසරණ අහිංසක ජීවිත වලට මෙහෙම දෙයියෝ උනත් වද දෙන්නේ ඇයි කියලා ඇයට හිතා ගන්නට බැහැ.

දියවන්නා වෙල් යාය නිමාවන පාර්ලිමේන්තු පාරට එන තෙක්ම ආවත් ඇයට ත්‍රීවීලරයක් හමුවුණේ නෑ.

"අ..නේ දෙ..යිය..නේ... අද පාර මෙච්චර පාළු ඇයි..."

කෙල්ල ඒ පැත්ත මේ පැත්ත බලමින් හිතුවා. ඉක්මනට මනෝජා ඇන්ටිව වෛද්‍යවරයෙකුට නොපෙන්නුවොත් ඇයට රෑ වෙද්දී උණ වැඩි වෙන්න පුළුවන්...

"එ..හෙම වු..ණොත් මහ රෑ මොනවා කරන්නද..."

ඔහුගේ දුරකථනය වසා තිබ්බේ ඇයි... "සමහර විට බැටරි බැහැලා ඇති..." ඒක අදම වුණේ ඇයි...

මේ මොහොතෙම කළු පැහැ ගත් හෙල්මටයක් පැළඳි බයිසිකල්කරුවෙක් රාජගිරිය දෙසින් පාර්ලිමේන්තු පාර දක්වා එමින් උන්නා... තමාව සොයාගෙන රංගනගේ සහචරයන් එන බව උපේක්ෂා දැන උන්නේ නෑ.

පාර්ලිමේන්තු පාරේ අඳුර අතරින් දියවන්නාව දෙසට එන බයිසිකල් කරුවා ඇතදීම ඇයව දැක්කා. ඒත් අන්ධකාරය නිසා ඔහුට පැහැදිලිව





කෙල්ලව පෙනුණේ නෑ.

බයිසිකලය ආ වේගය තරමක් අඩාල වුණා... බයිසිකල්කරුවා පැළඳි හෙල්මටයේ කළු ආවරණය ඉවත් කළා. ඔහු උපේක්ෂාව හොඳින්ම දුටුවේ ඒ මොහොතේදී... ඔහු බයිසිකලය ඇය ළඟටම කළේ තවත් ළඟට ඒ මුහුණ දැක ගන්නට අවශ්‍ය නිසයි. "සිරාම තමා මේ ඉන්නේ බඩුව... මාරයි... ලක්ෂ ගණන් වියදම් කරලා හෙව්වට පාඩු නෑ සිරා කෑල්ල..." රජ්තියාදූකාර බයිසිකල්කරුවා හිතුවා.

උපේක්ෂාගේ හිතට නුහුරු බියක් දැනුණා. ඇය හරි හදිස්සියෙන් වටපිට බැලුවා. ඒත් සමගම අඩි විස්සක් විතර ගිහින් බයිසිකලය නැවතුණා.

උපේක්ෂාගේ ඇස් නිකමට වගේ ඒ දෙසට යොමු වුණා. තමාව දැක්කට පස්සේ බයිසිකල්කාරයා නවත්තලා දුරකථනය අතට ගත්තේ ඇයි... "අනේ දෙයියනේ මේ මොනවද වෙන්නේ..." උපේක්ෂාට සිතා ගන්නටම බැරි වුණා.

"රංග ස..ර් මං පාලිත..."

ඒ නම ඇහෙද්දීම උපේක්ෂාගේ පපුව වෙව්ලා ගියා. කෙල්ලව ගිනි ගත්තා වගේ වුණා.

"ඉක්මනට පාර්ලිමන්ට් එක පිටිපස්සේ චෙක්පොයින්ට් එක පැනලා මහරගම පැත්තට එන්න... තත්පරෙන්..."

උපේක්ෂාගේ පපුව දඩස් ගාල හෙලවුණා. ඇයට දැන් සියල්ල පැහැදිලියි. "එහෙනම් මූව උඹයි එව්වේ... දියවන්නාවට පැනලා මැරුණත් මං උඹට අහු වෙන්නෑ..." උපේක්ෂා වේගයෙන් පාර්ලිමේන්තු හන්දිය වෙත දිව ගියා. ගෙට දුවගෙන ගියොත් වෙන්නේ මොනවද කියලා ඇය දන්නවා.

දුවාගන්නට බැරි ලෙස උපේක්ෂාගේ දෙපා වෙව්ලන්නට ගත්තා...



www.sinhalaelibrary.com

තමා පිටුපස එන බයිසිකල්කාරයා දෙස උපේක්ෂා පසුපස හැරී හැරී බැලුවේ ඇයව වෙව්ලද්දී... "අනේ දෙයියනේ මාව ආරක්ෂා කරන්න... මාව ආරක්ෂා කරගන්න..." කෙල්ල පාර්ලිමේන්තු මාවතේ කෙටි තුරුලතා අතරින් දුවමින් පැතුවා.

"ස..ර් මේකි පනිනවා... ඉක්මනට එ..න්..න..."

බයිසිකල්කරයා බයිසිකලයේ ඉඳගෙනම ජංගම දුරකථනයෙන් කියනවා ඇය අහගෙන. බයිසිකල්කාරයා ළඟ ළඟ එද්දී උපේක්ෂා අසළ වූ ආරක්ෂක මුරකුටියට ළං වුණා. එහි පොලිස් නිලධාරීන් තුන්දෙනෙක් රාජකාරියේ නිරතව උන්නා.

"අ..නේ... මා..ව බේරගන්..න.. අ..ර මී..නිහා ම..ගේ ප..ස්සෙ..න් එ..නවා... මට කරදරයක් කරන්න එන්නේ..."

උපේක්ෂා වැඳලා වගේ කිව්වා. ඒත් සමඟම පොලිස් නිලධාරියෙක් වේගයෙන් පාර පැන්නා. බයිසිකල්කාරයා එහෙමම බයිසිකලය හරවාගෙන නොපෙනී ගියා.

"කො..හෙද මේ නංගිගේ ගෙවල්..."

"මේ.. පැ..න්..තේ.. මං ය..න්..නැ..ම්... ම.. ම..ට මේ බ..ස් එ..ක න..වත්තලා දෙ..න්..න..."

පොලිස් නිලධාරියා බස් රිය නවත්වා දුන්නා. උපේක්ෂා බස් එකට ගොඩ වුණේ දෙවියන් යදිමින්. ඒත් සමඟම වගේ රංගනගේ ජීප් රිය දියවන්නා මාවත දෙසට හැරෙනවා ඇය බලාගෙන.

"බ..ල්..ලා දැ..න් ඒ පැත්තම පීරයි... මං මේ පැ..ත්..තේ ඉ..න්..නවා කියලා කො..හො..ම..ද දැ..න්..නේ..."

බස් එක කොහාට යනවද කියලා උපේක්ෂා දන්නේ නෑ. හොඳ වෙලාවට කෙල්ලගේ අතේ පුංචි පර්ස් එක තිබ්බා.

"මි..ස් කොහාටද..."





"මෙ.. මෙ..න..න හ..න්..දියට..."

කෙල්ලට කතා කර ගන්නවත් බෑ. ඇයව වෙව්ලනවා.

"ඇතුල් කෝට්ටේ හන්දියටද නුගේගොඩටද මිස්..."

"නු..ගේගොඩට..."

උපේක්ෂා එහෙමම හිස් ආසනයට බර වුණා... මේ බස් එකේ යන එක පවා අනතුරුදායකයි. උපේක්ෂා එකවරම පිටකෝට්ටේ හන්දියෙන් බැහැලා ආපු වෙනත් බස් රියකට ගොඩවුණා.

"උඹ එහෙනම් මාව හොයනවා... ඔව් උඹට මාව විනාශ කරන්න බැරි වුණානේ... ඒ ටික කරනකල් උඹට නින්ද යන එකක් නෑ... බල්ලා..."

උපේක්ෂාගේ ගතින් වැස්සකට තෙමුණා වගේ දහදිය ගලනවා.

"අනේ අසරණ සුදු ඇන්ටි... මං එ..නකල් බලන් ඇති... මං දැ..න් මො..නවද කරන්නේ... ඇයි ම..ට මෙ..හෙම ක..ර..න්නේ දෙයියනේ... ජීවිතේ දුන්න වද මදි කියලා දෙයියන්ට හිතෙනවද..."

උපේක්ෂාගේ ඇස්වලින් එක දිගට කඳුළු ගලාගෙන ගියා. එහෙමම ඇය අතින් ඇස් තද කර ගත්තා. නුගේගොඩ හන්දියෙන් ඇය බහිද්දී නගරය මැද්දේ මහා අසරණ කමක් ඇයට දැනුණා.

උපේක්ෂා එහෙමම කොමියුනිකේෂන් එකකට ගොඩ වුණා. මනෝජා ඇන්ටි තමාව සොයාගෙන පාරට ආවොත් තමාව සොයමින් යන දඩයම් බල්ලන්ට ඇයව හමුවන බව උපේක්ෂා දන්නවා.

කෙල්ල වෙව්ලන සුරතින් දුරකථනය එබුවා.

"සු..දු ඇ..න්..ටියේ ම..ම..."

කෙල්ලට ඇඬුණා.

"ශු..ගේ පු..තේ... ඔ..යා කෝ... මං මේ දොරකඩ බ..ල..න් ඉන්නවා... ඉ..ක්ම..නට එ..න්..න..."

"ම..ට එ..න්..න වි..දිහක් නෑ සුදු ඇන්ටි..."

"එ..න්..න විදිහක් නෑ.. ඇයි පුතේ..."

කෙල්ල අඬ අඬා හැමදේම කිව්වා.

"අනේ දෙයියනේ... ම..ගේ රත්තරන් දැ..නට ඔ..ත..න පරිස්සමින් ඉ..න්නවා නේද..."

"ඔ..ව්... ඒත් ම..ට බ..ය..යි... මට.. එ..න්..න විදිහක් නෑ සුදු ඇන්ටි... උ..න් මාව හොයනවා... දිගටම හොයයි..."

"අනේ දෙයියනේ... ඉන්න තැනකට මං එ..න්..නම් පුතේ..."

"එ..පා සු..දු ඇන්ටි... මං අයියට ග..න්නම්... ඒත් ෆෝන් වහලා තිබ්බේ..."

"මා..ත් බලන්..නම් පුතේ... පරිස්සමින් ඉන්න මැණික..."

"ම්.. වටපිට බලන්න ඇන්ටි... උන් ගෙවල් වලටත් එයි..."

"ඒක මං බලාගන්නම්..."

උපේක්ෂා දුරකථනය තියලා එහෙමම මුහුණ පිසදා ගත්තා. මොහොතකට කලින් ගනිද්දී ඔහුගේ ජංගම දුරකථනය වහලා තිබ්බේ. මේ දවස් ටිකේ ඔහු ඉන්නෙත් කරදරයෙන් කියලා ඇය දන්නවා. ඒත් ජීවිතේ ඉන්න එකම දෙයියාට මේ දුක නොකියා කාට කියන්නද...

ඇගේ ඇඟිලි තුඩු වේගයෙන් ඔහුගේ අංකය ඔස්සේ එබුණා. ඒ අංකය මේ හිතේ ලියවිලා තිබ්බ එක කොච්චර දෙයක්ද...

"අ..යියේ... මං..."

තාරකට පුදුම හිතුණා. එකක් කෙල්ල කතා කලේ අඬ අඬා... අනික ඇය ගත්තේ නුපුරුදු අංකයකින්...

"නංගී.. ඇයි මේ... ඔයා කොහෙද..."

"මං මම... ආයෙ..ත් ඔයාගෙන් පිහිට..ක් ඉ..ල්ලන්..න වෙලා අ..යියේ..."

උපේක්ෂාට පුදුමාකාර විදිහට ඇඬෙන්න එනවා. ඒ ඇඬුම හිර කරගන්න හරි අමාරුයි.





"නංගී... කොහෙද ඉන්නේ කියන්න..."

තාරක කතා කලේ බයවෙලා. කෙල්ලගේ ජීවිතේට මොකක් හරි ලොකු අනතුරක් කියලා ඔහුට නිකමට වගේ දැනුණා.

"මං.. නු..ගේ..ගො..ඩ ඉ..න්..නේ..."

"කරදරයක් නෑ නේ..ද..."

"නාම නෑ අයියේ... ඒත්..."

"නුගේගොඩ කොතනද ඉන්නේ කියන්න..."

"සු..ප..ර් මා..ර්කට් එක ළඟ කොමියුනිකේෂන් එකක..."

"ඔ..හො..මම ඉ..න්..න තේරුණාද..."

"ම්..."

"මං විනාඩි පහෙන් ඔතන..."

"අයියට පි..න්..."

"වෙච්ච දේ ආවාම කියන්න..."

"ඌ පස්සෙන් එ..නවා අයියේ..."

"බබා.. විනාඩි පහක් පරිස්සම් වෙන්න..."

"මං ඉ..න්..නා..ම් ඇතුළටම වෙලා ඉන්නම්..."

තාරක එහෙමම දුරකථනය තිබ්බා. ඔහු වාහනයේ යතුර අරගෙන වේගයෙන් පහළට ආවා. සාලයේ කවුරුවත් පේන්න උන්නේ නෑ. ගෙදරින් එළියට යද්දීම වාගේ වාහනයක් වත්තට ඇතුල් වුණා.

"තා..ර..ක..."

දිල්කි කෑ ගසද්දීම තාරක වේගයෙන් වාහනය පාරට ඇම්මා. ඒත් සමගම ආ ඇමතුම දිල්කිගෙන් බව ඔහු දන්නවා.

"මට හදිස්සියක් දිල්... මං තියනවා..."

"ඔ..යා..ට මො..ක..ද..."

දිල්කි කතා කරන්නත් පෙර තාරක දුරකථනය තිබ්බා. ඔහු වේගයෙන්



www.sinhalaelibrary.com

වාහනය පාරට දමමින් ගත්තේ මනෝජාට.

"ඇන්ටි මම..."

"අ..නේ පු..තේ ම..ගේ කෙ..ල්ල..."

තාරකගේ පපුවම දන්නට ගත්තා. කෙල්ලට මොකක් හමුත් ලොකු කරදරයක්.

"හරි ඇ..න්ටි මං දැන් ය..නවා... ඔයා බයවෙන්නෙපා... ගෙදරම ඉ..න්..න..."

"ම..ගේ කෙ..ල්..ල..ට අනතුරක් වෙ..න්..න තියන්නෙපා පුතේ..."

"ඒකි මගෙත් කෙල්ල ඇන්ටි..."

තාරක කිව්වේ එච්චරයි. ඔහු වේගයෙන් නුගේගොඩ දෙසට වාහනය ධාවනය කළා. දිල්කි දිගටම ගන්නවා.

"තා..ර..ක..."

"දිල් ම..ට හ..දිස්සියක්..."

"හොල්මනක් දැක්කද කොහෙද ගියේ..."

"මං පස්සේ ගන්නම්..."

තාරක වේගයෙන් දුරකථනය ආසනයට දැම්මා. තමාගෙත් අත් වෙව්ලනවා වගේ ඔහුට දැනෙවා.

"නෑ උඹට මං කරදරයක් වෙන්න ඉඩ තියන්නෑ... එහෙම වෙ..න්න බෑ..."

තාරක තමාටම කියා ගත්තා.

තාරකගේ වාහනය නුගේගොඩ සුපිරි වෙළඳ සැල අද්දරට එද්දිම වාගේ කෙල්ල පාර හරහා දුවගෙන ඇවිත් වාහනයට නැග්ගා.

"ඇ..තු..ළකට ය..න් අ..යියේ..."

කෙල්ලව වෙව්නවා... තාරකට මතක් වුණේ එදා ග්‍රෑන්ඩ් හෝටලයෙදි ඇඳ යටට රිංගපු කෙල්ලව. කෙල්ල අද ඉන්නේ එදාටත් වඩා බයවෙලා





කියලා ඔහුට හිතුණා.

තාරක නුගේගොඩ පාළු ඇතුල් පාරකට වාහනය දාලා ටික දුරක් ගිහින් නතර කළා.

"මො..කද වු..ණේ..."

"ඌ... ආවා අ..යියේ... ඌ ආවා..."

උපේක්ෂා අඬ අඬා හැමදේම කිව්වා. ඒ ටික කියද්දී ඇයට ඉබේටම ඔහුගේ අත ඇල්ලුණා. කෙල්ලව තාමත් වෙව්ලනවා.

"බ..ය..වෙ..න්..නෙපා... ඔයා දැන් මං ගාව..නේ..."

තාරක පුදුමාකාර ආදරයකින් ඒ හිස අතගෑවා.

"ම.. ම..ට.. අයියේ..."

"දැන් මං ඉන්නවනේ නංගී..."

"මං.. ඇ..න්ටිට අසනීප නිසා එ..ළියට ආවේ..."

"කොටිය එහෙමයි... ලේ රහ දැනුණට පස්සේ ගොදුර අතාරින්නෑ... ලේ රහ දිගේ එ..නවා..."

"ඒ..වි..තේ මෙ..හෙ..ම වි..ඩින් වි..ඩේ ක..ර..දර කරනවට ම..ට ස..මා..වෙ..න්..න අ..යියේ..."

තාරක දිග සුසුමක් හෙළුවා.

"මනෝජා ඇන්ටි ගන්නේ... බලමු..."

තාරක ඒ ඇමතුම ගත්තා.

"පු..තේ..."

"කවුරු හරි ආවද ඇන්ටි..."

"ආවේ නෑ පුතේ... පාරේ බයික් දෙකතුනක් එහෙට මෙහෙට ගියා..."

"ම්..."

"කෙල්ල ආවේ කොහෙන්ද කියලා උන් දන්නෑ..."

ගෙදරට දුව නොගොස් පාරට දුවපු එක කොච්චර හොඳද කියලා



www.sinhalaelibrary.com

උපේක්ෂාට හිතුණා. එහෙම ගියා නම් උන් තමා ඉන්නා තැන දැනගන්නවා.

"ඇ..න්..ටි..."

"පු..තේ..."

"අද ඔයා ගෙදර ඉන්නෙපා... ඇන්ටි ලෑස්තිවෙලා ඉන්න... මං කෙල්ලත් එක්ක රෑ වෙලා එන්නම්..."

"හොඳයි පුතේ..."

"අද රෑ මං දෙන්නව තැනක් නතර කරන්නම්..."

දුරකථනය දිගටම නාද වෙනවා. කතා කරන්නේ දිල්කි කියලා ඇයට ජේනවා.

"අ..යියෙ එයා..."

"ගත්තදෙන්.. මට දැන් එයාට උත්තර දිදී ඉන්න බෑ..."

මොනවා කරන්නද කියලා තාරකටත් එකපාර හිතාගන්නට බැහැ.

"මං ද..න්..නවා... මං හි..ත්..ා හ..රි ක..ර..දර..."

එවර නම් තාරක ලස්සනට හිනාවුණා.

"ආදරේටද දන්නෑ ඔච්චර හොයන්නේ..."

"උ..න් මො..නාද අ..යියෙ ආදරේ ගැ..න ද..න්නේ..."

කෙල්ල කිව්වේ හරි දුකකින්.

"මං විහිළුවක් කළේ... දැන් හිනාවෙලා ඉන්න..."

"හ..රි අමාරුවෙන් මං ජීවිතේ ප..ටන් ග..ත්..තේ..."

"ඔ..යාට කරදරයක් වෙ..න්..න මං ඉඩ තියන්නෑ... මාව විශ්වාස කරන්න..."

"විශ්වාසේ කියන වචනේ තේරුම දැනග..ත්..තෙ..ත් අයියගෙන්..."

ඇය එපමණයි කිව්වේ.

"පව් ගෙදරට ඇඳන් ඉන්න ඇඳුම පිටින් ඉ..න්නේ... අපි ගෙදර ගිහින් ඇඳුමක් අරගෙනම යං..."





"ඇ..පි ත..ව චු..ට්ටකි..න් යං අ..යියේ..."

උපේක්ෂා එහෙමම ඒ වමතට සුරත තිබ්බා.

"උපේක්ෂා..."

"අ..යියේ..."

"මේ ප්‍රශ්නේ බේරුමක් කරගන්නත් ඕන.. නේද..."

"මං.. මං.. ද..න්..නවා අයියේ... ඒත්..."

"කසාද සහතිකේ නම ගියාට පස්සේ ලොකු ප්‍රශ්නයක්නේ..."

"ම්.. ම..ම චු..ට්ටක් ඉ..දලා පිළිවෙලක් හදාගන්නවා... මු..න් ම..හ ජරා මිනිස්සු අ..යියේ... ඒ ඔක්කොම දේපොල වල අයිතිය මට තියෙන්නේ..."

"අපි වෙලාවක ලෝයර් කෙනෙක් හම්බවෙමු.. ම්..."

"ම..ට චුට්ටක් නැගිටින්න අ..ත දෙ..න්..න අයියේ..."

"ම්.. ග..න්..න..."

ඔහු ඇත්තටම අත පෑවා. ඇය ඒ දිහා බලා උන්නේ දේව අතක් දිහා බලා ඉන්නවා වගේ.

"ඔ..යාට ඕ..න වෙ..ලාවට ඔ..යා ළඟ මං ඉඳී..."

ඔහු කිව්වේ එච්චරයි.

ඒත් මෙ අත තව ටික දිනකින් කෙනෙක්ට සින්නක්කරේටම ලැබෙනවා. ඊට පස්සේ යුග ජීවිතයකට බැඳුණ අතකට අත තියන්න බෑ. ඒක මහ අපිරිසිදු වැඩක්.

"ය..න් ඔං බොන්..න මො..නවා හරි අරන් දෙන්නම්..."

උපේක්ෂා ඔහු දිහාම බලාගෙන උන්නා. ජීවිතේ අමාරුම ප්‍රශ්න වලදී තමන්ගේ අය තරම් උතුම් අය තවත් නෑ... ජීවිත කාලේ එක් තැනකදී හමුවූ ඔහු ආත්ම ගණනක ඉඳලා තමන්ගේම කෙනෙක් වෙන්නට ඇති.

තාරක අතුරු පාරේ තිබූ කඩයක් ළඟ නතර කරලා සීත කළ ක්‍රීම් සෝඩා බෝතලයක් රැගෙන ආවා. එය ගෙනා ඔහු එහෙමම ඇයට පෑවා.



www.sinhalaelibrary.com

"අ..යි..යා බී..ලා දෙ..න්..න..."

"බො..න්..නකෝ..."

ඇත්තටම හරි පිපාසයි. කට ලේ රහයි. සීතල ක්‍රීම් සෝඩා උගුරු දෙක තුනක් උගුරෙන් පහළට යද්දී දැනුණේ පුදුමාකාර සනීපයක්. කෙල්ල බටය කටේ ගසාගෙන කල්පනාබරව බොන දිහා ඔහු බලාගෙනම උන්නා.

අද තාරක එක දෙයක් වටහා ගත්තා. ඒ මේ ජීවිතය දාලා ගිහින් සැනසීමක් නම් නෑ කියලා. ඒ ජීවිතයත් මේ ජීවිතයත් අතර මොකක්ද ලොකු බලගතු බැඳීමක් තියෙනවා. තමන්ගේ ශරීර අවයවයක් වෙන කොහෙවත් තියලා කෙනෙක්ට සැනසීමකින් ඉන්න බෑ... ඇය ගැන ඔහුට හිතෙන්නේ එහෙමමයි.

"බො..න්..න අ..යියේ..."

තාරක ක්‍රීම් සෝඩා ටිකක් බීලා යළිත් බෝතලය ඇය අතටම දුන්නා.

"රෑට කෑ..ව..ද..."

"ඇ..න්..ටිට බෙහෙත් ටිකක් ගෙනත් මොනවා හරි උණුවෙන් හදලා දෙන්න උන්නේ..."

"මට අ..ඩ අ..ඩ කිව්වේ මගේ කෙල්ලව බේරගන්න කියලා..."

"ඔයාට එහෙම කියන්නේ මේ දුප්පත් ජීවිතේට ඔයා ඇරෙන්න වෙන දෙවියෙක් නැති නිසා..." උපේක්ෂා හිතුවා.

"අපි උපේක්ෂා..."

"ම්..."

"හෙ..ට උදේ ලෝයර් කෙනෙක් හම්බවෙමු..."

උපේක්ෂා ඔහු දෙස බලාගෙන උන්නා. ඒත් කොච්චර අමාරු වැඩක්ද කියලා ඇය දන්නවා.

"අ..යියේ..."

"ම්..."





"මේ වෙ..ඩි..න් එ..ක ක..ටේ තියාගෙන..."

තාරක කතා නෑ. ඒ ගැන මතක් කරද්දී හිතට අලුත් බරක් එනවා.

"නේ..ද..."

උසාවිවලට ඔහු එක්ක යන්න බෑ. ඔහුට තමා සමඟ එන්නත් බෑ. ඒත් මේ ජීවිතයේ තියෙන එකම අත්වැල ඔහු... ඒ අත්වැල ඒ අතට මුද්දක් වැටුණට පස්සේ බිඳිලම ය..යි..ද...

"ම..ට හැ..ංගිලා ටි..ක කාලයක් ඉ..න්..න පුළුවන්..."

"හැ..මදාම.. මෙ..හෙ..ම..."

"අ..යියට ක..තා ක..ර..න්..න බැරි ද..වස..කු..ත් එ..නවා න..ම..යි..."

තාරක හිනාවුණා. ඒක මහ පුදුමාකාර සිනාවක්.

"එ..හෙම වෙ..න්..නෑ..."

"එ..යා..ගේ ම..හ..ත්..තයට ම..ම..."

හිතට හරි දුකයි... ජීවිතේ හමුවීම දෙවියන් මෙහෙම ප්‍රමාද කරලා මවන්නේ ඇයි...

"අ..පි ය..න්... මනෝජා ඇන්ටිත් බලාගෙන ඇති..."

"ඒ බ..ල්..ලා තා..ම ඇ..ත්..ද..."

"මං ඉ..න්නවනේ..."

"ඔව් ඔයා ඉන්නවනම් ආලවක යක්ෂයා ආවත් බය නෑ. එහෙම ආරක්ෂාවක් ඔයා ළඟදී මට දැනෙනවා..." උපේක්ෂා හිතින් කිව්වා. කරදර ගොඩක් මැද්දේ මෙහෙම සිත සන්සුන් කරගෙන ඉන්නේ ඒ නිසා...

*** *** *** ***



www.sinhalaelibrary.com

තාරක දියවන්නාව දෙසට වාහනය ධාවනය කළා... ඇතුල් කෝට්ටේ හන්දියෙන් වාහනය දියවන්නාව දෙසට ඇද්දී කෙල්ල බයෙන් වගේ බැලුවා.

"මං ඉ..න්..නවනේ..."

ඔහු ඒ අතට අත තියලා කිව්වේ හරි කරුණාවෙන්. මේ ලැබීම සදාකාලික නම්... මේ බැඳීම සදාතනික නම්... ජීවිතේ මෙ රැයින් පටන් ගන්නවා.

ඒත් කොහොමද... මේ කතා කරන්නේ ඔහුගේ දිල්ය...

"අ..යියේ එ..යා..."

උපේක්ෂා එක දිගට නාද වෙන දුරකථනය ඔහු වෙත පෑවා. තාරක ඇමතුම සම්බන්ධ කර ගත්තා.

"දිල් කොහෙද ඉන්නේ..."

"මං ඉන්න තැන කියන්න කලින් ඔයා ඉන්න තැන කියන්න..."

"මං මඟ දිල්..."

"මා..ත් ම..ග... ඔයාට එකක් කියන්නම් තාරක..."

"ම්..."

"මේ වලට උත්තර දෙන්න වෙයි හොඳද..."





"උත්තර දෙනවනම් මටත් ප්‍රශ්න පත්තරයක්ම තියනවා අහන්න දිල්..."

දිල්කි එකපාරටම නිහඬ වුණා. වීදුරු ගෙවල් වල ඉඳගෙන ගල් ගහන්න බෑ.

"දිල්..."

"මගෙන් මොනා අහන්නද..."

තාරක හිනාවුණා. ඒක මහ පුදුම හිනාවක්.

"අ..දට එක ප්‍රශ්නයක් විතරක් අහන්නද..."

උපේක්ෂා බයෙන් වගේ ඔහු දිහා බැලුවා. "මෙහෙම ප්‍රශ්න ඇති කර ගන්නේ ඇයි... දැන් එයත් එක්ක ජීවත් වෙන්නෙපැයි..." ඇයට හිතෙන්නේ එහෙමයි.

"ඉ..හි..න් අ..හ..න්..ඩ..."

දිල් කිව්වේ එච්චර ධෛර්යකින් නෙමේ.

"ඊයේ හවස දි..ල්..."

එහෙම අහද්දීම දිල්කිගේ කටහඬ නිහඬ වුණා.

"ගල්කිස්සෙ මොකටද ගියේ..."

දිල්කි එකපාර කතා කළේ නෑ. උපේක්ෂා හරි අමාරුවෙන් පාර දිහා බලාගෙන උන්නා.

"මං ගි..යා..."

"මත..ක නෑ නේ..ද... මේ පැය විසි හතරකට කලින්... හවස..."

"දැන් පස්සෙනුත් එනවද..."

"අනේ නෑ... එහෙම පස්සෙන් ගිහින් පරිස්සම් කරන්න පුළුවන් නෝනා කෙනෙක් නෙමේ කියලා මං දන්නවා..."

ඔහු මොනවද මේ කියන්නේ.

"ගියාද කියන්නකෝ... අර වැස්සේ..."



www.sinhalaelibrary.com

දිල්කි කතා කළේ නෑ.

"මට උත්තර ඕන නෑ දිල්... උත්තර බලාපොරොත්තු වෙන්නෙත් නෑ... මේ වලට උත්තර දෙන්න වෙයි කියලා කිව්ව නිසා මං ඇහුවේ... මං උදේට ගන්නම්... ගුඩ් නයිට්..."

තාරක එහෙමම කියලා දුරකථනය තිබ්බා. උපේක්ෂාට හීන් සුසුමක් පිට වුණා.

"නංගී..."

"ම්..."

"මේවා හිතන්නෙපා... මේ මගේ ප්‍රශ්න..."

කෙල්ල කතා කළේ නෑ.

"මෙ..හෙ..ම ක..තා ක..රලා අයියේ එ..යා එ..ක්..ක..."

"දුර ගමනක් යන්න බෑ..."

"ඒ..ක..නේ.. ඉවසන්නෙපැයි..."

තාරක හිනාවුණා.

"එ..හෙ..නම් උපේක්ෂා..."

"ම්.."

"හනිමූන් එකට ග්‍රෑන්ඩ් හෝටලේට ආපු ඔයා දුවන් ඇවිත් මගේ කාමරේ ඇඳ යට රිංගුවේ ඇයි..."

කෙල්ල කතා නෑ. කියන්නේ මොනවාද... හිල්ලෙනවා විතරයි.

"ඇත්තම කියන්නද..."

"ම්..."

"උඹ කෙල්ලෙක් වෙලා උඹට තිබ්බ ධෛර්ය මට නෑ..."

උපේක්ෂාගේ අත එහෙමම ගියරය මත වූ ඔහුගේ සුරතට වැටුණා.

"ග..න්..න තීරණයක් අයියගේ ජීවිතේ ගැන හිතලම ගන්න..."

තාරක කතා නොකරම පාර්ලිමේන්තු හන්දියෙන් දකුණට දැම්මා.





කෙල්ලගේ දෙනෙත් පාර පුරා වේගයෙන් ගියා. දැන් පාර පාළුයි.

"අ..යියේ..."

"ම්..."

"ම..ම ගෙ..දර ඉ..න්..නම් ක..ම..ක් නෑ..."

තාරක දිගටම සිතුවා. අද රෑ විතරක් කෙල්ලව පිට තියලා වැඩකුත් නෑ තමයි.

"ය..න්..කෝ..."

තාරක එහෙමම වාහනය පුංචි මිදුලේ නැවැත්තුවා. පසුව ඔහු වාහනයේ හෙඩ් ලයිට් පවා නිවලා දැම්මා.

"අපි ය..න්..."

කෙල්ලව ඇරලා තාරක මිදුලට වෙලා මොහොතක් උන්නා. මුළු දියවන්නා පරිසරයම පාළුයි. පාර්ලිමේන්තුව හරහා යන පාරේ ඉඳහිට වේගයෙන් වාහනයක් ඇදීගෙන ගියා. "ටිකක් රෑ වෙනකල් ඉඳලම යනවා..." ඔහු එහෙම හිතා ගත්තා.

"එ..හෙම ගෙවල් වෙක් කරන්න කාටවත් බෑනේ පුතා... මං කෙල්ලව පරිස්සම් කරගන්නම්..."

මනෝජාත් මිදුලට බැහැලා කිව්වා.

"ඇ..න්ටි..."

"පු..තේ..."

"එ..යා..ව පරිස්සම් කර ග..න්..නම ඕ..න..."

"මං ද..න්නවා පුතේ..."

"අද කෙල්ල ළඟම ඉන්න..."

"අනේ කෙල්ල පාරට දිව්වේ ම..ට අසනීප නිසා පුතේ... මං එ..ප..න් කිව්වා..."

"ම්.. ටික දවසක් යනකල් එයාට මේ මිදුලේ වත් ඉන්න දෙන්නෙපා..."



www.sinhalaelibrary.com

"මං හිතුවා..."

තාරක එහෙමම සාලයේ පුටුවකට බර වුණා. හිතට අද බරයි. අද රෑ මේ ගෙදර පහන් කරන්න තරම් ඔහුට හිතෙනවා. ඒත් ඒක හොඳ නෑ.

"පු..තා ටි..කක් ඉඳලා නේද ය..න්නේ..."

"ඔව් ඇන්ටි... මං රෑ වෙලා යන්නම්..."

"මං කෑම ටිකක් හදන්නම්..."

"ඕ..යාට උ..ණ..නේ ඇන්ටි... මං හදන්නම්... අයියා එක්ක කතා කර කර ඉන්න..."

උපේක්ෂා කිව්වා.

"ඒ උ..ණ ගියා රත්තරන් උඹට කරදරයක් කිව්වාම... පපුවයි රිදෙන්න ගත්තේ... දැන් හරි..."

තාරක සැටියට බරවෙලා කෙල්ල දිහා මොහොතක් බලා උන්නා. ජීවිතය ගැන මොනවා හරි අලුතින් දෙයක් ඔහුට හිතන්න ආසයි. ඒ හිතන්න මේ දෑස් ඉදිරියේ ඉන්නේ හොඳ නිමිත්තක් කියලා ඔහු දන්නවා. ඒත් කෙල්ලව තවත් දුක් ගොඩකට ඇද ඇලා ඇයව එහෙම අපිරිසිදුම කරලා දාන්න බෑ.

"තේ..ක..ක් හදන් එ..න්..නම් අයියේ..."

තාරක හිනාවුණා.

"ප්..ලේන්ටියක්..."

"ම්..."

තාරක එහෙමම දෑස් වසා ගත්තා. දිල්කි... අරම කිව්වාම ඇය මොනවා හිතනවා ඇත්ද කියලා ඔහු හිතුවා. සමහර විට මේ කිසිම දෙයක් ගැන එයා හිතන්නෙත් නැතුව ඇති.

ඉරිදාට වෙඩින් එකට දින දාගෙන ඒ වැඩ නිමා වෙනවා... ජීවිතය ගැන අලුතින් හිතන්න මේ වැස්ස මදි. සඳුදා වෙද්දී හිර කරන්න පටන්



www.sinhalaelibrary.com



ගන්නවා.

"අ..යියේ..."

ඔහු උන්නේ දෙනෙත් පියාගෙන. ඒ පපුව තියෙන්නේ බරෙන් කියලා ඇය දන්නවා. තාරක සුදු පීරිසි කෝප්පය අතට ගත්තා.

"නංගී..."

"ම්..."

"ටි..ක දවසක් ඔහොම ඉන්නකෝ..."

ටික දවසක් ගෙවුණට පස්සේ මොනාද වෙන්නේ කියලා අහන්න ඇයට හිතුණා. ජීවිතේ දෙයක් වෙනුවෙන් ටික දවසක් නෙමේ අවුරුදු ගණනාවක් උනත් බලන් ඉන්න පුළුවන්. ඒත් දෛවයත් වෙනස් කරන්නම අමාරු වෙන වෙලාවල් තියෙනවා.

"හි..තු..ණො..ත් අ..යියේ..."

"ම්..."

"මං මේ ඔක්කො..ටම එරෙහිව සටන් ක..ර..නවා... හෙට උදේ ඉඳලා ම..ගේ තා..ත්..තට අයිති හැ..ම දේම මං ග..න්..නවා... ඔ..ක්..කො..ම ව..ල් ස..ත්තු මං එලවලා දාන..වා..."

තාරක පුදුමයෙන් වගේ බලා උන්නා.

"නංගී..."

"ම්..."

"ඔ..ය හයිය මේ කසාදේ වෙ..න්..න කලින් තිබ්බේ නැද්ද..."

තාරක ඒ ඇස් දෙසම බලාගෙන උන්නා. ඇය නැහැ කියන්න වගේ හිස දෙපසට වැනුවා.

"එ..දා අයියේ..."

"ම්..."

"මේ ස..ම..න් දෙ..යියෝ මං ළ..ඟ... උ..න් නෑ..."

කෙල්ල ඔහුගේ දණ මඬලට සුරත තියලා කිව්වා. තාරක බලාගෙන උන්නේ ඇල්පෙනිති තුඩවල් ඇනෙන බැල්මකින්.

"ම..ට අ..යි..යේ හෙ..ට උ..දේ සා..රි..ය..ක් ඇ..ඳ..ගෙ..න ම..ගේ තා..ත්..තගේ ගාමන්ට් එකට ය..න්න පු..එවන්... ඒ හයිය අද මට තියෙ..න..වා..."

තාරක කතා නොකරම උන්නා. ඊටත් පස්සේ ඔහු නැගිට්ටා. ඇවිත් කෙල්ලගේ උරතල මත දෑත තිබ්බා. කෙල්ල නැගිට්ටේ ඔහුගේ මුහුණට සමාන්තරව.

"ඒ ස..ට..න ප..ට..න් ග..න්..න... ස..ම..න් දෙ..යියො ව..ගේ මං පිටිපස්සේ ඉ..න්..නම්..."

උපේක්‍ෂා බලාගෙනම උන්නා.

"ඒත් අ..යියේ... මේ වෙ..ඩ්..න් එක ක..ටේ නේ..ද..."

"ඒවා මං බලාගන්නම්.. අපි ලෝයර් කෙනෙක් හම්බවෙමු... පොලීසියට යන්... ඔයාගේ ආරක්‍ෂාවට මං ඕන දේවල් කරන්නම්..."

"ම්..."

"මං ඒ ස..ට..න ක..ර..න්..න..ම ඕ..නා... තා..ත්තා හී..නෙ..න් ඇ..විත් කියනවා..."

"ය..න්..න ඔයා දිනනවා..."

ඔහු ඒ හිස මත අත තියලා කිව්වා.

"එ..හෙ..නම් දිනනවම තමා..."

උපේක්‍ෂා හරි පුදුම විදිහට හිනාවෙලා කිව්වා.

කෙල්ලගේ හිත ඇතුලේ පුදුමාකාර මනුස්සකම් කන්දක් වාගේම හොඳ ආත්ම ධෛර්යකුත් තියෙනවා කියලා තාරක දන්නවා. එදා ග්‍රෑන්ඩ් හෝටලයේ කාමරයෙන් කෙල්ල පැනල ආවේ අතේ තිබ්බ පර්ස් එක පිටින්. කෙල්ල ඇඳගෙන උන්නේ සාමාන්‍ය සායක්. බ්ලවුස් එකක්.





www.sinhalaelibrary.com

කෙල්ලගේ පර්ස් එකේ තිබ්බේ රුපියල් දාහකුයි ඇගේ හැඳුනුම්පතයි විතරයි. ජීවිතයේ එහෙම දේවල් කරන්න සාමාන්‍ය කෙල්ලෙක්ට බෑ. ඒකට අසාමාන්‍ය ධෛර්යක් ඕන.

"හැමදෙයක්ම අපි පිළිවෙලට කරමු... තාත්තාගේ ලෝයර් කෙනෙක් උන්නද..."

"ඔ..ව්... මං කතා කරන්නම් හෙට..."

"එයාට උනත් ඉන්න තැනක් කියන්නෙපා... මං සිම් කාඩ් එකක් දෙන්නම් ෆෝන් එකක් එක්ක... ඒකෙන් ගන්න..."

"හො..දයි අයියේ... මං කිය..න විදිහටම ක..ර..න්..න..ම්..."

"මං පිටිපස්සේ ඉන්නවා... ඒත් පේන්න එන්නෑ... තේරුණාද..."

කෙල්ල හරි ලස්සනට හිනාවුණා.

"ඇයි හිනාවෙන්නේ..."

"දෙයියෝ එහෙමනේ..."

"ඇයි..."

"පේන්..න එ..න්..නෑ... ඒත් පිටිපස්සේ ඉන්නවා... ඒක දැනෙනවා..."

"සඳරාජිනී" - 07 කලාපය සමග
තවත් රසබර කොටසක්...

හැමදාම මට මොකක්ද අඩුවක් දැනුණා... ඒක විස්තර කරන්න මට තේරෙන්නේ නෑ... නිකං මොකක්ද දෙයක් නැහැ වගේ මට නිතරම දැනෙන්න ගත්තා... ගිය ආත්මෙක මට තිබුණ දෙයක් මේ ආත්මේ මට නෑ වගේ මට දැනෙන්න ගත්තා... මම ගොඩක් හිතුවා... ඇයි මට මෙහෙම හිතෙන්නේ කියලා... ඒත් තේරුමක් තිබුනේ නෑ... එක දවසක මම ඔයාව දැක්කා... ඔයාගේ ඇස් දෙක මගේ ඇස් ඉස්සරහට ආවා... එදා මට පුදුම හිතුණා... පස්සෙන් පහු මම තේරුම් ගත්තා මේ ආත්මේ අඩුවක් වගේ තේරුණේ ඔයා නැති එක කියලා... මගේ ජීවිතේ මේ දැනෙන අඩුව ඔයා කියලා මම හරියටම තේරුම් ගත්තා... මෙකයි... අපි පහුණු ආත්මෙක එකට උන්නා... සමහරවිට මේ ආත්මෙට ලඟම තිබුණ අතීත ආත්මේ වෙන්න ඇති... ඉතින් මොකද කරන්නේ... ඔයා හිතනවද මට මේ ආත්මේ ඔයා නැතුව ජීවත්වෙන්න පුළුවන් කියලා... එහෙම වුණොත් මට හැමදාම ලොකු අඩුවක් දැනෙයි...

නිකං හිස් ගතියක්... මොකක්ද නෑ වගේ... එහෙම වෙන්නේ කොහොමද... එතකොට ජීවිතේ සම්පූර්ණ නැතේ බබා... ඉතින් මම තීරණය කළා ඔයාගේ ජීවිතේ කොටසක් වෙන්න... ඇත්තම කතාව මෙකයි... මට ඕන ඔයාව මගේ කරගන්න... මොකද ඔයා නැතුව සුදූ මම සම්පූර්ණ නෑ...

ඒක ටිකක් ආත්මාර්ථකාමී දෙයක්... මොනවා කරන්නද... ජීවත්වෙන්න ඔයාටම ඕනනම්... නේද... ඉතින් කියනවා මම ඔයාට හරි ආදරෙයි... ගොඩක්... කියන්න බැරි තරම්......"

සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්



www.sinhalaelibrary.com



ආදරය ගින්දරක්
එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...
නවකතා තිළිණය
07 පොත
www.sinhalaelibrary.com
සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්

එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...

## සුජීව ප්‍රසන්න ආරච්චි

ඈස් දිහාම ඔහු බලාගෙන උන්නා. සමහර විට මේ දෛවය තනිකරම කනිපිට හැරෙයි.

"අම්මයි ඒ මිනිහයි බැඳලද..."

"ඔ..ව්.. මං හිතන්නේ තාත්තගේ මරණින් පස්සේ එ..හෙම කළා..."

"එහෙනම් මරු..."

"ඇයි..."

"එහෙම උනොත් එතනින් වාසිය නංගිට... කොහොමත් උපේක්ෂා... ඔ..යා..ගේ හ..ස්..බ..න්..ඩ්..."

කියාගෙන ආ දේ ඔහුම ගිල ගත්තා.

"ඒ මි..නිහා රංගන... මගේ කවුරුවත් නෙමේ අයියේ..."

"සොරි මිස්... රංගන... එයාට අයිතියක් ඇත්තෙම නෑ මෙවා අල්ලගෙන ඉන්න... ඔයාට හෙට යන්න පුළුවන්..."

"මං ද..න්..නා..වා..."

"සමහර විට ඌ ඔයාව හොයන්නෙත් ඒක දන්න නිසා..."





උපේක්ෂා හිස වැනුවා. මනෝජා ඇවිත් දෙන්නා දිහාම බලාගෙන උන්නා. මෙ ජීවිත දෙක අතර මොනවා හරි වෙන්නම ඕන. නැත්නම් දෙයියෝ ළඟ හාස්කම් නෑ. එයත් පගා ගන්නවා විතරයි.

"පු..තේ කෑ..ම ටි..කක් කාලා ඉ..න්..න... දැන් රෑ වෙලා..නේ..."

"කමු ඇන්ටි..."

තාරක කෙල්ලත් එක්කම මේසයට ආවා. මනෝජා හදිස්සියට හැදුවේ නූඩ්ල්ස්. ඇය කැරට් ලීක්ස් දාලා නූඩ්ල්ස් තෙම්පරාදුවක් දාලා චිකන් කරියක් හැදුවා. බිත්තර තම්බලා නූඩ්ල්ස් එක උඩ දැම්මා.

කෙල්ල මේසේ දැකලා හිනාවුණා.

"ඔන්න දැන් බනී..."

"තෙ..ල්නේ අ..යියේ... ලෙඩ වුණාම තියෙන ගින්දර..."

කෙල්ල ඇත්තටම බණිනවා.

"තෙල් නම් තමා ඇන්ටී..."

"අද මෙහෙම කමු..."

ඔහුට බෙදුවේ උපේක්ෂා.

"හැබැයි ඇන්ටි හරි සුවඳයි ෆ්‍රයිඩ් නූඩ්ල්ස් එක..."

ඒ පාර කෙල්ල කියනවා. සුප් කැටයක් එහෙම දාලා මනෝජා හැදුවේ. තෙම්පරාදුවට සුප් කැටයක් දැම්මාම හරි සුවඳයි.

"නංගිත් ඉඳගෙන කන්න..."

ඇත්තටම ඔහුත් එක්ක ඉඳගෙන කෑම ටිකක් කන්න ඇයට ආස හිතුණා.



www.sinhalaelibrary.com

"ම.. දෙන්නටම කොකා කෝලා දෙකකුත් ගෙනාවා..."

මනෝජා සීතල කොකා කෝලා වීදුරු දෙකකුත් ගෙනත් තිබ්බා.

"මේ රෙස්ටොරන්ට් එක හොඳයි නේද අයියේ..."

කෙල්ල හිනාවෙලා කිව්වා. මනෝජා කුස්සියට ගියේ ඇගේ හිස අතගාලා... උපේක්ෂා ඔහු ළඟට වෙලා කෑම ටික කෑවේ හරි ආශාවෙන්... අද ඒ හිතන්න දහසක් දේවල් තියෙනවා...

*** *** ***





**උපේක්ෂා** කාමරයට ආවේ කෝපි චුට්ටක් හදාගෙනම්යි. අසනීප නිසා මනෝජා වේලාසනම නිදාගත්තා. ඇය නිදා ගත්තේ කෙල්ලට ඒ ඇඳේම නිදාගන්න කියලයි. උපේක්ෂා සෑහෙන වේලාවක් මනෝජා ළඟට වෙලා උන්නා. ඇය කාමරයට ආවේ ඇයට නින්ද ගියාට පස්සෙයි.

ගෑණියෙක්ට අවතාර තියෙනවා. වෙලාවකට ඇයට ලස්සන සීතා දේවියක් වෙන්නට පුළුවන්. වෙලාවකට පඬි රට ගිනි තියන පත්තිනි දේවි කෙනෙක් වෙන්නත් පුළුවන්. තවත් වෙලාවකට පළිගන්නා කාලි දෙවඟන වෙන්නත් පුළුවන්. ඒක පිරිමි දන්නේ නෑ.

දැන් මුල ඉඳලා හිතන්න ඕන. තාත්තා දුක් මහන්සියෙන් ගොඩ නගපු හැම දෙයක්ම ගන්නවා කියලා ඇය හිතාගත්තා.

"හෙට තාත්තේ මං ඔයා ඉන්න සොහොනට එනවා... ඔයාගේ වළ උඩ අත තියලා මං දිව්රනවා ඒ ඔක්කොම චූටි දුව ආයෙත් ගන්නවා කියලා... මං ඒ ඔක්කොම ගන්නවා..."

ඒක ලොකු සටනක්. ඒත් ඒ සටන කළ යුතුමයි.



www.sinhalaelibrary.com

"එක වල් සතෙක්ට දෙන්නෙකුට බයේ මං පැනල යන්නේ නෑ... සටන පටන් ගත්තාම මට කරගෙන යන්න පුළුවන්... මං බය නෑ... මං පිටිපස්සේ එයා ඉඳී..."

කොහොමත් මේ සටන පටන් ගත්තේ ඔහුගේ දෙපා වැඳලයි. ජීවිතයට ඒ ශක්තිය ලොකු ආශිර්වාදයක්.

"පුදුමයි... ඔයා ඉන්න කාමරේටම මේ කෙල්ල දුවගෙන ගියා... ඇයි ඔයා ඒ කාමරේ දොර ඇරලා තිබ්බේ... මං එනවා දැනගෙනද..."

සමහර දේවල් එහෙමයි. ඒවා හාස්කම්.

"උ..න් මාව මරලා දාන්නම බලයි... මාව විනාශම කරලා දාන්න බලයි... ඒත් මං දන්නවා මට මොනවත් වෙන්නෑ..."

අද හිතට එන්නේ පුදුමාකාර හයියක්. ධෛර්යක්.

"සමහර විට මට නීතියේ පිහිට ගන්නම වෙයි... ඒත් කමක් නෑ... මම ඕන උසාවියකට යනවා... පොලීසියකට යනවා..."

මහ රෑ දුරකථනය නාද වුණා. එතකොට රෑ එකට විතර ඇති. කෙල්ල දුරකථනය අතට ගත්තේ සැහෙන හිතලයි. ඒත් ගත්ත ගමන් කෙල්ල කතා කළෙත් නෑ.

"නංගී මම..."

උපේක්ෂාගේ හිතට සැනසීමක් ලැබුණේ එවිටයි. ඔහු මේ මහ රෑත් නිදි නැද්ද...

"මං.. අ..යියේ..."

"මං දන්නවා... එහෙම එකපාර කතා කරන්නත් එපා..."





"නිදි නෑ... දැ..න් එ..කයි දහයයි..."

තාරක හිනාවුණා.

"නංගී..."

"අයියේ..."

"මං පාන්දර පහට ඔතන... තේරුණාද..."

"පා..න්..දර අයියේ..."

"වැඩ පටන් ගමු... දැනට තියෙන හොඳම ඇඳුම අඳින්න... අපි හෙට ඇඳුම ටිකක් ගමු..."

"හො..ඳයි අයියේ..."

"පඬුරක් ආලා වැඩ පටන් ගමු..."

"එ..හෙම මදි..."

"එහෙනම්..."

"මං ද..ණ ගහලා වැඳලා වැඩ පටන් ගන්නේ..."

"උදෙන්ම එන්නම්..."

"අ..යියේ..."

"කියන්න නංගී..."

"මෙහෙම මං එක්ක ගියාම..."

"ඉතින්..."

"ප්‍රශ්නයක් නේ..ද..."

"ඒවා මං බලාගන්නම්..."

"බු..දු සරණයි අයියේ..."



www.sinhalaelibrary.com

"බූ..දු සරණයි... දැ..න් නිදාගන්න..."

ඒත් නිදාගන්න කෙල්ලට හිතක් නැහැ. සටනක් පටන් ගනිද්දි එහෙම නිදාගන්න බෑ. නින්ද යන්නෙත් නෑ.

"මේ සටන කරනකල් ඔයා මාත් එක්ක ඉඳලා පස්සේ ඔයා ගියොත්... එදාට මට පුදුම තනිකමක් දැනෙයි..."

ඒ හැඟීමෙන්ම උපේක්ෂා හිරිවැටී ගියාය.

"ආ..දරේ කරන්න හරි ආසයි... ඔයා වගේ කෙනෙක්ට... ඔයා එනකල් බලා ඉන්න... ඔයාට උයලා දෙන්න... ඔයාට කවන්න... ඔයා ළඟ නිදාගන්න... ඒත් කෙනෙක් ඔයාට මවලනේ..."

පපුව කාගෙන එන කැක්කුමක් එන්නේ එවිටය. "මෙච්චර වටින කෙනෙක් ලැබිලත් ඇයි දිල්ට එයා වෙනුවෙන්ම කැප වෙන්න බැරි. පුදුමයි..." උපේක්ෂා සිතුවා...

"මේ සටන පටන් ගන්නේ කොතනින්ද කියලා මට තේරෙන්නෑ... ඒත් මං සටන් කරනවා..."

උපේක්ෂා එකවරම ඇඳෙන් නැගිට්ටා. ඇගේ හිතට ආවේ පුදුමාකාර ශක්තියක්. එහෙමම ඇය ගිහින් ඇඳුමක් තේරුවා. ඔහු තෝරා ගෙනවිත් දුන් ගොඩක් ඇඳුම් ලස්සනයි. පිළිවෙලයි.

උපේක්ෂා එක ඇඳුමක් තෝරාගෙන එය මදින්න ගත්තා. එය මැද තැබූ ඇය පසුව එයට ගැළපෙන පාවහන් යුගලයකුත් ගෙන ඒ ළඟම තිබ්බා. උපේක්ෂා වෙලාව බැලුවා. වෙලාව තුනට කාලයි. දැන් කොහොමත් නිදාගන්න කාලයක් නෑ.





එහෙමම ඇය කුස්සියට ගියා. සෙනසුරාදා කිරිබත් හදමු කියලා මනෝජා ඇන්ටි සුදු හාල් ගෙනාවා කෙල්ලට මතකයි. කිරිබත් හදන්න ඇය ගොඩක් දන්නෑ. ඒත් දාන්නේ කිරියි ලුණුයි විතරයි. ඒක ගලපගන්න එක මහ දෙයක් නෙමේ.

උපේක්ෂා සුදු හාල් ටික ලිපේ තියලා සද්ද නොනැගෙන්න පොල් ගෙඩියක් බින්දා... ඇය පොල් ගෑවේ මනෝජාට නැසෙන තරමටයි. පාළු කුස්සියේ තනිවෙලා උයන ගමන් කෙල්ල දහසක් දේ හිතුවා. මෙච්චර දවසක් මේ දේවල් නොහිතුවේ අපරාදේ කියලා ඇයට හිතුණා.

උපේක්ෂාගේ අතින් කිරිබත හොඳටම ආවා. ඇයට හරි සතුටුයි. ආසාවට ඇය හැන්දට අරගෙන උණුවෙන්ම කිරිබත් කටවල් දෙකක් කෑවා.

සීනි සම්බෝල හදන්න ඇය දැන උන්නෑ. ඒත් එළු බැදුමක් හදන්න උපේක්ෂා දන්නවා. කොහොම හරි උදේ හතර වෙද්දි ඇය කිරිබතකුත් එළු බැදුමකුත් කට්ට සම්බෝලයකුත් හැදුවා. හොඳ වෙලාවට ගෙදර ගෙනාපු ඇඹුල් ඇවරියකුත් තිබ්බා. ඊයේ ඉතුරු වූ ටිකත් කරිත් තිබ්බා.

කෙල්ල ලයිනින් වලට ගෙනාපු සුදු රෙද්දක් කපාගෙන ඇවිත් මේසෙට දැම්මා. ලස්සනට තේ මේසේ සූදානම් කළා.

ඊටත් පස්සේ ටික වෙලාවක් ඒ දිහා බලාගෙන උන්නා. ජීවිතේ කරන්න බැරි දෙයක් නෑ කියලා කොහොමත් දැන් ඇය දන්නවා. ඒ ආත්ම ශක්තිය මේ ලේ වල දැන් ගලනවා.

මේසේ පත්තර කොළ වලින් වහලා ගිහින් ඇය නා ගත්තා. නාගෙන



www.sinhalaelibrary.com

ඇවිත් ඇඳගත්තා. මනෝජා ගාව කියුටෙක්ස් ලිප්ස්ටික් ඕන තරම්. ගෑණි පොඩි පැෂන් කාරියක්. එළියට යද්දී ඇයට මේවා ඕනමයි.

කෙල්ල හිමිහිට ඇවිත් ලා පාට ලිප්ස්ටික් එකක් තෝර ගත්තා. අයි බ්‍රෝ පෙන්සිල් එකත් ගත්තා. ෆවුන්ඩේෂන් ක්‍රීම් එකත් ගත්තා. රෝස පුයර එකත් ගත්තා.

මේවා උපේක්ෂා හොඳට දන්නවා. ඇයට පුංචි මේකප් එකක් දාගන්න මහ වේලාවක් ගියේ නෑ. කැඩපතේ උන් උපේක්ෂා දිහා බැලුවා. එහි උන්නේ පහුගිය දවස්වල කඩා වැටිලා උන්න උපේක්ෂා නෙමේ. අලුත් උපේක්ෂා කෙනෙක්.

කෙල්ල කැඩපතේ උන් උපේක්ෂාට හිනාවුණා.

"මං ලැස්තියි..."

උපේක්ෂා කිව්වා. හරි ලස්සනට හිනාවෙලා.

"එහෙනම් පටන් ගන්න... විෂ් යූ ඔල් ද බෙස්ට්..."

කැඩපතේ උන් උපේක්ෂා කියනවා වගේ ඇයට ඇහෙනවා.

"සමහර විට මේ සටනින් ඔයාට නොහිතපු දේවල් ලැබෙයි..."

හිතේ ඉන්න කෙනෙක්ව ලැබෙයිද... හදවත අහන්නේ එහෙමයි.

"සමහර විට..."

උපේක්ෂා හැරුණා. පාවහන් දෙක දා ගත්තා. මාලේ පපුව මැදට කරලා හදා ගත්තා. ඇය මනෝජාගේ කාමරයට එද්දීත් ඇය නිදි.

"සු..දු ඇ..න්..ටි..."

කෙල්ල කතා කළා. තාම පරිසරයේ කළුවර. ඉර උදාවෙන්නට





හිතලාවත් නෑ.

"සු..දු ඇන්ටි..."

මනෝජා ඇස් ඇරියා. ඇය දැක්කේ අලුත්ම උපේක්ෂා කෙනෙක්. මනෝජා මොහොතක් කෙල්ල දිහා බලාගෙන උන්නා.

"පු..තේ..."

උපේක්ෂා හිනාවුණා.

"ඔ..යා පු..තේ අද..."

"ල..ස්..ස..න..ද..."

"පුදුමයි... පුංචි නෝනා කෙනෙක් ඇත්තටත් එහෙමනේ... එයා ඇවිත් වගේ..."

"මං සටනක් පටන් ගන්න යන්නේ සුදු ඇන්ටි..."

මනෝජා ඇවිත් එහෙමම කෙල්ලව අල්ල ගත්තා.

"තු..ණු..රුවන් ස..රණයි... ඔයා දිනනවා..."

"ඒ.. ඇති ම..ට..."

ගෑණි කෙල්ලව හරි ආදරෙන් ඉම්බා.

"ඔයාගේ මේක් අප් බඩු ටික මං ගත්තා..."

"ඉ..න්නකෝ..."

මනෝජා ගිහින් ඇගේ අල්මාරිය ඇරියා.

"පු..තේ..."

"ඇන්ටි..."

"මේක දාගන්න..."

මනෝජා ඇයට දුන්නේ හීන් රත්තරන් පාට ඔරලෝසුවක්. ඒක හරි ලස්සනයි.

"හරි ලස්සනයි..."

"දාගන්නකෝ..."

කෙල්ල ඒක දාගත්තා. ඒවා ලස්සන ඒ සුදු අතට...

"ම්.. මේකත් ගන්න..."

මනෝජා ඇය අරන් තියාගෙන උන්න ලස්සන රෝස පාට අත් බෑගයකුත් දුන්නා. කෙල්ල ඒ සේරම ගත්තා.

"සු..දු ඇන්ටි..."

"පු..තේ..."

"මං හිතන් ඉන්නේ ඔයා මගේ අම්මා කියලා... දුවෙක් වගේ මං මේවා ගන්නේ..."

"මා..ත් දුන්නේ එහෙම හිතලනේ පුතේ..."

"ඔයාට පින්..."

"කවදහරි පුතේ..."

"ම්..."

"ඉන්න තැනක ම..ටත් වැටිලා ඉන්න දෙන්න..."

"අ..නේ..."

කෙල්ල ඒ මුහුණ හරි ආදරෙන් අතගෑවා.

"අම්මලාව එහෙම තනි කරනවද... ම..ට මේ සටන කරන්න දෙන්න..."





"ය..න්..න මා..න් අද පන්සලට යන්නම්..."

"එ..න්..නකෝ බඩුවක් පෙන්නන්න..."

"කොහෙද..."

"එ..න්..නකෝ අ..නේ..."

උපේක්ෂා ඇයවත් අතින් අල්ලාගෙනම එක්කාගෙන ගියේ මේසේ ළඟට. ඇය පත්තර කොළ ටික අයින් කළා.

"මේ... පු..තේ..."

"මං හැදුවේ..."

"අනේ දෙයියනේ..."

"ඇයි..."

"පච් මැණික... කිව්වනම් මං හදනවනේ..."

"මං හැදුවා... රහද දන්නෑ..."

"රහම ඇති... එහෙනම් කිරිබත් කාලා වැඩ පටන් ගන්නේ..."

"ඔව්... පහනක් පත්තු කරලා ඔය දෙන්නට වැඳලා..."

"උඹ දිනනවා..."

"දිනන්නම ඕන..."

උපේක්ෂා ගිහින් බය නැතුව ඉදිරිපස දොර විවර කළා. දියවන්නාව දෙසින් හමා ආ සීතල සුළඟ එහෙමම කෙල්ලගේ වත සිප ගත්තා. පාර්ලිමේන්තු පාර දිගේ ආ වාහනයක් මේ පැත්තට හැරුණා. ඒ ඔහුගේ වාහනය කියලා ඇය දන්නවා.

උපේක්ෂා කොරිඩෝවේ ඇල්වූ විදුලි පහන යටටම වී උන්නා. තාරක

බැහැලා ආවේ කෙල්ල දිහා බලාගෙනමයි. ඔහු බලාගෙනම ආවා.

"අ..යියේ... මං ලැස්..තියි..."

ඇය උගුරෙන් වගේ කිව්වා. තාරක එහෙමම ඇවිත් ඒ හිසට අත තිබ්බා.

"හ..රි ල..ස්..ස..නයි..."

"තැ..න්..කියු අ..යියේ..."

"මේ.. ඇ..ත්..ත උපේක්ෂාම නේ..ද..."

"ඔව් ග්‍රෑන්ඩ් හෝටලේදී ඇඳ යට රිංගුවේ..."

"උ..න් කිව්වේ ඔළුව හොඳ නෑ කියලා..."

"ඒ..ක පෙ..න්..න..න්..න ත..මා ය..න්නේ..."

උපේක්ෂා හිනාවෙලා කිව්වා.

"ය..න්.. කිරිබත් කටක් කාලම ය..න්..."

"කිරිබතුත් හැදුවද..."

"ම්.. ගමනක් පටන් ගන්නේ එහෙමනේ..."

ඇය මුදු හඬින් කිව්වා. තාරක නැවතිලා බලාගෙනම උන්නා.

"මේ... මං හැදුවේ..."

කෙල්ලගේ ලස්සන පේන්නේ දැන්... හදවත පසාරු කරගෙන අසාමාන්‍ය ලෝබකමක් එනවා.

"අද ඇන්ටි පොඩි ඔපනිං එකක් වගේ නේද..."

"ඒ..කනේ පුතේ... පාන්දර තුනේ ඉඳලා නැඟිටගෙන හදලා..."

"ඒ ආත්ම ධෛර්යට ගරු කරන්නම ඕන..."





තාරකගේ අත කෙල්ලගේ හිස උඩ.

"අනේ පුතේ මං කිව්වා කවදහරි යන තැනක මාවත් තියා ගන්නයි කියලා..."

"ඒකනේ... මේ උපේක්ෂා මිස් මාවත් තියාගන්නෝන... නේද ඇන්ටි..."

"අ..නේ මටනේ එ..හෙම කියන්නේ..."

ඒ ඇස්වල කඳුළු. තාරක හිස මත තිබූ සුරත ආදරයෙන් හිස පුරා ගෙන ගියා.

"මං කෝපි හදන් එන්නම්... දෙන්නත් එක්ක කන්න එහෙනම්..."

ඔහුට ඇය ලස්සනට බෙදුවා. කිරිබත් ඈණූ බැදුම් කට්ට සම්බෝල... හරියට අද සිංහල අවුරුද්ද වගේ. වේලාසන අනුභවය යෙදිලා වගේ.

"අ..යියේ..."

"ම්..."

"ම..ට අයියේ..."

"ඉතින්..."

"කිරිබත් ක..ට..ක් ක..වනවද..."

ඔහු හරි පුදුමයෙන් වගේ ඇය දිහා බැලුවා. එහෙම කන කිරිබත් කටක එච්චර හාස්කමක් බලගතු කමක් තියෙනවද...

"ම්... අපේ පුංචි නෝනට ජයම ලැබෙන්න ඕන..."

ඒ කිරිබත් කට කාලා ඇය එහෙමම දණ ඔබලා ඔහුට වැන්දා... දැනුයි සටන පටන් ගත්තේ.



www.sinhalaelibrary.com

"දැන් හ..රි..ද..."

"ම්.. හරියට හරි..."

උතුම් ආශිර්වාදයක් කොතරම් බලගතුද කියලා ඇය දන්නවා. ඒ ආශිර්වාදය ජීවිතයෙන් නැතිවෙලා තිබ්බේ. ඒ තාත්තා මිය ගිය නිසා.

"කිරිබත් ටික හරිම රහයි..."

"ඔ..ය මං හැදුවමයි..."

"දන්නැතුව හදලා මෙච්චර රහනම්..."

"දැනගෙන හැදුවාම නේ..ද..."

ජීවිතයේ කරදර මැද්දෙත් මේ කෙල්ල මෙහෙම නැගිටගෙන එනවා කියලා හිතද්දීත් පුදුමයි.

"උපේක්ෂා..."

"අයියේ..."

"නුවරඑළියේ..."

"ඉතින් අයියේ..."

"දවසක ය..න්..නෝ..න..."

"අ..නේ ය..න් හොඳේ..."

"අර කාමරේම නමක් නැද්ද..."

"රූම් නම්බර් ෆෝ ෆයිව් සික්ස්..."

"ඒකත් මතකද..."

"එහෙදිනේ ම..ම සමන් දෙයියෝ දැක්කේ..."

"මේ කරදර ඉවර වුණාම යං.. මටත් ආසයි..."





"අ..ර අයියේ ඊට පස්සේ පහුවදා රෑ හිටියේ..."

"ම්..."

"එහෙටත් යන් හොඳේ..."

ඇයි ඒ මතක පාරවල් වල ආයෙත් යන්නේ. මොනවා හොයාගෙනද... ජීවිතය හොයාගෙනද... ආදරය හොයාගෙනද...

ආදරයකින් තොරව ජීවිතයක් ලැබිලා වැඩක් නෑ. ජීවිතයේ රහක් නෑ. ආදරය තියෙනවා නම් ජීවිතයක් ගැන අමුතුවෙන් හිතන්න ඕනෙත් නෑ. හිත ගිය තැන මාළිගාව... ආදර රන් මාළිගාව...

"උපේක්ෂා..."

"ම්..."

"මො..නවද හිතුවේ..."

හිතපු දේවල් ඔහුට කියන්න බෑ. ඒ නිසා ඇය ලස්සනට හිනාවුණා. ඒ සිනාව වෙනදාටත් වඩා බර විදිහට ඔහුගේ හිතේ ඇඳුනා.

"නව කැල්ලක් කමු..."

"දා..න්..න..."

"නාම පාන්දරනේ... කාලා යන්..."

"මං හයට ලෝයර් ගාව අපොයින්ට්මන්ට් එක දැම්මේ..."

"කොහෙද අයියේ..."

"රාජගිරියේ... මේ ළඟ... ලෝයර් දක්ෂ කෙනෙක්... අද උදේ වරුවම ෆ්‍රී කිව්වා... කතාවම කියමු..."

"ඒ ක..තාවට අයියේ..."



www.sinhalaelibrary.com

"ම්..."

"ඔයා සම්බන්ධ වෙච්ච විදිහත් කියමු හොඳේ..."

"කිය..න්..නම වෙනවා..."

කෙල්ලගේ කිරිබත් එක ඇත්තටම රහයි.

"අද උපේක්ෂා..."

"ම්..."

"ඇඳුම් ටිකකුත් ගමු..."

"ම..ට අ..ර..න් දෙ..නව..ද..."

එහෙම අහද්දී ඔහුට ආසයි. ඒ ආසාව වෙනමම ලෝබකමක්. මනෝජා දෙන්නාටම කෝපි හදාගෙන ආවා.

"මාත් තාරක පුතේ අද පන්සලට ටිකක් යනවා..."

"බාරයක් වෙන්න ඇන්ටි... අපි ඔක්කොම ගිහින් ඔප්පු කරමු..."

මෙ සටන දිනද්දී අනේ ඔයා මං ළඟ නැත්නම්... උපේක්ෂාගේ හදවත එවැනි දුකකින් බර වුණා. ඒත් මොකක්දෝ හේතුවක් නිසා මේ බැඳීමට එහෙම වෙන්නෑ කියලත් ඇගේ හිත කියනවා.

"ඇන්ටි... මායි නංගියි එද්දී හවස් වෙනවා... වටේ පිටේ පොඩ්ඩක් ඇහැ ගහගෙන ඉන්න..."

"මං කොහොමත් එහෙමයි ඉන්නේ පුතේ..."

"ඔය ජීවිත වටේ කැරකෙන පුළුටු පිශාචයෝ පන්නන්නම ඕන..."

තාරක එහෙම කියලා මොහොතක් බලා උන්නා.

"හැමෝගෙම ජීවිත වලට එහෙම අය ඉන්නවා..."





උපේක්ෂා කතා කළේ නෑ. ඔහු කියන්නේ මොනාද කියලා ඇය දන්නවා.

"එ..හෙ..නම් යං නංගී..."

"චු..ට්ටක් අ..යියේ..."

කෙල්ල එහෙමම බිම දණ එබුවා. ඒක මහ පුදුමාකාර වැදිල්ලක්. කෙනෙක් හදවතින්ම කෙනෙකුට වඳිනවා නම් දණ බිම ඇනෙන්නම ඕන. සිරස දෙපතුල් වල ගෑවෙන්නම ඕන. දෑත් එකතු වෙන්නම ඕන. හැමෝම එහෙම වඳින්නෑ. හැමෝටම එහෙම වඳින්නත් බෑ.

තාරක දෝතින්ම කෙල්ලව නැගිට්ටෙව්වා. ඊටත් පස්සේ ඒ හිස ළං කරලා සිප ගත්තා. ඒ සිප ගැන්ම කොතරම් හැඟීම්බරද... උතුම්ද පවිත්‍රද කියලා ඇය දන්නවා.

"බුදු සරණයි..."

කෙල්ල මනෝජාටත් එලෙසම දණ ගසා වැන්දා.

"ඔයාට හරියන්නම ඕන රත්තරන්..."

"දවල්ට එහෙනම් කන්න හොඳේ..."

"ම්..."

"මං එද්දී රෑට හදන්න මොනවා හරි ගේන්නම්..."

"ඒවා අද හිතන්නෙපා... මං ඒවා බලාගන්නම්... මේ වැඩේ කරගන්නකෝ..."

"යං අයියේ..."

ඇය බුදු පහනටත් වැඳ ඇවිත් කිව්වා. රෝස පාට හෑන්ඩ් බෑගයත්



www.sinhalaelibrary.com

දාගෙන ආ ඇය වාහනයට නගිද්දී පාන්දර ප්‍රථම අරුණැල්ල එන්න සිතමින් කිව්වා.

තාරක වාහනය පණ ගන්වලා වාහනයේ සී.ඩී. ප්ලේයරය ක්‍රියාත්මක කළා. එහි වාදනය වුණේ පිරිත් සංජ්ජායනාවකි.

"ජය පිරිත..."

තාරක කිව්වා.

"ම්... හැමදාම අහනවද..."

"ඊයේ ගත්තේ..."

"උදේ යද්දී හිතටම සනීපයිනේ..."

"ම්.. ය..න්ද..."

"හා..."

උපේක්ෂා මනෝජාට අත වැනුවා. මනෝජා අත වනලා පියාඹන හාදුවක් එව්වා. කෙල්ල ඒක අල්ල ගන්නවා වගේ පෙන්නුවා. තාරක මේ වලට හිනා වෙනවා.

දියවන්නාව අවට පාන්දරට නිස්කලංකයි. ලස්සනයි... යංතම් මීදුම තට්ටුවක් දියවන්නාව උඩින් තියෙනවා. ඒක හරි ලස්සන දර්ශනයක්.

"උපේක්ෂා දන්නවද..."

"මො..ක..ක්ද අයියේ..."

"මං අද ඉඳලා මගේ ජීවිතෙත් පොඩි සටනක් පටන් ගන්නවා..."

"අ..යියගේ ජීවිතේ..."

"ම්.. ජීවිතේ වෙනස්ම කරගන්න ඕන... මේ යන විදිහ ටිකක් මට





අමාරුයි..."

උපේක්ෂා බලාගෙනම උන්නා.

"ඒ.. වෙ..නු..වෙ..න් ම..ට දෙ..ය..ක් කර..න්න තියෙ..න..වනම් අයියේ.. කියන්න..."

"දවසක උපේක්ෂා..."

"ම්..."

"මට ඔයාගෙන් උදව්වක් ගන්නම වෙයි..."

"එහෙම උදව්වක් කියලා කියන්නෙපා..."

"ඇයි..."

"තමන්ගේ කියන අ..යගෙන් උ..දව් ඉ..ල්ල..න්..නෑ... ඒවා කරන්නම ඕන..."

තාරක ඉස්සරහ බලාගෙන හිස වැනුවා. කෙල්ල මේ ජීවිතේ ගොඩක් දේවල් ඔහුට උගන්නනවා.

"අද ඉඳලා කඳුළු බෑ හොඳද... චන් ෂොට්..."

"ම්..."

ඒත් ඉඳලා හිටලා ඇඬෙයි. වෙලාවකට කඩා වැටෙනවා. ඒත් මේ පාර නැගිටින්නම හිතලයි ඇය ආවේ.

"තාත්තගේ ගාමන්ට් එකේ උපේක්ෂා..."

"ඔව් අයියේ..."

"ස්ටාෆ් එක උපේක්ෂට හිතවත්ද..."

"ස්ටාෆ් එකම මට ආදරෙයි... තාත්තටත් එහෙමයි... මේ සත්තුන්ට



www.sinhalaelibrary.com

ආසම නෑ... ඒත් රස්සාවනේ..."

"ම්..."

"අපි බලමු කොතනින්ද පටන් ගන්න පුළුවන් කියලා..."

උපේක්ෂා මොහොතක් දෑස් පියාගෙන පිරිත් හඬ අසාගෙන උන්නා. අද උදෑසන හරි පුදුමාකාරයි. ඒයේ ජීවිතේට පාත් වුණේ හිතාගන්න බැරි අනතුරක සේයාවක්. ඒ කරදර මැද්දෙන්ම අද නැගිටිනවා. ජීවිතයේ එහෙම දේවල් අනන්තවත් වෙනවා.

නීතිඥ වරාගොඩ මහතා සාවධානව උපේක්ෂා කියන දේ අහගෙන උන්නා. ඔහු කොහොමත් හොඳ සවන් දෙන්නෙක්. කතාවක් වගේ ඔහු සියල්ල අසාගෙන උන්නා.

"අන්තිමට උපේක්ෂට රංගනව මැරි කරන්නම වුණා..."

"ම..ට එච්චරටම බලපෑම් කළා... ම..ම ඒ වෙලාවේ අසරණ වුණා ස..ර්..."

"ම්... එහෙම වෙනවනේ... ඉතින් මැරි කළා..."

"ඊට පස්සේ සර්... එදා හනිමූන් ගියා..."

"ම්... කොහෙටද ගියේ..."

"නුවරඑළියට..."

"ම්..."

"නුවර පාරට වාහනේ අපු තැන ඉඳලා නුවරඑළියේ ග්‍රෑන්ඩ් හෝටලය ළඟට එනකල් මං හිතුවා..."

"මො..නවද..."





"ම..ගේ ජීවිතේ ගැ..න... මෙතනින් එහාට..."

"ප..ස්සේ..."

"ම..ට ය..න්න තැනක් තිබ්බේ නෑ... යාළුවෙක් උන්නේ නෑ... හරිහමන් නෑයෙක් උන්නේ නෑ... ඔක්කොමල්ලා අම්මා අල්ලගෙන උන්නේ... සල්ලි වලින්..."

"ඉතින්..."

"ඒත් මං හිතුවා..."

"මො..කක්ද..."

"පාරට බහිනවා කියලා..."

"පා..ර..ට..."

"එයත් එක්ක ඉන්නවට වඩා ජීවිතේ වෙන විදිහක් බලන එක හොඳයි කියලා හිතුණා... මං සර් පාස්පෝට් එක අරන් ආවේ..."

"ම්..."

"හිතුවේ රටකට වත් යනවා කියලා..."

"ඇයි ඒ තීරණේ මැරි කරන්න කලින් ගත්තේ නැත්තේ..."

"ගෙදර උන්න උපේක්ෂට නොතිබ්බ දෙයක් එළියට ආපු උපේක්ෂාට තිබ්බා සර්..."

"ම්.. ඉතින් ඔයාලා අතර මොනවා හරි සිද්ධ වුණාද... මං අහන්නේ ශාරීරිකව..."

"නෑ... මං හරි අමාරුවෙන් රැකගන්න ඕන දේවල් රැකගත්තා... ඒත් ඒක ලේසි උන් නෑ..."



www.sinhalaelibrary.com

"ඉතින්..."

"හොටෙල් රූම් එකේදී මං වොෂ් එකක් දාගෙන ආවා... ඇඳුමක් දාගෙනම ආවා..."

"ම්.."

"එයා පස්සේ බාත් රූම් එකට ගියා... මට හිතන්න මහ වෙලාවක් තිබ්බෙ නෑ... ඒක මහ පුදුම වෙලාවක්... මං ස්ලිපර්ස් දෙක දාගත්තා... මගේ පර්ස් එක අතට ගත්තා..."

"ම්..."

"එතකොටම එයා ටවල් එක ඇඳගෙන එළියට ආවා..."

"හරි..."

"මං එහෙමම කාමරෙන් එළියට දුවගෙන ආවා..."

"මයි ගෝඩ්... මහ රෑ..."

"ඔ..ව් ස..ර්... ඒක අසරණ කෙල්ලෙක් එයාගෙ ජීවිතේ පිරිසිදුකම වෙනුවෙන් ගත්ත බොළඳ ඒත් හරි අසරණ උත්සාහයක්..."

වරාගොඩ මහතා තාරක දිහා බැලුවා. ඔහු කතා කළේ නෑ. ඒත් සටහන් කර ගන්නවා.

"එයා ළඟ ළඟම එනවා කියලා මට දැනුණා... ඒක මහ විශාල හෝටලයක්... මැදදී මං අතරමං වුණා... රංගන දුවගෙන ආවා... ඒ පැත්තෙන් මේ පැත්තෙන් එක එක කොරිඩෝස්..."

"ඔව්.. ග්‍රෑන්ඩ් හෝටලේ එහෙමනේ... ඉතින්..."

"ම..ට කරන්න දෙයක් තිබ්බෙම නෑ... එයා දුවගෙන ඒන සද්දේ





ඇහුණා..."

"ම්..."

"මං බිත්ති අතගාගෙන ආවා... එක රූම් එකක දොරක් අඩවල් කරලා තිබ්බේ... ම..ට හිතන්න වෙලාවක් තිබ්බෙ නෑ..."

"ම්..."

"මම එහෙමම ඒ කාමරේට ගිහින් දොර වැහුවා..."

එහෙම කියලා ඇය බිම බලා ගත්තා... ඒ ඇස්වල කඳුළු.

"ඇයි උපේක්ෂා අඬන්නේ..."

වරාගොඩ මහතා කාරුණිකව ඇහුවා.

"නෑ ස..ර්... ඒක හරි පුදුම දෙයක්..."

"කවුද ඒ හොටෙල් රූම් එකේ උන්නේ..."

"දෙවියෙක්..."

එච්චරයි ඇය කිව්වේ. තාරකගේ බඩ පපුව දාගෙන යනවා.

"ඉ..ති..න්..."

"මම එහෙමම දොර වහලා දොර පාමුල වැටුණා... මාව වෙව්ලනවා ස..ර්..."

"ම්..."

"රූම් එකේ හිටපු කෙනා උන්නේ බාත් රූම් එකේ... මට වොෂ් එකක් ආන ෂවර් සද්දේ ආවා..."

"ම්..."

"ටික වේලාවකින් එයා ආවා... තරුණ කෙනෙක්..."

"පිරිමි කෙනෙක්..."

"ඔ..ව්..."

"එයා ඇවිත්... මං දිහා බලාගෙනම උන්නා... ඒ මූණ දකිද්දී මට කරදරයක් වෙන එකක් නෑ කියලා මට හිතුණා... ඒත් මට කතා කරගන්න පුළුවන් උනේ නෑ... මාව වෙව්ලනවා..."

"ම්..."

"මං වැඳලා පිහිටක් ඉල්ලුවා... ඒත් එක්කම දොරට කවුද තට්ටු කළා..."

"ම්..."

"මං ගිහින් ඇඳ යටට රිංගුවා... වෙ..න කරන්න දෙයක් තිබ්බේ නෑ... තිබ්බෙම නෑ... එයා ඇවිත් මගේ පේන්න තිබ්බ සායේ කෑල්ලක් ඇඳ යටට කළා..."

"කවුද ඒ ආවේ..."

තාරකගේ පපුව ඒ සිදුවීම සිහිවී අලුතෙන් දනවා. ඒත් මේ සිදුවීම් පෙළ මෙහෙම මතක් කරන්න ඔහුටත් ආසයි.

"රංගන..."

"හස්බන්ඩ්..."

"ඔව් සර්... හොටෙල් මැනේජර් කෙනෙක් එක්ක..."

"මයි ගෝඩ් ඉතින්..."

වරාගොඩ මහතා ඔහුගේ නීතිඥ ජීවිතයේද මෙවන් කතාවක් අහලම නෑ. මේ ඇත්තම කතාවක්ද කියලා අහන්න ඔහුට හිතෙන්වා.





"මැනේජර් කිව්වා මේ සර්ගේ නෝනා එළියට ඇවිත් මේ පැත්තේ ආවද කියලා..."

"ඉතින්..."

"එයා කිව්වා කාගෙවත් වයිෆ්ලා මං මගේ කාමරේට මොකටද ගන්නේ කියලා..."

"ප..ස්සේ..."

"පස්සේ සර් ඌ කිව්වා වයිෆ්ට පොඩි මෙන්ටල් ආබාධයක් තියෙනවා කියලා..."

"ඔ..යාට..."

"ඔව් සර්... එක මානසික ආබාධයක් මට 'තිබ්බා සර්... ඒ මගේ තාත්තා මාව හදපු අහිංසක විදිහ..."

"ම..ට තේරෙනවා උපේක්ෂා..."

කෙල්ලගේ දෑස්වල කඳුළු පටල දිගටම ඇදෙනවා. ජීවිතයේ අමාරුම දවස වුණෙත් එදා... ආසාවෙන් මතක් කරන්නෙත් එදා... ඒකයි මේ ඇවිලිල්ල...

"එයා බය නැතුව කිව්වා මං විතරයි ඉන්නේ ඕනනම් චෙක් කරන්න කියලා..."

"ස්මාට්.. ඉතින්..."

"ඒ කතාවට එයාලා ගියා..."

"ම්..."

"ඊට පස්සේ එයා ඇඳ යටට පාත් වුණා... මං ඇඳ යට බලාගෙන

උන්නා ගුලි ගැහිලා..."

"ෂූ.. තාරක මට මේක මැවෙනවනේ පුතා..."

තාරක හරි අහිංසක විදිහට හිනාවුණා. ඇත්තටම මැවෙන්නම ඕන.

"ඉතින් උපේක්ෂා..."

"එයා කිව්වා එයාලා ගියා එන්න කියලා..."

"ම්..."

"මං ඒ කකුල් දෙක අල්ලලා වැන්දා ස..ර්... ඇඬුවා... අඬ අඬා ඔක්කොම කිව්වා... එයා ළඟ බිම වාඩිවෙලා ඔක්කොම කිව්වා..."

"එයා..."

"අහගෙන උන්නා... අද සර් අහන් උන්නා වගේ... හරි කරුණාවෙන්..."

වරාගොඩ මහතා හරි දුක්බර විදිහට හිනාවුණා.

"එදා රෑ ස..ර් හරි සීතල දවසක්... පුදුමම සීතලයි... නුවරඑළියට නාකපන්න වහිනවා..."

"ඉ..තින්..."

"එයා මට එයාගේ ෂර්ට් එකක් ඇඳගන්න දුන්නා... කෑම ගෙනත් කන්න දුන්නා... කෝපි ගෙනත් දුන්නා... අවුරුදු ගාණක යාළුකමක් ඒ පැය දෙක තුනේදී අපි අතර ඇතිවුණා..."

"ඉතින්... දෙන්..."

"ටික ටික රෑ වුණා... තවත් වහිනවා... සීතල පුදුම විදිහට වැඩි වුණා... ඒත් සර්..."

"ම්..."





"එදා ඒ හෝටලේ මොකක්ද අනතුරක් කිව්වා..."

"හස්බන්ඩ් පොලීසිය ගෙනත් හොටෙල් එක සර්ච් කරයි කියලා..."

"ඔව් සර්... එයා දන්නවා මං හෝටලෙන් අවුට් උනේ නෑ කියලා..."

"මයි ගෝඩ් ඉතින්..."

"ජීවිතේ සර් මහ පුදුම දේවල් වෙනවා... අමාරුම වෙලාවට දෙයියන්ට වඩා මිනිස්සු පිහිට වෙනවා..."

"අනිවාර්යෙන්ම... ඔයා හරියට හරි..."

"එදා එයා මාව හරි පුදුම විදිහට ග්‍රෑන්ඩ් හෝටලෙන් එළියට අරගත්තා... මහ වැස්සේ... රෑ දොළහට එකට විතර..."

"එළියට ආවා..."

"ඔව් සර්..."

"තෑන්ක්ස් ගෝඩ්..."

වරාගොඩ මහතා දැන් හදවතින්ම මේ කෙල්ලත් ඇයට හමුවූ ආගන්තුකයාගෙත් පැත්ත ගෙන තිබ්බා. දැන් උන්නේ නීතිඥයෙක් නොවේ. තාත්තා කෙනෙක්.

"එදා රෑ එයා මාව නුවරඑළියේ පුංචි හොටෙල් එකකට එක්කං ගියා... කඳපොල පාරේ..."

"ඔයා ඒ කෙනාව විශ්වාස කළා..."

"ඔව් සර්... මගේ හදවතින්ම... ජීවිතේ එක පාරක් ගෑණියෙක් එක්කෙනෙක්ව කොහොමත් විශ්වාස කරනවා... ජස්ට් වන් නොට් වූ... ෆ්‍රොම බොටම් ඔෆ් හර් හාට්..."

"එක්සැක්ට්ලි..."

"එයා ගැන ඒ වෙලාවේ හිතේ තිබ්බේ මගේ මැරිච්ච තාත්තා ගැන වගේ භක්තියක්... ඒක පුදුම දෙයක්... පුදුමම දෙයක්..."

තාරක යටි තොල හපා ගත්තා. ඔහුව වෙව්ලනවා වගේ.

"ඉතින්..."

"එ..දා රෑ ස..ර්..."

"අපිට නිදාගන්න ඩබල් බෙඩ් එකක් තිබ්බේ... එයා ඒ පැත්තේ මම මේ පැත්තේ... ස..ර් මොකද හිතන්නේ... නුවරඑළියේ... තද වැස්ස... පුදුම සීතලයි... එයයි මායි විතරයි... එක ඇඳක් උඩ.. මොනවද වෙන්න ඇත්තේ..."

"ස..මිතිං හැපන්ඩ්..."

ඔහු කීවේ මොනවා හෝ වෙන්න ඇති කියායි.

"නෑ සර්.. පහුවදා උදේ වෙද්දිත් මං පිරිසිදු කෙල්ලෙක්..."

"රිඅලි..."

"ඔව් සර්..."

"මට එ..ක පාරක් පෙන්නන්න ඒ කෙනා උපේක්ෂා... ඔයා කියනවා වගේ එයා දෙවියෙක් වෙන්නම ඕන... ඔයා වගේ බියුටිෆුල් ගර්ල් කෙනෙක් එහෙම තියාගෙන..."

"එයා ඇත්තටම දෙවියෙක් සර්... අපි දේවාල ගානේ යනවා... ඒත් දෙවිවරු අපි ගාවත් ඉන්නවා..."

"කවුද ඒ උපේක්ෂා..."





"ස..ර් ඉ..ස්..ස..රහ ඉ..න්..නේ ඒ පුංචි දෙයියා තමා... ස..ර්..."

උපේක්ෂාට ඇඬුණා. වරාගොඩ මහතා හරි පුදුමයෙන් ඔහු දිහා බැලුවා.

"තා..ර..ක මේ.. කිය..න්..නේ ඇත්තද..."

"ඔව් අ..න්..ක..ල්..."

ඔහු හරි අමාරුවෙන් කිව්වා.

"යූ ආ ග්‍රේට් මයි ස..න්..."

"තැන්කියු අ..න්..කල්..."

"ඒ රෑ ඉ..දලා අ..යියා මාව බලාගත්තා ස..ර්... මේ මො..හොත වෙනකම්..."

මනෝජා ඇන්ටිගේ ගෙදරට ආපු තැන දක්වා සියල්ල ඇය කිව්වා.

"ඕ..කේ උපේක්ෂා... ඔයාට දුව මං හෙල්ප් කරන්නම ඕන..."

උපේක්ෂා කඳුළු පිරි දෙනෙතින් බලාගෙනම උන්නා.

"තා..රක..."

"අ..න්..කල්..."

"ටික දවසක් යනකල් උපේක්ෂාව ආරක්ෂා කරන්නම ඕන..."

"ඔව් අන්කල්..."

"අපිට නඩු දෙකක් දාන්න තියෙනවා... එකක් ඩිවෝස් කේස් එක... මං ඒක ඉක්මනටම අරන් දෙන්නම්... දෙන්නා ජීවත් උනේම නෑනේ..."

"ඔව් අන්කල්..."

"අනික මේ දේපොළ සම්බන්ධව... උපේක්ෂාගේ අම්මා ඒ කෙනාව



www.sinhalaelibrary.com

මැරි කරලා නිසා ප්‍රශ්නයක් නෑ... උපේක්ෂාට මේ ඔක්කොම අයිති වෙනවා... ඒක මම අරන් දෙනවා... ඊට කලින්..."

"කියන්න අන්කල්..."

"අපි ෆැක්ටරියේ වැඩ නවත්තන්න ඕන... ඒකට සීල් තියවන්න ඕනා..."

"නැත්නම් නඩු ඉවර වෙද්දී ඒ ප්‍රොපටීස් මෙයාලා අදින්න පුළුවන්..."

"ඇට්ස් රයිට්... උපේක්ෂට තේරෙනවද..."

"ඔ..ව් ස..ර්..."

"උපේක්ෂා හිතන්නේ නැද්ද උපේක්ෂගේ තාත්තා අන්තිම කැමති පත්‍රයක් ලියලා ඇති කියලා... ලාස්ට් විල් එකක්..."

"තා..ත්තගේ ලෝයර්ගෙන් තමා අහන්න ඕන ස..ර්..."

"එයාලා අම්මා එක්ක සම්බන්ධද..."

"නෑ සර්..."

"කවුද එයා..."

උපේක්ෂා ඒ නම කිව්වා.

"මිස්ටර් වික්‍රමරත්නව නම් මං දන්නවා... අපි බලමු... මං කතා කරන්නම්... කොහොමත් උපේක්ෂා අපට මේ ටික කරන්න පුළුවන්... ඔයාට ඔයාගේ තාත්තගේ ඔක්කොම ලැබෙනවා... ඒක දන්න නිසා තමා රංගනගේ තාත්තා ඔයාව එයාගේ පුතාට මැරි කරලා දුන්නේ..."

"මට තේරෙනවා සර්..."

"මට සතියක් දෙන්න... මට ඔයාගේ අයි ඩී එක දෙන්න..."





උපේක්ෂා එය දුන්නා.

"නාමලී මේක ෆොටෝ කොපි කරන්න..."

"තාරක..."

"අන්කල්..."

"මට ඇඩ්‍රස් එකක් ඕන... වහලා ආපු ගේක... උපේක්ෂා ඉන්න ගෙදර නෙමේ... ඔය මුරකාරයෙක් තියලා තියන ගේක... මේ නඩුවට ආන්න..."

"මං දෙන්නම් අන්කල්..."

"ගුඩ්... අපට පොලිසියේ ඇන්ට්‍රි එකකුත් ආන්න වෙයි... මං ඒකට දවස කියන්නම්... තව දෙයක්... උපේක්ෂා තාත්තගේ ෆැක්ටරි එකේ සීනියර් ඔෆිසර් කෙනෙක්ව දන්නවද..."

"ඔව් සර්..."

"කතා කරන්න පුළුවන්ද..."

"පුළුවන් සර්... ඕනනම් හම්බ වෙන්නත් පුළුවන්..."

"දැනට කතා කරන්න... මේ මොනවත් කියන්නෙපා... මේගොල්ලෝ නීති විරෝධී විදිහට මේ දේපොල බිස්නස් එයාලගේ නම්වලට හරවගෙන ඇති..."

"ඔ..ව් සර්... බැන්ක් එකවුන්ට් පවා මාරු කරලා..."

"අ..න්න හරි... ඒ වගේ එක බැන්ක් ස්ටේට්මන්ට් එකක් මට ගෙනත් දෙ..න්න... මොකද... බිස්නස් එකේ අයිතිය නැතුව ඒවා කරන්න බෑ... නීති විරෝධියි... ඒකට ඔයාගේ අනුමැතිය ඕන... මොකද මේවා තියෙන්නේ ඔයාගේ තාත්තගේ තනි අයිතියට..."

"ඔව් සර්..."

"ඕ..කේ ගුඩ් ලක්... ඒක නෙමේ උපේක්ෂා..."

උපේක්ෂා වරාගොඩ මහතා දෙස බැලුවා.

"අර කාමරේ දොර..."

"ඔව් සර්..."

"ඔයාට එන්නම ඇරලා තිබ්බා වගේ නේද... සාමාන්‍යයෙන් කෙනෙක් බාත් රූම් ය..න්නේ..."

"දොර වහලනේ ස..ර් නේද..."

උපේක්ෂා තාරක දිහා බලාගෙන කිව්වා.

"එහෙම වුණේ ඇයි දන්නෑ අන්කල් ඇත්තටම..."

"එහෙම දේවල් වෙනවා පුතා... නමසිය හැත්තෑ ගණන් වල අග... මං ලෝ කොලේජ් එකෙන් අවුට් වෙලා ප්‍රැක්ටිස් කරන කාලේ..."

"හා අන්කල්..."

"මගේ පස්ස පැත්තේ ගෙඩියක් ආවා... ලොකු ගෙඩියක්..."

"ඉ..තින් අන්කල්..."

"මං හොස්පිටල් ඇඩ්මිට් වුණා... මේක කපාගන්න හරි..."

"ම්..."

"ඒකට ට්‍රීට් කළේ යං ලේඩි ඩොක්ටර් කෙනෙක්... මං ඉතින් පස්ස එළියේ දාගෙන ඉන්නවා..."

"ඉ..තින් අන්කල්..."

"සතියකින් ගෙඩිය සනීපයි..."





"හා..."

"ඩිස්චාජ් කරන දවසේ ලේඩි ඩොක්ටර් ආවා... මාර බියුටිෆුල්..."

"ඉතින්..."

"ඇවිත් ඇහුවා දැන් සනීපද කියලා..."

"ම්..."

"මං කිව්වා පස්සේ ගෙඩිය නම් දැන් සනීපයි... දැන් හාට් එකේ ගෙඩියක් ඇවිත් කියලා... එදා මට ෆෝන් නම්බර් එක දුන්නා..."

"ඉ..තින්..."

"ඉතින් මොනාද මාස හතරකට පස්සේ අපි මැරි කළා..."

"මේ ඇ..න්..ටි..."

"ම්.. එයා ඩොක්ටර් කෙනෙක්... පස්සේ අයින් වුණා..."

උපේක්ෂා වරාගොඩ මහතා දිහා බලාගෙනම උන්නා. ජීවිතය පුදුමයි. හාස්කම් උතුරනවා. එහෙම හාස්කමක් මේ ජීවිතයටත් වෙන්නම ඕන...

• [illegible] 07 කලාපය සමග
තවත් රසබර කොටසක්...



www.sinhalaelibrary.com

හැමදාම මට මොකක්ද අඩුවක් දැනුණා... ඒක විස්තර කරන්න මට තේරෙන්නේ නෑ... නිකං මොකක්ද දෙයක් නැතැ වගේ මට නිතරම දැනෙන්න ගත්තා... ගිය ආත්මෙක මට තිබුණා දෙයක් මේ ආත්මේ මට නෑ වගේ මට දැනෙන්න ගත්තා... මම ගොඩක් හිතුවා... ඇයි මට මෙහෙම හිතෙන්නේ කියලා... ඒත් තේරුමක් තිබුණේ නෑ... එක දවසක මම ඔයාව දැක්කා... ඔයාගේ ඇස් දෙක මගේ ඇස් ඉස්සරහට ආවා... එදා මට පුදුම හිතුණා... පස්සෙන් පහු මම තේරුම් ගත්තා මේ ආත්මේ අඩුවක් වගේ තේරුණේ ඔයා නැති එක කියලා... මගේ ජීවිතේ මේ දැනෙන අඩුව ඔයා කියලා මම හරියටම තේරුම් ගත්තා... මෙහෙයි... අපි පහුගිය ආත්මෙක එකට උන්නා... සමහරවිට මේ ආත්මෙට උරුම තිබුණ අතීත ආත්මේ වෙන්න ඇති... ඉතින් මොකද කරන්නේ... ඔයා හිතනවද මට මේ ආත්මේ ඔයා නැතුව ජීවත්වෙන්න පුළුවන් කියලා... එහෙම වුණොත් මට හැමදාම ලොකු අඩුවක් දැනෙයි...

නිකං හිස් ගතියක්... මොකක්ද නෑ වගේ... එහෙම වෙන්නේ කොහොමද... එතකොට ජීවිතේ සම්පූර්ණ නැහේ එබා... ඉතින් මම තීරණය කළා ඔයාගේ ජීවිතේ කොටසක් වෙන්න... ඇත්තම කතාව මෙකයි... මට ඕන ඔයාව මගේ කරගන්න... මොකද ඔයා නැතුව පුදු මම සම්පූර්ණ නෑ...

ඒක ටිකක් ආත්මාර්ථකාමී දෙයක්... මොනවා කරන්නද... ජීවත්වෙන්න ඔයාවම ඕනනම්... නේද... ඉතින් කියනවා මම ඔයාට හරි ආදරෙයි... ගොඩක්... කියන්න බැරි තරම්........"

සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්



www.sinhalaelibrary.com


www.sinhalaelibrary.com
ආදරය ගින්දරක්
එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...
නවකතා
තිළිණය
08
පොත
Happy New Year
2014
සුජීව ප්‍රසන්න ආරච්චි



සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරය ගින්දරක්

එය ඇතිවූ දා සිට සැනසීමක් නැත...

www.sinhalaelibrary.com
Happy New Year 2014

උපේක්ෂා වාහනයට ගොඩ වුණේ ලොකු නිවනකින්. තාරක වාහනයට ගොඩ වුණේ අලුතෙන් හදවතේ උපන් කැක්කුමක් එක්ක. කොහොමත් මේ පපුව පුරා කැක්කුමක් තිබ්බා. ඒත් අද ඒ කැක්කුම වැඩි වුණා.

"අ..යියේ..."

"නංගී..."

"ම..ට එ..හෙම කියන්න වු..ණා..."

"කිය..න්..නම එපැයි නංගී..."

"ඒ කතාව..."

"ම්..."

"ම..ට කිය..න්..නත් ආසයි... දහස් වතාවක් විතර මං මතක් කරලත් තියෙනවා..."

දෙන්නගේ ඇස් එකට හමුවුණා. ඒක පුදුමාකාරම හමුවීමක්.

"දැ..න් බයවෙන්නෙපා..."

"මං දැ..න් බ..ය නෑ කොහොමත්..."





"දැන් උපේක්ෂා..."

"කො..හෙද අයියේ ය..න්නේ..."

"ගිහින් ඇඳුම් ටිකක් ගමු..."

උපේක්ෂා ඔහු දිහා බැලුවා. ඒ ඇස් අසරණ පාටයි.

"අයියේ.. එහෙම ගියාම ප්‍රශ්නයක් නේද... සාප්පුවල... සෙ..නඟනේ..."

"ඔයාව තනියම යවන්නත් බෑ..."

"ඒත් එයා.. ඔයානේ කරදර විඳින්නේ..."

"අපි යමු..."

තාරක ඇහුවේ නෑ. ඔහු කොළඹ දෙසට වාහනය පැදෙව්වා. වැඩි වේලාවක් ගියේ නෑ. තාරකගේ දුරකථනය නාද වුණා.

"අ..යියේ එ..යා..."

තාරක ඇමතුම ගත්තා.

"තාරක පුතා මම ඇන්ටි..."

කතා කළේ දිල්කිගේ අම්මා. කටහඬ එච්චරම හොඳ නෑ.

"ඔයා කොහෙද ඉන්නේ..."

"මං පාරේ ඇයි ඇන්ටි..."

"පාරේ කොහෙද..."

"ම්.. මේ පැත්ත බොරැල්ල කිට්ටුව..."

"ආවේ පාර්ලිමන්ට් පැත්තේ ඉඳලනේ..."

"ඔ..ව්.. ඒ පැත්තේ ඉඳලා තමා ඇන්ටි..."

උපේක්ෂාව වෙව්ලනවා වගේ. "කවුරු හරි දැකලා ඇති... මං ඔයාට

කිව්වා..."

"කවුද ඔයා එක්ක ඉන්නේ..."

"මගේ හිතවත් ළමයෙක්..."

"ගර්ල් කෙනෙක්..."

"ඔව් ඇයි..."

"ඔයත් පුදුම කෙනෙක්නේ ඇයි කියලා අහන්නේ... එහෙම යන්න පුළුවන්ද..."

"මං ඔයාට ඇත්ත කිව්වා ඇන්ටි... මං ආවේ කොහෙන්ද... යන්නේ කොහෙද ඉන්නේ කා එක්කද... මං හංගන්නෑ..."

"ඉතින්..."

"ඔයා දිල් යන ඔක්කොම තැන් ගැන දන්නවා... එයා යන්නේ කාත් එක්කද කියලත් දන්නවා... ඉන්නේ බාත් රූම් එකේද කියලත් දන්නවා... නේද..."

ඇය කතා කළේ නෑ.

"මේ හෙට අනිද්දා මැරි කරන්න ඉන්න දුවගේ ඒවා ඔයාට ප්‍රශ්නයක් නැත්නම් මගේ ඒවාවලට ඔයා ඇයි වොරි වෙන්නේ... ආ... ඔව් මං ඉන්නේ මෙ හිතවත් ළමයෙක් එක්ක... මොකද මේ වෙලාවේ මං මේ ළමයව එක්කං යන්නම ඕන... ඒත් ඇන්ටි මේ දක්කනවා නෙමේ... හොඳේ... ආයෙත් මැසේජ් එකක් ආවොත් කලින්ම අහන්න... මං කියන්නම්..."

තාරක එහෙමම දුරකථනය තිබ්බා. උපේක්ෂා දිග සුසුමක් හෙළුවා.

"අයියේ මෙහෙම..."





"මෙහෙම කතා කරන්න හොඳ නෑ තමා නංගී..."

"ඒකනේ..."

උපේක්ෂා හූල්ලලා වගේ කිව්වා.

ටික දුරක් යනකල් තාරක කතා කළේ නෑ. ජීවිතය ගැන හිතන්න කොහොමත් මහා දෙයක් තියෙනවා. කෙල්ල නීතිඥ මහතාට කියූ සමහර දේවල් තාරකට දෝංකාර දිදී ඇහෙනවා. "කොහොමත් සර් ගෑණියෙක්ට ජීවිතේ එක්කෙනෙක්ව එකපාරක් විශ්වාස කරන්නම වෙනවා. ජස්ට් වන් නොට් ටූ..." ඒ වචන දිගේ ඔහු හොඩාක් හිතුවා.

"මේ තාරකව එහෙම විශ්වාස කළා නම් ඒ උඹ විතරයි..." ඔහු තමාටම කියා ගත්තා. ඒ තරම්ම විශ්වාසවන්ත හදවතක් මේ තරම ළඟ තියෙද්දී මේ යන්නේ කොහෙද...

"උපේක්ෂා..."

"අයියේ..."

"මගේ ප්‍රශ්න ගැන හිතන්නෙපා... ඒවට උත්තර මං හොය හොයා ඉන්නේ... මං ඒ උත්තර ලැබිච්ච දාට..."

"එ..දා..ට..."

"මං දිනුම්... එදාට තමා මං කිරිබත් උයන්නේ..."

උපේක්ෂා ඔහු දෙසම බලාගෙන උන්නා. ඔහුට තියෙන්නේ මොන තරම් වටිනා ජීවිතයක්ද...

"දැන් උපේක්ෂා..."

"ම..."



www.sinhalaelibrary.com
Happy New Year 2014

"අපට වෙන තැනක නවතින්න වෙයි... උන් දන්නවනේ ඔයා ඉන්නේ ඔය දියවන්නාව අවට කියලා..."

"ඔ..ව් අ..යියේ..."

"පොඩ්ඩක් ඇතුලේ තැනක අපිට ඉන්න වෙනවා... නැත්නම් අපාට්මන්ට් තියෙන්නේ..."

අපාට්මන්ට් යනු කොළඹ නගරයේ ඇති තට්ටු විස්සේ තිහේ නිවාස සංකීර්ණය. ඒවා හරි පුංචියි. ඒත් උඩ ගෙවල් වලට මුළු කොළඹම පේනවා.

"ඔ..ව් අයියේ..."

"මනෝජා ඇන්ටිත් එක්කම ටික දවසකට එහෙම තැනක ඉ..මු..."

"ඇ..න්..ටි..ට කරදරයක් වෙයිද අයියේ..."

"එහෙම කියන්නෑ... ඔයාට ඒ තරම් ආදරෙයි..."

"එ..හ..න ඉ..න්..න නම් අයියෙ ටිකක් අමාරුයි... වාහනයක් ගියත් බඩ පපුව දනවා..."

"මේ දවස් ටිකට විතරනේ... අර දේපොල නංගිට ලැබෙනවනේ..."

"අ..යියේ..."

"ම..."

"ම..ට ඒ..වා ක..ර..න් ය..න්..න උ..දව් කර..නවා නේ..ද.. මං..."

ඔහු ලස්සනට හිනාවුණා.

"මං උපේක්ෂා මිස් ගාව වැඩට හරි එන්නම්කෝ..."

"ඕ..න්..න කිව්වා ප..ව් කතාවක්..."

ඒ ඔක්කොම ඔයාට දීලා ම..ට ඔයා ළඟට වෙලා ඉන්න තියෙනව්





නම්... උපේක්ෂා තනියම හිතනවා. ඒත් කියාගත්තේ කොහොමද...

"උපේක්ෂා ගෙදරදී මොබයිල් ෆෝන් එකක් පාවිච්චි කළාද..."

"නෑ අ..යියේ..."

"ඇයි..."

"ම..ට අ..යියෙ ක..තා ක..ර..න්..න කෙ..නෙ..ක් උ..න්..නෑ..."

කෙල්ල ඇත්තම කිව්වා. තාරක හිනාවුණා.

"දැන් එකක් ඕන වෙයි උපේක්ෂා..."

දැන් මට කතා කරන්න කෙනෙක් ඉන්නවද... එහෙම අහන්න ඇයට හිතෙනවා.

"එයාලට කතා කරන්නත් වෙයි උපේක්ෂා... අ..ම්මට රංගනට..."

"ඔ..ව්... මං ක..තා ක..ර..න..වා..."

"පුළුවන් නේද..."

"ම..ට ඒ හයිය ඇ..ත් තියෙනවා අයියේ... ඒ ශක්තිය මට දුන්නට අයියට පින්..."

ඒ ඇස් හරි හැඟීම්බරව ඔහු දෙසට යොමු වෙලා තිබ්බා.

"අපි මෙතනින් ඇඳුම් ටිකක් බලමු..."

"අ..යිය..ටත් ගමු..."

"ෂ..ර්ට් එක..ක් වගේ ඇති..."

"අ..නේ..."

"ඉස්සරහට මට ඇඳුම් නම් ලැබෙයි..."

"ඇයි..."



www.sinhalaelibrary.com
Happy New Year
2014

"ඇයි ෆැක්ටරියක්ම මං දන්න කෙනෙක්ට ලැබෙනවනේ..."

ඒ අනාගතය කොහොම උදා වෙයිද... ඒ උදාවන අනාගතය මැද්දෙන් පුංචි තරු එළියක් ඇයට පෙනෙනවා. ඒ තරු එළිය සදාකාලයටම මේ ජීවිතයේ තියේනම්... ඒ අනාගතය හරි ලස්සන වේවි... ඒත් පතන දේම ජීවිතයට ලැබෙන්නේ නෑ.

තාරකගේ ජංගම දුරකථනයට දිල්කිගෙන් ඇමතුමක් ආවේ ඔහු උපේක්ෂා සමඟ ඇඳුම් සාප්පුවට ඇතුල් වෙද්දීමය.

"උපේක්ෂා බලන්න... හොඳ ඇඳුම් ටිකක් බලන්..න.. ඉක්සරහට උසාවිත් යන්න ඕන..."

තාරක ඇමතුම සම්බන්ධ කර ගත්තා. උපේක්ෂා නැවතී ඔහු දිහා බැලුවා.

"ඔ..ව් දිල්..."

උපේක්ෂාගේ මුවින් හීන් සුසුමක් පිට වුණා.

"කවුද ඔය ඔයත් එක්ක ඉන්න කේස් එක..."

තාරක එකවර කතා කළේ නෑ. ඒ වචන වලින් ඔහුට දැනුණේ ලොකු අප්පිරියාවක්.

"මං ළඟ කේස් එකක් නම නෑ දිල්..."

තාරක කිව්වේ උපේක්ෂා දිහා බලාගෙනමයි. උපේක්ෂාගේ හිත හරි දුකකින් බර වුණා. දැන් ප්‍රශ්නය කැරකෙන්නේ තමා වටා කියලා ඇය දන්නවා. "මං නිසා ඔයාට මෙහෙම ප්‍රශ්න ඇති වෙද්දී දරාගන්නම බෑ..." උපේක්ෂා සිහින් කිව්වා.



www.sinhalaelibrary.com
Happy New Year 2014



"කේස් එකක් නැත්නම් කවුද ඔය ඉන්නේ... තාරක අපි මැරි කරන්න ඉන්නේ..."

"පුංචි නෝනට ඒක මතක් වෙච්ච එක හොඳයි..."

"මට උත්තර දෙන්න තාරක..."

"එදා මාත් ප්‍රශ්න වගයක් ඇහුවා දිල්..."

"නිකං බයිලා කියවන්නෙපා... අම්මටත් පාට් එක ආලා... මෙයා කෙල්ලෝ අගෙන වටේ යනවා..."

තාරක හිනාවුණා.

"මං ඔයාගේ අම්මට ඇත්තම කිව්වා... මොකටද බොරු කියන්නේ..."

"එයා අද අන්කල්වයි ඇන්ටිවයි හම්බවෙයි..,"

"යන්න කියන්න... මම ලේලිගේ හැටි සාක්ෂි සහිතවම පෙන්නන්නම්..."

"පල් වැඩ ඔයා කරන්නේ..."

සාප්පුව ඇතුළත ජනප්‍රිය ගීතයක් වාදනය වෙමින් තිබ්බා.

"කොහෙද තාරක ඉන්නේ..."

"මං ඉන්නේ සාප්පුවක..."

"අර බඩුවත් එක්ක..."

"දිල් මං කිව්වා..."

"බඩුවක් නැත්නම් වෙන කවුද... ඇයි ඒකි ගරනවා ඇති හොඳට..."

"අපි දිල් වෙලාවක හම්බවෙලා කතා කරමු... දැන් මම වැඩක්..."

"ඇයි ෂොපින් නේ... නේද..."

"මං කිව්වේ වැදගත් විදිහට හම්බවෙලා කතා කරමු කියලා... ගොඩක්

දේවල් තියෙනවා කතා කරන්න..."

"එ..න්..න ඉතින්..."

"බෑ... අපි කොහේ හරි හම්බවෙලා කතා කරමු... මට සංගම් මැද්දේ කතා කරන්න බෑ... මැරි කරනවනම් මේ ප්‍රශ්න ටික විසඳගමු... හොඳේ... කතා කරලා විසඳගෙන මැරි කරමු... එතකොට හොඳයිනේ..."

තාරක ඒ ටික කියලා ඇමතුම තිබ්බා. උපේක්ෂාට හිල්ලුනා.

"ග..ත්තද උපේක්ෂා..."

"මේ.. මේ දෙ..ක..ක් ග..ත්..තා ඒ ඇති අයියේ..."

"පිස්සු නටන්නැතුව එන්න... ඔවා අඳින්න පුළුවන්ද..."

තාරක කිව්වේ තරහින්. "අද කේන්තිත් ගිහින්..."

"අයියේ..."

ඉහල මාලය වෙත යද්දි උපේක්ෂා කතා කළා.

"එහෙම කතා කරන්නෙපා... එයාගේ පැත්තෙන් එයා සාධාරණයි..."

"මගේ පැත්තෙන් කොච්චර සාධාරණද කියලා ඔයා දන්නෑ..."

"චු..ට්ටක් නිවෙමු... මං නිසා අයියේ..."

"උපේක්ෂා..."

තාරක පඩිපෙල මැද නතර වුණා.

"මේක මගේ ප්‍රශ්නයක්... ඔයා මේ ප්‍රශ්නේ නැහැ... මායි මං බඳින්න ඉන්න කෙනයි අතර ප්‍රශ්නයක්..."

"ම..ට ස..මා..වෙ..න්..න..."

කෙල්ල එච්චරයි කිව්වේ. තාරක ඔහුටම බැණ ගත්තා. මිනිහෙක්





අවුල් වුණාම එහෙමයි. කරන්නේ මොනවද කියලා තේරෙන්නේ නෑ.

"මේ සාරි තුනක් විතර බලලා ගන්න... උසාවියටත් අඳින්න පුළුවන් ඒවා..."

"ම්..."

සාරි තෝරද්දී කෙල්ලගේ අත වෙව්ලනවා වගේ. විනාඩි දහයක් පමණ තේරුවත් ඇයට එක සාරියක් වත් තෝරා ගන්නට බැරි වුණා.

"ඇයි උපේක්ෂා හොඳ සාරි නැද්ද..."

ඒ ඇස්වල යංතමට කඳුළු. ඒත් ඇය මූණ පෙන්නුවේ නෑ.

"අ..යියේ..."

"ම්..."

"වෙ..න වෙ..ලාවක ඇ..විත් ග..න්..න..ද..."

"එ..හෙ..නම් ය..න්..."

දෙන්නාම සාප්පුවෙන් පිටවුණේ එක ඇඳුම් කෑල්ලක්වත් නොගෙනයි. උපේක්ෂා මඟදී අමාරුවෙන් දෑස් පිසදා ගත්තා.

*** *** *** ***



www.sinhalaelibrary.com
Happy New Year 2014

**තාරක** කතාබහකින් තොරව ඉබාගාතේ වගේ වාහනය පැදෙව්වා. අවසානයේ ඔහු කොළඹ ගාලු පාරට සමාන්තරව සාදා තිබූ මැරින් ඩ්‍රයිව් නමින් හඳුන්වන මුහුදුබඩ ගාලු පාරට වාහනය දැම්මා. ඒ පැත්ත නම් නිස්කලංකයි.

ඒ දිගේ වාහනය පදවාගෙන ගිය තාරක මුහුදු වෙරළ පෙනෙන නොපෙනෙන මානයේ තිබූ තැනක වාහනය නතර කළා.

"නංගී..."

"අයියේ..."

"සො..රි..."

"අ..නේ... එ..හෙම කියන්නෙපා..."

"ඔළුව අවුල් වුණාම වැරදි වෙනවනේ..."

"එ..හෙම අවුල් කරගන්නෙපා අ..යියේ..."

"මේක කොහොමත් අවුල් වෙච්ච ජීවිතයක් උපේක්ෂා... අවුල්ම වෙච්ච ජීවිතයක්... ඔයාට නංගී ජීවිතේ ඉලක්කයක් තියෙනවා... මට නෑ..."





"ඇයි මෙහෙම කතා කරන්නේ කොච්චර වටින ජීවිතයක්ද..."

"ඒකිට වටිනවද ඉතින්..."

"ඔය බලන්න තරහ ගන්න හැටි..."

තාරක කතා කළේ නෑ. ඔහු බලා උන්නේ ගිනියම් මුහුද දිහා.

"මේ අහන්න අයියේ..."

උපේක්ෂාගේ අත එහෙමම ඔහුගේ බාහුවට ගියා.

"ම..."

"එයාට වටින නිසානේ මෙ..හෙ..ම..."

"නෑ උපේක්ෂා... කෙනෙක්ව තව කෙනෙක්ට වටිනවා කියන්නේ මේකට නෙමේ... මං අපිරිසිදු වෙච්ච මිනිහෙක් නෙමේ..."

"ඒක මං..නේ දන්නේ..."

"ඒත් එයා එහෙම මං වෙනුවෙන් පිරිසිදු උන කෙනෙක් නෙමේ... මේ බැඳීමට එයා වටිනාකමක් දුන්නෑ..."

"අපි මෝඩ කෙල්ලට සමාව දෙමු..."

තාරක ලස්සනට හිනාවුණා.

"එහෙම හදා ගන්න පුළුවන් නම් උපේක්ෂා මං එයාව බැඳලා ගොඩක් කල්..."

"දැන් මොනාද ඉතින් කරන්න යන්නේ..."

"දැ..න්..නෑ..."

"අනේ එතකොට..."

"ප්‍රශ්න තමයි... ගෝරි තමයි... මං දන්නවා..."



www.sinhalaelibrary.com
Happy New Year 2014

"අ..ද හ..රියට තරහ යනවනේ..."

තාරක දිග වේලාවක් කතා කළේ නෑ.

"එයා එක්ක හිමිහිට කතා කරලා... අර කිව්වේ කතා කරමු කියලා... කොහේ හරි ගිහින්..."

"උපේක්ෂා..."

"ම්..."

"දැන් රංගනට ගන්න... දාගන්න වෙලාවක්... ගිහින් කතා කරලා සමාදාන වෙලා මෝඩයගේ වැරදි වලට සමාව දීලා බුදියගනිං... ඌත් එක්ක... කරනවද එහෙම... ආ..."

තාරක ඇත්තටම බැණ්නා. කෙල්ලට ඇඬුණා. ඔහුට ඒ තරම් කේන්ති ගියේ ඇයි.. . කෙල්ල තොල් පට තද කරගෙන මුහුද දිහා බලාගෙනම උන්නා.

"එ..හෙම ක..ර..න්න පුළුවන්ද ම්..."

"අයියා මා..ත් එ..ක්..ක ත.. ත..රහ වෙ..ලා... මං ය..න්..න..ම්... ක..මක් නෑ..."

කෙල්ල ඇඬුවා. ඇයට දුක හිතුණේ අර කතාවට නෙමේ. එහෙම ඔහු බනී කියලා ඇය හිතුවේ නෑ.

"උපේක්ෂා..."

"මට බෑ නංගී ඒ ගෑණිව බඳින්න..."

"ඒත් අ..යියේ පො..රො..න්..දුත් වෙලා..."

"එතකොට උඹ කසාද බැඳලා පොත්වල ලියලා හනිමූනුත් ආවේ...





ඒක..."

අද ඇයි මෙහෙම කතා කරන්නේ...

"ඇයි ඒ විදිහට මං ගැනත් හිතන්න බැරි... ආ... මාත් මනුස්සයෙක් නේද..."

"නෑ..නේ.. දෙයියෙක්..නේ.. ඒකනේ ති..යෙ..න ප්‍ර..ශ්..නේ..."

උපේක්ෂා අඬ අඬාම කිව්වා. තාරකගේ පපුව මහා දුකකින් පෙරලුණා. හඬා වැටුණා.

තාරක පුදුමාකාර වේදනාවකින් බලා උන්නා. දැන් කොල්ලට කතා කරගන්නම බෑ. ජීවිතයේ ප්‍රථම වරට ඔහුට ලොකු පසුතැවීමක් දැනුණා. තමන්ගේම අයට බණින හැමෝටම මේ පසුතැවීම එනවා.

"අ..යියේ..."

උපේක්ෂා කතා කළේ හරි හැඟීම්බර විදිහට. ඔහු ඉන්නේ ලොකු ගින්දරක කියලා ඇයට දැනෙනවා. ඔහුව නිවා ගන්නට ඕන. මේ තියෙන්නේ නිකමම නිකම් ජීවිතයක් නෙමේ. පුදුම තරම් වටිනා ජීවිතයක්.

"එයාව අයියේ..."

"ම්..."

"බඳින්..නම වෙ..නවද..."

"ම්.. මාව හිරවෙලා ඉන්නේ... ගෙදරිනුත් ලොකු බලපෑමක් තියෙන්නේ... අම්මට නම් තේරුම් කරලා දෙන්න පුළුවන්... ඒත් තාත්තට බෑ..."

"දැන් ඔයාලා බඳිනවා කියලා ඔක්කොම දන්නවා නේද..."



www.sinhalaelibrary.com
Happy New Year 2014

"ඔව් නොදන්න කෙනෙක් නෑ..."

තාරක දැන් කතා කරන්නේ හරි හිමින්.

"දැ..න් අයියා කිව්වා වගේ එයත් එක්ක කතා ක..රලා..."

"කතා කරන්න එන්නම් කිව්වේ එකතුවෙන්න නෙමේ... එයාව බදාගෙන..."

"එහෙනම්..."

"වෙන්වෙන්..න..."

"ප්‍රශ්න ගොඩක් නේද..."

"ම්... ගොඩක්.. මං ඒ ප්‍රශ්න වලට මූණ දෙන්නම ඕන..."

"මං දන්නවා... ම..ට වගේ හනිමූන් දවසේ පැනලා යන්න බෑ... නේ..ද..."

තාරක හිනාවුණා. ඒත් කතා කලේ නෑ. කෙල්ලෙක්ට වඩා කොල්ලෙක්ව ප්‍රශ්න වලදී හිර කරනවා.

"උපේක්ෂා..."

"අයියේ..."

"මේ වෙලාවේ නංගී මේක හිතන්න ඕන නෑ... මට කේන්ති ගියා..."

"මං දන්නවා... අනේ මට කේන්ති ගිහින් ගැහුවත් මොකද... මං..."

කියන්නට ගිය දේ උපේක්ෂා ගිල ගත්තා. පපුව ඉස්සරහට පනිනවා වැඩියි. ඇත්තටම වැඩියි.

"උපේක්ෂා..."

"ම්..."





"මේ බැඳීම..."

"ඔව් අයියේ..."

"ඔයාගෙයි මගෙයි බැඳීම..."

"ම්..."

"නමක් නැතුව මෙහෙම ටික කාලයක් තිබ්බදෙන්..."

"ම්.. මට නමක් ඕන නෑ... නම් අලා හදන බැඳීම්වල හැටි පේනවනේ..."

එච්චරයි. තාරක ලොකු සුසුමක් හෙළලා පපුව නිදහස් කර ගත්තා.

"දැන් ආයෙත් ඇඳුම් ගන්න ය..න්..ද..."

ඔහු සැහැල්ලුවෙන් ඇහුවා.

"අ..නේ වෙන දවසක..."

"මං මූඩ් එක නැවා නේ..ද..."

"අයියට මහන්සියි..."

"අද හොඳ දවසක්... අපි කෑම ටිකක් කන්න ය..න්... ඉන්දියන් කෑම කන්න ආසද..."

"ම්.. හ..රි ආසයි... ඉස්සර තාත්තා එක්කං ය..නවා..."

"කොහෙද..."

"සරවනාස් එකට... ඒකේ කෑම හරි රහයි..."

"එහෙනම් ය..න්..."

"දැන්..."

"ම්..."



www.sinhalaelibrary.com
Happy New Year 2014

"එතන කට්ටිය මාව දන්නවා..."

"එතකොට..."

"එයාලා හිතයි අයිය මගේ..."

"කොහොම හිතුවාම මොකද..."

එහෙම හිතනවනම් කොච්චර හොඳද... ඒක ඇත්ත වෙනව නම් ඊට වඩා හොඳයි.

www.sinhalaelibrary.com

*** *** *** ***





**සරවනාස්** අවන්හලේ පුංචි මේසයක් දෙපැත්තේ දෙන්නා වාඩි වුණා. ඒ මැද තියෙන්නේ ඉන්දියන් ලැන්ටන් එකක්. වේටර්වරයෙක් පැමිණ එහි ඉටිපන්දම ඇල්වූවා.

"ආ... මි..ස්..නේ ගොඩාක් කාලෙකින් මිස්..."

ඇය ලස්සනට හිනාවුණා. ඇය කිව්වේ ඇත්ත. "තාත්තා හරි ආදරෙන් ඉන්න ඇති දූ පොඩ්ඩට..." තාරකට හිතුණා.

Happy New Year 2014

"ස..ර් නම් මේ ආවමයි..."

"ඔව්..."

"ලොකු ස..ර් සනීපෙන්ද මිස්..."

කෙල්ලගේ දෑස් බර වුණා. ඒ දුක කොහොම කියන්නද...

"තාත්තා නැතිවුණා..නේ..."

"අ..නේ.. අයම් සොරි මිස්..."

"ඒක කමක් නෑ..."

"ඉස්සර ඔඩරේම දාන්නද මිස්..."

"අයියේ..."

කෙල්ලට බැලුනේ ඔහු දිහාව.

"අපි ඉස්සර ගන්නේ චිකන් ටික්කයි පරිප්පු කරියි බණ්ඩක්කා බැදුමකුයි නාන් රොටියි බතුයි..."

"ඒක මරු නංගී..."

"ඒකම ආන්න... මැන්ගෝ දෙකකුත් ගේන්න..."

වේටර්වරයා ගියාට පස්සේ තාරක හරි දුක හිතුණ විදිහට කෙල්ල දිහා බලලා හිනාවුණා.

"දුකයි නේ..."

"නෑ අයියේ... මේ තැන්වලට ආවාම සතුටුයි... අද රහට කනවා... තාත්තා උන්න තැන ඔය අද අයියා ඉඳගත්තේ..."

"තව කොහෙද තාත්තා එක්ක ගියේ..."

"නොගිය තැනක් නෑ අයියේ..."

"අපි විවේක වෙලාවට යමු..."

"හා.. එතකොට එයා ඉන්නවා වගේ දැනෙනවා..."

"මේ මං ඉන්නේ කොහොමත් තාත්තගේ ආත්මේ එක්ක... ඔයා මගේ තාත්තමයි..." උපේක්ෂාට හිතෙන්නේම එහෙමයි.

"අයියේ... එයා..."

දිල්කි ගැන අහන්න ගියත් ඒ මූණ අඳුරු වෙනවා. "එච්චර කෙනෙක්ව බඳින්න පොරොන්දු උනේ ඇයි..." උපේක්ෂාට එහෙම අහන්නම හිතෙනවා.

"නෑ... මං හිතුවේ අ..යියා කිව්වොත්..."





"අහයිද..."

"ම්.."

"නෑ උපේක්ෂා... එහෙම අහයි... පුංචි හරි ආදරයක් තිබ්බනම්... වෙන දේකට ලෝබකමේ ඉන්න මිනිස්සු එහෙම නෑ..."

"ආ..දරේ නෑ කියලා ද..න්..නේ කොහොමද..."

"ඔයා දන්නේ කොහොමද..."

"අපි ප..ස්සේ ක..තා කරමු..."

ආයෙත් ඔහුට කේන්ති යයි කියලා උපේක්ෂාට ඇත්තටම බය හිතුණා. තාරක හිනාවුණෙත් ඒකමයි. "තේරුම් ගන්නවා කියන්නේ මෙකට. ඒක ආදරේ තියෙන හොඳම දේ..."

"කවදහරි දවසක උපේක්ෂා..."

"ම්..."

"මැරි කරන්න හිතපු දවසට..."

"ම්..ම්..."

කෙල්ල මහා දෙයක් කිව්වා වගේ අහනවා. ඒ තරමට ඇගේ ඇස් ලොකු වෙලා.

"ඔ..ව්..."

"මං අයියේ කා..ව මැරි කරන්නද..."

"නෑ හිතුණ දවසට නංගී..."

"ම්..."

"මට කෝල් එකක් දෙනවද..."



www.sinhalaelibrary.com
Happy New Year
2014

"ඇ..යි අ..යියේ..."

කෙල්ල උගුරෙන් වගේ ඇහුවා. ඒ ඇස් හරි අමුතුයි.

"ඇවිත් පුංචි නෝනව හම්බවෙන්න..."

"ඉ..තින් අ..යියා අපිත් එක්ක ඉන්නවනේ..."

"කොහේ හිටියත් කතා කරන්..න..."

"ඇයි අයියේ... අයියා ඇවිත්..."

"මට කතා කරන්න ඕන වෙයි..."

"එ..හෙම හිතන්නෙම නෑ..."

"ඇයි..."

"නෑ අයියේ..."

"බඳින්නෙම නෑ..."

"බ..ඳි..නවා..."

"කා..වද..."

"එ..හෙම අයියේ..."

අඹ බීම දෙක ගෙනාවා. ඒ නිසා කතාව නැවතුණා. ඊට පස්සේ ඔහු ඒ කතාව ඇද්දේ නෑ. ඒත් මේ කතාව කවදහරි කතා කරන්නත් වෙයි. අද නැතත් දෛවය කවදහරි ඒ තැනටම මේ දෙන්නව ගේනවා. ජීවිතේ එහෙමයි. ඇත්තටම එහෙමයි.

*** *** *** ***





www.sinhalaelibrary.com

**තාරක** උපේක්ෂාව දියවන්නාවේ ගෙදරින් බැස්සුවේ ගොඩාක් රෑ වෙලා: ඇයව වේලාසන එළියට තියෙද්දී දියඹන්නාව පැත්තට ගේන්න ඔහුට චුට්ටක් බය හිතුණා. දිගටම ඇය ළඟ ඉන්නව නම් රංගන නෙමේ කවුරු ආවත් ඔහු බය නෑ. ඒත් ඇයව අලා තමා ගියාට පස්සේ නපුරු දෙයක් වෙන්න පුළුවන්.

Happy New Year 2014

අද දවස ජීවිතයේ උදා වූ වෙනස්ම දවසක්. ඔක්කොටම වඩා උපේක්ෂායි තාරකයි ගොඩක් කිට්ටු වුණා. දෙන්නෙක් එහෙම කිට්ටු වෙද්දී ඒ දෙන්නාටම ඒක දැනෙනවා. පපුවල බිත්ති යංතමට උණුවෙන්න ගන්නවා. අද වුණේ ඒක...

"උපේක්ෂා..."

"අයියේ..."

"දැන් හොඳට කල්පනාවෙන් වැඩ කරන්න... තාත්තගේ ෆැක්ටරියේ කෙනෙක්ට කතා කරන්න... අර මං දුන්න ෆෝන් එකෙන්... තේරුණාද..."

"මං රෑට ගන්නම් අයියේ..."

"ඉන්න නැනක් නිකමටවත් කියන්නෙපා..."

"ම්..."

"අපි අනිද්දා රෑට ගිහින් ලෝයර් හම්බවෙමු ආයෙත්..."

දියවන්නා පාරට වාහනය හැරෙද්දී උපේක්ෂාට දුකයි. ලස්සන දවසක් නිමා වෙනවා. ඇය ඔහු දෙස බැලුවේ ඒ දුකින් බරවූ දෙනෙතින්මයි.

www.sinhalaelibrary.com

"මං හෙට උදේ මේ පැත්තේ එන්නම්..."

"අ..යිය..ට වැඩ..ත් ඇති..."

"මේ වැඩත් දැන් මගේ වැඩ වගේ තමා..."

එහෙම කියද්දී උපේක්ෂාට හරි සතුටක් දැනෙනවා. තමා වෙනුවෙන් ඇබින්දක් වත් හිතන්න කෙනෙක් දැන් ඉන්නවා වගේ ඇයට හිතෙනවා.

"ය..න් මං මනෝජා ඇන්ටිට බාර දීලම යන්නම්..."

"බාරදීලා යන්න මං ඔයාගෙ දුවද..." එහෙම අහන්න ඇයට හිතෙනවා.

Happy New Year
2014

"ආ.. මං හිතුවා දෙන්නා අද රෑ එන එකකුත් නෑ කියලා..."

එක්කගෙන යන්න නම් හිතුණා තමා... තාරකට එහෙමත් කියන්න හිතෙනවා.

"ඔන්න ඇන්ටි මං බාර දුන්නා... එළියට බහින්න දෙන්නෙපා..."

"නෑ නෑ... අද ඉඳලා මං පපුවේ තියාගෙන ඉන්නේ..."

"අයියේ තේ චු..ට්ටක්..."

කෙල්ල බැගෑපත්ව අහනවා.

"මං ගිහින් බොන්නම්... දැන් මහන්සියිනේ..."





"මට මොන මහන්සියක්ද ඉඳගෙන ආවා..."

"මං ය..න්..න..ම්..."

කෙල්ල දණ ඔබලා සාලයේදී ඔහුට වැන්දා... යන්නට හදද්දී තාරක ඒ උරතලයට සුරත තිබ්බා.

"දවල් බැණ්නට අරව මේවා කිව්වට සොරි හොඳේ..."

"අනේ... ඒවා ගිනනවද මම... ඕනනම් ගහලා ය..න්..න..."

ඒ ඇස් ඔහුගේ ඇස්වල ඇලෙනවා. පැටලෙනවා.

"අ..යියේ..."

"ම්..."

"ප..රිස්ස..මින්... බු..දු සරණයි..."

එළියට බහින්නට ප්‍රථම ඔහු තවත් පාරක් බැලුවා. අලා යන්නට බැරි ගතියක් ඒ ඇස්වල ලියවිලා.

වාහනය ඈත යද්දී කෙල්ලට ලෝබයි. දුකයි.

"සු..දු ඇ..න්..ටී..."

"පු..තේ..."

"එ..යා දු..ක් වි..දින..වා... ඒ ජීවිතේ හිරවෙලා..."

"මං දන්නවා පුතේ..."

"ආදරේ කියන්නේ නිවනක්... ඒත් දිල් ඒක දන්නෑ... මොනවද පිස්සු වැඩ ටිකක් කරලා එයා මේ කොල්ලව නැති කර ගන්නවා..."

"ඒකි එහෙමයි... ආදරේ ගැන දිල් මොනාද දන්නේ පුතේ..."

"ඒත් අයියා එයාට ටිකක් හරි ආදරෙයි... ඒ අයියගේ හැදිච්චකම...

හදා ගන්න කියලා දෙයක් නෑ... දිල්ට තිබ්බේ මෝඩි නොවී මේ ජීවිතේ වෙනුවෙන් කැප වෙලාම ඉන්න..."

"එ..හෙම කැප වෙන්න හැමෝම දන්නෑ පුතේ..."

"ම්... අපරාදේ..."

"මොකක්ද..."

"දෙන්නගෙම ජීවිතේ..."

"එහෙම වෙන එකක් නෑ..."

"ඇයි..."

"ජීවිතේ මහ පුදුම දේවල් වෙනවා..."

"ම්..."

උපේක්ෂා මනෝජාව ළඟ තියාගෙන හැමදේම කිව්වා. නීතිඥ මහතා හමුවූ තැන ඉඳලා සේරම කිව්වා.

"එ..යා ළ..ග ඉ..න්..න..ව..නම් සු..දු ඇ..න්..ටි..."

"ම්..."

"මං මේ ස..ට..න දි..න..න..වා... ඔයාව මම හරිම සැපට තියනවා..."

"අනේ... මට උඹ ළඟ වැටිලා හිටියාම ඇති... කොහොමත් කොල්ලා ඔයා ගාව ඉඳී..."

"පායපු ඉරක් ළඟ ඉන්නව වගේ..."

උපේක්ෂා කිව්වේ මුළු හදවතින්මයි.

"ඉතින්... අද අපි ඉන්දියන් රෙස්ටොරන්ට් එකකින් කෑවා... ඔයාව හරියට මතක් වුණා... මං දවසක එක්කං යන්නම් හොඳේ..."





"අ..නේ... ඒක මොකක්ද..."

"මොනවද දවල්ට කෑවේ..."

"මං පා..න් කෑවා..."

"පාන් හොඳ නෑනේ අනේ..."

"ඔයත් නැතුව දැන් මට පාළුයි... තනියම උයන් කන්න..."

"ඉතින් මං උන්නෑනේ ඉස්සර..."

"එහෙම තමා පුතේ..."

"එ..හෙම තමා... දැන් මටත් ඔයාලා නැතුවම බෑ... ජීවිතේ සුදු ඇන්ටි..."

"ම්..."

"අපට එකටම ය..න්න පුළුවන්නම්..."

"අනේ මං හිතන්නේ උඹේ දරුවෙක් මට නලවන්න තියේනම් කියලා..."

"මගේ..."

"ම්..."

උපේක්ෂා ඇය දිහාම බලාගෙන උන්නා. කියන්න දහසක් දේවල් ඇගේ හිතට එනවා. ඒත් කියවෙන්නේ නෑ.

"රෑට මං කැකුළු බත් ඉව්වා..."

"ඒක හොඳයි... මොනා එක්කද..."

කෙල්ලත් දැන් දුවෙක් වගේ එහෙම අහන්න පුරුදු වෙලා.

"ඇඹරැල්ල උයලා හාල්මැස්සෝ තෙල් ආලා පරිප්පු..."



www.sinhalaelibrary.com
Happy New Year 2014

"අද හොඳයි... හොඳට කන්නෝන..."

"මං බිත්තර ඔම්ලට් එකකුත් හදන්නම්..."

"ඔය ඉතින්... අච්චර රහ කෑම ටිකක් තියෙද්දී බිත්තර ඔම්ලට් මොනාටද... නිකංනේ ලෙඩ හදාගන්නේ... මොකද ඔයා හිනාවෙන්නේ..."

මනෝජා හිනාවෙද්දී උපේක්ෂා ඇසුවා. කෙල්ල ටිකක් වසයි...

"බැඳපු කාලෙකට..."

"ම්..."

"කොල්ලා පව්..."

"ම..ගේ..."

"ම්..."

"ඇයි..."

"මස් ටිකක් කන්න දෙන්නෑ... මාළු කෑල්ලක් බැදලා කන්න දෙන්නෑ... ෆ්‍රයිඩ් රයිස් එකක් කන්න දෙන්නෑ... බිත්තර ඔම්ලට් එකක් දෙන්නෑ..."

මනෝජා දිගටම කියාගෙන යනවා. උපේක්ෂා තොල් පට තද කරගෙන අහගෙන ඉන්නවා.

"සුදු ඇන්ටි..."

"ම්..."

"දෙයියෙක් වගේ මහත්තයෙක් ලැබුණාම..."

"ම්..."

"එ..හෙම රකින්න ඕන තමා... එක දෙයියනේ ඉතින් ඉන්නේ..."





ලැබුණොත් ඉතින් කොළ කැඳමයි පොවන්නේ... රතුහාල්මයි කන්න දෙන්නේ... වතුර වෙනුවට පොවන්නේ තැඹිලි වතුර... මැල්ලුම් තලි තලි කවන්නේ... සීනි දෙන්නෙම නෑ... පොඩි රට ඉඳි ගෙඩියක් එක්ක තේ දෙන්නේ..."

මනෝජා ඒ දැස් දෙසම බලා උන්නා.

"එ..හෙ..ම ක..ලා න..ම් පැව්යෝ අ..න්..ක..ලුන් නාම ජීවත් වෙ..න..වා..."

"ම..."

මනෝජා කෙල්ලගේ හිස ආදරයෙන් අතගෑවා. මේ ගෙදරට අහම්බෙන් උනත් ආවේ මහා බලගතු කෙල්ලෙක් කියලා ඇය දන්නවා.

*** *** *** ***



www.sinhalaelibrary.com
Happy New Year 2014

www.sinhalaelibrary.com

**උපේක්ෂා** ඇගේ පියාගේ ඇඟලුම් කම්හලේ උන් හිතවත්ම පරණම මැනේජර්ට ගත්තේ රෑ වෙලා... ඇය ඔහුගේ අංකය ඉල්ලා ගත්තේ රන්තරු එකෙන්මයි. ඇයට ඒ අංකය විතරයි මතක තිබුණේ. තමාට හිමි ඇඟලුම් ආයතනයකටම ආගන්තුකයෙක් වගේ කතා කරන්න වෙච්ච එක පුදුමයි කියලා උපේක්ෂාට හිතුණා.

"මේ සෙනෙවිරත්න මහත්තයා නේද..."

"ඔ..ව් ක..තා කරනවා..."

සෙනෙවිරත්නට ඒ හඬ හුරුයි. උපේක්ෂා සැනසුම් සුසුමක් හෙළුවා.

"මේ උපේක්ෂා පුංචි නෝ..නා නේ..ද..."

සෙනෙවිරත්න නිකමට ඇහුවා.

"අ..න්..ක..ල්ට එ..හෙ..න..ම් මා..ව ම..ත..ක..යි..."

"අ..නේ පුංචි නෝ..නා... මොකද සුදු පුංචි නෝ..නේ වු..ණේ..."

උපේක්ෂාට ඇඬුණා.

"වෙච්ච දේවල් ඔ..ක්..කො..ම අ..න්..කල් දැ..න්..නව..නේ..."

Happy New Year 2014





"සහගහනවා පුංචි නෝනා... සහගහනවා... අනේ මං දවසට කී පාරක් අපේ මහත්තයවයි පුංචි නෝනවයි මතක් කරනවද..."

"මං දැ..න්..නවා අන්කල්... මං කතා කළෙත් ඒකමනේ... ර..න්තරු එකේ කාටවත් මට කතා කරන්න බැනේ..."

"මේ පුංචි නෝනගේ අයිතිය පුංචි නෝනා... ඇවිත් මේවා ගන්න..."

"ම..ට ඒ..කපාර එ..න්න බැ..නේ අ..න්..ක..ල්..."

"වෙච්ච දේවල් ආරංචි වුණා... මු..න් අතින් මැණිකව නාස්ති වුණාද..."

"නෑ අ..න්..කල්..."

"මං හිතුවා... අන්තිම මොහොතේ හරි එහෙම තීරණයක් ගත්තු එක හොඳයි..."

"ම..."

"දැන් කොහෙද පුංචි නෝනා..."

"මං ආරක්ෂිත තැනක ඉන්නවා... මං අන්කල්ට කියන්නම්..."

"කොහේ හරි පරිස්සමින් ඉන්න... මුන් ඉ..න්න දෙන එකක් නෑ..."

"මා..ව කෙ..නෙ..ක් ප..රිස්සම් කරනවා අන්කල්..."

"එ..හෙම කෙ..නෙ..ක් උ..න්..නැනේ පුංචි නෝනා..."

"දැන් ඉන්නවා..."

උපේක්ෂා කිව්වේ හරි හැඟීමකින්. මොන දේ උනත් ඔහු ඉන්නවා කියන හැඟීම දැන් හදවතට දැනෙනවා.

"අ..න්කල්..."

"පුංචි නෝනා..."

"මො..නවද ෆැක්ටරි එකේ වෙන්නේ..."

"අහන්න ඕන මොනවද නොවෙන්නේ කියලා... මුන් මේ දේවාලයක් වගේ තිබ්බ තැන නාස්ති කරනවා පුතේ..."

"මං ඒ දේවාලේ ආයෙත් ගන්නවා අන්කල්... ම..ට උ..දව් කරන්න... පිරිත් කියලා මං ඕක ආයෙත් පටන් ගන්නේ..."

"අනේ ඇත්තමයි මට අද හරි සතුටුයි... කොහේ හරි ඉඳගෙන අපේ මහත්තයා බලාගෙන ඇති..."

"මට අන්කල් විතරයි ඔතන හිතවත් කෙනෙකුට ඉන්නේ..."

"මං ඕන දෙයක් කරන්නම් පුතේ..."

"ඒ වචනේ මට හරි හයියක් අන්කල්..."

"මොනවද මං කරන්න ඕන..."

"ගාමන්ට් එක තිබ්බේ තාත්තගේ තනි අයිතියට... එයාලා කොහොමද බැන්ක් එකවුන්ට් කරන්නේ..."

"අලුත් එකවුන්ට්ස් පටන් අරගෙන..."

"රන්තරු නමට..."

"ඔව්... බොරු ඩොකියුමන්ට් හදලා තියෙන්නේ... රන්තරු එක එයාලට අයිති විදිහට..."

"ආ..."

"උසාවියකට පුතා එකපාරයි යන්න ඕන... සාක්ෂියට මිනිස්සු පෝලිමේ එයි... මං සාක්ෂි දෙනවා..."





"මං මේ සටන් කරන්නේ තාත්තා වෙනුවෙන් අන්කල්..."

"ඒක කරන්න පුතේ..."

"මට උදව් කරන්න..."

"ඒක තමා ඇහුවේ... මං මොනවද කරන්න ඕන..."

"මට බැන්ක් ස්ටේට්මන්ට් අරන් දෙන්න... සයින් කරපු චෙක්ස්වල කොපි එක්ක..."

"මං අරන් දෙන්නම්... ඔක්කොම ගෙනත් දෙන්නම්... තව..."

"රන්තරු එක එයාලගේ නමට තියෙනවා කියලා හදාගන්න මොනව හරි තියේද..."

"ඇයි සීල්... රංගන එයා මැනේජින් ඩිරෙක්ටර් කියලා සීල් දාගෙන ඉන්නේ..."

"ඒ සීල් ගහපු ලිපි දෙකක් විතර දෙන්න..."

"තව..."

"අම්මා එනවද ෆැක්ටරි එකට..."

"නෑ... එයා මන්වෙලානේ පුතේ ඉන්නේ..."

"මං දන්නවා... අන්තිම මාස තුනේ යවපු ෂිප්මන්ට් වල කොපිවලට කවුද අන්කල් අත්සන් කළේ..."

"රංගන..."

"ම..ට ඒ කොපි තුනක් විතර..."

"මං ගේන්නම්... හෙටම ගේන්නම්... මට මොනාද මේකේ කරන්න බැරි... මං අපේ මහත්තයයි පුංචි නෝනයි වෙනුවෙන් රස්සාව ගහලා



www.sinhalaelibrary.com
Happy New Year 2014

ගියත් ඒක කරන්නම්..."

උපේක්ෂාට ලොකු ආත්ම ශක්තියක් ආවා. තාත්තා මේ මිනිස්සුන්ට කොතරම් ආදරෙන් ඉන්න ඇත්ද... අද මෙහෙම තමාට පණ දීගෙන ඉන්නේ ඒකයි.

"පුංචි නෝනා..."

"අ..න්..කල්..."

"මේ කසාදේ පු..තේ..."

"මං ඩිවෝස් කේස් එකක් ආනවා අන්කල්..."

"ඒක හොඳයි... මේ වල් සතා එක්ක මොන පවුල් ජීවිතද පුතේ..."

"එහෙම වෙන්නෑ අන්කල්... මං ඉක්මනටම ඕක සුද්ද කරනවා..."

"අපි පුතේ පිරිත් ආලා වැඩ පටන් ගන්නේ..."

"ආයෙමත් ඒ පිරිත් ඇහෙයි අන්කල්..."

"මං පුතාව හම්බවෙන්නේ කොහොමද..."

"අන්කල් මේ ඩොකියුමන්ට් ටික ලෑස්ති කරලා මට ගන්න... මං ගෙදරට එන්නම්..."

"පරිස්සමින් පුංචි නෝනේ..."

"මං ඉක්මනටම එනවා අන්කල්... මේ වගක් කාටවත් කියන්නෙපා..."

"අනේ දකින්නත් ආසයි..."

"මං එනවනේ... අපි ආවාම තාත්තගේ ආනෙත් ලස්සනට දීලා පිරිත් කියලා වැඩ පටන් ගමු..."

"ඒක හොඳයි... මට නම් අද හරි සතුටුයි..."





www.sinhalaelibrary.com

සෙනෙවිරත්න කතා කළේ ඇත්තටම අඬන්න වගේ. ඒ හැඟීම් උපේක්ෂාට දැනෙනවා. අවංක මිනිස්සුන්ගෙන් එන සුවඳ ඇය හොඳට අඳුනනවා. ඒ සුවඳ කෙල්ලට ඉගැන්නුවේ තාත්තා.

"පුංචි නෝනා..."

"අන්කල්..."

"ඇන්ටිට කියලා බත් මුලක් හදලා ගෙනත් දෙන්නද..."

සෙනෙවිරත්න ඇහුවේ අතීතය මතක් වෙලා. ඉස්සර කෙල්ලට එක එක ගෙවල් වලින් කන්න ඕන... "සෙනෙවි මේ කෙල්ලට නෝනට කියලා බත් මුලක් උයවලා ගෙනත් දෙන්න..." තාත්තා කියන්නේ එහෙමයි.

Happy New Year 2014

"අන්කල්ට ඒවා තාමත් මතකයි..."

"දැනුත් බත් මුලක් ගේද්දී මතක් වෙනවා පුංචි නෝනා..."

"ආවාම ඇන්ටිට කියලා හදවගෙන කමු... අඹ උයලා එහෙම නේද..."

"පුංචි නෝනට තුණුරුවන් සරණයි..."

"අන්කල්..."

"පුතේ..."

"ඔයාගේ දුවට දෙයක් කරනවා කියලා හිතලා මට මේ දේ කරන්න... මං ඔයා ගැන නෙමේ කවදහරි බලන්නේ... නදී ගැන..."

උපේක්ෂා එහෙමම කිව්වා. නදී සෙනෙවිරත්නගේ එකම දුව.

"මං දන්නවා පුතේ..."

"බුදු සරණයි... මං එහෙනම් ඉක්මනට හම්බුවෙන්නම්..."

"හොඳයි.. බුදු සරණයි..."

"සඳරාජිනී" - 09 කලාපය සමඟ
තවත් රසබර කොටසක්...



www.sinhalaelibrary.com
හැමදාම මට මොකක්ද අඩුවක්
දැනුණා... ඒක විස්තර කරන්න මට
තේරෙන්නේ නෑ... නිකං මොකක්ද
දෙයක් නැහැ වගේ මට නිතරම
දැනෙන්න ගත්තා... ගිය ආත්මෙක මට
තිබුණ දෙයක් මේ ආත්මේ මට නෑ වගේ
මට දැනෙන්න ගත්තා... මම ගොඩක්
හිතුවා... ඇයි මට මෙහෙම හිතෙන්නේ
කියලා... ඒත් තේරුමක් තිබුණේ නෑ...
එක දවසක මම ඔයාව දැක්කා...
ඔයාගේ ඇස් දෙක මගේ ඇස්
ඉස්සරහට ආවා... එදා මට
හිතුණා... පස්සෙන් පසු
ගත්තා මේ ආත්මේ
තේරුණේ ඔයා නැති
මගේ ජීවිතේ මේ දැනෙන අඩුව ඔයා
කියලා මම හරියටම තේරුම් ගත්තා...
මෙහෙයි... අපි පහුණු ආත්මෙක එකට
උන්නා... සමහරවිට මේ ආත්මෙට අයම
තිබුණ අතීත ආත්මේ වෙන්න ඇති...
ඉතින් මොකද කරන්නේ... ඔයා හිතනවද
මට මේ ආත්මේ ඔයා නැතුව
ජීවත්වෙන්න පුළුවන් කියලා... එහෙම
වුණොත් මට
හැමදාම ලොකු අඩුවක් දැනෙයි...
නිකං හිස් ගතියක්... මොකක්ද නෑ
වගේ... එහෙම වෙන්නේ කොහොමද...
එතකොට ජීවිතේ සම්පූර්ණ නෑනේ
බබා... ඉතින් මම තීරණය කළා ඔයාගේ
ජීවිතේ කොටසක් වෙන්න... ඇත්තම
කතාව මට ඕන ඔයාව මගේ
ඒක ටිකක් ආත්මාර්ථකාමී දෙයක්...
මොනවා කරන්නද... ජීවත්වෙන්න
ඔයාවම ඕනනම්... නේද... ඉතින්
කියනවා මම ඔයාට හරි ආදරෙයි...
ගොඩක්... කියන්න බැරි තරම්........
Happy New Year
2014
ආදර ගින්දරක්
සුජීව ප්‍රසන්න ආරච්චි




www.sinhalaelibrary.com

**උපේක්ෂාගේ** හිතට පුදුමාකාර නිවනක් දැනුණා. රන්තරු එකේ මැෂින් මැදින් සාරිය ඇඳගෙන යනවා ඇයට මැවී පෙනුණා.

**"මං යද්දී මගේ ළඟ ඔයත් ඉන්නවනම්... ඔයාව එහෙනම් පුටුවේ ඉන්දවලා මං බලන් ඉන්නවා..."**

www.sinhalaelibrary.com

උපේක්ෂාට එහෙමයි හිතුණේ. ඒක පුදුමාකාර හැඟීමක්.

එදා රාත්‍රියේ උපේක්ෂා ජීවිතය ගැන ගොඩාක් බරපතල විදිහට හිතුවා. දිගට හරහට පහළට උඩට හැම පැත්තටම හිතුවා.

**"අරමුණක් නැතුව බලාපොරොත්තුවක් නැතුව ජීවිතේ ගැන අල්ප මාත්‍ර හැඟීමක් නැතුව ග්‍රෑන්ඩ් හෝටලේ කාමරෙන් එළියට පැනලා දුවපු මට ජීවත් වෙන්න ශක්තිය දුන්නේ ඔයා... මං ජීවිතේ අලුතින් පටන් ගන්න හිතුවේ ඔයාගේ ඇස් දෙක දිහා බලලා... ඔයා මට මොනවා හරි කියනවා කියනවා වගේ... ඒක මට දැනෙනවා... මේ බැඳීම පවක්ද කියලා මං දන්නෑ... ඔයා දිල්ව බැඳලා නම් ඒ බැඳීම ලොකු බැඳීමක් නම් ඇත්තටම මං කරන්නේ පවක්... ඒක පවක් නම් ඔයාව මගේ ජීවිතේ තියන්න එපා..."**





"මේ ආත්මයේ එහෙම පවක් කරන්නෑ කියලා උපේක්ෂා හිතාගත්තා. ඒ තරමටම මේ ආත්මේ දුක් වින්දා. උපදින මතු ආත්මෙක දුප්පත් හොඳ අම්මා කෙනෙක්ගේ දුවෙක් වෙලා මට උපදින්න ඕනේ. මගේ තාත්තා මගේ දරුවන්ගේ දරුවොත් බලන්න ජීවත් වෙන්න ඕන. මේ ආත්මේ නැතත් මතු ආත්මෙක හරි මට ඔයා වගේ කෙනෙක් වේලාසනම මුණගැහෙන්න ඕන... ඒ වෙනුවෙන් මං මේ ආත්මේ පව් කරන්නෑ...

බැඳීම මැද පව් කළාම මතු ආත්මයක උපදින්නේ කුණු බැඳීම් ගොඩක් එක්ක... ඒක උපේක්ෂා දන්නවා.

**"මං පතාගෙන ආවේ ඔයාවම නම් ඔයාව මට ලැබෙයි... මෙහෙම අපිව මුණගැස්සුවෙත් ඒ නිසා වෙන්නත් ඇති... ඒත් දෙයියෝ කාගේ පැත්තෙද කියලා දන්නෑ තාරකයියේ..."**

පපුවට දැනෙන මහා ලෝබකම පපුව හාරා ගෙන එන්නාක් මෙන් ඇයට දැනෙනවා. ඒ හැඟීමෙන් මිදෙන්න අමාරුයි.

**"ඔයාගෙයි දිල්ගෙයි ජීවිතවල වෙන්න තියෙන දෙයක් වෙයි... ඒත් ඔයාට නරකක් වෙන්නෙපා කියලයි මං පතන්නේ... ඉතුරු ටික දෙයියෝ කරයි..."**

උපේක්ෂා ඇදේ ගුලිවුණා. ආයෙත් ජීවිතේ රුදුරු තනිකමට බිලි දෙන්න අමාරුයි. එහෙම ඉඳලා සටන් කරන්නත් අමාරුයි.

"මේ හයිය දුන්නේ ඔයා..."

ඒ හයිය ඔහු ළඟ නැතිවූ දාකට නැතිවෙනවා. ඒක ඒකාන්තයි. හේතුවක් නැතුව ගලා ගිය කඳුළක් කෙල්ලගේ දෙකම්මුල් අතරින් වැටුණා.

"ඔයාව මට ලැබෙනවනම් මේ ජීවිතේ තව මොනවත් නොලැබුණත් කමක් නෑ... ඒත් එහෙමම වෙයිද... මං ජීවිතේ අවුල් කරගත්ත කෙල්ලෙක් කියලා ලෝකේ හිතයි..."

උපේක්ෂා දෑස් පිසදාගෙන පොරවනයෙන් වත වසා ගත්තා. ඒත් කටුක සීතලක් ඇයට දැනෙනවා.

*** *** *** ***





**තාරක** උන්නේ හරි අමාරු තත්වයක... කසාදයක් කවේ ඉන්න මනමාලයෙකුගේ මුහුණේ මේ තරම් දුකක් කණගාටුවක් නෑ. ඒත් කොල්ලගේ මුහුණ ඊට වඩා හාස්පසින් වෙනස්.

උපේක්ෂා හමු වන්නට ප්‍රථම තාරක උන්නේ මේ දෛවය මෙහෙමම ගෙඩි පිටින් බාරගන්න. ඊට පස්සේ ජීවිතේට වෙන දෙයක් හිතනවා කියලා ඔහු හිතාගෙන උන්නා. ඒත් දැන් එහෙම හිතන්න දුකයි. ඊට වඩා ලෝබයි.

"ජීවිතේ සමහර වැරදි එහෙම හිතන තරම් ලේසියෙන් නිවැරදි කරන්න බෑ..."

තාරක ඒක දන්නවා. ජීවිතේ සමහර දේවල් ලියන්නේ... ලියවෙන්නේ පැන්සල් අකුරින් නෙමේ... ඒ නිසා මකන කෑලි වලින් ඒවා ලේසියෙන් මකා දාන්නට බැහැ.

ඒ නිසා පපුව උඩ... ජීවිතේ උඩ ලියාගන්නා දේවල් පරිස්සමින් ලියාගන්න ඕනේ. ඒත් මේ ජීවිතේ සමහර දේවල් ලියන්නේ තමන් නෙමේ. වෙන අය,



www.sinhalaelibrary.com

පාන්දර ඉඳලා තාරක හිතනවා. ඇඳෙන් නැගිටින්නවත් ඔහුට හිතක් නෑ.

වසන්ති තේක අරන් ඇවිත් තාරකගේ ඇඳ උඩින්ම වාඩි වුණා.

"ඔෆිස් යන්නැද්ද පුතා..."

"අද ටිකක් ඇඟට අමාරුයි අම්මා..."

තාරක අම්මා අතින් තේක ගත්තේ ඇස් මඟාරින ගමන්. අම්මත් ඇඳ උඩින් ඉඳගත්තේ නිකම්ම නෙමෙ කියලා තාරක දන්නවා.

"මො..නවද දිල්ගේ අම්මා කියන්නේ..."

ගෑණි ගිනි තියන්න ඇති. තාරකට හිතුණා.

"මො..ක..ක්ද අම්මා..."

"ඔයා කවුද ගෑණු ළමයෙක් එක්ක ගියා කියන්නේ..."

"ඔ..ව් මං එයාට කිව්වා..."

www.sinhalaelibrary.com

"කවුද ඒ..."

"මං දන්න ළමයෙක්... ඒ ළමයව වැඩකට එක්කං ගියා... මං ඒක ඔයාට හැංගුවේ නෑ... එයාගේ දුව මිනිස්සු එක්ක යන්නේ හැංගි හැංගි..."

"මොනාද මේ කියන්නේ... මෙහෙම කොහොමද අලුත් ජීවිතයක් පටන් ගන්නේ..."

"ඒක මාත් එයාගෙන් අහන්න අම්මේ උන්නේ... අම්මා කෙනෙක්ගේ මූණ දිහා බලාගෙන කියන්න බැරි දේවල් දිල් කරනවා..."

අම්මාට හීල්ලුණා. ඇයත් සමහර දේවල් නොදන්නවා නොවෙයි.

"ධර්මදාස අන්කල් ඉන්නේ..."





"ම්... ඉතින් අම්මා..."

"කාලෙකට පස්සෙ ඊයෙ කතා කළා..."

"දැන් කැබ් සර්විස් එකක් කරනවනේ... නේද... ගල්කිස්සේ..."

"ම් කිව්වා... ඔයාවත් මතක් කළා..."

"ඉතින්..."

"පුතා බඳින්නේ දිල්කිවද කියලා ඇහුවා..."

"ම්..."

"මං කිව්වා ඔව් කියලා... වෙඩින් කියන්න එනවා කිව්වා..."

"ඉතින් අම්මා..."

"මහ පුදුම කතාවක් කිව්වා..."

"මොකක්ද..."

"ලේලි ගැන ටිකක් හොයලා බලන්න කිව්වා..."

"මිනිස්සු මට ඕවා කියලා ගොඩක් කල් අම්මා... කාට කියන්නද ඉතින්..."

"මොනාද මේ ළමයා කරන්නේ..."

"එයාට හිතෙන දේ... අනේ මේ දහම් පාසල් ගිය මාව මේ ඩාන්සින් ස්ටාර්ගේ ඇගේ ගැහුවනේ..."

තාරක කිව්වේ හරි දුකින්. අම්මා ඇත්තටම ලොකු කම්පනයකින් බලාගෙන උන්නා.

"ඒත් පුතේ මේ කසාදේ කටේ..."

"මං දන්නවා... බඳින්නම කිව්වොත් බඳිනවා... මට බෑ ගෝරි

දාගන්න... ඒත්..."

"ඇයි..."

"මගේ ජීවිතේම වතුරේ... ඒක මං දන්නවා... ගැණු අරන් හදාගන්න බෑ අම්මේ..."

තාරක එහෙමම කිව්වා. අම්මා කෙනෙකුට පුතෙක් මෙහෙම කියන්නේ සෑහෙන දේවල් හිතලයි.

"මං දිල්ගේ අම්මා එක්ක කතා කරන්නද ටිකක්..."

"එපා අම්මේ... මටත් ටිකක් හිතන්න කාලේ තිබ්බනම් තමා හොඳ..."

"අනේ මන්දා..."

"අ..ම්මේ..."

"හොඳ ළමයෙක් උන්නනම් නේද..."

"මොකටද..."

"මට බඳින්න..."

අම්මට ලොකු දුකක් දැනුණා. ඒක පුදුමාකාර දුකක්. කොල්ලා කොච්චර අහිංසකද කියලා ඇය දන්නවා.

"එ..හෙම කෙනෙක් ඉන්නවද..."

"උන්නත් දැන් මොනා කරන්නද..."

තාරක හිස් හැඟීමෙන් කිව්වා.

"මං උදේ මනෝජා ඇන්ටිගේ ගෙවල් පැත්තේ යනවා... කාලෙකින් ගියෙත් නෑ... කාත් කවුරුවත් නැති ගෑණිනේ පුතේ..."

තාරකගේ හිතට එකපාර ගැස්මක් ඇතිවුණා.





"ම..නෝජා ඇන්ටිලගේ ගෙදර..."

"ඔ..ව්... ඔයත් එනවද..."

"ක..ම..ක් නෑ අ..ම්මා ය..න්..න..."

"කියක් හරි දීලා එන්නත් ඕන... පව්... කොහොම ජීවත් වෙනවද දන්නෑ..."

"ම්..."

අම්මා නැගිටලා යද්දී තාරක හිතුවා. අමමා දැන් එහේ ගියාම කෙල්ලව දකිනවා. අම්මා එහෙම ඇයව දකින එක හොඳද... නැත්නම් නරකද...

තාරකට තේරෙනේ නෑ.

*** *** *** ***

www.sinhalaelibrary.com

අම්මා උදේ ගෙදරින් පිටවෙද්දීම වගේ තාරක මනෝජාට ගත්තා.

"හෙ..ලෝ..."

ගත්තේ කෙල්ල... ඒ හඬ උදේක අහන්නත් ආසයි.

"නංගී..."

"ගු..ඩ් මෝ..නිං අ..යියේ..."

"මෝ..නිං නංගී... මොනාද කරන්නේ..."

"මං අ..යියේ මේ නා..ලා ආපු ගම..න්..."

"උදෙන්ම නෑවා..."

"ම්... අද වැඩ ගොඩක් තියෙනවා ඒකයි..."

"නංගී..."

"අයියේ..."

"චුට්ටකට ෆෝන් එක මනෝජා ඇන්ටිට දෙන්න මං නංගිට හිම්හිට ගන්නම්..."

"අ.. අයියේ..."





කෙල්ලගේ හිතට අමුත්තක් දැනුණා. ඒත් ඇය දුවලා ගිහින් මනෝජා ඇන්ටිව එක්කගෙන ආවා.

"පු..තේ..."

"ඇන්ටි... අද අපේ අම්මා ඇන්ටිව බලන්න එනවා..."

"අ..නේ... සුදු නෝනා එනවා කිව්වද..."

"ඔව්... දැන් මේ පිටවුණා..."

"ඉතින් පුතේ..."

"නංගී ඉන්නවනේ ඇන්ටි..."

"ඔව් පුතේ..."

"අම්මා දකිනවා... එහෙම දැක්කට කමක් නැද්ද නැත්නම්..."

මනෝජා බැලුවේ කෙල්ල දිහාව. ඇය මොහොතක් කල්පනා කළා.

"පු..තේ..."

"ඇන්ටි..."

"මං කෙල්ලව ටිකක් ඇතුලේ තියන්නම්... දැනට එහෙම හොඳයි... මෙහෙම ඉන්නවා අම්මා දකින එක එච්චර හොඳ නෑ..."

"මා..ත් එ..හෙම හිතුවා... ඇන්ටි එහෙනම් බලලා මොකක් හරි කරනවද..."

"ඒක හිතන්නෙපා පුතේ..."

"කෙල්ලට දෙන්නකෝ..."

මනෝජා දුරකථනය උපේක්ෂා අතට දුන්නා.

"නංගී..."



www.sinhalaelibrary.com

"අ..යියේ..."

"අ..ද නංගී අපේ අම්මා මෙහේ එනවා..."

"මෙහේ අයියේ..."

"ම්... මනෝජා ඇන්ටිව බලන්න.. ආවාම බබා..."

"මං ඇ..තු..ලට වෙලා ඉ..න්නම්..."

"න..රක..කට නෙමේ එ..හෙම කියන්නේ..."

"මං එ..හෙම හිතන්නෑ අයියේ..."

මට ඔයා වගේ හොඳ පුතෙක්ව හදපු අම්මගේ මූණ ටිකක් බලාගත්තම ඇති... උපේක්ෂා හිතුවා.

"මං පස්සේ දවසක අඳුන්නලා දෙන්නම්... මේ දවස් එච්චර හොඳ නෑ නංගී..."

www.sinhalaelibrary.com

"මාව කොහොමද අඳුන්නලා දෙන්නේ..." එහෙම අහන්න ඇයට හිතෙනවා.

"හා අයියේ..."

"ඊයේ ෆැක්ටරියේ කෙනෙකුට කතා කළාද..."

"ඔව්... සෙනවි අන්කල්ට... එයා ඇඩුවා..."

ඒ වූ කතාබහ උපේක්ෂා සේරම ඔහුට කිව්වා.

"එ..හෙ..නම් එයාලා සැහෙන්න නටලා..."

"ම්.. අ..පිට අයියේ ර..න්තරු එක ආයෙත් ග..න්න පුළුවන්..."

"අරගෙනම දෙනවා නංගී..."

"ම..ට හීනයක් වගේ..."





"හීන ටික ටික හැබෑවෙයි..."

"ඒත් ජීවිතේ මොන හීනේ හැබෑ උනත් වැඩක් නෑ... හිතේ තියෙන එක හීනයක් හැබෑ වෙන්නේ නැත්නම්..." ඔහොම කියන්නයි ඇයට හිතෙන්නේ.

"මො..නාද උදේට කෑවේ..."

"මුං ඇටයි පොල් සම්බෝලයි බතුයි හැදුවා... තාම කෑවේ නෑ..."

"ඇයි මුං ඇට..."

"මුං ඇට ගුණයිනේ... ඇයි ආස නෑ..."

"හොඳයි..."

"මනෝජා ඇන්ටිත් මූණ ඇඹුල් කර ගත්තා... ගුණ දෙයක් කන්නෙම නෑ..."

"ගුණ නම් ඉතින් කන්නම වෙනවනේ..."

"ගොඩක් රහ දේවල් ගුණ නෑ අයියේ..."

"ම්... ඒ වුණාට නංගී..."

"ම්..."

"සමහර ගුණ දේවල්..."

"ම්..."

"හරිම රහයි..."

"මො..නාද..."

"කාපු දවසට කියන්නම්... තියනවා හොඳේ..."

"ම්.. බුදු සරණයි..."

උපේක්ෂා දුරකථනය තියලත් හූල්ලනවා. හදවත මෙහෙම මෙහෙම ගිහින් මොනවා මොනවා කරගනීද කියලා හිතාගන්න බෑ.

"සු..දු ඇන්ටි..."

"ම්..."

"ඒ අ..ම්මා හො..ඳයි..ද..."

"පින් කඳක්... කොල්ලා වගේම තමා..."

මනෝජා එහෙම කිව්වා.

"දකින්නත් ආසයි..."

"හෙමිහිට බලන්න... ඒත් ජේන්න එන්නෙපා... මෙහෙම ඉන්නවා දකින්න ඕන නෑ..."

"ම්..."

"දවසක මේ මූණ අතගාලා කතා කරයි..."

"මගේ..."

"ඒ ඇයි..."

"බලන්නකෝ..."

මනෝජා කෙල්ලගේ මූණ අතගාලම කිව්වා.

"මොනාද හද හද හිටියේ..."

"මං මේ පොල් පිට්ටු කෑලි දෙකක් හැදුවා කට්ට සම්බෝලයක් එක්ක..."

"ඇයි..."

"පුතාලගේ අම්මා හරි ආසයි පොල් පිට්ටු කන්න ආවාම කාලා





යන්නේ..."

"කට්ට සම්බෝලයි කිරියි විතරක් ඇද්ද..."

"ඇති ඇති... වෙන ඒවා තිබ්බත් කන්නෑ..."

"හොඳ අම්මා කෙනෙක් වෙන්න ඇති... නේද ඇන්ටි... මෙච්චර හොඳ පුතෙකුත් හදලා තියෙන්නේ..."

"ඇත්තටම හොඳයි... කොල්ලට තියෙන්නෙත් අම්මගේ ගතිගුණ තමා..."

මනෝජා කිව්වේ හිනාවෙලා. උපේක්ෂා මනෝජා කට්ට සම්බෝලය හදන අයුරු බලාගෙන උන්නා.

"ඇන්ටි..."

"පු..තේ..."

"එයා..."

"පුතාද..."

"ම්..."

"ඉතින්..."

"අපිට දෙනවනම් නේද..."

ඒ වචන ටිකට මනෝජාගේ පපුව ඇකිළිලා ගියා. කෙල්ල මෙහෙම කියන්නේ ඔහු ගැන කොච්චර හිතුවට පස්සෙද කියලා මනෝජා දන්නවා.

"නොදී ඉන්නෑ..."

"අපට..."

"ම්..."



www.sinhalaelibrary.com

"මහ්... පින් මදි..."

"ජීවිතේ සමහර අයව පුතේ..."

"ම..."

"වෙලාසන අයින් කරලා ඇත් කරලා එළි කරන්නේ..."

"දෙවියෙක් වඩම්මන්න තමා නේ..."

"ඒකනේ... පූජාව ලැස්ති කරගෙන ඉඳපන්... කහ වතුරෙන් නාලා..."

"ක..හ ව..තුර ඕ..න නෑ සුදු ඇන්ටියේ... මේ අත් දෙක ඒ තරම් පිරිසිදුයි... හරිම පිරිසිදුයි..."

කෙල්ල කීවේ දෑතම පාලා... මනෝජා ඒ සුදු අත් දෙක දිහා බලලා හිනාවුණා.

*** *** *** ***



www.sinhalaelibrary.com



කෙල්ල බුදු කුටිය ළඟ තිබ්බ කාමරේ ජනේලය හිමිහිට ඇරගත්තා. එතනට මුළු දියවන්නාවමත් මිදූලත් ලස්සනට පෙනෙනවා. කෙනෙක් එනවනම් එයාවත් අපූරුවට පේනවා. සමහර දවස්වලට උපේක්ෂා ඒ කාමරේ ජනේලය ඇරගෙන දියවන්නාව පටුමග දිහා බලාගෙනම ඉන්නවා. ඒ ඔහු කොයි මොහොතක හරි එයි කියලා හිතාගෙන...

එහෙම හිතන සමහරක් දවස්වලට ඔහු ඇත්තටම එනවා. එදාට හදවතම මල් යායක්. ඒත් සමහරක් දවස්වලට එන්නේ නෑ. එදාට හදවතම සහරා කතරක්.

එක හිතක් පස්සේ... එක වතක් පස්සේ... එක ජීවිතයක් පස්සේ වැටුණට පස්සේ හදවතකට සැනසීමක් කියලා දෙයක් නෑ. හදවතට නිවනක් කියලා දෙයක් නෑ.

කවිටිය නම් කියන්නේ ඒ හැඟීමට ආදරේ කියලා... ඒත් ඒක හදවත් රෝගයක්... කවදාවත් සුව නොවන... ආදරෙන් ඉන්න කෙනෙක්ගේ දෙන්නෙක්ගේ පපුවේ ඒ රෝගය සදාකල් තියෙනවා. සීයා මැරුණාම

සමහර ආච්චිලා මිනිය ළඟට වෙලා ඉන්නේ හිනාවෙවී... "තව ටිකකින් නැගිටලා තේ ඉල්ලයි" ඒ ආච්චිලා කියනවා. "ඔය මාව බය කරන්න..." එහෙමත් කියනවා. එහෙම කියන ආච්චි අම්මලා සීයා මැරිලා සතියකින් දෙකකින් නැති වෙනවා.

ආදරේ එහෙමයි. සාගරේ තරම්. වෙලාවකට පට්ට දුකක්. වෙලාවකට දොට්ට දාන්න බැරි සතුටක්.

උපේක්ෂා දිගටම බලාගෙනම උන්නා. ඒ අම්මව දකින්න මේ තරම් ආස ඇයි කියලා ඇයට තේරෙන්නෑ. "ඔයාව හදපු අම්මනේ..." ඇයට එහෙමයි හිතෙන්නේ.

ජීවිතේ ඉස්සරහට මොන මොනා වෙන්න තිබ්බත් එක දෙයක් වෙනස් නොවී තියෙනවනම් ඇය ආසයි. ඒ මේ පුංචි බැඳීම... "ඒක පටන් ගත්තේ එදා ග්‍රෑන්ඩ් හෝටලෙන්... ඒක කවදාවත් ඉවර වෙන්නේ නැති බැඳීමක් වෙනව නම් තමා මං ආස..ම..."

www.sinhalaelibrary.com

"අපිව මෙහෙම එක ළඟට කරපු එකේ තේරුමක් තියෙන්න ඕන... දෙයියෝ එහෙම කමකට නැති වැඩ කරන්නෙත් නෑ... එයා දෙයක් කරන්නෙ අනාගතේ දෙයක් ගැන හිතලයි... ඒත් ඒක ඇන්මම කියන්නෑ..."

නමක් නැති බැඳීමක් එක්ක යන්න පුළුවන් දුර කොච්චරද... කෙල්ලට ඒක තේරෙන්නෑ. එක අතකට බැඳීමකට නමක් ඕනමද...

"අපි හොඳ යාළුවෝ..."

නිකමට එහෙම කියන්න පුළුවන්... ඒත් ඒක කොච්චර බොරුවක්ද... මේ තරම්ම ළඟ යාළුකමක් කෙල්ලෙක්ගේ ජීවිතේ තියෙන්න බෑ...





තියෙන්න පුළුවන්.. එයාගේ බෝයි ෆ්‍රෙන්ඩ් එක්ක... නැත්නම් හස්බන්ඩ් එක්ක... ඒත් ඔයා මගේ ඒ කවුරුවත් නෙමේ..."

"ඔයා මේ වෙලාවේ දිල්ගේ බෝයි ෆ්‍රෙන්ඩ්... හෙට ඔයා එයාගේ හස්බන්ඩ්..."

ඒ බැඳීම මැද්දේ මේ ජීවිතයට ඉඩක් නෑ. ඉඩක් තිබ්බත් ඒ ඉඩට ලෝකේ ඉඩක් නෑ.

"ඒ පව්කාරකමද මේ මං අතින් වෙන්නේ..."

උපේක්ෂා ඇයගෙන්ම ඇහුවා. වෙලාවකට ඇයට ඉමේ මොනවත්ම නොහිතා ඔහුව ඇසුරු කරන්නට හිතෙනවා.

"මේ ලෝකේ මැද්දේ තියන බැඳීම් ගැන මොකට හිතනවද... එහෙම බැඳීම මොකටද... අදටත් කතා කරලා කැවද කියලා අහන්නේ එයා..."

හේතුවක් නැතුවම උපේක්ෂාගේ දෙනෙත් තෙත් වෙලා ගියා... ඇය බලවුස් කරින් දෙනෙත් පිසදාගෙන ග්‍රිල් වලට බර වුණා.

නවීන පන්නයේ සුදු පාට කාර් එකක් දියවන්නාව පටුමඟට හැරුණේ ඒ වෙලාවේ. උපේක්ෂා ඒ වාහනය දිහාම බලා උන්නා. වාහනය පිටුපස අසුනේ කවුද ඉන්නවා වගේ ඇයට පෙනෙනවා.

"ඒ අම්මා වෙන්න ඇති..."

උපේක්ෂා ජනෙල් රෙද්ද තව ටිකක් වහගෙන වගේ බලා උන්නා. හිතුවා වගේම ඒ සුදු පාට කාර් එක මිදුලට ඇම්මා. ඇවිත් බෝගන්විලා ගස් මැද නතර කළා.

වාහනයෙන් බැහැලා ආවේ තාරකගේ අම්මා. ලා රෝස පාටයි සුදු

පාටයි මිශ්‍ර වෙච්ච චාම් සාරියක් ඇඳ උන් ඇය තාරක වගේම පින් පාටයි.

"ඒ මූණමයි... අනුලා කරුණාතිලක වගේ..."

කෙල්ලට එහෙමම හිතුණා. ඇය හරි ලෝබකමින් තාරකගේ අම්මා දිහා බලාගෙන උන්නා... වසන්ති ගෙට ආවේ මොනවද සුදු බෑග් එකක් බරට අරගෙනමයි.

"අ..නේ සුදු නෝ..නේ..."

"ම..නෝ... මට මොකක්ද වෙනසක් පේනවා..."

කෙල්ල ආසාවෙන් අසාගෙන ඉන්නවා.

"මො..ක..ක්..ද..."

"ටිකක් තරුණවෙලා වගේ... ඇඟත් ටිකක් අඩුවෙලා... මූණත් ටිකක් පාට වැටිලා... අවුරුදු දහයකට කලින් වගේ..."

"ම..ම..."

www.sinhalaelibrary.com

උපේක්ෂාට තනිවම හිනා... ඇය මනෝජාට තරක කෑමක් කන්න දුන්නේම නෑ. ඇය මේ ගෙදරට ආවට පස්සේ මැල්ලුම් මිටි පනහක් විතර හැදුණා. උදේට කොළ කැඳ හැදුණා. සම්බා හාල් ගේන එක තහනම් වුණා. රතු කැකුළු විතරයි ගෙනාවේ.

"කෑමෙන් බීමෙන් ටිකක් පරිස්සම් වුණා නෝ..නේ..."

"ඒක තමයි... දැන් ෂෝක්... දැන් අර තිබ්බ බඩත් නෑ..."

මනෝජාට සිහිවුණේ කෙල්ලව. මෙහෙම අද සනීපෙට ඉන්නේ කෙල්ල නිසා. ඒ ආදරණීය බැණුම් නිසා.

"ඉ..තින් නෝනේ..."





"ආවා මනෝව බලලා ය..න්න... එන්න හිතනවා හැමදාම... එක එක කරදර මනෝ..."

"කිව්ව නම් මං දුවන් එනවනේ..."

"මටත් එන්න ගමනක් තියෙන්නෙපැයි... ආ... මම මේ බඩු ටිකක් ගත්තා ගෙදරට..."

"හැමදාම එද්දී ගේනවා..."

දෙන්නා හරි යාළුවෝ වෙන්න ඇති කියලා උපේක්ෂාට හිතුණා. ඇය දොර ළඟ බිම කොට්ටයක් දාලා ඉඳගත්තේ දෙන්නගේ කතාව අහගෙන ඉන්න ඒ තරමට ආස නිසා...

"සුදු නෝනා කාලා නෙමේ නේද ආවේ..."

"උඹේ ගෙදරට එනකොට මං කවදද කාලා ආවේ..."

"පොල් පිට්ටුයි කට්ට සම්බෝලයි කිරියි තියෙනවා ගේන්නද..."

වසන්ති පුදුමයෙන් වගේ මනෝජා දිහා බැලුවා.

"මනෝ..."

"සුදු නෝනා..."

"මං එනවා කියලා කිව්වේ නෑනේ..."

"ම..ට හිතිලා හැදුවේ සුදු නෝනා..."

"උඹටත් හිතෙන දේවල්..."

මනෝජා ඇන්ටි ලොකු අමාරුවක වැටෙන්න ගිය බව උපේක්ෂා දන්නවා... "තව ටිකෙන් හොර අහුවෙනවා... අයියා කතා කළා කියලා..."

මනෝජා සුදු ලස්සන පිඟානට බෙදාගෙන ආවා. වසන්ති ආවාම

කන්න ආස මෙහෙමයි... සමහර දවස්වලට ඇය කුස්සියටම වෙලා කනවා.

"ෂා උ..ණුවෙන් තියෙන්නේ..."

"දැන් බෑවේ සුදු නෝනා..."

"උඹත් තනියම පිට්ටු හදං කකා ඉන්නවා නේද..."

වසන්ති අහද්දී මනෝජා හිනාවුණා. "කෙල්ලව පෙන්නන්න තියේනම්..."

"මනෝ..."

"සුදු නෝනා..."

"ගේ දැන් හරි පිළිවෙලයිනේ... ගිය පාර එද්දී මෙච්චර පිළිවෙලට තිබ්බෙ නෑ..."

උපේක්ෂා තනිවම හිනාවෙනවා. කෙල්ල මනෝජාට කතුර වත් මෙසේ උඩ තියන්න දෙන්නේ නෑ.

"ටි..කක් අස් කර ගත්තා සුදු නෝනා..."

"ම්... ලස්සනයි දැන්..."

මනෝජාට කෙල්ලව කාමරෙන් එක්කගෙන ඇවිත් පෙන්නන්න හිතෙනවා.

"තව කිරි ටිකක් ආන්නද සුදු නෝනා..."

"ආන්න... අපේ කොල්ලා මේ පැත්තේ ආවේ නැද්ද ළඟදි මනෝ..."

කොල්ලා දැන් මෙහෙමයි කියලා කියන්න මනෝජාට හිතෙනවා.

"මෙතනින් යන හැම වෙලාවෙම මාව ඇවිත් බලලා යන්නේ සුදු නෝනා... කොල්ලා නැත්නම් මං ජීවතුන් අතර නෑ... මට නම් සුදු නෝනා



www.sinhalaelibrary.com



සිදුහත් කුමරයා වගේ..."

"මටත්..." කෙල්ලට කෑ ගහලා කියන්න හිතෙනවා. තාරක ගැන හොඳ කියද්දී අම්මට හරි ආසයි.

"ම..නෝ..."

"සුදු නෝනා..."

"ඒකා ඉන්නේ එච්චර හිතේ සතුටකින් නෙමේ... පරවෙලා වගේ..."

උපේක්ෂා බිත්තියටම බර වුණා.

"ම..ට තේරෙනවා සුදු නෝනා..."

"මො..නවා හරි කිව්වද..."

"නොකියනවමත් නෙමේ... මට ඉතින් කිව්වුනේ සුදු නෝනා... ඉස්සර කක්ක බරක් හැදුනත් මටනේ කිව්වේ..."

"ම.. මොනවා වෙන්න යනවද මන්දා..."

"දිල් ගැන නේද..."

"ඒකනේ... මාත් ඉන්නේ ලොකු බයකින් මනෝ... මේ කෑවට බඩට ය..න්..නෑ..."

වසන්ති කිව්වේ අඬලා වගේ. ඒ අම්මා පුතා ගැන මේ තරම්ම දුකින් කතා කරයි කියලා උපේක්ෂා හිතුවේ නෑ. "එයා දුක් විඳිනවා කියලා ඔයාට පේන්න ඕන අම්මේ..."

"උදේ මට කියනවා..."

"ම්..."

"ගෑණු අරගෙන හදාගන්න බෑලු... හොඳ ළමයෙක් උන්නනම්

හොඳයි නේද කියලා අහනවා..."

"මො..කටද සු..දු නෝ..නා..."

"බඳින්..න..."

උපේක්ෂාගේ යටි පතුල් දිගේ මොකක්ද ගින්දරක් උඩට ආවා.

"මං ඇහුවා එහෙම කෙනෙක් ඉන්නවද කියලා..."

"ඉතින්..."

"උ..න්..න..ත් දැන් වැඩක් නැලු..."

උපේක්ෂා ඇස් පිසදා ගත්තා. "ඇයි ඔයා මේ දවස් වලම මේවා කතා කරන්නේ තාරක... ඔයා කවුරු ගැනද මේ කියන්නේ..."

"කොල්ලා පව් සුදු නෝනා..."

"තව කියනවා අනේ මේ දහම් පාසැල් ගිය මාව මේ ඩාන්සින් ස්ටාර්ගේ ඇඟේ ගැහුවනේ කියලා..."

උපේක්ෂාට පුදුමයි... ඔහු ඒ තරම්ම ඒ බැඳීම පිළිකුල් කරනවාද...

"දිල්ගේ වැඩනම් සුදු නෝනා..."

"ම්..."

"ගොඩාක්ම හොඳයි කියන්න බෑ..."

"දන්නවා මනෝ දන්නවා... මටත් කී දෙනෙක් කියනවද..."

"එහෙම එකේ සුදු නෝනා..."

"මං කියලා කොහොම මේවා තේරුම් කරන්නද මනෝ..."

"ඒ ජීවිතේ සුදු නෝනා..."

"මල් පැලේ වගේ හැදුවේ මම..."



www.sinhalaelibrary.com



"ඔව් එයා මල් පැලයක් වගේ තමා... ඒකනේ ළඟම ඉන්න අපිටත් එච්චරම සුවඳ..." උපේක්ෂා තනිවම හිතනවා.

"තාරක පුතාට ගැළපෙන්නේ ඒකට පණට පණ දෙන්න කෙල්ලෙක්ව..."

ඕනනම් ඒ කෙල්ලව දැන් කාමරෙන් එළියට අරන් පෙන්නන්න පුළුවන් කියලා කියන්න මනෝජාට හිතෙනවා.

"එහෙම ලේලි කෙනෙක්ව තමා මාත් බලාපොරොත්තු උනේ..."

"දිල් නරකයි කියනවා නෙමේ සුදු නෝනා ඒත් කොල්ලට..."

"ගැළපෙන්නෑ..."

"ම්..."

"මනෝ..."

"සුදු නෝනා..."

"මං හිතන්නේ මනෝ..."

"ම්..."

"තාරකගේ මොකක් හරි සම්බන්ධෙකුත් තියෙනවා..."

උපේක්ෂාගේ පපුව ඇවිලිලා වගේ ගියා.

"ඇ..යි එ..හෙම කිව්වේ සුදු නෝනා..."

"මට නිකං හිතෙනවා... තිබ්බත් පුදුම වෙන්න දෙයක් නෑ..."

මේවා කිව්වේ නෑ කියලා දවසක සුදු නෝනම මට දොස් කියයි... මනෝජා හිතුවා.

"එ..හෙම ඉන්නවනම් සුදු නෝනා මෙ..හෙම කරන එක හරිද... කොල්ලා ජීවිත කාලෙම දුක් විඳියිනේ..."

"ඇත්ත මනෝ... ඒත් මේ මඟුල දැන් කටේ..."

"එයාට දිල්ව බඳින්නම වෙනවා..." උපේක්ෂා හිතුවා. අම්මත් කියන්නේ ඒකයි.

"අනේ මන්දා..."

"තාරක දිල් ගැන ගොඩක් දේවල් දන්නවා... අම්මා කෙනෙක්ගේ මූණ දිහා බලාගෙන කියන්නත් බැරි දේවල්ලු තියෙන්නේ කියලා කිව්වා..."

උපේක්ෂාට හීල්ලුනා. මේ සිද්ධ වෙන දේවල් ඔක්කොම හිතුවාම ඇයට දුක හිතෙන්නේ ඔහු ගැන. "එයාට තියෙන්නේ එහෙම අවුල් වෙලා නාස්ති වෙන්න ඕන ජීවිතයක් නෙමේ..."

"ම..නෝ..."

"සුදු නෝනා..."

www.sinhalaelibrary.com

"වියදමට අනේ කීයක් වත් නෑ නේද..."

"තියෙ..නවා සුදු නෝනා..."

"කොහෙන් ලැබෙන්නද... බොරු කියන්නෙපා..."

"තාරක පුතා ආවාමත් දෙනවා... මහ වියදමක් නෑනේ..."

"ම්.. මේකත් තියාගන්න..."

මේ අම්මයි පුතයි දෙන්නාම බෝසත් කුලේ වෙන්න ඇති කියලා උපේක්ෂාට හිතුණා.

"සුදු නෝනා මේ දරුවා ගැන බලන්න..."

"දෙයියන්ටවත් කියන්න ඉන්නේ මනෝ... වෙලාවක යන්ද මං එක්ක මුන්නේශ්වරම්... අපි වතාවක් ගියේ..."





"හෙට හරි ය..න්..."

"මං බලලා කියන්නම්..."

"මො..නවා හරි වුණාට පස්සේ වැඩක් නෑ සුදු නෝනා..."

"ම්..."

"එයා වෙනුවෙන් ඕනනම් මං දවස් හතක් මුන්නේශ්වරම යන්නම්..." උපේක්ෂාට කියන්නට හිතෙනවා.

"මං එහෙනම් යනවා මනෝ... අසනීපයක් එහෙම දැන් නැනේ..."

"අනේ නෑ සුදු නෝනා... උන්නට වඩා සනීපෙන් ඉන්නවා..."

"මං යනවා එහෙනම්..."

"බුදු සරණයි නෝනේ..."

"බුදු සරණයි..."

දෙන්නාම මිදුලට බහිනවා උපේක්ෂා බලාගෙන... දුවලා ගිහින් ඒ අම්මට වඳින්න ඇයට හිතෙනවා. "එහෙම දවසක් ඒවි කියලා මට නිකමට හිතෙනවා..." උපේක්ෂාට හිතුණා.

වසන්ති යන දිහා බලා උන් මනෝජා ගෙට ආවා. උපේක්ෂා ඇස් පිහද පිහදා එළියට ආවා.

"දැ..ක්..ක..නේ..."

"ම්.. ඔයා කිව්වා හරි... පින් කඳක්..."

"කොල්ලා ගැන හරි දුකින් ඉන්නේ..."

"එයා ඇත්තටම ඉන්නේ ප්‍රශ්න ගොඩක සුදු ඇන්ටි..."

"ම්... මොනවා හරි වෙන්නම ඕන පුතේ..."

"මො..න..වා වෙ..න්..න..ද..."

"එ..හෙම හාස්කම් වෙනවා..."

"ජීවිතේ..."

"ම්..."

එහෙම හාස්කම් සිද්ධ වෙන්නට පුළුවන් කියලා උපේක්ෂාත් දන්නවා.

"ඔය උදේ කිව්වා කියපු දේවල් කිව්වේ..."

"ම්..."

"කා ගැනද කියන්නේ මැණික ඒ..."

"ද..න්..නෑ සු..දු ඇ..න්..ටී..."

උපේක්ෂා බිම බලාගෙන කිව්වා. මනෝජා කෙල්ලගේ උරතලයට අත තිබ්බා.

"ඕ..යා ගැ..න..."

උපේක්ෂා කතා කළේ නෑ. ඒ කියන්නේ තමා ගැන කියලා ඇයත් දන්නවා.

"අපි බලමු..."

"ම්..."

"ප්‍රශ්න ගොඩක් විසඳ ගන්නත් තියෙනවනේ නේද..."

"ඒකනේ..."

"ඒවා විසඳෙයි පුතේ... මට එහෙම හිතෙනවා..."

මනෝජා කෙල්ලට බත් බෙදුවා.

"දැක්කද කිව්වා සුදු නෝනා..."





"මොකක්ද..."

"මං ලස්සන වෙලාලු... කෙට්ටු වෙලාලු... ඇඟ ෂේප් වෙලාලු..."

"ම්..."

"උඹ නිසා තමා..."

මනෝජා කෙල්ලගේ මූණ අතගෑවා. උපේක්ෂා හිනාවුණා.

"ගේත් පිළිවෙලයිලු..."

"ම්..."

"ඉස්සර මගේ වැඩ එහෙම පිළිවෙලක් නෑ තමා, පුතේ... ඔයයි ඔක්කොම කළේ..."

"ඕ..යා ඊට වඩා දේවල් මගේ ජීවිතේට කළා සුදු ඇන්ටී..."

උපේක්ෂා මුළු හදවතින්ම කිව්වා.

www.sinhalaelibrary.com

*** *** *** ***

**හවස** උපේක්ෂා හරි නිස්කලංකේ තාරකට ගත්තා. ඇඟ සෝදගෙන ඇවිත් බුදු පහනටත් වැඳලා ආපු කෙල්ල දුරකථනය අතට ගත්තා. මේ වෙලාවට කෙල්ල ළඟ හරි සුවඳයි. තාමත් ඇයට මහ ගොඩක් ඇඳුම් පැළඳුම් නෑ. ඒත් තියෙන ඇඳුම් ටික ඇය පිළිවෙලට ඇන්දා...

හවස ඇය මෙහෙම ඇඟ සෝදාගෙන පිළිවෙලට ඇඳගෙන රෝස පාට රබර් සෙරෙප්පු දෙකක් දාගෙනම ආවේ ගොඩක් දේවල් හිතාගෙනයි. අද උදේ තාරකගේ අම්මා ආපු වෙලාවේ කිව්ව දේවල් තවමත් ඇගේ හිතේ දෝංකාර දෙනවා.

**"මං ජීවිතේ ගොඩක් දුක් විඳපු කාලෙක ඔයා මට දෙවි හාමුදුරු කෙනෙක් වගේ උදව් කළා... ඒ පිහිට මට ඔයාට වෙන්න පුළුවන් නම්... ඒත් කොහොමද කියලා තේරෙන්නෑ තාරක අයියේ..."**

ජීවිත කඩාගෙන වැටෙනවා. හදවත් කඩාගෙන වැටෙනවා. එහෙම අනතුරක් ජීවිතේට උනාම පිහිටක් ඉල්ලන්නෑ. ළඟම ඉන්න කෙනා එයාට පිහිට වෙන්න ඕන.





ඔහු තමාට පිහිට උනේ එහෙම... දැන් ඔහු හදවත කඩාගෙන දුක් විඳින කාලේ... පිහිට වෙන්න විදිහක් තියෙනවද.. ඇය හිතනවා.

එයාගේ දුකවත් අහගෙන ඉන්න ඕන... උපේක්ෂාට හිතෙනවා.

දුරකථනය නාද වෙද්දීම ඔහු ගත්තා...

"අ..යියේ..."

**"ළමයා දැන් මොනාද කරන්නේ..."**

**"ම්.. මං මෙ ඇඟ සෝදගෙන පහන තියලා ආවා විතරයි..."**

පහන තියලනේ දෙයියන්ට කතා කරන්න ඕන.

**"ඇඳුමක් දාගෙන ඉන්න... මං විනාඩි දහයෙන් එනවා..."**

"දැ..න්..."

"ම..."

**"හා.. කොහෙවත් ය..න්නෑ නේද අයියේ..."**

"ඇයි..."

"නෑ මෙ..හෙ..මම එ..න්..න..."

**"ඔහොම හොඳයි... එළියට එන්නෙපා... මං ඇවිත් කතා කරන්නම්..."**

**"හා..."**



www.sinhalaelibrary.com

# ආදරය ගින්දරක්

හැමදාම මට මොකක්ද අඩුවක් දැනුණා... ඒක විස්තර කරන්න මට තේරෙන්නේ නෑ... නිකං මොකක්ද දෙයක් නැහැ වගේ මට නිතරම දැනෙනන්න ගත්තා... ගිය ආත්මෙක මට තිබුණ දෙයක් මේ ආත්මේ මට නෑ වගේ මට දැනෙන්න ගත්තා... මම ගොඩක් හිතුවා... ඇයි මට මෙහෙම හිතෙන්නේ කියලා... ඒත් තේරුමක් තිබුනේ නෑ... එක දවසක මම එයාව දැක්කා... ඔයාගේ ඇස් දෙක මගේ ඇස් ඉස්සරහට ආවා... එදා මට පුදුම හිතුණා... පස්සෙන් පහු මම තේරුම් ගත්තා මේ ආත්මේ අඩුවක් වගේ තේරුණේ ඔයා නැති එක කියලා... මගේ ජීවිතේ මේ දැනෙන අඩුව ඔයා කියලා මම හරියටම තේරුම් ගත්තා... මේකයි... අපි පහුණු ආත්මෙක එකට උන්නා... සමහරවිට මේ ආත්මෙට ළඟම තිබුණ අතීත ආත්මේ වෙන්න [illegible] ජීවත්වෙන්න පුළුවන් කියලා... එහෙම වුනොත් මට

හැමදාම ලොකු අඩුවක් දැනෙයි... නිකං හිස් ගතියක්... මොකක්ද නෑ වගේ... එහෙම වෙන්නේ කොහොමද... එතකොට ජීවිතේ සම්පූර්ණ නැනේ බබා... ඉතින් මම තීරණය කළා ඔයාගේ ජීවිතේ කොටසක් වෙන්න... ඇත්තම කතාව මේකයි... මට ඕන ඔයාව මගේ කරගන්න... මොකද ඔයා නැතුව පුදු මම සම්පූර්ණ නෑ...

ඒක ටිකක් ආත්මාර්ථකාමී දෙයක්... මොනවා කරන්නද... ජීවත්වෙන්න ඔයාවම ඕනනම්... නේද... ඉතින් කියනවා මම ඔයාට හරි ආදරෙයි... ගොඩක්... කියන්න බැරි තරම්......."

**සුජීව ප්‍රසන්න ආරච්චි**



www.sinhalaelibrary.com


නවකතා
තිළිණය
10
පොත
ආදරය
ගින්දරක්
www.sinhalaelibrary.com
සුජීව ප්‍රසන්න ආරච්චි

**හවස** උපේක්ෂා හරි නිස්කලංකේ තාරකට ගත්තා. ඇඟ සෝදගෙන ඇවිත් බුදු පහනටත් වැඳලා ආපු කෙල්ල දුරකථනය අතට ගත්තා. මේ වෙලාවට කෙල්ල ළඟ හරි සුවඳයි. තාමත් ඇයට මහ ගොඩක් ඇඳුම් පැළඳුම් නෑ. ඒත් තියෙන ඇඳුම් ටික ඇය පිළිවෙලට ඇන්දා...

හවස ඇය මෙහෙම ඇඟ සෝදාගෙන පිළිවෙලට ඇඳගෙන රෝස පාට රබර් සෙරෙප්පු දෙකක් දාගෙනම ආවේ ගොඩක් දේවල් හිතාගෙනයි. අද උදේ තාරකගේ අම්මා ආපු වෙලාවේ කිව්ව දේවල් තවමත් ඇගේ හිතේ දෝංකාර දෙනවා.

**"මං ජීවිතේ ගොඩක් දුක් විඳපු කාලෙක ඔයා මට දෙවි හාමුදුරු කෙනෙක් වගේ උදව් කළා... ඒ පිහිට මට ඔයාට වෙන්න පුළුවන් නම්... ඒත් කොහොමද කියලා තේරෙන්නෑ තාරක අයියේ..."**

ජීවිත කඩාගෙන වැටෙනවා. හදවත් කඩාගෙන වැටෙනවා.





එහෙම අනතුරක් ජීවිතේට උනාම පිහිටක් ඉල්ලන්නෑ. ළඟම ඉන්න කෙනා එයාට පිහිට වෙන්න ඕන.

ඔහු තමාට පිහිට උනේ එහෙම... දැන් ඔහු හදවත කඩාගෙන දුක් විඳින කාලේ... පිහිට වෙන්න විදිහක් තියෙනවද.. ඇය හිතනවා.

එයාගේ දුකවත් අහගෙන ඉන්න ඕන... උපේක්ෂාට හිතෙනවා.

දුරකථනය නාද වෙද්දීම ඔහු ගත්තා...

"අ..යියේ..."

"ළමයා දැන් මොනාද කරන්නේ..."

"ම.. මං මේ ඇඟ සෝදගෙන පහන තියලා ආවා විතරයි..."

පහන තියලනේ දෙයියන්ට කතා කරන්න ඕන.

"ඇඳුමක් දාගෙන ඉන්න... මං විනාඩි දහයෙන් එනවා..."

"ඈ..න්..."

"ම..."

"හා.. කොහෙවත් ය..න්නෑ නේද අයියේ..."

"ඇයි..."

"නෑ මෙ..හෙ..මම එ..න්..න..."

"ඔහොම හොඳයි... එළියට එන්නෙපා... මං ඇවිත් කතා කරන්නම්..."



www.sinhalaelibrary.com

"හා..."

කෙල්ලට දැන් පුදුම සතුටුයි. ඒ හඬ ටිකක් අහන්න ගියේ ඒ තරමටම හදවතට සතුටු නිසයි. ඔහු එනවා කිව්වහම ඇයට දරාගන්නට බෑ.

කෙල්ල කුස්සියට දුවගෙන ගියා. මනෝජා රෑට මොනා හරි හදන්න පොල් ගගා උන්නේ.

"අ..නේ පව්... මං ගාන්න එනවනේ..."

කෙල්ල මනෝජාගේ ගෙළ වටා දෑතම යවලා කිව්වා.

"දවල්වත් ඉව්වා... මං රෑට හදන්නම්..."

"එපා සුදූ ඇන්ටියේ..."

"ඇයි..."

"දැන් අයියා එනවා කිව්වා..."

"ම්..."

"එළියට චුට්ටක් යන්න... මං එද්දී කෑම ගේන්නම්... අදට විතරක් කොත්තුවක් දෙනවා..."

මනෝජා හරි ලස්සනට හිනාවුණා. කොත්තු කන්න ඇය හරි ආසයි.

"එහෙනම් වරෙන් කොත්තුවක් දෙන්න..."





ඇය ඇත්තටම කෙල්ලව බදාගෙන ඉඹ ගත්තාය.

"ල..ස්ස..නට කිස් කරනවා..."

උපේක්ෂා කිව්වා.

"මං ඒවා හොඳට දන්නවා..."

"කී දෙනෙක්ව කිස් කළාද..."

"අනේ වස්තුවේ.. මගේ පණට විතරයි..."

"මං නා..ම් තා..ම කවුරුවත් කිස් කරලා නෑ..."

"ඒක හොඳයි..."

"ඇයි..."

"එතුට උඹ තොල්ලව පෙරලගෙන කිස් කරයි..."

"ඒ..හෙම ලැජ්ජයි ඉ..නි..න්.. මෙතනට චූ..ටි එක..ක්..."

කෙල්ල නළලත මැද කියලා කිව්වා. මනෝජා හිතට ආපු දේ කිව්වේ නෑ. ඔහු ඇවිත් ෆෝන් එක ගැහුවා.

"අ..යියා ඇවිත්... මං ය..නවා හොඳේ..."

"ම්..."

මනෝජා දුවගෙන යන කෙල්ල දිහා හරි ආදරෙන් බලා උන්නා.

උපේක්ෂා වාහනයට නැග්ගෙම හිනාවෙච්. කෙල්ල මෙහෙම සතුටින් ඉන්නවා දකිද්දී තාරකට ඇත්තටම ආසයි.



www.sinhalaelibrary.com

"ළමයා හරි සතුටින් වගේ..."

"ළ..ම..යා දැ..න් වු..ට්ට වු..ට්ට හි..නාවෙ..න්..න ඉගෙන ග..න්නවා.. ඇයි දන්නවද..."

"ම්..."

"අ..පට එක දෙවියෙක් ඇවිත් පාර පෙන්නුවනේ..."

වාහනයම පුසුඹයි. මේ වගේ හවසක යුවතියකගේ වතින් නික්මෙන ඒ නිර්මල සුවඳ තාරක විඳල තිබ්බේ නෑ.

"මොකටද හිනාවෙවී ආවේ..."

අඳුරු දියවන්නා මාවත දිගේ වාහනයක් පදවමින් ඔහු ඇසුවා.

"නෑ අ..ඩියෙ මේ..."

"ඉතින්..."

"ම..නෝජා ඇන්ටි මාව ලස්සනට කිස් කළා... මෙහෙම අත ඇලා මේ අත මෙතනට තියලා... හරිම ස්විට්..."

එවර නම් ඔහුත් හිනාවුණා.

"එහෙම කවුරුවත් ස්විට් විදිහට කිස් කරලා නැද්ද..."

උත්තරය හිනාවක්. ඔහු දන්නවා.

"අන්කල් ඉඳිද්දී ඉන්න දෙන්නැතුව ඇති..."

තාරක හිනාවෙවී කිව්වා.



www.sinhalaelibrary.com



"ඒ..ක පු..දුම දෙ..ය..ක් අ..ඩියේ..."

"මො..ක..ක්..ද..."

"ආදරේ..."

"ම්..."

ඉන්පසු දෙදෙනාම ටික දුරක් යනතෙක් කතා කළේ නෑ.

"යද්දී මට තොත්තුවක් අරන් දෙන්න හොඳේ..."

"තොත්තු කඩවල නැනේ... දෙනවා මිසක්..."

ඔහු එහෙමම කිව්වා. උපේක්ෂාට හිනාව නවත්වා ගන්නට බැරි වුණා.

"තො..ත්..තු නෙ..මේ අ..ඩියේ..."

කෙල්ල හිනාවෙවීම කිව්වා.

"එ..හෙ..නම්..."

"තො..ත්..තු... අ..ප..ට රෑට ක..න්..න..."

තාරක ඉදිරිය බලාගෙන හිනාවුණා. ඇයි තොත්තුවක් එපාද... කියලා අහන්න ඔහුට හිතුණා. පුළුවන් නම් තොත්තුවකුත් දෙන්න කියලා කියන්න ඇයට හිතුණා.

දෙන්නාගේම සිනාව දෙතොල් මත රැඳී තිබුණා. අව්‍යාජ අහිංසක මුහුණු දෙකක ආදරය ඒ දෙතොල් මතයි තිබ්බේ.

"අ..ද අයියට මහන්සි පාටයි..."

"දිගටම වැඩ කළා උපේක්ෂා..."

"අපරාදේ... මූණ චුට්ටක් හෝදගෙන තේ එකක් බීලම එන්න තිබ්බා..."

"මගින් තේකක් බොමු..."

එසේ කියන අතරතුරම තාරක පැති කණ්නාඩියෙන් පිටුපස බැලුවා.

"උපේක්ෂා..."

www.sinhalaelibrary.com

ඔහු කතා කළේ වෙනස්ම විදිහට...

"ඇ..යි අයියේ..."

"අපිව කවුරු හරි ෆලෝ කරනවා..."

තාරක කිව්වේ කෙල්ලගේ අතට අත තියලා.

උපේක්ෂාගේ පපුව ඇවිලීගෙන වගේ ගියා. කෙල්ලට බය හිතුණේ ඇය ගැන නෙමේ. ඔහු ගැන. "ඔයාවයි දෙයියනේ මං රකින්න ඕනේ..." ඇය වෙව්ලන හදින් සිතුවා.

"පිටිපස්සෙන් බයික් දෙකක් එනවා නංගී..."

"ඒ.. උ.න් ත..මා අ..යි..යේ... එදත් ආවේ මෙ..හෙම බයික් දෙ..කකින්..."





"බයවෙන්නෙපා... උන් මඟ රැකගෙනම ඉන්න ඇති... ඔයාට මොනවත් වෙන්න මං ඉඩ දෙන්නෑ..."

"ම.. ම..ට බ..ය අයියා ගැ..න..."

තාරක වාහනයේ වේගය වැඩි කළා. බයිසිකල් වල වේගයත් ඒ අනුවම වැඩි වෙනවා ඔහු බලාගෙන.

"නංගී..."

"අ..යියේ..."

"සමහර විට මුන් ඉස්සරහිනුත් ඉන්න පුළුවන්..."

"ඔ..ව්... ස..මහර විට ඒ මි..නි..හම වෙ..න්න පුළුවන් අ..යියේ..."

"මේ වෙලාවේ අපි ටිකක් පරිස්සම් වෙ..න්..නම ඕන..."

"ඔ..ව්.. මං.. මං ඒ මි..නිහව දකින්නවත් ආස නෑ... සු..දු අයියේ..."

කෙල්ලව වෙව්ලනවා ඔහු බලාගෙන. ඒක පුදුමාකාර බයක්... කෙල්ලගේ ජීවිතයම අවුල් කළේ ඔහු... ඒ නිසයි කෙල්ල මේ තරමම බය.

"උ..න් මේ ළ..ඟ අ..යියේ..."

"ඉ..න්..නකෝ නංගී..."

ඉදිරිපස තිබූ පාරෙන් තාරක වාහනය පාර්ලිමේන්තු මාවතට දැම්මා... එතනින් කෙළින්ම වැටෙන්නේ පාර්ලිමේන්තු වටරවුමට.

"මො..ක..ද ක..ර..න්..නේ..."

තාරක වේගයෙන් වාහනය පදවාගෙන යන ගමන් හිතුවා. මොනවා

"නංගී..."

"අ..යියේ..."

www.sinhalaelibrary.com

"සමහර විට මුන් ඉස්සරහිනුත් ඉන්න පුළුවන්..."

"ඔ..ව්... ස..මහර විට ඒ මි..නි..හම වෙ..න්න පුළුවන් අ..යියේ..."

"මේ වෙලාවේ අපි ටිකක් පරිස්සම් වෙ..න්..නම ඕන..."

"ඔ..ව්.. මං.. මං ඒ මි..නිහව දකින්නවත් ආස නෑ... සු..දු අයියේ..."

කෙල්ලව වෙව්ලනවා ඔහු බලාගෙන. ඒක පුදුමාකාර බයක්... කෙල්ලගේ ජීවිතයම අවුල් කළේ ඔහු... ඒ නිසයි කෙල්ල මේ තරම්ම බය.

"උ..න් මේ ළ..ග අ..යියේ..."

"ඉ..න්..නකෝ නංගී..."

ඉදිරිපස තිබූ පාරෙන් තාරක වාහනය පාර්ලිමේන්තු මාවතට





දැම්මා... එතනින් කෙළින්ම වැටෙන්නේ පාර්ලිමේන්තු වටරවුමට.

"මො..ක..ද ක..ර..න්..නේ..."

තාරක වේගයෙන් වාහනය පදවාගෙන යන ගමන් හිතුවා. මොනවා

"නංගී..."

"අ..යියේ..."

"සමහර විට මුන් ඉස්සරහිනුත් ඉන්න පුළුවන්..."

"ඔ..ව්... ස..මහර විට ඒ මි..නි..හම වෙ..න්න පුළුවන් අ..යියේ..."

"මේ වෙලාවේ අපි ටිකක් පරිස්සම් වෙ..න්..නම ඕන..."

"ඔ..ව්.. මං.. මං ඒ මි..නිහව දකින්නවත් ආස නෑ... සු..දු අයියේ..."

කෙල්ලව වෙව්ලනවා ඔහු බලාගෙන. ඒක පුදුමාකාර බයක්... කෙල්ලගේ ජීවිතයම අවුල් කළේ ඔහු... ඒ නිසයි කෙල්ල මේ තරම්ම බය.

"උ..න් මේ ළ..ග අ..යියේ..."

"ඉ..න්..නකෝ නංගී..."

ඉදිරිපස තිබූ පාරෙන් තාරක වාහනය පාර්ලිමේන්තු මාවතට දැම්මා... එතනින් කෙළින්ම වැටෙන්නේ පාර්ලිමේන්තු වටරවුමට.

"මො..ක..ද ක..ර..න්..නේ..."

තාරක වේගයෙන් වාහනය පදවාගෙන යන ගමන් හිතුවා. මොනවා කරන්නත් ලොකු කාලයක් නෑ... තාරක ඉදිරියෙන් තිබූ මාර්ග බාධකය අසළදී වාහනයේ වේගය බාල කළා... ඒ අනුව බයිසිකල් කාරයන් දෙදෙනාට වේගය බාල කරගන්නට අමාරු වුණා. තාරක ඔවුන්ට ටික දුරක් යන්නට දුන්නා. කළු හෙල්මට් පැළඳගෙන උන් බයිසිකල් කාරයන් දෙදෙනාම වාහනය පාස් කළේ වාහනයේ උන් තාරකත් උපේක්ෂාත් දෙදෙනා දිහාම බලාගෙනමයි.

www.sinhalaelibrary.com

"උ..න් අ..පිව දැක්කා උපේක්ෂා..."

"ඔ..ව්..."

"බලමු..."

ඔවුන් හරවාගෙන එන්නට ප්‍රථම තාරක වාහනය අතුරු පාරකට හැරෙව්වා. තාරක ඒ අතුරු පාර දිගේ වේගයෙන් වාහනය පැදෙව්වා. "ඔයා පව්... මං නිසයි මේ දුක..." උපේක්ෂා ඔහු දිහා බලාගෙන හීල්ලුවා.

තාරක එක් අතුරු පාරකින් තවත් අතුරු පාරකට වාහනය හැරවූයේ ඔවුන් පසුපස එන බව දැනගෙනමයි... අතුරු පාරවල් හතර පහකින්ම වාහනය දැමූ තාරක අවසානයේ වාහනය තාවල





පාරෙන් නාරාහේන්පිටට දැම්මා.

"නංගී..."

"අ..යියේ..."

"හොඳට බල..න්..න බබා බයික් කාරයෝ එනවද කියලා... හොඳට හැරිලා බලන්න..."

උපේක්ෂා සීට් එක උඩ ඉඳගෙන වගේ පිටුපස බලාගෙන උන්නා. එහෙම ඉන්නවා දකිද්දී ඔහුටත් හිනා ගියා. එහෙම ඉන්නකොට කෙල්ල හරි හුරතල් පාටයි.

"එක එක බයිසිකල් නම් එනවා අ..යියේ... ඒත්.. උ..න් නෑ..."

වැඩි ආරක්ෂාවටත් එක්ක තාරක වාහනය යළිත් අතුරු පාරකට දැම්මා. ඒ අතුරු පාරේ ටික දුරක් ගිහින් ඔහු වාහනයේ වේගය බාල කළා...

"එ..නවද..."

"නෑ.. අ..යියේ..."

"උ..න් දැ..න් අ..පිව අ..ල්ල..නවා බො..රු... අපි මෙහෙම ටිකක් ඉ..මු..."

තාරක වාහනයේ වායු සමීකරණය ටිකක් වැඩි කරලා කොණ්ඩය එහෙමම අතින් පිටුපසට කර ගත්තා. කෙල්ලගේ ගැහෙන අත

තාරකගේ වමතට පහත් වුණා.

"ම..ට ර..ත්..න..ර..න් අ..යියේ ස..මා..වෙ..න්..න..."

ඒ ඇස්වල කඳුළු. තාරකගේ පපුව කඩාගෙන වගේ ගියා.

"ස..මා..වෙ..න්..න මොකටද..."

"මං නිසා මේ ක..ර..දර..."

"ඔයාට කරන දෙයක් මට කරදරයක් නෙමේ..."

තාරක ඒ හිස අතගාලා වගේ හරි ආදරෙන් කිව්වා. උපේක්ෂාට ඇඬෙන්නට වගේ ආවා. කියන්නට දහසක් දේ තාරකගේ හිතට එනවා. ඒත් ඔහු කිව්වේ නෑ.

www.sinhalaelibrary.com

"නංගී..."

"ම්..."

"දැ..න් අපට මනෝජා ඇන්ටිගේ ගෙදර ය..න්න බෑ..."

"ඔ..ව්... ඒ..ක..නේ මං කි..ව්වේ අ..යියට කරදර ගොඩක්..."

තාරක හිනාවුණා. ඒ හිනාව හරි පුදුමාකාරය. පපුවේ තියන ඔය ඔක්කොම ඒ හිනාවෙන් නිවෙනවා.

"ම..ට උපේක්ෂා..."

"ම්..."

"මේ වගේම කරදර එයි..."





"ම්..."

"එදාට මට උදව් කරනවද..."

"වැ..ඩී..ගෙ..න ක..ර..න්..න..ම්..."

"ඒ ඇති... දැන්.. මො..කද අපි කරන්නේ... ය..න්නෝ..."

තාරක වාහනය දැම්මේ වෙනස්ම පාරකින්... එහෙම ආ ඔහු අවසානයට මතු වුණේ දෙහිවලින්...

දෙහිවලට ආ තාරක එහෙමම මනෝජාට ගත්තා.

"මනෝජා ඇන්ටි... මම..."

"ආ පු..තේ..."

"පොඩි කරදරයක් ඇන්ටි..."

තාරක සිදුවූ සියල්ල කිව්වා.

"අනේ දෙයියනේ කෙල්ලව ගේන්නෙපා පුතේ..."

"ඔයා ඇන්ටි නංගිගෙයි ඔයාගෙයි ඇඳුම් ටිකකුත් අ..රගෙ..න ත්‍රීවිල් එකකින් එන්න..."

"එ..න්..නම් පුතේ... කොහාටද..."

"ම්.. ගල්කිස්ස හන්දියට එන්නකෝ... ඊට පස්සේ මං කියන්නම්..."

"මං දැන්මම එන්නම්..."

තාරක උපේක්ෂා දිහා බැලුවා.

"උපේක්‍ෂා..."

"අයියේ..."

"අදම අපි කොහේ හරි නවතිමු... හොඳද..."

"ම්..."

"මං හෙට වැඩ පිළිවෙලක් හදන්නම්..."

"ම්..."

"කොහොමත් අපට දැන් වැඩ පටන් ගන්නම වෙනවා..."

"එයාලට මෙහෙම උඩ පනින්න දෙන්න බෑ... ඔයා රැකෙන්නම ඕන..."

"මං රකිනවා..." ඔහු කෙල්ල දිහා බලාගෙන දැඩි අධිෂ්ඨානයකින් හිතුවා.

දැන් ඇයව රකින්න ඕනා මේ රාත්‍රියෙ විතරක් නෙමේ. සමහර විට ඇගේ ජීවිතයට හරි පිළිතුරක් ලැබෙන තුරුම කෙල්ලව රකින්නට ඕනා.

"උපේක්‍ෂා ඉන්නේ බයෙන්ද..."

ඒ බය කෙල්ලගේ මුහුණින් පෙනෙනවා. ඕනවට වඩා කෙල්ල බය උනොත් ඒ ජීවිතය ආයෙත් පසුබසින්න පුළුවන්.

"ම..ට අ..යියේ..."





"ම්..."

"අ..යියා ළ..ග ඉ..දිද්දී එ..හෙම බයක් දැනෙන්නෑ..."

ඒ වචන වලට තාරක පුදුම විදිහට ආස කළා. මේ අතින් කෙනෙකුට රැකවරණයක් ලැබෙනවා කියලා අහද්දී හදවතට වෙනමම ආඩම්බරයක් දැනෙනවා.

"මං ළඟම ඉන්නවා..."

ඒක පොරොන්දුවක් වගේ. ඒ තරමටම ප්‍රබලයි. උපේක්‍ෂා පුංචි දෙවියෙක් දිහා බලනවා වගේ ඔහු දිහා බැලුවා.

"අපි උපේක්‍ෂා හෙට කොහොමත් ලෝයර්ව හම්බවෙන්නම ඕනා..."

"අ..යිය..ට වැඩත් ඇති..."

"කල් දාන්න බෑ... අපි අර උපේක්‍ෂාගේ මැනේජර්වත් හම්බවෙමු..."

"එයා ඒ ඩොකියුමන්ට් අරගෙනත් ඇති..."

"හරි හෙට එයාවත් හම්බවෙමු... දැන් කල් යවන්න බෑ... අපිට හැංගිලා ඉන්නත් බෑ..."

"ම්..."

තාරක හිමිහිට ඒ හිසට සුරත තිබ්බා. ඔළුවම රස්නෙයි.

"වැටිලා නෑ නේද..."



www.sinhalaelibrary.com

"නෑ.. මං කිව්වේ අයියා ළඟදි වැටෙන්නෑ..."

"මං දැන් වැටෙන්න දෙන්නෙත් නෑ..."

උපේක්ෂා හිස වැනුවා. ළඟ මහා පර්වතයක් තියෙනවා වගේ හැඟීමක් ඔහුට දැනෙනවා.

**** **** **** ****





www.sinhalaelibrary.com

**තාරක** මනෝජාව ගල්කිස්ස සුපර් මාර්කට් එක ළඟින් ගත්තා... මේ ප්‍රශ්න මැද්දේ මේ දුප්පත් ගෑණි කෙල්ල ළඟ ඉන්න එක ලොකු දෙයක් කියලා තාරකට හිතුණා.

"ඇන්ටි..."

"පු..තේ..."

"අපි ඇන්ටි මේ වෙලාවේ මේ කෙල්ලව රකින්නම ඕන..."

එහෙම කියද්දී උපේක්ෂාගේ බඩ පපුව ආගෙන යනවා.

"දැ..න්..නවා පු..තේ... මං ඕන දුකක් විඳින්නම්... දැ..න් මෙකි මගේ දුව වගේනේ..."

"වගේ නෙමේ ඇන්ටී... ඔයාගෙම දුව තමා..."

තාරක එහෙමම කිව්වා. උපේක්ෂා පසුපස අසුන දිහා බලලා අසරණ පාටට හිනාවුණා.

"අපිට ඇන්ටි ටික දවසක් හෝටලේක ඉන්න වෙනවා.. උන් ගේ දකින්න ඇති.."

"ඔ..ව්... ප්‍රශ්නයක් නෑ පුතේ..."

"අපි ටික දවසක් එහෙම කරමු... ඊට පස්සේ මං විදිහක් හිතන්නම්..."

"කෙල්ලව රකින්නනේ පුතේ ඕන... හෝටලේක නෙමේ පන්සලක වැටිලා හරි මං ඉන්නම්..."

මනෝජා කියද්දී උපේක්ෂාගේ දෑස් තෙමී යනවා.

"උන් ඇන්ටි බලන්නේ උපේක්ෂාව අල්ලගෙන මේ දේපොල ටික ගන්න... ඒ දේපොල නැති උනත් ඇන්ටි අපි අපේ කෙල්ලව බේරගන්න ඕන..."

උපේක්ෂාට ඇඬුණා... ජීවිතයේ අමාරුම දවස් කිහිපයක පිහිට වූ ඔහුව තමා වෙත එව්වේ දෙවියන්ද... හිතා ගන්නවත් බෑ.

"පන්සලක් පන්සලක් ගානේ ගිහින් බාරවෙලා හරි මාත් ඒක කරනවා පුතේ..."

"අපි තුන්දෙනාම යං... අඬන්නෙපා දරුවෝ..."

"ම..ට මෙ..හෙම පිහිට... වෙ..නවට..."

"මං එදත් කිව්වා නංගිට... තමන්ගේ අයට පිහිට වෙන්නෑ...





තේරුණාද..."

ඇය අඬ අඬාම හිස වනනවා.

"අපි ආරක්ෂිත තැනක් හොයාගමු... යමු..."

තාරක වාහනය පාරට දැම්මා. කෙල්ලව අයාලේ යන තැනක නතර කරන්න බැහැ. එහෙම නතර කරලා ගිහින් ගෙදර නිදා ගන්නත් බෑ.

තාරක වාහනය කළුතර දෙසටම ධාවනය කළා... වෙලාව රෑ අටයි.

"ළඟ හරියක නවත්තන්න බයයි උපේක්ෂා... තේරුණාද... අපි කළුතර යන්..."

"ම්..."

"කළුතර ඕන තරම් හෝටල් තියෙනවා... හොඳ එකක නවතිමු..."

"පුතා අපිව ආලා යනවද..."

මනෝජා එහෙම අහද්දී උපේක්ෂාටත් ඔහු දෙස බැලුණා. "අනේ යන්නෙපා" කියන්නාක් බඳු බැල්මක් ඒ ඇස්වල තිබ්බා...

"මං අම්මට කියන්නම්..."

"අ..යියට කරදරයි.. නේ..."

"අම්මව ෂේප් කරගන්න පුළුවන්... නංගිගේ ඇඳුම් ගෙනාවද



www.sinhalaelibrary.com

ඇන්ටි..."

"ඔ..ව් පු..තේ.. අහුවෙන ඇඳුම් දෙක තුනක් ගත්තා..."

"ය..න ගමන් මාත් සරමක් ගන්නම්..."

උපේක්ෂාට පුදුමයි. ඔහු වන් කෙනෙක් මේ ජීවිතයට මෙහෙමවත් ළං නොවුණා නම්... අද මේ ජීවිතයම ඉවරයි. සමහර විට තමා ජීවතුන් අතර නැතිවෙන්නට පුළුවන්.

www.sinhalaelibrary.com

තාරක යන ගමන්ම අම්මාට ගත්තා.

"අ..ම්මා..."

"කොහෙද පුතා... තාත්තත් ඇහුවා..."

"ම..ගේ මේ යාළුවෙක්ට පොඩි කරදරයක් අම්මා... මට අද රෑ එයාලත් එක්ක ඉන්නම වෙනවා..."

"ම්.. හිටියට කමක් නෑ... උදේ එන්න ඕන... තාත්තා අහයි..."

"මං උදේට ගේ ළඟ... හොඳ අම්මනේ... මට එයාලව දාලා එන්න විදිහක්ම නෑ.. කරදරයක් උනාම ළඟ ඉන්නෙපැයි..."

ඔහු කතා කරද්දී උපේක්ෂා පස්ස හැරී හැරී මනෝජා දිහා බලනවා. අද රෑ ඔහු ළඟ ඉන්න එක ලොකු ශක්තියක්. නැත්නම් මේ හිත ඉක්මනට කඩා වැටෙනවා.

"අම්මා එහෙනම් ක..න්න හොඳද..."





"ම්..."

"බුදු සරණයි..."

තාරක අම්මට අරගෙන එහෙමම උපේක්ෂා දිහා බැලුවා.

"සුදු නෝනා පුතා ගැන හරි දුකෙන් ඉන්නේ..."

"ඇන්ටිට කිව්වද..."

"කිව්වා පුතේ... මට කතා කළා මුන්නේෂ්වරම් යන්නත්..."

"අම්මා පව්..."

ඔහු එපමණයි කිව්වේ. මේ ජීවිතයට තියෙන අපල වලින් මිදෙන්න මුන්නේෂ්වරම් යන්න ඕන නෑ. මේ වම් පැත්තේ ඉන්න කෙල්ලව ජීවිතයට දුන්නනම් ඇති.

"නංගී..."

"අයියේ..."

"අපි සරමක් අරන් එමුද..."

"හා අ..යියේ..."

කෙල්ල ඇස් පිහදාගෙන ඔහුත් සමඟම බැස්සා. ඔහු යද්දී ඒ මුහුණ දිහා ඕනකමින් බැලුවා. "පව්" එහෙමම ඔහුට හිතෙනවා.

"මේ අත්කොට කමිසෙත් ගමු අයියේ..."

"ම්... හෙට ලෝයර් ළඟට යන්න ඇඳුමකුත් ගමු..."

"ඇ..න්ටි ගෙනත් ඇති..."

"ශ..න්..නකෝ..."

මොනවවත් කියන්න ඇයට හිතෙන්නෑ. "එයා මෙහෙම අරන් දෙද්දී හරි ආසයි" ඇය තනිවම හිතනවා.

**** *** *** *** *** *** *** *** ***

www.sinhalaelibrary.com





**ඔවුන්** නැවතුනේ කළු ගං මෝය අසබඩ සුන්දර හෝටලයකයි. එක් පැත්තකින් කළු ගං මෝයටත් අනිත් පැත්තෙන් දකුණු මුහුදු තීරයටත් මායිම්ව තිබුණ මේ හෝටලය ලංකාවට එන සංචාරකයන් අතර ඉතාමත්ම ජනප්‍රිය හෝටලයක්. එහි තිබුනේ අදහන්නට අමාරු නිස්කලංක බවක්.

රාත්‍රියේ සාගරය දෙසින් ආ කරදිය සුළඟේ තිබුනේ මෘදු සීතලක්. එක දිගට විහිදී ගිය වෙරළ තීරයේ තැනින් තැන හෝටලය විසින් පන්දම් දල්වා තිබුණා. ඒ පන්දම් එළිය වෙරළ තීරයට වෙනස් රසබර බවක් ගෙන ආවා. මධුසමය ගතකරන්නට ආ තරුණ විදේශීය යුවළක් ඔවුනොවුන්ට තුරුල් වී වෙරළ පුරා සක්මන් කළා. පොල් රුප්පාව යෝධ වැටකෙයියා ගසකට මායිම්ව ලස්සන ලී බංකුවක් හෝටලය විසින් තනා තිබුණා. එය එහෙමම මුහුණ ලා තිබුනේ මුහුදටයි.

කෙළින්ම එන කරදිය සුළඟ අනාරාධිතවම එතන ඉන්න කෙනෙක්ගේ මුහුණ ලස්සනට සිපගන්නවා.

තාරකත් උපේක්ෂාත් උන්නේ එහි ඉඳගෙනයි. මනෝජා කාමරයටම වෙලා උන්නේ කොල්ලාටත් කෙල්ලටත් කතාකරන්න දෙයක් තියෙනවා කියලා හිතුන නිසයි. ඇයට දෙයක් දැනෙන්න අරන් දැන් සෑහෙන දවසක් වෙනවා.

අනන්ත කරදර මැද උදාවූ මේ රාත්‍රිය හරි ලස්සනයි කියලා තාරකට හිතෙනවා. ඔහුට සිහිවෙන්නේ නුවරඑළිය ග්‍රෑන්ඩ් හෝටලයේ ඔහු උන් කාමරයට කෙල්ල ආව රැයයි. එදත් අදත් අතර මොනතරම්නම් දේ සිද්ධවුණාද...? අවසානයේ දෛවය හරි ලස්සනට තමාව කෙල්ලගේ ළඟට ගෙනත් ඇරලලා කියලා අද තාරකට හිතෙනවා.

ඔහු උපේක්ෂා දෙස බලාගෙනම උන්නා. වෙරළ තීරයේ තරමක් ඈතින් දැල්වූ පන්දම් එළිය කෙල්ලගේ මුහුණ මතට අහිංසකව වැටිලා තිබුණා. ඔහු උන්නේ දෙයක් පපුවට දරාගන්නට බැරුවයි.

"අ..යි..යේ..."

උපේක්ෂා කතාකළේ ඔහුගේ බැල්ම දරාගන්න බැරි නිසා නෙමෙයි. මේ නිහඬ බවට වඩා ලස්සන දොඩමළු බවක් තියෙනා



www.sinhalaelibrary.com



නිසයි.

"අද හරි ලස්සනයි..."

ඔහු කට පුරා කිව්වා. උපේක්ෂා ලස්සනට හිනාවුණා.

"මං නෙමෙයිනේ ලස්සන අයියේ..."

ඇය කියන්නේ නෙත් පමණක් ඔසවා ඔහු දෙස බලාගෙනයි. තාරක හිනාවුණා.

"මේ ස..ර..ම..ට..යි වෙක් ෂර්ට් එකටයි හරිම ලස්සනයි..."

ඇය කියනවා. තාරක ආයෙත් හිනාවෙනවා.

"න..ං..ගී..."

"ම්..."

වචන එන්නේ උගුරින්ද කියලා ඔහුට හිතෙනවා.

"ම..ම තව ටිකක් ළඟට ආවට කමක් නැද්ද..."

ඔහු අහනවා. උපේක්ෂා බැලුවා.

"ම..ම එන්නම්..."

ඒක හරි ලස්සන කතාවක්. උපේක්ෂා ලී බංකුවේ කොනක ඉඳලා ඔහුගේ සමීපයටම එනවා. දැන් ඔහුගේ වතින් එන රස්නය පවා උහුලගන්න බැරි විදිහට ඇයට දැනෙනවා. ඒ වගේම කෙල්ලගේ වතින් එන මෘදු විලවුන් සුවඳත් ඔහුට ඇඩිව දැනෙනවා. මේ රාත්‍රිය

මනරම්... ඔහුට හිතෙන්නේ එහෙමයි.

"දෙ..ය..ක් කියන්න ඕන නිසා ළඟට එන්න ගියේ..."

තාරක කියනවා. 'එච්චරම ළඟට අරගෙන කියන්න තියෙන්නේ මොනවාද..' ඇය හිතනවා.

"ම..ම අහගෙන ඉන්නම්..."

ඇය කියනවා. තාරකගේ අතක් හරි ආදරණීය විදිහට ඇවිත් කෙල්ලගේ උරතලය මතට වැටෙනවා. සිනිඳු ඊ ඇඳුමෙන් පමණක් වැසුණු කෙල්ලගේ උරතලයේ සිනිඳු බව ඔහුට දැනෙනවා.

www.sinhalaelibrary.com

කෙල්ලගේ හදවත ඇකිලීගෙන යනවා. ආයෙමත් පිපීගෙන එනවා.

"මං මොනවාහරි කියන්න ඕනද... ම්..."

ඔහු අහනවා. කෙල්ල බිම බලාගෙන හිනාවෙනවා.

"ම..ම..ද කියන්න ඕ..නා... ආ සුදු අයියේ..."

ඇය අහනවා.

තාරක හිනාවෙනවා.

"මං කි..ය..න්..න..ද... ම්.."

ඇය අයදිනවා. තාරක හිස වනනවා. ඇය දැන් ඉන්නේ ඔහුගේ වම් ඇලයට බරවෙලයි. තාරක ඇගේ උරතලයට අතක් තබා ඇයගේ





මුහුණටම එබීගෙන උන්නේ. මේ මොහොත පවා හරි ලස්සනයි.

"ම..ම ම..ගේ සු..දු අ..යි..ය..ට ගොඩක් ආ..ද..රෙ..යි... කියන්න බැරි තරම්..."

ඇය කියනවා. තාරකගේ දෙනෙත් පවා තෙත්ව යනවා. ඇය දෙනෙත් ඔසවා බලනවා.

"අ..නේ ඇ..යි මේ..."

"මා..ත්... ගොඩක් ආ...ද..රෙ..යි..."

කෙල්ලගේ හදවත දහ දොළොස් කඩකට කැඩීගෙන යනවා. එහෙමම ඇය ඔහුව වැළඳගන්නවා. ඊටත් වඩා වේගයකින් ඔහු කෙල්ලව වැළඳගන්නවා.

"ජීවිතේ හැම කරදරයකින්ම මාව ගළවගත්ත එක දෙවියයි ඉන්නේ... අ..නේ මට ඒ දෙවියව ලැ..බු..ණා..නේ..."

කෙල්ල අඬනවා. ඔහු මෘදුව ඇගේ නළලත පිරිමදිනවා.

"මේ හැම කරදරයක්ම මැද්දෙන් අපි අලුත් ජීවිත කතාවක් ලියමු බබා... ම්..."

ඔහු කියනවා.

"ඊ..ට කලින් ම..ම මෙ..තා..න චුට්ටක් කි..ස් කළාට කමක් නැද්ද.."

ඇය අහන්නේ ඔහුගේ දිගැටි නළලත මතට ඇඟිල්ලක් තියලයි.

"ඇ..යි එතන.."

."එහෙනම් කොතනද..."

ඔහු හිනාවෙනවා.

"එතන නෙමේ මෙ..ත..න..."

ඔහු ඔහුගේ ලවන් මතට සුරත තියනවා. කෙල්ල බිම බලාගෙන හිනාවෙනවා. ඒත් ඊළඟ තත්පරයේදී අලුත් ආදරවන්තයෝ උහුලාගන්න බැරිතරම් වේගයකින් සිපගන්නවා. වසන්තය ඇරඹුනා...

www.sinhalaelibrary.com

"ම..ගේ අ..යි..යේ.."

ඇය කතාකරන්නේ වෙව්ලමින්.

"මෝ..න..ව..ත් කියන්න එපා බබා... මෙතන ඉඳලා මගේ... මගේ කියන පූස් පැටියෙක්ටවත් මම දුක් විඳින්න දෙන්නේ නෑ... ජීවිතේ පටන් ගත්තා.. අද... මෙතනින්... මේ කළුතර බීච් එකෙන්... ම්..... දැන් බයවෙන්න එපා..."

තාරක කියනවා. ඇය ඔහුගේ දෙනෙත් දෙසම බලාගෙන ඉන්නවා.

"ඇයි බබා.."

"හැමදාම දෙවියෙක්ව දැක්කා මේ ඇස්දෙකින්..."

ඇය කියනවා.





"අද ඒ දෙවියෝ මටම ලැබුණා... ජීවිතේ මොන දුකක්ද ඉතින්..."

උපේක්ෂා අනන්ත වූ සැනසීමකින් ඔහුගේ පපුවට බරවුණා... කළුතර මුහුදු තීරය පුරා අසිරිමත් කරදිය සුළඟක් වේගයෙන් කඩාගෙන ගියා. වැටකෙයියා ගාලෙන් මුවා වූ කුඩා ලී බංකුව මත උන් අලුත් ආදරවන්තයින් ගැන දැන උන්නේ උඩ පිපෙමින් තිබූ ඇසළ සඳ පමණයි.

ආදරය ගින්දරක් නොවේ යැයි කියන්නේ කෙසේද..මේ මොහොතේදීත් මේ දෙදෙනාගේ හදවත්වල ඇවිලෙන්නේ ගින්දරක්... ලස්සනත් ඒ ගින්දරම නොවේද..?

**ආදරය ගින්දරක් 01**
**මින් නිමාවේ.**

**ආදරය ගින්දරක් 02 ළඟදීම බලාපොරොත්තුවන්න.**



සුජීව ප්‍රසන්න ආරච්චි

# ආදරයයි ගින්දරක්

හැ ඳෑම මට මොකක්ද අඩුවක් දැනුණා... ඒක විස්තර කරන්න මට තේරෙන්නේ නෑ... නිකං මොකක්ද දෙයක් හැලුනා වගේ මට නිතරම දැනෙන්න ගත්තා... හිය ආත්මෙක මට තිබුණ දෙයක් මේ ආත්මේ මට නෑ වගේ මට දැනෙන්න ගත්තා... මම ගොඩක් හිතුවා... ඇයි මට මෙහෙම හිතෙන්නේ කියලා... ඒත් තේරුමක් තිබුණේ නෑ... එක දවසක මම ඔයාව දැක්කා... ඔයාගේ ඇස් දෙක මගේ ඇස් ඉස්සරහට ආවා... එදා මට පුදුම හිතුණා... පස්සෙයන් පහු මම තේරුම් ගත්තා මේ ආත්මේ අඩුවක් වගේ තේරුණේ ඔයා නැති එක කියලා... මගේ ජීවිතේ මේ දැනෙන අඩුව ඔයා කියලා මම හරියටම තේරුම් ගත්තා... මෙතයි... අපි පහුගිය ආත්මෙක එකට උන්නා... සමහරවිට මේ ආත්මෙට ලබෙම තිබුණ අතීත ආත්මේ වෙන්න ඇති... ඉතින් මොකද කරන්නේ... ඔයා හිතනවද මට මේ ආත්මේ ඔයා නැතුව ජීවත්වෙන්න පුළුවන් කියලා... එහෙම වුනොත් මට හැමදාම ලොකු අඩුවක් දැනෙයි... නිකං හිස් ගතියක්... මොකක්ද නෑ වගේ... එහෙම වෙන්නේ නොහොඳ... [illegible] ජීවිතේ [illegible] වෙන්න... ඇත්තට කතාව මේකයි... මට ඕන ඔයාව මගේ කරගන්න... මොකද ඔයා නැතුව පූර්ණ මම සම්පූර්ණ නෑ... ඒක වීනත් ආත්මාර්ථකාමී දෙයක්... මොනවා කරන්නද... ජීවත්වෙන්න ඔයාවම ඕනකාම්... තේද... ඉතින් කියනවා මම ඔයාට හරි ආදරෙයි... ගොඩක්... කියන්න බැරි තරම්......

www.sinhalaelibrary.com